
# ලෙනින් චරිතය



සුරේන්ද්‍ර ප්‍රකාශන

# ලෙනින් චරිතය

නවකතාවකි

## මරියා ප්‍රිලෙෂායෙවා

මුද්‍රණය හා බෙදාහැරීම :
සුරේන්ද්‍ර ප්‍රකාශන,
ගණේමුල්ල.
දුරකථන : 060-2838510

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

ප්‍රිලෙෂායෙවා මරියා
ලෙනින් චරිතය / මරියා ප්‍රිලෙෂායෙවා, පරිවර්තනය
දැදිගම වී. රුද්‍රිගු - කොළඹ : කැටපත ප්‍රකාශන 2003
පි. 204, : චිත්‍ර 22 සෙ. මී. 20

ISBN 955-9412 - 23 - X මිල රු. 225.00

i 891. 73 ඩීවි 21 ii ග්‍රන්ථ නාමය
ii රුද්‍රිගු, දැදිගම වී. පරි.
1. නවකතා, රුසියානු සාහිත්‍යය 2. රුසියානු ප්‍රබන්ධ

අනුවාදය
දැදිගම වී. රුද්‍රිගු

ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රණය :
2003 සැප්තැම්බර්

මුද්‍රණය හා බෙදාහැරීම :
සුරේන්ද්‍ර ප්‍රකාශන,
ගණේමුල්ල.
දුරකථන : 060-2838510

## පෙරවදනක් වෙනුවට

...පෙරෙයස්ලාව්ස්කි උයෙස්ද්වලට* අයත් ගමක එක්දහස් නවසිය විසි ගණන් වලදී මම ගුරුවරියක මෙන් සේවය කළෙමි. ෂාහි ගඟේ උස් තීරයෙහි ගෝර්කි ගම පිහිටියේය. මෙහි පැක්ටරි හිමියකු වන ගාන්ෂින්ට අයත් තරමක විශාල ගෙයක් විය. 1894 දී ලෙනින් විසින් ලියන ලද ''ජනතාවගේ 'මිතුරන් කවුද?' ඔවුන් සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට එදිරිව සටන් කරන්නේ කෙසේද'' නැමති පොත රහසේ මෙහි මුද්‍රණය කැරිණි.

1894 දී එහි පැමිණි විසි හතර හැවිරිදි වි. අයි. ලෙනින් දුටු බව එගම පාසල් ගුරුවරයෙක් මට කීවේය.

ගුරුවරයා මෙසේ පැවසීය: ''මෙන්න මේ බිරියෝසා සහිත පටු මග දිගේ අපි සක්මන් කළා. වී. අයි. ලෙනින් ඔහුගේ සගයා — එවකට විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකුවැ සිටි— ගාන්ෂින් සමග මෙන්න මේ බංකුවේ වාඩිවී කතා කළා. ගාන්ෂින් තමා පොත මුද්‍රණය කළේ...''

මෙය අපූරු පොතක් වූයේ කෙසේද? අවසාන නිගමනය ඇතුළු හැම දෙයක්ම එහි අපූරු විය: ''...ප්‍රජාතන්ත්‍රවාදී සියලු බලවේගයන්ගේ ප්‍රධානියා වන රුසියානු කම්කරු පංතිය සාර්ගේ අත්තනෝමතික පාලනය විනාශ කොට රුසියානු නිර්ධන පංතිය (ඒ සමගම ලෝකයේ සියලු රටවල නිර්ධන පංති) විවෘත දෙශපාලන සටන් මගටද, කොමියුනිස්ට්වාදී විප්ලවයේ ජයග්‍රහණය දක්වාද ගෙනයනු ඇත.''

මා තරුණ කාලයේදී අත්දුටු අසමාන හැඟීම්ය, ඒ...

තරුණ ලෙනින්ගේ චරිතය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ කරුණු මම දිගු කලක් තිස්සේ හැදෑරුවෙමි. තරුණ ලෙනින් ''කම්කරු පංතිය නිදහස් කර ගැනීමේ සටන්කාමී සංගමය'' සංවිධාන කළ සැටි විස්තර කරන ''පටන් ගැනීම'' නැමැති පොත මගේ මුල් කෘතියයි. රුසියානු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ පක්ෂයටද, රුසියානු කොමියුනිස්ට් (බොල්ෂෙවික්) පක්ෂයටද බීජ වස්තු වූයේ එම සංවිධානයය. ලෙනින් හා ඔහුගේ සගයෝ

---

*පෙරයස්ලාව්ස්කි උයෙස්ද් — පරිපාලක ඒකකයකි.

සාර්ට හා ධනපති ක්‍රමයට විරුඬව ගෙනයන සටන දෙස නොබලා ඇස්පියාගෙන සිටීමට සාර් ආණ්ඩුව සූදානම් නොවීය. ලෙනින් සහ ඔහුගේ සගයන් බොහෝ දෙනෙකු සිරගෙට යවන ලදී; සයිබීරියාවට පිටුවහල් කරන ලදී.

ලෙනින් සයිබීරියාවෙ පිටුවහල් ජීවිතය ගත කළ සූෂෙන්ස්කොයෙ ගම්මානයට මම ගියෙමි. එය සූෂා නැමැති නදිය අසල පිහිටියේය. සයිබීරියාවේ යෝධමය ගංගාවක් වන යෙනිසෙයි ගලා බැස්සේ තරමක් ඈතිනි. සයාන් කඳු මුදුන හිම කැටි වලින් වැසිලාය. ලෙනින් සිය පිටුවහල් ජීවිතයේදී ගමන් කළ සියලු මාවත් හා පටු මාවත් මම සොයා ගත්තෙමි. එගමේදී ඔහු ලියූ සියලු පොත් හා පත්‍රිකා මම කියවා බැලීමි. පිටුවහල් ජීවිතයක් ගතකළ ලෙනින් කොතරම් විශාල වැඩ ගොඩක් කිරීමට සමත් වී දයත්, එය මගේ විස්මයට හේතුවිය. දෙශපාලන පක්ෂයක් ගොඩනැගීමේ සැලැස්ම ගැන ඔහු කල්පනා කළේය. මේ සඳහා හැමටම පළමුව පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශ කරන කම්කරු පුවත්පතක් පටන් ගැනීම අවශ්‍ය විය.

ලෙනින්ගේ පිටුවහල් ජීවිතය පිළිබඳ පොතක් මම ලියුවෙමි. එය ඔහුගේ මුළු පිටුවහල් කාලය ගැන නොවේ; එක් අවුරුද්දක් ගැන පමණකි. ''අපූරු අවුරුද්ද'' යන මැයෙන් ම විසින් ලියා පළ කරන ලද, ඒ පොත ලෙනින්ගේ පිටුවහල් ජීවිතයෙ එක් අවුරුද්දක් ගැන කියයි. ශ්‍රමය, නිර්මාණාත්මකතාවය, චින්තනය, සැළැස්ම පිළිබඳ එම කාලය සැබැවින්ම අපූරුය! එමෙන්ම වාසනාවත්ය. ඒ ලෙනින්ගේ මනාලිය ඔහු සොයා ස්ෂෙන්ස්කොයෙ ගමට පැමිණි බැවිනි. ඇගේ නම නදේෂ්ද කෲප්ස්කයාය. ඇද ඔහු මෙන්ම විප්ලවවාදියක වූ බැවින්, සාර් ආණ්ඩුව විසින් ඇයද පිටුවහල් කරන ලදී. සුන්දර රූ සපුවකින් හෙබි ඇ බුඬිමත් තරුණියක් වූවාය.

මේ ගැන මම ලියුවෙමි.

විප්ලවවාදී ක්‍රියාවන්ගෙන්, අදහස් හා හැඟීම්වලින් යුත් උසස් ලෝකය මා සිත කොතරම් තදින් වෙළාගත්තේදයත්, මට එයින් ඈත් විය නොහැකි විය.

පිටුවහල් ජීවිතයෙන් පසු ලෙනින් සුප්‍රසිඬ ''ඉස්ක්‍රා'' (ගිනි පුපුර) පුවත්පත පළකිරීමට සූදනම් වූ සැටි විස්තර කරන පොතක් ඉන්පසු මම ලියුවෙමි. එය ''සති තුනක විවේකයක්'' නමින් පළවිණි. පිටරට යාමට පෙර වී. අයි. ලෙනින් තම බිරිඳ — නදේෂ්ද කෲප්ස්කයා හමුවීමට උපා නගරයට ගියේය. ඈට නියම කර ඇති පිටුවහල් කාලය ඈ එහි ගත කරමින් සිටියාය.

වී. අයි. ලෙනින් නිවාඩු ගැනීමට ගියේද? විවේක ගැනීමට ගියේද? නැත. ''විවේකය පිළිබඳ සිහින පමණක් දකිමු...'' පක්ෂය සඳහා, ජනතාව සඳහා, විප්ලවය සඳහා ශ්‍රමය වැය කිරීම, හැමදමත් හැම තැනමත් වැඩ කිරීම. පැයක් හෝ දවසක් හෝ වැඩ නොකර නිකම් නොසිටීම...

''ලෙනින් චරිතය'' නැමැති මේ පොත ලිවීමට පෙර තරුණ ලෙනින් ගැන පොත් තුනක් මා ලියුවේ ඒ විධියටය.

ලෙනින්ගේ ජීවිතය පිළිබඳ නියම විස්තරයක් කිරීමට මා සමත් වෙතිද යන බියක්, සැකයක් හා කැළඹීමක් මා තුළ උපනි.

මගේ මිතුරෝ — කතුවරු, විද්‍යාඥයෝ, පක්ෂයේ නායකයෝ මට බොහෝ උපදෙස් දුන්හ. සගයින්ගේ ආධාරය මට නොඅඩුව ලැබිණි. ලෙනින් චරිතය පිළිබඳ පොතක් පාඨකයින්ට අවශ්‍ය බව මා දැන සිටි නිසා, මහත් ආශාවෙන් එය මම ලියුවෙමි.

මරියා ප්‍රිලෙෂායෙවා
1971 පෙබ්‍රවාරි

## පටුන


7 පෙරවදනක් වෙනුවට
10 ප්‍රීතිය
11 ශීත සමය
12 ගිම්හානය
14 නෞකා සංචාරයක්
16 විද්‍යාල ශිෂ්‍යයා
18 අසහනය
21 තාත්තා
23 මාර්තු පළමුවැනිද
26 සිම්බීර්ස්ක් නගරයෙන් සමුගැනීම
28 කසාන් විශ්ව විද්‍යාලය
29 ඉදිරිමග සඳහටම තෝරා ගැනීම
33 පොලිස් ඔත්තුකරුවකු රැවටීම
34 පළමුවැනි පොත
35 පත්‍රිකා හතරක්
37 ''මිනෝගා''
39 අපේ ව්‍යාපාරය විනාශ කළ නොහැකිය
41 අංක 193 සිර කාමරය
43 කොළ පැහැති පහන
46 පිටුවහල් ජීවිතය
48 මැයි පළමුවැනිද
50 අනටෝලි වනේයෙව්
53 නිදහස!

55 ගිනි පුපුර
58 ලෙනින්
62 බොල්ෂෙවික්වරු
66 පෙළපාලියට වෙඩි තැබීම
70 මුහුදේ ලෙළදුන් රතු කොඩිය
75 රහස් හමුවීම
80 නැවත පිටරට
84 මව මුණගැසීම
86 ලොන්ජියුමෝ ගම
90 යුද විරෝධී යුධය
92 පෙබ්‍රවාරි විප්ලවය
95 සමාජවාදී විප්ලවයට ජයවේවා!
98 පාලන බලය සෝවියට් සභාවලට
101 රස්ලිව් වැව
105 දුම්රිය කම්කරුවා
109 පුදුම ආරක්ෂකයා
113 නැවත සැඟවී වැඩකිරීම
115 විප්ලවය ආසන්න වීම
118 ස්මෝල්නි ආයතනයට පැමිණීම
121 පටන් ගැනීම
124 හිම මාලිගය අල්ලා ගැනීම
127 පළමුවැනි පණත
129 කුලුණු සහිත ධවල මන්දිරය
132 ඔවුන් ජීවත්වූ හැටි
135 ඉගෙන ගනිමු
137 බර පතළ පාඩමක්
141 මොස්කව්
144 කොමියුනිස්ට් පක්ෂය
145 ගම්වලට යාම
148 ආක්‍රමණය

152 වෙඩි තැබීම
156 අසීරු කාලය
159 සොකොල්නිකි සිඩිය
162 මරණ බිය සහ වසංගත රෝග
164 "වැඩකරන ජනතාවගේ පුත්‍රයා..
167 මහජන දේපොළ
169 මැයි දින උත්සවය
172 කොමියුනිස්ට් තරුණ සංවිධානය
176 ජය අපටය
179 දුර්භික්ෂය
183 නව ආර්ථික ප්‍රතිපත්තිය
186 ප්‍රදීපය
188 නව වසර
191 හැමදම සටන් පෙරමුණේ
194 ශරත් සමය
197 ජීව ප්‍රේමය
199 නායකයාට ගරු කරමු!



## ප්‍රීතිය

නිහඬ සිම්බීර්ස්ක් නගරයේ අහසෙහි ගී ගයන කුරුල්ලෝ පියාඹති. වොල්ගා නදිය හඬ නගමින් නගරය අසලින් ගලා බසී. හිම කැටි දිය වී ගියේ මේ නොබෝදය. වොල්ගාව දිගේ නැවක් දුවයි.

''සුදෝසුදු නැව කොහෙද තුඹ දුවන්නේ?''

සිම්බීර්ස්ක්වලට වසන්තය පැමිණ ඇත. මාවත්වල හා උයන්වතුවල කුරුල්ලෝ මිහිරි නද දෙති. සුළං පහරට බිරියෝසා ගස්වල කොළ අතු සැලෙයි. වසන්තයේ ප්‍රීතිය දසත පැතිර ගියේය.

උල්යානොව් පවුලේ උදවියද ප්‍රීතියෙනි. ඔවුන්ගේ ගෙදර පිහිටියේ වොල්ගා නදිය අසලය. කවුළු තුළින් ගෙදරට උණුසුම් හිරු එළිය ලැබේ. වොල්ගා නදියේ දුවන නැව්වල නළා හඬ ඇසේ.

අම්මා තොටිල්ල වෙත නැඹුරු වූවාය. එහි සිටින බිළින්ද දෙස බලමින් ඈ සිතයි: ''තුඹ ලොකුවුණාම කොහොම කෙනෙක් වේවිද? තුඹේ ඉරණම මොකක්ද?''

තාත්තා — ඉල්යා නිකොලායෙවිච් උල්යානොව් ගෙදර ආවේය.

''මරියා!'' ඔහු අඬ ගැසීය. ''ශුභ දවසක් වේවා! මරියා!''

තාත්තා සමග වැඩිමහල් ළමයිද — ආන්යා සහ සාෂා — අම්මා වෙත ආහ. කළු පැහැති ඇස් හා කෙස් කැරළි සහිත හිසක් ඇති ආන්යාගේ වයස අවුරුදු හයකි. සාෂා සිව් හැවිරිදි ළමයෙකි. කුතුහලයෙන් යුතුව ඔවුහු තොටිල්ලට ළං වූහ.

''දරුවනි! තුඹලාට මල්ලී කෙනෙක් උපන්නා! '' යැයි තාත්තා කීවේය.

''අනේ එයා හරි පුංචියි!'' ආන්යා කීවේ විස්මයට පත් වෙමිනි.

''තව කල් ගියාම ලොකු වේවි!'' තාත්තා පිළිතුරු දුන්නේය.

''මල්ලීගෙ නම මොකක්ද?'' මෙසේ ප්‍රශ්න කළ සාෂා ඇඟිලි තුඩුවලින් සිටගනිමින් තොටිල්ලේ සිටි සිඟිත්තා දෙස බැලීය.

''අපි එයාට වලෝද්යා කියල නම් තබමු''යි අම්මා කීවාය.

1870 අප්‍රේල් 22 ද වොල්ගා නදිය අසල සිම්බීර්ස්ක්හි ව්ලදිමීර් උල්යානොව් උපන්නේය. මොහු අන්කිසිවකු නොව සියලු රටවල ජනතාවගේ ආදරයට හා ගෞරවයට පාත්‍ර වූ ශ්‍රේෂ්ඨ ලෙනින්ය.

## ශීත සමය

වසරෙන් වසර හැදී වැඩුණු වලෝද්යා අටවැනි වසරට පා තැබීය. මන්යාෂා පුංචි නංගී දූන් තොටිල්ලේ සිටින්නීය. ඒ හැර වලෝද්යාට පසු ඕල්යා සහ දිමිත්‍රි උපන්හ. ආන්යා, සාෂා, වලෝද්යා, ඕල්යා, දිමිත්‍රි සහ මරියා, තාත්තා සහ අම්මා, කොතරම් විශාල පවුලක්ද!

ආන්යා සහ සාෂා පාසලට යති. වලෝද්යා පාසැලට ඇතුළුවීමට ඉගෙන ගනිමින් සිටී. භාෂාව හා ගණිතය උගැන්වීමට විශෙෂ ගුරුවරයෙක් පැමිණියේය. අම්මා ලස්සන කතන්දර බොහොමයක් දන්නීය. ග්‍රීෂ්ම සහ ශීත රටවල් ගැනද, ඇල්ප්ස් කඳු මුදුන්වල හිම ගොඩේ ගමන් කොට අතරමං වුණු කෙනෙකු මුදගත් සැන් බර්නාඩ් වගීයේ නුවණැති බල්ලකු ගැනද, නැපෝලියන්ගේ රුසියානු ආක්‍රමණය සහ බොරදීනො මහ සටන ගැනද ඈ දන්නීය.

ශීත කාලයේදී ඉක්මනින් හිරු බැසයන බැවින් ඇඳිර පැතිර යයි. උල්යානොව් පවුලේ දූ දරුවෝ මේසය වටා වාඩිවී අම්මා කියන ලස්සන කතාවලට සවන් දෙති. ජනේල වීදුරු හිම තට්ටුවලින් වැසී අපූරු චිත්‍ර මවයි. අඳුර බිඳමින් නැඟෙන අම්මාගේ කට හඬත් පිටු පෙරළෙන සියුම් හඬත් ඇසීමට වලෝද්යා කැමතිය.

ශීත සමයේදී නත්තල් උත්සවය පැවැත්වේ. නත්තල් ගහ වටේ වාඩිවී සෙල්ලම් කරමින් ප්‍රීතිවීමට ළමයි ආශා කරති. නත්තල් උත්සවය ළංවෙත්ම, නත්තල් ගහ සැරසීමට රුස්වන ළමයි කඩදසි වලින් සෙල්ලම් බඩු සාදති, කඩදසි දම්වැල් පුරුක් සාදති.

තාත්තා — ඉල්යා නිකොලායෙවිච් තම කාර්‍යාල කාමරයේ වැඩ කරමින් සිටී. ඔහුට බාධා නොවන සේ අම්මා ළමයින් රුස්ව සිටි කාමරයේ දොර තදින් වැසුවාය.

ළමයින්ගේ අත්වල කඩදසි සෙල්ලම් බඩුය. රතු, නිල්, රන්වන් සහ කහ පාටින් සාදන ලද දම්වැල් හා කොඩි මඳ සුළඟට සෙලවෙයි. අඳුරු කාමරයක තබා ඇති නත්තල් ගහේ ඉටිපන්දම් ඉක්මනින්ම දල්වනු ඇත. නත්තල් ගහ සරසා හැඩ වැඩ දමා අවසන් කරන තුරු ළමයිනට ඉවසුම් නැත.

''අපි ගිහින් නත්තල් ගහ බලමු''යි වලෝද්යා නංගීට කීවේය.

ඕල්යා වහාම කැමති වූවාය:

''යමු!''

පුංචි දිමිත්‍රි පුටුවෙන් බිමට පැන්නේය

''මාත් එනවා!''

''දම්වැළක් වාගේ අතින් අල්ලා ගනිමු!''යි ආන්යා කිවාය.

අඳුරු කාමරය ගල් ගුහාවකට සමානය. හිම තට්ටු වලින් වැසී ඇති ජනේල වීදුරු වල අතරින් පතර ඇති හිඩැස් අතුරෙන් සඳ එළිය පෙනේ. බිමද තැනින් තැන හඳ එළිය වැටී ඇත. නත්තල් ගහ හුදකලාව සිටී. එයින් ප්‍රණීත නැවුම් සුවඳක් වහනය වෙයි.

''කාමරයක් ගානේ යමු''යි වලෝද්යා යෝජනා කරයි.

හැම දෙනෙක්ම නිහඬ වූහ. අද ගෙය අමුතු සිරියක් උසුලයි. එහි හැම දෙයක්ම අළුත්ය. ඇත්ත වශයෙන්ම, ඔවුන් මෙහි පදිංචියට ආවේ මේ නොබෝදය. මෙන්න අම්මාගේ කාමරය. එය කොරිඩෝරයෙන් වෙන් වී ඇත්තේ බිත්තියකින් නොව ඉස්කිරිමකිනි. ලාවවූ පෙට්ටිය මත පහන එතරම් දීප්තිමත් නැත. තොට්ල්ලේ මරියා නිද සිටින්නීය. ළමයි තොට්ල්ල අසලින් නිහඬව ගමන් කළහ.

පඩිපෙළ දිගේ ඉහළට නැග උඩුමහලේ ළමා කාමරයට ඔවුහු ඇතුළු වූහ. මෙහි සිට බලන විට සඳ එළිය වඩාත් දීප්තිමත්ය. ජනේල වීදුර වසා ඇති හිම, මල් පෙතිවලට බෙහෙවින් සමානය.

අතින'ත අල්ලා ගත් ළමයි පටු පියගැට පෙළ දිගේ පහළ බැස්සාහ.

ඊළඟට ඔවුන් ඇතුළු වූයේ තාත්තාගේ කාර්යාල කාමරයටය.

''මෙන්න මගේ හමුදුව!'' යැයි කී තාත්තා තම දූ පුතුන් දැතින් බද අල්ලා ගත්තේය.

ළමයින් කල්පනාකාරීව සිටින බව ඔහුට පෙනිණි. ඔවුහු එකිනෙකාගේ අත් අල්ලාගෙන සිටිති. අත්වැල් ගෙන ගෙයි කාමරයක් පාසා යමින් ක්‍රීඩා කිරීමට වලෝද්යා යෝජනා කළ බව ඔහු නොදත්තේය.

එහෙත් යම් කිසිවක් ගැන අනුමාන වශයෙන් සිතූ තාත්තා දයාන්විත ලෙස මෙසේ පැවසීය:

''ආදරණීය දරුවනි! හැමදම මේ වගේ සමගිව මිතුරුව හිටපල්ලා!''

## ගිම්හානය

අවුරුද්දේ හොඳම කාලය ගිම්හානයයි! සිම්බීර්ස්ක්හි ගිම්හානය උණුසුම්ය, වියලිය. උයන් වතුවල ඇපල් ගස් ගෙඩිවලින් පිරිලාය. මේ නගරයේ උයන් වතු විශාල ගණනකි.

උල්යානොව් පවුල පදිංචිවී සිටින ගෙයි පිටුපසද උයන් වත්තකි. ප්‍රමාණයෙන් කුඩා වුවද එහි නොමැති පලතුරු වර්ගයක් නැත. මග දෙපස රිදීවන් බර්ච් ගස්ය. වැල් සහ අතු නැවී පියස්සක් මෙන් සෑදී ඇත.

අකාසියා ගස්වල විශාල මල් හටගෙන ඇත; ''කහ පැහැති වනයක්'' මෙනි.

උදෑසන හත වන විට ජනේලය තුළින් කාමරයට හිරු එළිය වැටිණි. වලෝද්යා අවදි වූයේ, තත්පරයකින් නැගී සිට උදෑසන ව්‍යායාම කරන්නට විය — එකයි, දෙකයි, තුනයි! මුහුණ සෝද දත් මැද හිස පීරාගෙන ඇපල් ගහ යටට දිව්වේය. අනිත් අයට පෙර එහි ගොස් ඇපල් අහුලා ගෙන ඔවුන්ට සංග්‍රහ කිරීමට මේ සහෝදර සහෝදරියෝ මහත් ආශාවක් දක්වති.

උල්යානොව් පවුලේ හැම දෙනෙක්ම උදෑසනින් නැගිටිති. සාෂාට හා වලෝද්යාට විශේෂ වැඩ කොටසකි: මල් පැලවලට වතුර දැමීම සඳහා ළිඳෙන් වතුර ඇද පීප්පවලට පිරවිය යුතුය. ඊයේ හවස වතුර නොදැමූ බැවින් දැන් එය කළ යුතුය.

තේ බීම සඳහා සමොවාරය සූදානම් කොට ඇත. එයින් දුම් පිටවේ. උදේ ආහාර ගැනීම සඳහා ළමයින් වාඩි වූ විට, අද ප්‍රංශ භාෂාවෙන් කතා කරන බව අම්මා දැන්වූවාය. අද හැම කතාවක්ම ප්‍රංශ බසිනි. හෙට හැම දෙයක් ගැනම ජර්මන් බසින් කතා කළ යුතුය.

සත්තකින්ම, රුසියන් බසින් කතා කිරීම ඉතාම ලෙහෙසිය. එහෙත් දරුවන් විදේශීය භාෂා උගත යුතු බව අම්මා සිතන්නීය.

''කෑම කාලා කරන්නේ මොනවද?'' ඕල්යා වලෝද්යාගෙන් ඇසුවාය.

''සාෂා මොනවද කරන්නේ?''

සාෂා හැමදම මෙන්ම අදත් කියවයි. ඔහු බැරෑරුම් පොත් කියවයි. රසායනික විද්‍යාව සහ ප්‍රකෘති විද්‍යා ගැන ඔහු මහත් සැලකිල්ලක් දක්වයි. සාෂා ගෙවත්තේ රසායන විද්‍යාගාරයක් සාද ඇත.

තවත් තැනෙක සත්තු වත්තකි. පුංචි ඉත්තෑවෙක් මුල්ලකට වී කොළ වගී කයි. ලේනෙක් කූඩුව තුළ කරකැවෙයි, පිනුම් ගහයි.

ගිම්හානයේදී නිදහසේ සිටිය හැකිය. තමන් කැමති පොතක් තෝරා ගෙන සෙවණ ඇති තැනක වාඩිවී කියවීමට පටන් ගත් විට මෙලොව අන් හැම දෙයක් ගැනම අමතක වෙයි. දහවල් කෑමට අඬගසන තුරු ගෙවත්තේ කුරුල්ලන්ගේ මිහිරි හඬට කන් දිය හැකිය. අම්මාගේ මහන මැසිමේ හඬ ගෙයින් පිටත වුවද ඇසේ. තම දූ දරුවන් හය දෙනෙකුගෙන් එක් කෙනෙකු සඳහා අම්මා හැමදම කිසිවක් මසන්නීය. දියණියෝද මැහුම් උගත්හ.

දහවල් ආහාරයෙන් පසු හිතේ හැටියට ක්‍රීඩා කළ හැකිය. ඕල්යා වලෝද්යාට අඬගසයි:

''ගිහිං සෙල්ලම් කරමු!''

''කන්, කන්, බූරු — සිං, සිං, නෝරු,
දුවලා, දුවලා ගිහින් මට බිරියෝසා ගහකින්
රතුපාටට හුරු කොළයක් ගේන්න!''

හිරු තරමක් බැස ගිය පසු ක්‍රොකට් ක්‍රීඩාව පටන් ගනිති. ක්‍රීඩකයෝ සියලු රීති පිළිපදිති. වලෝද්යා සහ තාත්තා වාදයෙහි සූරයෝය. සිනාසීමට හපන්නුය. ඔවුන්ගේ සිනා හඬ වත්ත පුරාම පැතිර යයි.

හිරු බැස යත්ම ඇඳිර පැතිර යයි.

''පිරිමි ළමයි ගඟට යාමට ලෑස්ති වෙයල්ලා!'' තාත්තා අණ කරයි.

උල්යානොව් පවුලේ හැම දෙනෙක්ම දිය නෑමට ස්වියාගා ගඟට යති.

නිල් පැහැති වෙරළක් සහිත නිසල නදියකි, ස්වියාගා.

ළමයි ගඟ දෙසට දුවගොස් වතුරට පැන පීනමින් දිය කෙළිති.

හිරු බැස ගියද ඇඳිර පැතිර නැත. අහස ලා රත් පැහැයෙන් බැබළේ. ක්ෂිතිජයේ පහන් තරුව දැකිය හැකිය.

වලෝද්යා සහ සාෂා ඉදිරියෙන් ගමන් කරති.

''සාෂා අයියේ! මොනවා ගැනද කල්පනා කරන්නේ?''

''හැම දෙයක් ගැනම. අර තරුවජේනවද? එය උපන්නේ කොහොමද? මහ පොළොවේ ජීවිතය පටන් ගත්තේ කොහොමද? අප ජීවත් වන්නේ මොකටද? අපේ අරමුණ කුමක්ද? ''

වලෝද්යා අයියාට සවන් දෙයි. ඔහුගේ මනැසෙහි නොයෙක් අදහස් උපදී: ''අප ජීවත් වන්නේ මොකටද? අපේ අරමුණ කුමක්ද? ජීවත්වීම, කල්පනා කිරීම, ප්‍රශ්න ඇසීම, දැනගැනීම, කිසිවක් කිරීම — මේ හැම දෙයක්ම සිත් ඇදගන්නා සුලු දේය. සාෂා බුද්ධිමතෙකි. සාෂා වගේම මාත් හැසිරිය යුතුය''.

## නෞකා සංචාරයක්

ගඟේ යාත්‍රා කරන තට්ටු දෙකේ නැවක් වරායේ නවතා තිබිණි. මගීන් සඳහා වෙන්කළ කාමරවල ජනේල හිරු එළියෙන් ආලෝක වෙලාය. තඹින් කළ කොටස් හිරු එළියට අනුව රත්රන් මෙන් දිලිසිණි. නැවේ කපිතන් තැන මෙගපෝනය මගින් අණ දෙයි.

ප්‍රවේශ පත්‍ර සියල්ල තිබේදැයි තාත්තා පිරික්සා බැලීය. බඩු බාහිරාදිය ගැන සොයා බැලීය. හැම කෙනෙක්ම තම ශක්තිය අනුව අතින් මල්ලක් හෝ පොදියක් හෝ ගෙන යති. නැව දෙවරක් දීර්ඝ ලෙස හූ හඬ තැබීය.

තෙවැනිවර තැබූ හූ හඬ කෙටි විය. රෝද කැරකැවිණි, හඬ පිටවිය, ජලය කැළඹිණි, නැව සිම්බීර්ස්ක් වරායෙන් පිටවී කසානය බලා යාත්‍රා කළාය.

එතැන සිට කොකුෂ්කිනො ගමට වියොර්ස්ට්* හතළිහකි. එම දුර අසු පිටින් යා යුතුය.

නැව සිම්බීර්ස්ක් නගරයෙන් ඈත් විය. නගරයේ ගෙවල් වල හා ගොඩනැගිලි වල වහළවල් රතු පාටය. බොහෝ දුර යනතෙක් ඒවා පෙනිණි. වොල්ගා නදිය ඔස්සේ යාත්‍රා කරන නැව හැරෙත්ම සිම්බීර්ස්ක් නගරය නොපෙනී ගියේය.

මුහුදු ලිහිණියෝ නාද කරමින් නැව පසු පස පියාඹති.

වලෝද්‍යා ලිහිණියන්ට පාන් කැලි වීසිකොට නැවේ යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කරවන කොටසට දිවගියේය. තඹින් සාද නිම කරනලද නැවේ යන්ත්‍ර වාෂ්ප බලයෙන් ක්‍රියා කරයි. ආතතිය නිසා ගැහෙමින්, හඬ නගමින් ක්‍රියා කරන යන්ත්‍රය තෙල් නිසා දිලිසෙයි. යන්ත්‍රයේ සම්බන්ධක කොටස් නොනැවතී ක්‍රියාකාරී විය. ඇබවලින් පිටවන වාෂ්ප හූ හඬ නගමින් සෝෂා කරයි. බොයිලේරුවට අඟුරු දමන කම්කරුවා කමිසය රහිතව වැඩ කරයි. ඔහුගේ සිරුර දූලි අඟුරුවලින් වැසිලාය. දහඩිය පෙරමින් ඔහු බොයිලේරුවට අඟුරු දමයි.

දිය කලතමින්, හඬ නගමින් වොල්ගා නදිය ඔස්සේ නැවයාත්‍රා කළාය. සක්මන් තට්ටුවට පැමිණි මගීහු ඔබ මොබ ඇවිදිමින්, අවට සිරි නරඹමින් ප්‍රීති වූහ. තාත්තා වෙස්දම් ලෑල්ලත් රැගෙන තම කාමරයෙන් පිට විය.

''දම් අදිමුද?'' වලෝද්‍යා තාත්තාගෙන් ඇසීය.

වලෝද්‍යාගේ වයස අවුරුදු දහයක් වුවද, තාත්තා ඔහු සමග දම් ක්‍රීඩා කළේ සමයකු මෙනි. ඔහු එතරම් කුඩා නැත. අගෝස්තු මාසයේදී මධ්‍ය විද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයට සූදනම් විය යුතුය. නිදැල්ලේ හැසිරීමට වේලාවක් නැත!

''ඔන්න, පුතාගෙ රජ්ජුරුවන්ව කොටු වුණා නෙවද?'' තාත්තා ප්‍රශ්න කළේය.

වලෝද්‍යා තම රජුගේ ආරක්ෂාව පිණිස අසු මෙහෙයැවීය.

''කපටියා!'' මෙසේ පැවසූ තාත්තා සෙබළ ඉත්තෙකු ඉදිරියට ඇද්දේය.

''ඔන්න අපි සෙබළාගෙන් ඉවත් වුණා. ඒ වෙනුවට...''

මඳ සුළඟට අසුවූ වලෝද්‍යාගේ දුඹුරු පැහැති හිසකේ සැලිණි. හිරු රැස් නිසා වොල්ගා නදියේ ජලය රිදී කඳක් මෙන් දිලිසෙයි. වලෝද්‍යා දෑස් හකුළුවා ගත්තේය.

''යන්ත්‍ර සූත්‍ර ක්‍රියාකරවන කොටසේ හරි උෂ්ණයි! තෙල් ගඳ ඉවසන්ට

---

* වියෝර්ස්ට් — දුර ප්‍රමාණය මණින ඒකකයකි.

බැහැ. අහුරු දමන කම්කරුවා දහඩියෙන් නැහැවිලා. ඔහුගේ තත්ත්වය යහපත් කරන්ට බැරිද?''යි වලෝද්යා ප්‍රශ්න කළේ අසතුට පළ කරමිනි.

තාත්තා නිහඬ විය. සාෂා ඔහු ළඟට විත් දෙවුර සොළවමින් මෙසේ පැවසීය:

''අහුරු දමන කම්කරුවාට අමාරු වුණාට නැව් අයිතිකාරයා ඒක තුට්ටුවකට වත් ගණන් ගන්නේ නැහැ.''

''ඒක හරි අසාධාරණ වැඩක් නෙව!'' වලෝද්යා වේගයෙන් පැවසීය.

''මේ ලෝකෙ සාධාරණත්වය හැම තැනම හොයන්ට බැහැ.''

පුත්තු දෙදෙන තාත්තා දෙස නිහඬව බැලූහ.

''තාත්තා සාධාරණත්වය සඳහා ක්‍රියා කරන බව අපි දන්නවා!'' යැයි සාෂා උණුසුම් ලෙස පැවසීය.

නැව වොල්ගා නදිය පුරා පැතිර යන සේ හූ හඬ නැඟීය. ඉදිරියට එන එක් නැවක් අනික් නැව පිළිගැනීමට හඬක් නැඟීය. ගඟේ ජලය කැළතිණි. රළ වේගය වෙරළ දක්වා පැතිරිණි.

## විද්‍යාල ශිෂ්‍යයා

1879 අගෝස්තු මාසයේදී විද්‍යාලයේ පළමුවැනි පංතියේ විභාගයට පෙනී සිටීම පිණිස වලෝද්යා පැමිණියේය. වොල්ගාව අසල නගරය මැද පිහිටි විද්‍යාල ගොඩනැගිල්ල තට්ටු දෙකකින් යුක්ත විය. අවුරුදු අටක් තිස්සේ වලෝද්යා මෙහි ඉගෙන ගනු ඇත.

විභාග වාරය ඇරඹිණි. ආචාර්ය මණ්ඩලය තමන්ට නියමිත අසුන් ගත්හ. අංක අනුව සිසුන් කැඳවන ලදී. වලෝද්යා නිර්භය ලෙස කළු ලෑල්ල වෙත ගියේය. ගුරුවරු ඔහුගෙන් ප්‍රශ්න ඇසූහ. වලෝද්යා නොපැකිළ, හනික පිළිතුරු දුන්නේය. ගණිත ප්‍රශ්න පත්‍රයට ඉක්මනින් පිළිතුරු ලියුවේය.

ආචාර්ය මණ්ඩලය වලෝද්යා පෙනී සිටි හැම විෂයයකටම ලකුණු පහ (රුසියානු අධ්‍යාපන ක්‍රමය අනුව දියහැකි උසස්ම ලකුණු ප්‍රමාණය) බැගින් තැබීය.

''අපේ වලෝද්යා විද්‍යාල ශිෂ්‍යයෙක්!'' යැයි කියමින් ගෙදර උදවිය ඔහු පිළිගත්හ.

ඔහුගේ සහෝදර සහෝදරියෝ ඔහු ඒ මේ අත අදිමින් ඔහුට සුබ පැතූහ. දිලිසෙන බොත්තම් සහිත විද්‍යාල ඇඳුම් කට්ටලයක් ඔහුට ඇන්දවූ අම්මා එහි අඩුපාඩු සොයා බැලුවාය. හෙට ඔහු පළමුවන වරට පළමුවැනි පංතියට ඉගෙනීමට යනු ඇත. අම්මා කවුළුව දෙස බලමින් කල්පනා සයුරේ ගිලුනා ය; දැන් ඇට විද්‍යාල සිසුවන් දෙදෙනෙකි, සාෂා සහ



රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයට හවුල් වුණැයි
සාර් විසින් එල්ලා මරා දමන ලද
වලෝද්‍යාගේ වැඩිමහල් සොයුරු ඇලෙක්සාන්දර්.






වලෝද්‍යා තුන් හැවිරිදි වියේදී



උල්‍යානොව් පවුල පාසල් ඇඳුමින් සැරසී
වලෝද්‍යා දකුණු කෙළවර වාඩිවී සිටී.




වලෝද්‍යා වයස 21දී. දන් ඔහු සරසවි සිසුවෙකි.



ලෙනින්ගේ සහක  ය නදේෂ්දා කෲප්ස්කයා.



වලෝද්යා තරුණ වියේදී.



පිරිසිදු ආලෝකමත් කාමරය වලෝද්යාගේය.



වලෝද්‍යා 1887දී පාසල අවසන් කළ පසු.

වලෝද්යාය. ආන්යාද කාන්තා විද්‍යාලයේ සිසුවියකි. කාලය පියාඹයි. දූ දරුවෝ හැදී වැඩෙත්.

උල්යානොව්ලාගේ ගෙදර කෑම කාමරයේ සීලිමේ එල්ලා ඇති සුදු පැහැති විදුරු කවරයක් සහිත පහන හිරු බැස ගිය පසු දල්වන ලදී. පසුදින පාඩම් වලට සූදනම්වීම පිණිස මේසය වටා ළමයි වාඩිවූහ. පස් හැවිරිදි ද්මිත්‍රි තවම පාසල් නොයන බැවින් පාඩම් වලින් ඔහු නිදහස්ය. දිව දිගු කරගත් ද්මිත්‍රි මහත් වුවමනාවකින් දුම් බටයක් සහිත නැවක් සහ වොල්ගා නදියේ රුල්ළ පින්තූරයට නගයි. වලෝද්යා තම ගෙදර වැඩ ඉක්මනින් අවසන් කළේය. පළමුවැනි පංතියේ සිසුනට එතරම් වැඩ ගොඩක් නැත. දූන් ඉතින් මොනවා කරමුද? තණ පෙත්තෙක් සාදගත් වලෝද්යා මෙහෙකාරියගෙන් නූල් පොටක් ඉල්ලා ගෙන බැඳ ක්‍රියා කරවීය. කඩදසි තණ පෙත්තා පනියි! ඌ ආන්යාගේ පාඩම් පොතට පැන්නේය.

''වලෝද්යා දඟ කරන්ට එපා! ආයෙමත් නුඹ විජ්ජා පෙන්වන්නට එනව.''

නූල් පොට අදිත්ම, තණ පෙත්තා අතුරුදන් විය. තත්පරයකින් ඌ සාෂාගේ පාඩම් පොතට පැන්නේය!

කිසිවෙක් තණ පෙත්තා අල්ලා ගන්නා තුරු සිනාසීම නොනැවතිණි.

''සන්සුන් වෙයන්'' යැයි වලෝද්යාට ආන්යා පැවසුවාය.

වලෝද්යා සන්සුන්වීමට සූදනම් නැත. තවත් විහිළු කරන්නේ කොහොමද?

''ද්මිත්‍රි, ද්මිත්‍රි! දිග අං ඇති දිග කන් ඇති මී හරකෙක් පැන පැන එයි, කාටද ඌ අනින්නේ?''

''මට නොවෙයි, මට නොවෙයි!'' ද්මිත්‍රි කෑගැසීය.

හිස නමාගෙන දෑතේ දබරැඟිලි දෙක හිස මත තබාගත් වලෝද්යා ද්මිත්‍රිට 'ඇනීමට' ඔහු ලුහුබඳියි. ද්මිත්‍රි බිම පෙරළෙමින් හඬ නගා සිනා සෙමින් මේසය යටට රිංගුවේය. එවිටම වාගේ තාත්තා දෙර ඇරගෙන කාමරයට ඇතුළු විය:

''වලෝද්යා, එන්න මා සමඟ.''

තවම හරිහැටි සන්සුන් නොවූ වලෝද්යා තාත්තාගේ කාර්‍යාල කාමරයට ගියේය. පොත් සහිත අල්මාරියක්ද, විශාල ලියන මේසයක්ද එහි විය. ඉදිරිපස බිත්තිය අසල අණ්ඩාකාර මේසයක් හා අමුත්තන් සඳහා සෝපාවක් තබා ඇත.

''වාඩිවෙන්න! ඔහොම ඉන්න!'' තාත්තා පැවසීය.

ඔහු නැවත කටයුතුවල යෙදෙන්නට විය. කුඩා කාලයේ සිටම

වලෝද්යා පියාගේ කාර්යයට ගරු කිරීමට පුරුදුව සිටියේය. තාත්තා බොහොසේ වැඩ කරයි. ගුබෙර්නියාවේ (පෙදෙසේ) හැම ගම්බද පාසලක් පාසාම ගොස් ඒවා පිරික්සා බැලීම පිණිස සැතැපුම් දහස් ගණනක් මග ගෙවීය. ශීත සමයේ හිම වැස්ස, තුෂාරය හා හිම කුණාටු නොතකා ගමන් කළ ඔහු ශරත් සමයේ වැසි කුණාටු හා මඩ ගොහොරු නොබලා පාසල් වලට ගියේය. ජනතා පාසල්වල අධ්‍යක්ෂකවරයකුවූ වලෝද්යාගේ පියා සිම්බීර්ස්ක් ගුබෙර්නියාවේ (පෙදෙසේ) හැම ගම්බද පාසලකටම ගොස් ගුරුවරුනට ආධාර කළේය. ගෙදර සිටි කාලයේදී තම ගමන් පිළිබඳ වාර්තා ලිවීම, සැලැස්ම පිළියෙළ කිරීම, ශික්ෂණ විද්‍යාව පිළිබඳ ලිපි හා විමර්ශන ලිවීම ආදිය කළේය.

''අද වැඩ හමාර කළා.'' මෙසේ කී ඔහු තම ලියවිලි සහිත ලිපි ගොනුව සකස් කළේය. ''තමන්ගෙ වැඩ හමාර වුණාට පස්සෙ සෙල්ලම් කරන්න පුළුවනි. හැබැයි අනිත් අයට බාධා කරන්නෙ නැතිවැ''ය කී වලෝද්යාගේ පියා දඹරුහිල්ල දිගු කරමින් තම පුතු දෙස බැලීය. ''ඉතින් කොහොමද විද්‍යාලෙ වැඩ, විදුහල් ශිෂ්‍යයා?''

වලෝද්යා තම විදුහල් විත්ති ගැන පියාට කීවේය.

සාලයෙන් පහත් හඬින් සංගීත වාදනයක් ඇසිණි.

ඔවුහු නිහඬව සාලයට ඇතුළු වූහ. අඩ ඇඳිරිය අවට පැතිර ඇත. පියානෝව මත ඉටිපන්දම් කීපයක් ආලෝකය විහිදුවමින් දැල්වේ. අම්මා පියානෝව වාදනය කරන්නීය. ගීත වාදනය ආලෝකමත්ය, පැහැදිලිය, ගිම්හානයේ හිරු එළිය සහිත දවසක් මෙනි. වාදනයට සවන් දෙමින් ඔවුහු මුල්ලක වාඩිවූහ.

## අසහනය

වලෝද්යා පහළ පංතිවල ඉගෙන ගනිද්දී, ඔහු වැඩ කිරීමට මැලි වෙතියි තාත්තා සැක කරන්නට විය. වලෝද්යා ලෙහෙසියෙන් හැම දෙයක්ම අවබෝධ කර ගන්නා දක්ෂ ළමයෙකි. ඔහු වැඩ කිරීමට සමත් බව පසුව තාත්තා දැන ගත්තේය. ඔහුට උපදෙස් ගැනීමට බොහෝ අය වූහ. ගෙදර හැම දෙනෙක්ම වැඩ කළහ.

සාෂා විද්‍යාලයෙන් සමත් වී පීටර්බුර්ගයේ විශ්ව විද්‍යාලයට ඇතුළු විය. සාෂාගේ පීටර්බුර්ග් ගමනට පෙර ඔහු වලෝද්යාත් සමග සිම්බීර්ස්ක්හි වොල්ගා ඉවුරේ කඳු වැටියකට ගියේය. මෙය වෙනෙට්ස් නමින් හැඳින්විණි. සොහොයුරෝ වෙනෙට්ස් කන්දට ආශා කළහ. ඔවුනට ඉහළින් අහසය. ඈත ක්ෂිතිජය දක්වා එහි සිට බැලිය හැක.

''අයියා කැමති මිනිස් ගතිගුණ මොනවාද?''යි වලෝද්යා ප්‍රශ්න කළේය.

''ශ්‍රමය, දැනීම, අවංක බව'' මෙසේ පිළිතුරු දුන් සාෂා මිදක් කල්පනා කොට යළි මෙසේද පැවසීය: ''මා හිතන හැටියට අපේ තාත්තාත් ඒ වගේ තමා''.

තාත්තා ගැන අයියා කී වචන වලෝද්යා නිතර මතක් කළේය. ගම්බද පාසල් පිරික්සා බැලීම සඳහා තාත්තා පිටත්ව ගොස් බොහෝ කලක් ගතවිය. මේ වන විට ඔහු නැවත පැමිණිය යුතුව තිබුණද, ඔහු නොපැමිණියේය.

අට්ටාලයේ ඉතා කුඩා කාමරයකට වී වලෝද්යා පොත් පාඩම් කරයි. ඔහුගේ කාමරය අසල වූ අනික් කුඩා කාමරය සාෂාගේය. එය හිස්ය. දැන් ඔහු පීටර්බුර්ග් විශ්ව විද්‍යාලයේ තෙවැනි වසරේ සිසුවෙකි. ආන්යා පීටර්බුර්ගයේ කාන්තාවන් සඳහා වූ පාඨමාලාවක් හැදෑරුවාය. ආන්යා සහ සාෂා ගෙදර නොසිටීම නිසා වලෝද්යා කාන්සියෙන් පසුවෙයි. විශෙෂයෙන්ම සාෂා නැති පාඩුව ඔහුට දැනෙයි.

''නොයෙක් දේ ගැන කල්පනා කළා මදෑ, දැන් ඉතින් වැඩ කරන්ට ඕන!'' වලෝද්යා තමාටම කියා ගත්තේය.

හෙට දවසට නියමිත සියලු පාඩම් නිසි ලෙස පිලියෙල කරගත් ඔහු පොත් මිටිය බැගයට දැමීය. හවස් කාලය පොත් කියවීම සඳහා ගත කළේය.

දොබ්රලුබව්, පිසරෙව්, බෙලින්ස්කි, ගෙර්ට්සෙන්* ආදීවිප්ලවවාදීන්ගේ පොත් වලෝද්යා කියවන බව විද්‍යාල ආචාර්යවරු නොදත්හ. පාඩම්වලදී ගුරුවරුන්ගෙන් අසන්නට නොලැබෙන බොහෝ දේ ඔහු මේ පොත් කියවා දැනගත්තේය. සමාජ අසාධාරණත්වය කුමක්දැයි ඔහු දැනගත්තේ මේ පොත් වලිනි.

..වලෝද්යා පොත් කියවීම නවත්වා ඔරලෝසුව දෙස බැලීය. පමා වී ඇත. අම්මා සොයා යා යුතුය. ඔහු ආහාර ගන්නා කාමරයට දිව ගියේය.

තාත්තාගේ සගයකු හා අසල්වැසියකු වන ඉවාන් යාකොව්ලෙවිච් යාකොව්ලෙව් අම්මා සමග පිළිසඳර කතාවෙහි යෙදී සිටියේය. චුවාෂ් ජාතිකයකු වන යාකොව්ලෙව්, පාසල් පරීක්ෂක වරයෙකි, සාර් ආණ්ඩුවේ පීඩනයට පාත්‍රවී සිටි තම කුඩා ජාතියේ ආරක්ෂාව සඳහා සටන් කරන්නෙකි.

''අපේ ඉල්යා නිකොලායෙවිච් බොහොම හොඳ මහත්මයෙක්. එයා දෙපාර්තමේන්තුවේ ලොක්කන්ට ඕන විදියට වැඩ නොකර මහජනයගෙ

---

* සාර් පාලනයට විරුඬව නැගීසිටි විප්ලවවාදීහුය.

සැපත සඳහා වැඩ කරනව. අපේ චුවාෂ් ජාතියටත්, මොර්ද්වින් ජාතියටත් ඉල්යා නිකොලායෙවිච් බොහොම සේවය කරල තියෙනව. එයා අපේ ළමයින්ට පාසල් බොහොමයක්ම විවෘත කළා.''යි යාකොව්ලෙව් අම්මාට පැවසුවේය.

''එයා දනටමත් ගෙදර එන්න ඕන. මම එයා නිසා තරමක් නොසන්සුන් වී ඉන්නවා'' යැයි අම්මා පැවසුවාය.

සාලයෙන් මුදු ගීත වාදනයක් ඇසිණි. ඕල්යා සුප්‍රසිඩ චයිකොව්ස්කිගේ ස්වර මාලා රචනයක් වාදනය කළාය. ඔවුහු නිහඬව වාදනයට සවන් දුන්හ.

අර ශබ්දය මොකක්ද? අසුන්ගේ කර බැඳ ඇති පුංචි සීනුවල හඬකි. එම හඬ ළං ළංව ඇසේ. වලෝද්යා අඩියක් ඉදිරියට පැන්නේය. අම්මා සැනෙකින් නැගිට සිටගත්තාය. ඇගේ මුහුණ ආලෝකමත් විය.

''වලෝද්යා, දරුවනි, තාත්තා ඇවිල්ලා!''

සීනු හඬ ගේ අසලම ඇසුණු අතර හිම යානය ගෙවැටේ දෙරටුව අසල නැවතිණි. තුලුපයක් (හිම කබායට උඩින් අඳින බැටළු සමකින් කළ කබායකි) පොරවා ගත් ඉල්යා නිකොලායෙවිච් ගෙතුළට පැමිණියේය. ඔහුගේ යටි රැවුළ වසා ඇති හිම කැට අයිස් බවට පත්වෙලාය.

හිම ඇඳුම් ගළවා දැමීමට තාත්තාට හැම කෙනෙක්ම උදව් වූහ. ගෙදරදී අඳින උණුසුම් කබාය සහ සපත්තු ගෙනාහ. උණු තේ සහ ආහාර සූදනම් කොට තාත්තාට කැවූහ, පෙවූහ. උණුසුම හා ආදර සංග්‍රහ නිසා තරමක ව්‍යාකූලයට පත් ඔහු යටි රැවුළ අතගාමින් මෙසේ පැවසීය:

''හා, හා, හිම කුණාටු සහිත සීතලට මූණ පැවට පස්සෙ ගෙදර ආවම කොතරම් හොඳද!''

සතුටු සාමීචි කතාවලින් පසුව, තාත්තාගේ මුහුණ දෙස බැලූ වලෝද්යා එහි දම්පාටට හුරු වර්ණයකින් යුත් ලප මතුවී තිබෙන සැටි දුටුවේය.තාත්තා බොහොසේ විඩාපත්ව සිටිතියි වලෝද්යා සිතීය. ඔහුගේ මුහුණේ කිසියම් කනගාටුදයක බවක්ද පෙනිණි. වෙනස වටහාගත් යාකොව්ලෙව් මෙසේ ප්‍රශ්න කළේය:

''ඉල්යා නිකොලායෙවිච්! අසුබ දෙයක් සිදුවුණාද?''

ඉල්යා නිකොලායෙවිච්ගේ පළල් නලළේ හම හැකිලී රැළි වැටිණි.

''ස්ටෙප්ස් බිමේ ගම්වල හැටි දන්නව නෙව. හරිම මූකළාන. ගම මැද ස්කෝලෙ. හරියට කාන්තාරෙ මැද රට ඉඳි ගහක් වගෙ. හැම තැනින්ම කුණාටු හමනව. ස්කෝලෙට යාබද ගුරුවරියගෙ කාමරය. පුවත්පත්, පොත් කිසි දෙයක් නැහැ. දර පවා නැහැ. සීත කාලෙට ගිනි තපින්ට දර

නොදීම හිතා ගන්ටවත් පුළුවන් දෙයක්ද! පොහොසත් ගම් මුලාදෑනියාගේ අණසකට ගුරුවරිය හිස පාත් නොකළ හන්ද තමා මේ සියලු කරදර. ඇට විරුඩව බොරු ප්‍රචාරය කරනව. ඇගේ ජීවිතය මහ කරදරයක් බවට පත්කරල. ඇ වෙනුවෙන් කතා කරන්ට කෙනෙක් නැහැ...''

''තාත්තා, ඇ වෙනුවෙන් ඉදිරිපත් වුණාද!'' වලෝද්‍යා ඇසීය.

''ඔව්. මම ඉදිරිපත් වුණා. පස්සේ ගෙදර ආවා. ඇ දැන් ආයෙමත් තනියම. පොහොසත්තු ගම පාලනය කරනවා. ගොවීන්ට කිසිම අයිතියක් නැහැ. උන්ට ඉඩම් බොහොම ටිකයි. ඉඩකඩම් සියල්ල පොහොසතුන් සහ රදළයින් අත. සීත කාලෙන් හරි අඩක්ම දුප්පත් ගොවියෝ බඩගින්නෙ පහුවෙනව.''

ඉල්යා නිකොයෙවිච් කාමරයේ ඔබ මොබ සක්මන් කරමින්, හුස්ම ගැනීමට අපහසු කලෙක මෙන් කර පටියේ බොත්තම ගැළවීය. ඔහුගේ දෙනෙත් සෝකාන්විත බවක් පළ කළේය.

මාරියා අලෙක්සාන්ද්‍රව්නා අසහනයකින් කතා කළාය. ''ඔයා හොඳටම මහන්සි වෙලා. විවේක ගන්න.''

''කමක් නැහැ. මට තවම හයිය තියෙනව. අන්න අර ඕක් ගහ වගේ.'' මෙසේ පැවසූ ඉල්යා නිකොලායෙවිච්, ''වටේටම ළපටි ඕක් ගස් වැව්ලා''යි කියමින් විහිළු කළේය.

ඔහු වලෝද්‍යා වැළඳ ගනිත්ම, තරුණයාද ඉදිරියට ගොස් ඔහුට ළංවිය. වලෝද්‍යාද තම පියා මෙන් පුළුල් හකු ඇට සහිත මුහුණකින් යුතු විය. ඔහුගේ නලළද පියාගේ මෙන් පළල්ය. පියාගේ ආදරය නිසා ඔහුගේ සිත අනුකම්පාවෙන් පිරී ගියද, ඔහු මඳක් ලජ්ජාවට පත්වී පිළිතුරු වශයෙන් මඳ සිනහවක් පෑවේය.

## තාත්තා

ශීත සමයේ පාසල් නිවාඩුව අවසන් විය. ආන්යා නැවත තම ඉගෙනීමේ කටයුතු සඳහා පිටර්බුර්ගයට පැමිණිය යුතුව තිබුණද, අවසාන දවස් කීපය ගත කිරීම සඳහා ගෙදර ගියාය. එහෙත් සාෂා ගෙදර ආවේ නැත.

ගෙදර පැමිණි ආන්යා හැම දෙයක් ගැනම ප්‍රීති වූවාය. ගෙතුළ තබා ඇති පිකුස් හා ඔලියාන්දර් පැළ දුටු ඇ සොම්නසට පත්වූවාය.

නිවාඩු කාලයේදී වලෝද්‍යා තම අක්කා වෙතින් ඈත් නොවී සිටියේය.

ඔවුහු සාලයේ මුල්ලක සැටියේ වාඩිවී හවස පහන පවා නොදල්වා කතා කළහ. සමහර දවස්වල ඕල්යාද ඔවුන් සමග වාඩිවී ආන්යාගේ පිටර්බුර්ග් කතාවලට සවන් දුන්නාය.

"ඉගෙනගැනීමට අපි පීටර්බුර්ගයට යන්නේ කවදද?" වලෝද්යාත්, ඕල්යාත් මේ ප්‍රශ්නය මතු කරමින් සිහින දුටහ.

1886 ජනවාරි 12 ද අඩ ඇඳිර පැතිර ගිය දවසක් විය.

"ළමයිනි, තේ බොන්ට වරෙල්ලා!" අම්මා උස් හඬින් කීවාය.

දරුවෝ තේ පානය කිරීම පිණිස ආහාර ගන්නා ශාලාව දෙසට ගියද, තාත්තාගේ කාර්යාල කාමරය අසලින් යන විට, කුඩා කලදී ලැබූ පුරුද්ද අනුව, ඇඟිලි තුඩුවලින් ගමන් කළහ.

තාත්තා දිවා රෑ නොබලා වැඩ කළේය. පාසල්වල වැඩ පිළිබඳ වාර්තා පිළියෙල කළ යුතුය. ඉල්යා නිකොලායෙවිච් උදේ සිට රෑ වන තුරු වාර්තා ලියුවේය. දිනපතාම ඔහු හමුවීමට පාසල් පරීක්ෂකවරු, ගුරුවරු පැමිණ ඔහු සමග සැලැස්ම සපුරාලීම සහ ශිෂ්‍යයින්ගේ දක්ෂතාවය පිළිබඳ තොරතුරු විමසා සාකච්ඡා කළහ.

යම්තමින් විවෘව තිබූ දොර අතරින්, තාත්තා හිස දෑතින් ගෙන සිටින සැටි වලෝද්යා දුටුවේය. මීට මෙළවූ අත් වලින් හිසේ සංකඩ වැසී තිබිණි. "තාත්තා හිතට කයට වධදෙමින් වැඩ කරනවා" යැයි වලෝයා තමාටම කියා ගත්තේය.

එහෙත් තේ මේසය වටා උණුසුම්ය, සැප දයකය. සමවාරයේ වතුර උතුරයි, දුම් බටය සිහින් හඬක් නගමින් දුම්පිට කරයි. සිතෙහි ඇතිවූ දොම්නස පහව ගොස් සොම්නසක් ඇති විය. වලෝද්යාගේ අනාගත අධ්‍යාපනය ගැන ඔවුහුආන්යා සමගනැවත කතා කළහ. සාෂා විද්‍යාඥයෙක් වනු ඇත. ඔහුගේ දක්ෂතාවය හා ඉරියව් හැම එකක්ම විද්‍යාඥයෙකුගේ මෙනි. දක්ෂ ලෙස පියානෝව වාදනය කරන ඕල්යා සංගීතඥයෙක් වනු ඇත. නොපසුබටව ඉගෙනගතහොත් ඈ දක්ෂ සංගීතඥවරියක් වනු නොඅනුමානය. අම්මා තාත්තාට කහට තේ වීදුරුවක් සාදගෙන ගොස් දී සමවාරය ළඟට වී, දරුවන්ගේ කතාවලට සවන් දෙමින් ගෙත්කම් කළාය. ටික වේලාවකට පසු ආහාර ගන්නා ශාලාවේ දොර ළඟට පැමිණි තාත්තා හැම දෙනා දෙසම මහත් වුවමනාවකින් බලා, නිහඬව පිටවිය.

"තාත්තා වෙනදට වඩා අද අමුතුය" යන හැඟීම වලෝද්යාගේ සිත තුළ ඇතිවිණි.

"තාත්තා බැලීමට යනවා" යැයි හිටිහැටියේම තීරණය කළ මාරියා අලෙක්සාන්ද්‍රව්නා ගෙත්තම මේසය මත තබා ඉක්මනින් කාර්යාල කාමරයට ගියාය.

"දරුවනි! ආන්යා, වලෝද්යා!" අම්මා බියගත් විලාසයකින් කෑ ගැසුවාය.

තාත්තා සැටිය මත වකුටුවී වැතිර සිටියේය . ඔහුගේ දෙනෙත් මළානික වෙලාය. උණ අධිකවීම නිසා ඔහු වෙව්ලන්නට විය.

දෙස්තරට දැන්වීමට කෙනෙක් දිව ගියහ. කෙනෙක් හැඬූහ, බියවී තොල මතුරන්ට වූහ.

පැයක් ගතවිය. තාත්තා සදහටම දෙනෙත් පියා ගත්තේය.

ඔහුගේ මළ සිරුර පෙට්ටියක බහා මැද සාලයේ තබන ලදී. දවස් තුනක් තිස්සේ අම්මා මළ සිරුර අසල නොසෙල්වී නිහඬව සිටියාය. දියණියෝ අඬා වැලපුණහ. වලෝද්යා කඳුළු නොවගුරුවමින් වැලපුණේය. ඔහු අධ්‍යාත්මික ලෙස ශක්තිමත් විය. ''දයාබර, ආදරණීය පියානෙනි! ඔබ අප අතරින් හැබැටම තුරන් වීද? ඔබ නැතිව අපි කෙසේ ජීවත් වෙමුද?'

ඉල්යා නිකොලායෙවිච් උල්යානොව්ගේ අවමඟුලට බොහෝ දෙනෙක් පැමිණිහ. ගුරුවරු සිසුවෝ හා මිතුරෝද ඒ අතර වූහ. ජනතාවම වැදගත් හා අවශ්‍ය වැඩ කොටසක් තාත්තා ඉටු කළ බව වලෝද්යා දැන සිටියද, ඔහු ජනතාව වෙනුවෙන් කළ සේවය නියම ලෙස අවබෝධ කර ගත්තේ දැන්ය!

හිම තුෂාරය සහිත අධික ශීත දවසක ඉල්යා නිකොලායෙවිච්ගේ මළ සිරුර භූමදාන කරන ලදී. ගස්වල අතු හිම කවර වලින් වැසී තිබිණි. තුරු අතු සුළඟට සැලෙත්ම කැටිවූ හිම බිම වැටිණ. මිතුරෝ ඔහුගේ මෘත දේහය සහිත පෙට්ටිය කරින් ගෙන ගියහ. ඉල්යා නිකොලායෙවිච්ගේ ගෝලයෝ මල් වඩම් ගෙන අවමඟුල් පෙරහැරට සහභාගි වූහ.

පියාගෙන් සමුගත් වලෝද්යා ඔහු කළ සේවයට කෘතඥතාව දැක්වීය: ''ඔබට මම සදා ණයගැති වෙමි.''

## මාර්තෑ පළමුවැනිදා

තාත්තා ජීවත්ව සිටි කාලයේදී, ඉවාන් යාකොව්ලෙව් චුවාෂ් ජාතික ගැටවරයෙකු වූ ඔහොට්නිකොව් වලෝද්යාට හඳුන්වා දුන්නේය.

''මේ ඉළන්දාරියට උගන්වන්න! චුවාෂ් ජනතාවට උගත් මිනිස්සු බොහොම අවශ්‍ය වී තිබෙනවා'' යැයි ඉවාන් යාකොව්ලෙව් පැවසීය.

ඔහොට්නිකොව්ට නොමිලේ උගැන්වීමට වලෝද්යා කැමති විය. තාත්තාගේ මරණින් පසු ඔහු වඩාත් උනන්දුවෙන් ඔහොට්නිකොව්ට උගැන්වීය. චුවාෂ් ජාතිකයින්ට පාසල් ලබා දීම සඳහා බොහෝ වෙහෙස වී වැඩ කළ තාත්තාගේ නමට ගරුකිරීමක් වශයෙන් වලෝද්යා ඔහොට්නිකොව්ට උගැන්වීය.

‘‘බොහෝම යහපත් ශ්‍රෙෂ්ඨ මහත්මයෙක්, එයා ජනතාවට සේවය කළා’’ යැයි වලෝද්‍යාගේ පියාගේ ගුණ වැනූ ඔහොට්නිකොව් පැවසීය.

වලෝද්‍යා නිතර නිතර කල්පනා කරන්නට විය: ජනතාවට සේවය කරන්නේ කොහොමද? ගොවි පුතකු වන ඔහොට්නිකොව්ට ඔහු උගන්වයි. ඉන්පසු කරන්නේ මොනවාද? ජනතාවගෙ නියම ආරක්ෂකයින් විප්ලවවාදීන් බව වලෝද්‍යාට අවබෝධ විය. එහෙත් විප්ලවවාදී සටන් අරගලවල යෙදෙන්නේ කෙසේද යන්න ඔහු නොදනී. විද්‍යාලයේ දැඩි හා නපුරු පාලන ක්‍රමය ඔහුට නොරිසි විය. ආගම විශ්වාස නොකළ ඔහු කරේ තිබුණු කුරුසිය සහිත මාලය ගළවා දැම්මේය. සමාජය කොතරම් අසාධාරණ ලෙස බෙදී තිබේද? යන්න ගැන ඔහු කල්පනා කරන්නට විය. පොහොසත්තු අලසයින් මෙන් ජීවත් වෙති. දුප්පත්තු දිවා රෑ නොබලා වෙහෙස නොතකා වැඩ කරති. එසේවුණද තම දුකින් මිදීමට දුප්පතුනට බැරිය. මෙය සාධාරණද? ඔහු සාර්ට ඇලුම් නොකළේය. සාර් දුෂ්ට, නපුරු පාලකයෙකි. ඔහුට එදිරිව සටන් කරන්නේ කෙසේද?

පිටර්බුර්ගයේ සිටින සාෂා මේ ගැන කල්පනා කරන්නේද? දේශපාලනයෙන් ඈත්වී ඔහු විද්‍යාවට පමණක් කැපවිද? 1887 මාර්තු 1 ද පිටර්බුර්ගයේ සිදුවූ දේ වලෝද්‍යා නොදත්තේය. අම්මා සහ වලෝද්‍යා පමණක් නොව, සාෂා සමග නිතර පාහේ ආශ්‍රය කළ ආන්යා පවා සිදුවූ දේ නොදත්තාය. එය වැහි නැති දවසක වළාකුළු රහිත අහසේ ඇතිවන අකුණක් මෙනි.

එදින වලෝද්‍යා පංතියේ වැඩවල යෙදෙමින් සිටියේය. විදුහල අසල ඔහු හමුවීමට පණිවුඩකරුවෙකු පැමිණ සිටීම හැරුණු විට, අන් හැම දෙයක්ම පුරුදු පරිදි සිදුවිණි.

‘‘වේරා වසීලෙව්නා කිව්වා ඔහෙට ඉක්මනට එන්ටයි කියලා’’ පණිවිඩ කරු වලෝද්‍යාට දැන්වීය.

මියගිය ඉල්යා නිකොලායෙවිච් උල්යානොව්ගේ මිතුරියක්වූ වේරා වසීලෙව්නා කෂ්කදමොවාද ගුරුවරියකි. සුදුමැළිව, අඩපණව සිටි ඈ වලෝද්‍යා අත ලිපියක් තැබුවාය.

එය පිටර්බුර්ගයෙනි. ‘‘තුන්වැනි අලෙක්සාන්දර් නැමැති සාර් රජු මරා දැමීම පිණිස විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් කණ්ඩායමක් කළ කුමන්ත්‍රණය අසාර්ථක විය. ඔවුන් සිරභාරයට ගෙන ඇත. ඔවුන’තර (සාෂා) අලෙක්සාන්දර් උල්යානොව්ද කෙනෙකි...’’

ලියුම කියවූ වලෝද්‍යා බොහෝ වේලාවක් යන තුරු ගොලු ගැසී සිටියේය. වලෝද්‍යාගේ අයියාවූ සාෂා උසය, සිහින්ය, ඔහුගේ විශාල දෙනෙත් සිහින දකින්නකුගේ මෙනි. හේ කුසලතාවයෙන් හෙබි බුඩිමත්

තරුණයෙකි. ආන්යාද සිරභාරයට ගෙන තිබෙන බව ලියුමේ සටහන් විය.

තාත්තා මියගියේ මීට අවුරුද්දකුත් මාස එක හමාරකට කලිනි. අම්මා තවම ශෝකයෙන් නොකඩවා තැවෙන්නී ශෝකය පළ කිරීමේ සංකේතයක් වන කළු ඇඳුම අතනොහැර ඇන්දය. ඇ නොහැඩුවාය, නොවැලපුණාය. ඇය වඩාත් මළානික වූවාක් මෙනි.කළු ඇඳුමෙන් සැරසී සිටි ඇගේ පෙණුම දුක්බරය, බැරෑරුම්ය. ගෙදර පාලනය වලෝද්යාට භාර දුන් අම්මා ලොකු පුතා බේරා ගැනීමට පිටර්බුර්ගය බලා ගියාය.

දූන් ගෙදර වැඩිමලා වලෝද්යාය. නංගී — මරියාගේ වයස අවුරුදු අටකි.

''අයියේ මා එක්ක සෙල්ලම් කරන්නකො. මොකද අයියා අද හිනා වෙන්නෙ නැතුව ඉන්නෙ?'' මරියා — පුංචි නංගී වලෝද්යාගෙන් ඇසුවාය.

වලෝද්යා නංගී සමග සෙල්ලම් කිරීමට තරම් අධිෂ්ඨාන ශක්තියක් ඇති කර ගත්තද, වෙනදා මෙන් සිනාසීමට සමත් නොවීය. ඔහු කල්පනා කළේ පිටර්බුර්ගයේ සිර අඩස්සියේ පසුවන තම වැඩිමහල් සොහොයුරා ගැනය. ''සාෂා! ආදරණීය අයියේ, ඔවුහු ඔබට මොනවා කරත්ද?''

මැයි මාසයේදී විදුහලේ පරීක්ෂණ වාරයයි. වලෝද්යා සහ ඕල්යා පරීක්ෂණ වලට පෙනී සිටියහ. නිහඬ ගල් රූප මෙන් ඔවුහු පරීක්ෂණ ශාලාවට පැමිණියහ. තම වාරය පැමිණි විට ආචාර්ය මණ්ඩලය ඉදිරිපිට පෙනී සිටි ඔවුන් සැපයූ පිළිතුරු නිසා ආචාර්යවරු පවා පුදුම වූහ. අයියා සහ නංගී සම්මාන සහිතව සමර්ථ වූහ. එසේ වුවද... පුවත්පතෙහි පළවූ නිවේදනයක් අනුව, මියගිය පාසල් අධ්‍යක්ෂකවරයාගේ වැඩිමල් පුත් අලෙක්සාන්දර් උල්යානොව්...

වලෝද්යා පරීක්ෂණ වාරයට පෙනීසිටීම සඳහා විදුහලට ගියේය. වසන්ත සියොත්හු ගී ගයමින් සිම්බීර්ස්ක් නගරයේ වීදිවලට ඉහළින් පියැඹූහ. වසන්තයේ ජීවන සුවඳ හැම තැනම පැතිර ගියේය.

වීදි ආලෝක කරන පහන් කණුවක් අසල රැස්වූ මිනිස්සු එහි අලවා ඇති පත්‍රිකාවක් කියවති. තාත්තා හඳුණන නිලධාරියෙක්ද එය කියවමින් සිට, වලෝද්යා දැක ඔහුට පිටුපා ඉවත්ව ගියේය. මිනිස්සු විසිර ගියහ. වලෝද්යා සෙමින් සෙමින් පත්‍රිකාව දෙසට පා නැගීය. එය කියවූ පසු ඔහුගේ දෙනෙත් ඉදිරියේ අඳුරු ලප මැවිණි. තුන්වැනි අලෙක්සාන්දර් රජුගේ ජීවිතයට හානි කිරීම පිණිස කුමන්ත්‍රණය කළ ශිෂ්‍යයින් පස්දෙනෙකු එල්ලා මරාදමන ලදී. සාෂාද ඔවුන'තර විය.

මේ පුවත දැන්වෙන පත්‍රිකා නගරයේ හැමතැනම අලවා තිබිණි. විදුහලේ පරීක්ෂණ ශාලාව තුළ සිටි යවුන් ඔහු පිළිගත්තේ සතුරු

නිහඬතාවයකිනි. වලෝද්යා අන් හැමටම පෙර ජ්‍යාමිතිය හා ත්‍රිකෝණ මිතිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා පරීක්ෂණ නිලධාරියාට එය භාර දී වෙනෙවිස් කඳු මුදුනට ගියේය. වොල්ගා නදියේ ජලය කැස්පියන් මුහුදට ගලා බසී. කුඩා නැවක් පාරුවක් ඇදගෙන ගඟ ඔස්සේ ගියේය. හැම දෙයක්ම නිසලය, සන්සුන්ය. ඔවුහු සාෂාට කුමක් කළෝද!

සතියකට පසු අම්මා පිටර්බුර්ගයේ සිට ගෙදර ආවාය. ඇගේ හිස කේ පැසී ඈ මහලු වී තිබෙන සැටි වලෝද්යා දුටුවේය.

## සිම්බීර්ස්ක් නගරයෙන් සමුගැනීම

උල්යානොව් පවුල හොඳින් දැන සිටි අය පවා ඔවුන් දුටුවිට අහක බලාගෙන ඔවුන්ගෙන් ඉවත් වෙන්නට වූහ. මරියා අලෙක්සාන්ද්‍රව්නා මහ මග දිගේ ගමන් කරන විට ඇට ආයුබෝවන් කීමට පවා නොකැමැතිවූ, ඇය දත් නගර වැසියෝ පාර හරහා ගොස් අනික් පදික වේදිකාවට පැන ගත්හ. මරණ දණ්ඩණයට ගොදුරුවූවකුගේ මවකට ආයුබෝවන් කීමට පවා ඔවුහු අකැමැති වූහ.

අම්මා ප්‍රෞඪ ලෙස හිස ඔසවාගෙන මහ මග දිගේ ගමන් කළාය. නොඅඩා සිටි ඈ තම වැඩිමහල් පුතු සාෂා ගැන කතා නොකළාය. ''අම්මා ආඩම්බරය, ශක්තිමත්ය!'' තම මවු ගැන වලේද්යා මෙසේ සිතුවේ ගෞරවයෙනි.

වලෝද්යා කොතරම් උසස් ලෙස පරීක්ෂණ ප්‍රශ්නවලට පිළිතුරු දුන්නේදයත්, ඔහු විදුහලේ පළමුවැනි ශිෂ්‍යයා ලෙස තේරිණි. ආචාර්‍යවරු සැක පළකරමින් තර්ක කළහ: එල්ලා මරනු ලැබූවකුගේ සොහොයුරකුට රන් පදක්කම දිය හැකිද? එහෙත් වලෝද්යා කොතරම් දක්ෂ ලෙස හා උසස් ලෙස ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සපයා තිබුණේදයත්, පරීක්ෂණ මණ්ඩලය මෙසේ තීරණය කළේය: රන් පදක්කම වලෝද්යාට දිය යුතුය.

''වලෝද්යා විශ්ව විද්‍යාලයට ඇතුළු වී වැඩිදුරටත් ඉගෙන ගත යුතුයැ''යි අම්මා සහ ඉවාන් යාකොව්ලෙවිච් තීරණය කළහ. ''පිටර්බුර්ගයේ විශ්ව විද්‍යාල ඔහුට අවසර දෙන්නේ නැතිද?''

''නැහැ. ඒ ගැන සොයා බැලීම පවා කාලය අපතේ යැවීමකි.''

තාත්තාගේ මරණින් පසු උල්යානොව් පවුල ආර්ථික අමාරුකම්වලට මූණ පෑවේය. දූ දරුවෝ ඉගෙනගත් අතර කිසිවෙක් මුදල් නොඉපැයූහ. තාත්තාට ලැබිය යුතු විශ්‍රාම වැටුප් අම්මාට ලැබුණද, පවුලේ වියහියදම්වලට එය ප්‍රමාණවත් වූයේ යම්තමිනි.

සිම්බීර්ස්ක් නගරය අතහැර යාමට තීරණය කළේ එබැවිනි. "අපේ අතීත ප්‍රීතිය සිහිපත් කරවන අපේ ගෙදර අතහැර යන්නෙමු. අපේ ආදර සත්කාර ලැබූ හැම ගසක්ම සහිත ගෙවත්තට ආයුබෝවන් කියමු. අපට පිටුපා යන අපේ පැරණි මිතුරන් හා හිතවතුන්ගෙන් ඉවත් වෙමු."

මෙසේ පිටුපා ගියේ හැම දෙනෙකුම නොවේ. තාත්තාගේ හිත මිතුරෙක්වූ ඉවාන් යාකොව්ලෙවිච් සහ වලෝද්‍යාගේ ගෝලයෙක්වූ ඔහොට්නිකොව්ද එසේ නොවූහ. වේරා වසිලෙව්නා කෂ්කදමොවා පෙර මෙන්ම උල්යානොව් පවුලට හිතවත්කම් දැක්වූවාය. ඈ දැන් පෙරටත් වඩා අම්මා සමග මිතුරු වූවාය.

සිම්බීර්ස්ක් පුවත්පතේ මෙවැනි දැන්වීමක් පළවිණි: "නගරයෙන් පිටව යන බැවින් ගෙවත්තක් සහිත ගෙයක්ද, පියානෝවක් සහ ගෘහ භාණ්ඩද විකුණනු ලැබේ. මොස්කව් වීදිය. උල්යානොව් නිවෙස."

තොර තෝන්වියක් නැතිව උල්යානොව් නිවෙසට මිනිස්සු එන්නට වූහ. ගෙදර සීනුවෙන් නිතර හඬ නැගිණි. ගැනුම් කරුවෝ කාමරයක් පාසා යමින් පිරික්සා බැලූහ. අම්මාගේ හිස සිට දෙපා දක්වා බැලූ ඔවුහු කුසු කුසු ගෑහ. සුදුමැලි පෙනුමකින් යුත් අම්මා සෘජුව ගෙදෙර අසල සිටගත්තී, කළු පැහැති රේන්ද සහිත පළඳනාවක් හිස පැළඳ සිටියාය. අම්මා වෙත ගොස්, ඇය දෙස හෙළන අප්‍රියජනක බැල්මෙන් ඇය ආරක්ෂා කිරීමටත්, රැකීමටත් වලෝද්‍යාට සිත්විය.

ඔහුද තම මවු මෙන් ආත්ම ශක්තියෙන් දැඩි හා හික්මීමකින් යුත් කෙනෙකු වීමට මහන්සි ගත්තේය.

වලෝද්‍යා තම වැඩිමහල් සොහොයුරු ගැන සිතුවේය: "සාෂා නුඹ සාර් රජුට වෛර කෙළෙහිය. සාර් මරා දැමීමට නුඹට වුවමනා විය. එවිට රටේ තත්ත්වය යහපත් වී ජනතාවට සෙතක් වනු ඇති බව නුඹේ බලාපොරොත්තුව විය. එහෙත් මීට අවුරුදු හයකට පෙර, 1881 මාර්තු පළමුවැනිද විප්ලවවාදී නරෝද්නික් වරුන් විසින් දෙවැනි අලෙක්සාන්දර් නැමැති සාර් රජු මරාදමන ලදී. එයින් මිනිසුන්ට යහපතක් සිදුවීද? කොහෙත්ම නැත. දෙවැනි අලෙක්සාන්දර් වෙනුවට තුන්වැනි අලෙක්සාන්දර් රජකමට පත්විය. එයින් යහපතක් සිදුවීද? සත්තකින්ම නැත. සටන් කළ යුත්තේ වෙනත් විධියකට බව පැහැදිලිය."

වලෝද්‍යා කල්පනා කළේ ඒ විධියටය.

උල්යානොව් නිවසේ දෙර-සීනුව දිගින් දිගට නාදවිය, ගැනුම් කරුවෝ ගෘහ භාණ්ඩ අනගා පිරික්සා බලා ගියහ. සමහරු සමහර දේ මිළදී ගෙන ගියහ.

පියානෝව පමණක් ඉතිරි විය.

''අපේ ළමා කාලය හා ප්‍රීතිය මේ සංගීත භාණ්ඩය සමග වෙළී ඇතැ''යි පියානෝව අත ගෑ වලෝද්‍යා සිතීය.

කසාන් නගරයට පදිංචියට ගිය උල්‍යානොව් පවුල පියානෝවද රැගෙන ගියේය.

## කසාන් විශ්වවිද්‍යාලය

කසාන් විශ්ව විද්‍යාලයට ඇතුළු වූ වලෝද්‍යා සිම්බීර්ස්ක්හි පිරිමි විදුහලට වඩා එහි ස්වාධීන පාලනයක් ඇතැයි සිතුවේය. සිසුන්ගේ හැම ඉරියව්වක්මපාලකයින්ගේ උකුසු ඇසට යොමුවිය.සාර්ට විරුඬව කිසිවෙක් කුමන්ත්‍රණය කරත්ද? කතා කරත්ද? ආණ්ඩුවට එදිරිව ප්‍රචාරය කරත්ද? පරීක්ෂක නිලධාරි පොටාපොව්ට එදිරිව කතා කරත්ද? පරීක්ෂක නිලධාරි පොටාපොව් ස්ථූල ශරීරයකින් හෙබි ගොරහැඩි මිනිහෙකි. ඊයම් බෝල වැනි ඔහුගේ දෙනෙත්වල මිනිස් සුහද ගති නොතිබිණි. සිසුන් පිළිබඳ වාර්තා කිරීමට පොටාපොව් වෙත නිලධාරීහු ආහ. වරදකරුවන් හැටියට පිළිගත් සිසුන් වහාම විශ්ව විද්‍යාලයෙන් පන්නා දමන ලදී. වරදකරුවන්ගේ නාම ලැයිස්තුව සාදන්නේ පොටාපොව්ය. දුප්පත් සිසුන්ට වඩාත් දැඩි දඬුවම් දුන්හ. දුප්පතුන්ට අධ්‍යාපනය ලබා ගැනීම වඩ වඩාත් අසීරු වූ අතර ගෙවිය යුතු විද්‍යාල ගාස්තු කීප වාරයකින් ඉහළ නැංගේය.

කසාන් විශ්ව විද්‍යාලය හිර ගෙයක් මෙන් මුසල ගතියක් දැරිය. මුළු මහත් රුසියාව සිරගෙයක් මෙන් විය.

මොස්කව්හි සිසු අරගල පිළිබඳ පුවතක් 1887 දෙසැම්බර් 4 ද පුවත්පතක පළවිය. කසාන් විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් අතර රහස් පත්‍රිකාවක් බෙදහරින ලදී: ''අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටින්න, සටන් කරන්න!''

දහවල් දෙළහේ කනිසම වදින හඬ ඇසිණි:

''ශිෂ්‍යයිනි රැස්වීම් ශාලාවට යමු!''

ශිෂ්‍යයෝ කාණ්ඩ ගැසී කොරිඩෝරයට වැදුණහ. රැස්වීම් ශාලාව පිහිටියේ දෙවැනි මාලයේය. වලෝද්‍යා උල්‍යානොව් පෙරමුණ ගෙන ගමන් කළේය.

ශිෂ්‍යයෝ රැස්වීම් ශාලාවට ඇතුළු වූහ.

''සහෝදරවරුනි! එකිනෙකාට පිහිටවෙමින්, එකිනෙකාගේ ඉල්ලීම් ආරක්ෂාකරමින්, සටන් කරන බවට දිවුරා පොරොන්දු වෙමු. නිදහස, නීති ගරුක බව, සත්‍යය, ඉල්ලා සිටිමු...'' යි සභාපති තුමා පිරිස ඇමතීය.

රැස්වීම් ශාලාවට පරීක්ෂක නිලධාරි පොටාපොව් පැමිණියේය. හේ තරබාරුය. ඔහුගේ යටි රැවුළ වැඩිලාය.

''මහත්වරුනි! නීතියේ නාමයෙන් වහාම විසිර යන ලෙස අණ කරනවා!''

''පලයන් යන්ට! හංගවේවා!'' ශිෂ්‍යයෝ කෑ ගැසූහ.

බියවූ පරීක්ෂක නිලධාරියා ඉවත දිව ගියේය.

ඉන්පසු රැස්වීම් ශාලාවට පැමිණියේ විශ්ව විද්‍යාලයේ කුලපතියා. ශිෂ්‍යයෝ නිහඬව කුලපතිට පෙත්සමක් ඉදිරිපත් කළහ.

''රුසියාවේ ජීවත්වීම අපහසුය. ශිෂ්‍යයින්ගේ ජීවිතය අතිශයින්ම අයහපත්ය!'' පෙත්සමෙන් කියැවිණි.

''මහත්වරුනි සන්සුන් වෙන්න!'' ශිෂ්‍ය රැස්වීම හසුරුවීම නොදත් කුලපතිතැන ඔවුන්ට වාටු බස් කියන්නට වී.

''තමුන්නාන්සේ අපේ ඉල්ලීම් සපුරාලීමට සූදනම් නැතිද?'' මෙසේ ප්‍රශ්න කළ ශිෂ්‍යයෝ නැවත තම විරුඬත්වය ප්‍රකාශ කළහ. ''විරුඬත්වය ප්‍රකාශ කිරීමක් වශයෙන් අපි විශ්ව විද්‍යාලයෙන් පිටව යමු. හැඳුනුම් පත් භාර දෙන්න!''

කුලපතිගේ මේසය මත පළමුවැනි හැඳුනුම් පත තබන ලදී. ශිෂ්‍යයෝ තම හැඳුනුම් පත් අතට ගත්හ. මොහොතකින් ඔහුගේ මේසය මත තබන ලද හැඳුනුම් පත්වල ගණන දහය... විස්ස... තිහ... දක්වාද පසුව අනූ නවය දක්වාද වැඩි විය.

වලෝද්‍යා උල්යානොව්ද තම හැඳුනුම් පත කුලපතිට දුන්නේය. එදින හවස ඔහු විශ්ව විද්‍යාලයෙන් නෙරපා දමන ලදී.

රාත්‍රියේදී රුසියන් පොලිසිය ඔහු සිරභාරයට ගෙන, කොකුෂ්කිනො ගම්මානයට පිටුවහල් කළේය.

## ඉදිරිමග සඳහාටම තෝරාගැනීම

ශීත කාලය දැඩි විය. හිම කුණාටු වැඩි විය. ඔවුන් ජීවත් වූ මඩුව තුළ දැඩි ශීත දැනිණි. රාත්‍රි කාලයේදී හිම කුණාටු හමන හඬ ඇසෙන්නට විය. අයිස් බවට පත්වූ හිම, දිගැති රිටි සේ ජනේල රාමුවේ එල්ලී තිබිණි. කොකුෂ්කිනො ගමේ ශීත කාලය කාන්සිය මුසු හුදකලා බවකින් යුක්ත විය.

වලෝද්‍යා උල්යානොව් මුළු ශීත කාලය තිස්සේම පොත් කියවන්නට විය. ඔහු ගේ ප්‍රියතම ගත්කරුවා චෙර්නිෂෙව්ස්කිය. ඔහුගේ විප්ලවවාදී බව වලෝද්‍යාගේ සිත් ගති. රුසියානු සමාජය හැදී තිබෙන සැටි චෙර්නිෂෙව්ස්කි යසට විස්තර කළේය. සාර් රජ කරයි. පාලනය සාර්, නිලධාරීන්, කම්හල් හිමියන් හා රදළයින් අතය. ගොවීන්ගේ හා

කම්කරුවන්ගේ තත්ත්වය ඉවසිය නොහැකි තරම් පහතට වැටී ඇත. රුසියානු සමාජ ජීවිතයේ අසහනය චෙර්නිෂෙව්ස්කි තම පොත් මගින් මැනවින් පෙන්වීය. ජනතාව සටන් කළ යුතුය, විප්ලවයක් කළ යුතුයැයි හේ කියා සිටියේය. දෙශප්‍රෙමී විප්ලවවාදියාගේ කෘතීන් වලෝද්යා කීප වරක්ම, නැවත නැවත කියැවීය. ඔහු ඉදිරියේ නව මාර්ග කීපයක්ම විවෘත වී ඇත.

අදහස් රාශියකි. ජීවිතයේ අරමුණ පිළිබඳ බලාපොරොත්තු හා සැළැස්ම රාශියකි! වලෝද්යා උල්යානොව්ගේ ජීවිත අරමුණ කුමක්ද? විප්ලවවාදී සටන් මගය. සාර්ට හා රදළ ධනපතීන්ට එදිරිව තම ජීවිතය සඳහටම කැපකිරීමට ඔහු ඉටා ගත්තේය. ජනතාවගේ සැපත හා ස්වාධීනත්වය සඳහා සටන් කළ යුතුය.

වලෝද්යා උල්යානොව්ගේ ඒකායන හා ප්‍රධාන අරමුණ විප්ලවවාදී සටන් මගය. එහෙත් ජීවත්වීම සඳහා මුදල් උපසා ගත යුතුය. විශ්ව විද්‍යාලයෙන් උපාධි ලබා වෘත්තීය විශෙෂතාවයක් ලබා ගත යුතුය.

වසන්තයේදී වලෝද්යා කසාන් විශ්ව විද්‍යාලයට ඇතුළුවීමට අයදුම් පතක් ඉදිරිපත් කළේය. එය ප්‍රතික්ෂේප කරන ලදී.

ගිම්හානය අවසානයේදී වලෝද්යාගේ මවු — මරියා අලෙක්සාන්ද්‍රොව්නා තම පුතා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට අයදුම් පතක් ඉදිරිපත් කළාය.

ඇමතිවරයා එයද ප්‍රතික්ෂේප කළේය.

නැවත වරක් වලෝද්යා උල්යානොව් අධ්‍යාපන අමාත්‍යාංශයට අයදුම් පතක් යැවුවද එයද ප්‍රතිෂේක්ප කරන ලදී.

විශ්ව විද්‍යාලයේ පාඨ මාලාව තනිවම හැදෑරීමට උල්යානොව්ට සිදුවිය. විශ්ව විද්‍යාලයේ නීති අංශයේ අවුරුදු හතරක පාඨ මාලාවක් අවුරුදු එක හමාරක් තුළදී තනිවම හැදෑරූ (වලෝද්යා) ව්ලදිමීර් උල්යානොව් බාහිර ශිෂ්‍යයකු මෙන් පරීක්ෂණයට පෙනී සිටීම සඳහා පිටර්බුර්ගයට ගියේය

ව්ලදිමීර් උල්යානොව් පිටර්බුර්ග් විශ්වවිද්‍යාලයේ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටියේය.

ඔහුට ලැබුණේ අමාරු ප්‍රශ්න පත්‍රයකි. මහලු මහාචාර්යවරු ඔහුගේ පිළිතුරු වලට මහත් වුවමනාවකින් සවන් දුන්හ. මදක් නෙරාගිය කපෝල හකු ඇට සහ තරමක් හැකිළුණු තියුණු නෙත් සහිත මුහුණක් ඇති තරුණයා නීතිය පිළිබඳ සංකීර්ණ ගැටළු ගැන ගැඹුරු හා මනා දැනීමක් ඇත්තකු බව මහාචාර්යවරු තේරුම් ගත්හ. ඔවුහු අදහස් හුවමාරුකර ගත්හ.

පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටින තරුණයාගේ පිළිතුරු සතුටුදයක බව ඔවුහු තීරණය කළහ. ව්ලදිමීර් උල්යානොව් විශ්ව විද්‍යාල

අවසාන පරීක්ෂණයෙන් උසස්ම ලකුණු ප්‍රමාණයක් ලබාගත් සිසු හැටියට නීතිවේදී උපාධිය දිනාගත්තේය.

ව්ලදිමීර් උල්යානොව් සතුටු සිතින් පිටර්බුර්ග් නගරයේ ඇවිදීමට පටන් ගත්තේ ඔහු නගරය එතරම් හොඳින් නොදන සිටි බැවිනි. තම බාල සොහොයුරිය වන ඕල්යා හමුවීමටද, නෙව්ස්කි මහ මග දිගේ ඇවිදීමටද, නගරයේ නොයෙක් තැන් බැලීමටද ඔහු පිටත්විය. ඕල්යා පිටර්බුර්ගයේ උසස් කාන්තා විද්‍යාලක උගත්තාය.

පරීක්ෂණයෙන් සමත් වූ පසු ඔහු ගියේ තම ජය පිළිබඳ ආරංචිය ඕල්යාට දන්වනු පිණිසය. වෙහෙස මහන්සි වූයේ නිකමට නොවේ! ඉක්මනටම පිටර්බුර්ගයට පැමිණ ප්‍රධාන කාර්‍යය වන විප්ලවවාදී කට යුතුවල යෙදෙමි!

තම සොහොයුරිය හමුවීමට ඔහු ගියේ ඉමහත් ප්‍රීතියකිනි.

ඔහු ඇගේ කාමරයට ඇතුළු වෙත්ම, ඈ ඇඳ මත වැතිර සිහිසන් නැතිව උණ විකාරයෙන් දෙඩවන සැටි දුටුවේය. ඇගේ මුහුණ රත් පැහැ ගෙන ඇත, හිස කේ අවුල් වෙලාය, දෙතොල් වියලී ඉරිතැලී ඇත. ඈ උණ විකාරයෙන් දෙඩවන්නී දෑත් වනමින් යමක් කිවාය:

"අම්මේ මාව බේරාගන්න! අම්මේ!"

ව්ලදිමීර් ඇය දැතින් ගත්තද, ඈ ඔහු නොදත්තාය. ඔහු ඇය රෝහලට ගෙනගොස් භාරදී, මවට විදුලි පුවතක් යැවීය.

මරියා අලෙක්සාන්ද්‍රව්නා පිටර්බුර්ගයට පැමිණෙන විට ඕල්යා අසාධ්‍ය තත්ත්වයක පසු වුණාය. 1891 මැයි 8 ද ඕල්යා උල්යානොවා මිය ගියාය. ඊට අවුරුදු තුනකට උඩදී, එනම් 1888 මැයි 8 දය, (සාෂා) අලෙක්සාන්දර් උල්යානොව් එල්ලා මරා දමනු ලැබුවේ.

ඕල්යාගේ අවමගුලට අම්මා සහ පුතා සහභාගි වුණහ. සුදුමැලි, මළානික අම්මා දෙතොල් සපාගනිමින් නොහඬා තම දියණියගේ මළ සිරුර සහිත පෙට්ටිය පසුපසින් ගමන් ගත්තාය.

ඕල්යාගේ මිනී වල මත විද්‍යාලේ සිසුවියෝ මල් වඩම් තබා අවසාන ගෞරවය කළහ.

අවමගුලෙන් පසු අම්මා සහ පුතා සමාරා නගරයට ගියහ. දැන් උල්යානොව්ලා පදිංචිවූයේ සමාරා නගරයේය.

ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව්ගේ ජීවිතයේ වැදගත් කාලය මෙය විය. විශ්ව විද්‍යාල පරීක්ෂණ සඳහා ඔහු සැරසුණේත්, මාක්ස්ගේ උගැන්වීම් ගැන වඩාත් හොඳට හා ගැඹුරුලෙස ඉගෙනීමක් ලැබුවේත් මෙහිදීය.

ජර්මන් ජාතික ශ්‍රේෂ්ඨතම විද්‍යාඥයකුවූ විප්ලවවාදී කාල් මාක්ස් "ප්‍රාග්ධනය" නැමැති මාහැඟි කෘතිය ලියා පළ කළේය. ඔහු සහ ඔහුගේ මිතුරු ෆ්‍රෙඩ්රික් එංගල්ස් "කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය" ලියූහ.

කම්කරු පංතිය ධනපතීන් පරදවා පාලන බලය අතට ගෙන මිහිපිට උසස් හා නව සමාජ ක්‍රමයක් වන කොමියුනිස්ට් ක්‍රමය ගොඩනගනු ඇතැයි කාල් මාක්ස් කරුණු සහිතව ඔප්පු කොට පෙන්වීය. ව්ලදිමීර් උල්යානොව් විස්මයට පත්වූයේ මාක්ස්ගේ උගැන්වීම් ගැඹුරු ලෙස හැදෑරීය. අනාගතය පෙන්වන එකම උගැන්වීම මාක්ස්වාදය බව ඔහුට ඒත්තු ගියෙන්, යා යුතු මග ඔහු සදහටම තෝරා ගත්තේය.

මාක්ස්ගේ උගැන්වීම් පිළිගත් අනිකුත් උදවිය මෙන්ම ව්ලදිමීර් උල්යානොව්ද මාක්ස්වාදියෙක් විය. සමාරාහි මාක්ස්වාදීන්ගේ කවයකට සහභාගිවූ ඔහු මාක්ස්ගේ උගැන්වීම් ප්‍රචාරය කරන්නට විය. මෙය කළ යුත්තේ සාර් පොලිසියට අසුනොවී රහසිනි. නීතිවේදියකු වූ පසු ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව් සමාරාහි අධිකරණය ඉදිරියේ ගොවීන් හා දුප්පත් මිනිසුන් වෙනුවෙන් බොහෝ වාරයක් පෙනී සිටියේය.

වැඩකරන අතර බොහෝ පොත් කියවමින් ඉගෙනගත් ඔහු සමාරා නගරයෙන් පිටව විශාල කර්මාන්ත නගරයකට, විශේෂයෙන් පිටර්බුර්ගයට යාමට බලාපොරොත්තු විය.

අම්මා නිසා නොවේනම් ඔහු පිටර්බුර්ගයට ගොස් බොහෝ කල්ය. ඕල්යාගේ මරණින් පසු අම්මා නිතර ඇ ගැන සිතමින් කාන්සියකින් පසුවුණාය. අම්මාගේ කනගාටුව තුනී කිරීම වස් ඔහු සැලකිලිමත් ලෙස හා මෘදු ලෙස ඇට සත්කාර කළේය.

1893 ශරත් සමයේදී උල්යානොව් පවුල සමාරාවෙන් පිටවිය. ද්මිත්‍රි උල්යානොව් විශ්ව විද්‍යාලයට ඇතුළු විය. මරියා අලෙක්සාන්ද්‍රව්නා තම බාල දරුවන් දෙදෙනා — ද්මිත්‍රි හා මරියා සමග මොස්කව් නගරයට විත් පදිංචි වුණාය.

උල්යානොව් පවුලේ වැඩිමහල් දියණිය ආන්නා, මාක් එලිසාරොව් සමග විවාහ වූවාය. ඔහු විශ්ව විද්‍යාල ශිෂ්‍යයකුව සිටි කාලයේදීසිටම සාෂා (අලෙක්සාන්දර්) උල්යානොව්ගේ සගයකු විය. මාක් ඒ කාලයේදී ආන්නා හඳුණාගත්තේ, සාෂාගේ මරණයෙන් පසු ඇ සමග වඩාත් කිට්ටුවෙන් ආශ්‍රය කළේය. විවාහයෙන් පසු ඔවුහු උල්යානොව් පවුලේ අනිකුත් සාමාජිකයින් සමග එකම ගෙයක පදිංචි වූහ. මාක් සහආන්නා ඔවුන් සමග මොස්කව් නුවරට ආහ.

විප්ලවවාදී දෙශපාලන ව්‍යාපාරයෙහි යෙදීමේ මහත් උනන්දුවකින් යුතුව ව්ලදිමීර් ඉල්යිච් පිටර්බුර්ගයට පැමිණියේය.

## පොලිස් ඔත්තුකරුවකු රවටීම

රාත්‍රී අඳුර පැතිරිණි. පීටර්බුර්ගයේ පහන් කණු වීදි ආලෝක කළේ කණමැදිරි එළියකිනි. පයින් ගමන් කරන්නෝ තම ගෙවල් බලා ඉක්මනින් ගියහ.

ව්ලදිමීර් ඉල්යීච් අස්රියකින් (අස්ස කෝච්චිය) ගමන් කළේය. අබලන් රියක් වූ එය ඒ අත මේ අත පැද්දිණි. වීදුරු ජනේලවල හිම මිදුණෙන් රිය යන දිසාව බලාගැනීම පවා අපහසු විය. ඔහු යන්නේ දුර ගමනකි. නෙව්ස්කි දොරටුවට එහා කම්කරුවන්ගේ දේශපාලන කවයකට සහභාගිවීම සඳහා ඔහු යමින් සිටී.

ව්ලදිමීර් ඉල්යීච් අස්රියට නගින විටම වාගේ, කළු පැහැති උපැස් යුවළක් ඇස ලා ගත් මිටි මිනිහෙක් රථයේ පා පුවරුවට නැග ගත්තේය. රිය නවතා තිබූ ස්ථානයේ ඔහු සිටින සැටි ව්ලදිමීර් ඉල්යීච් දුටුවේය. ඔත්තුකරුවා පුවත්පතක් කියවන සැටියක් මවා පෑවද, ඔහු යටැසින් ව්ලදිමීර් ඉල්යීච් දෙස බලන්නට විය. රියට ගොඩනැගුනේ ඔත්තුකරුවකු බව ඔහු නිසැකවම දැනගත්තේය.

අස්රියේ දොරටුව අසල අසුනක වාඩිවූ ඔහු ඔත්තු කරුවාගෙන් බේරියන සැටියක් කල්පනා කරමින්, කබායේ කර පටිය උස්සා ගෙන නිදිකිරා වැටෙන සැටියක් මවා පාමින්, හිමෙන් වැසී ඇති ජනේල වීදුරුවට කටින් පිඹිමින්, හිම දියකර හැර, රියෙන් බැස යා යුතු තැන නොවරදිනසේ බලන්නට පටන් ගත්තේය. ඔත්තුකරුවා රවටා ඔහුගෙන් බේරී යාහැකි එක් ස්ථානයක් ඔහු දැන සිටියේය. නොවරදවා රියෙන් බැස යා යුතු ස්ථානය ගැන සොයමින් ඔහු හිම දියවූ කුඩා සිදුරෙන් බලන්නට විය. තමාට අවශ්‍ය නැවතුම් පොළට දැන් දැන් අස්රිය පැමිණෙනු ඇත. මී ළඟ නැවතුම් පොළින් බැස යා යුතුය. අස්රිය නැවතිණි.

"බහින්නේ කවුද?" කොන්දොස්තර තැන ඇසීය.

හැම කෙනෙක්ම නිහඬ වූහ. ව්ලදිමීර් ඉල්යීච්ද නිහඬව සිටියේය.

අශ්වයෝ නැවත ගමන් අරඹත්ම, නැගී සිටි ව්ලදිමීර් ඉල්යීච් සැනෙකින් අස්රියෙන් එළියට පැන්නේය. ඉන්පසු ඔහු ගෙවත්තකට දිවගියේ වේගයෙනි. අස්රියේ කිසිවෙක් සීනුව හඬවන සැටි ඔහුට ඇසිණි. කොන්දොස්තර තැනද සීනුව හැඬවීය. අස්රිය නැවතිණි. එහෙත් ඒ වන විට ව්ලදිමීර් ඉල්යීච් දුව ගියේ, දොරටුව තුළින් ගෙවත්තට වැදී සැඟවිය. ඔත්තුකරුවාද අස්රියෙන් බැස වට පිට බලමින් ඔහු සෙවීය. එහෙත් සොයාගැනීමට බැරිවිය.

ව්ලදිමීර් ඉල්යිච් වෙනත් දෙරටුවකින් තමාට වුවමනා විජියට බැස රැස්වීමට ගියේය.

නේව්ස්කි දෙරටුවට එහා යාන්ත්‍රික කම්හලක යකඩ කම්කරුවකුවූ ඉවාන් බාබුෂ්කින්ගේ ගෙදර රහස් දෙශපාලන කවය පවත්වන ලදී. එම පෙදෙසේ බොහෝ කම්හල් හා පැක්ටරි තිබිණි. උදැසන හිරු උදවීමටත් කලින් වැඩට ගිය කම්කරුවන්, නැවත ගෙදර පැමිණියේ හවස ඇඳිරිය පැතිර ගිය පසුය. ඉරු එළිය කුමක්දැයි ඔවුහු නොදත්හ. ජීවිතය ඇඳිරිය! හැමදම මේ විධියට ජීවත්වීම කළ නොහැක!

පොලිසියට හොරෙන් ඉවාන් බාබුෂ්කින්ගේ ගෙදර රැස්වූ කම්කරුවෝ තම තත්ත්වය ගැන සාකච්ඡා කළහ.

එදින රැස්වූ කම්කරුවෝ නිකොලායි පෙත්රෝව්ච් නැමැති දෙශපාලන දේශකයා බලාපොරොත්තුවෙන් සිටියහ. ඒ අන්කිසිවකු නොව ව්ලදිමීර් ඉල්යිච්ය.

කම්කරු දේශපාලන කවයන්ගේ රැස්වීම්වලට සහභාගිවීමට ව්ලදිමීර් ඉල්යිච් පැමිණියේ ඇයි?

කම්කරුවන්ට මාක්ස්වාදය පිළිබඳ දැනීමක් ලබාදෙනු පිණිසය. සමාජය පෙරළා අළුත් සමාජයක් ගොඩ නැගිය හැකි එකම බලවේගය කම්කරු පංතිය බව මාක්ස් පෙන්වා දුන්නේය. සාර්ට හා ධනපති පංතියට එදිරිව නැගී සිටීමට කම්කරු පංතිය තීරණය කළහොත් ඔවුන්ගේ බලය බිඳදැමීමට කිසිවකුට බැරිය. එබැවින් කම්කරු පංතිය සමගි කළ යුතුය. අරමුණ කරා ඔවුන් මෙහෙයැවිය යුතුය. කම්කරුවන්ගේ අරමුණ කුමක්ද? සමාජයේ පාලන බලය සියතට ගැනීමය. වැඩකරන ජනතාවගේ රජයක් පිහිටුවීමය.

ඉතාම හොඳ රජයක් හා සාධාරණ සමාජයක්! මාක්ස් මේ සමාජය හැඳින්වූයේ කොමියුනිස්ට්වාදී සමාජය නමිනි.

## පළමුවැනි පොත

නේව්ස්කි දෙරටුවට එපිට වාසය කළ ඉවාන් බාබුෂ්කින්ගේ නිවෙසේ රැස්වූ කම්කරුවන්ට දෙශපාලනය ගැන ව්ලදිමීර් ඉල්යිච් කතා පවත්වන විට, පිටර්බුර්ගයේ නොයෙක් දිසාවල කම්කරුවන්ගේ මාක්ස්වාදී කවයන් පැවැත්විණි. පිටර්බුර්ගයට පැමිණි විගස ඔහු කළේ විප්ලවවාදී මාක්ස්වාදීන් සෙවීමය.

"සහෝදරවරුනි! අප හැමදෙනෙක්ම මාක්ස්ගේ උගැන්වීම් කම්කරු ජනතාව වෙත ගෙනගිය යුතුය. කම්කරු පංතිය සමගිකොට විප්ලවය

සඳහා සූදානම් විය යුතුය''යි ව්ලදිමිර් ඉල්යිච් විප්ලවවාදී මාක්ස්වාදීන් අමතා පැවසීය.

''කම්කරු පංතිය මුදගැනීමේ සටන්කාමී සංගමය'' නැමැති විප්ලවවාදී සංවිධානය පැන නැංගේ එසේය. පළමුව මේ සංවිධානය පීටර්බුර්ගයේද පසුව අනිකුත් නගරවලද ඇතිවිය.

ව්ලදිමිර් ඉල්යිච් මේ දේශපාලන කවයනට නායකත්වය දුන්නා පමණක් නොවේ. දහවල් කාලයේදීත් හවසත් සමහර විට රෑ බෝවන තුරුත් ඔහු පොත් හා ලිපි ලියුවේය. ඔහු ධනපති පංතිය බිය ගන්වන පොත් ලිවීය. ධනපති ක්‍රමයට එදිරිව සටන් කළ යුතු සැටි සහ සංවිධාත්මකව එම සටන මෙහෙයැවිය යුතු සැටි ඔහු විස්තර කළේය.

ඔහු තම පළමුවැනි මාක්ස්වාදී කෘතිය ලියනු ඇත. මාක්ස්වාදී සග යින් එය රහසේ මුද්‍රණය කොට කම්කරු කවයන්වල බෙද හරිනු ඇත.

රෑ බෝවිය. ව්ලදිමිර් ඉල්යිච්ගේ කාමරයේ ජනේලයෙන් එපිට ඇඳිර පැතිර ඇත. අසල ගෙවල්වල පහන් නිවිණි.

ඔහු ලිවීම නවත්වා නැගිට සිට පියවර තුනක් ඉදිරියට තැබීය. කාමරය බොහොම කුඩා වුවද, ඔහු ඔබ මොබ සක්මන් කිරීමට කැමතිය.

''අප ඉදිරියේ ඇත්තේ එක් මගකි. විවෘත දේශපාලනමය සටන්කාමී මග ඔස්සේ රුසියානු කම්කරු පංතිය ඉදිරියට ගොස් කොමියුනිස්ට්වාදී විප්ලවය ජයග්‍රාහී ලෙස අවසන් කරනු ඇත.'' ව්ලදිමිර් ඉල්යිච් එසේ සිතමින් සක්මන් කළේය. ජයග්‍රාහී ලෙස කොමියුනිස්ට් විප්ලවය අවසන් කරනු පිණිස ඔහු තම පොතින් රුසියානු කම්කරු පංතියට ආයාචනා කළේය. මීට පෙර කිසිවෙක් රුසියානු කම්කරු පංතියට මෙවැනි නිර්භය ආයාචනයක් කර නැත.

පොතේ කතුවරයාවූ ව්ලදිමිර් ඉල්යිච් උල්යානොව්ගේ වයස එවකට අවුරුදු විසි හතරක් විය. ඔහු තරුණයෙකි, බහුශ්‍රැතයෙකි. රුසියානු කම්කරු පංතිය විප්ලවයක් කරතියි ඔහු දැඩිලෙස විශ්වාස කළේය.

## පත්‍රිකා හතරක්

පොලිසිය ගෙයක් පාසා ගොස් කැරළිකරුවන් සිරභාරයට ගෙන දෑත් පිටිතල කොට බැඳ පොලිස් කාර්‍යාලය වෙත ගෙන ගියහ.

''මුදලාලිගේ කඩේ කැඩුවද? කැඩුවා. එහෙනම් පල හිරගෙට.''

''පාලක නිලධාරියාගේ එළිපත්තට ගිනි තැබුවද? ඔව්. පල හිරගෙට.''

බාබුෂ්කින් බලාපොරොත්තුවෙන් සිටියේය: ''මා ගෙනයාමට පොලිසිය දූන් එනු ඇත''.

3•

රාත්‍රියේදී ඔහුගේ ගෙදෙරට යමෙක් ඉක්මනින් හා කෙටියෙන් තට්ටු කරන හඬ ඇසිණි.

දෙරට තට්ටු කළේ ව්ලදිමීර් ඉල්යිච්ය. ඔහු හිමෙන් නැහැවී සුදු පැහැගෙන සිටියේය. ඔහුගේ ඇස් බැම්වල හිම කුඩා අයිස්කැට බවට හැරිණි. හිම කබාය ගළවා දමා ඔහු උණුසුම් වනු වස්, ශාලාව තුළ ඔබ මොබ ඇවිද්දේය.

''ඉතින් කියන්ට කොහොමද පටන් ගත්තේ කියල? කම්කරුවො මුහුණ දුන්නෙ කොහොමද?''

බාබුෂ්කින්ට සිදුවූ දෙය සම්පූර්ණයෙන්ම විස්තර කිරීමට වුවමනා විය. ඊයේ කම්හලේදී ඇතිවූ කම්කරු කැරැල්ල ගැනත්, පාලක නිලධාරියාගේ නිවසේ එළිපත්ත විනාශ කිරීම ගැනත්, අසල තිබූ මුදලාලිගේ කඩය විනාශ කිරීම ගැනත් ව්ලදිමීර් ඉල්යිච්ට විස්තර කිරීමට ඔහුට සිතුණේ, ඔහු එම සිඳීන් සියැසින් දුටු බැවිනි. කම්කරුවන්ගේ මේ ප්‍රහාර නිසා පොලිසිය ඔවුන් සිරභාරයට ගත්තේය.

''පංති හැඟීමෙන් යුත් කම්කරුවෝ ගුටි ඇන ගැනීමට ඉදිරිපත් නොවිය යුතුයි. අපි මේ ගැන පත්‍රිකා මගින් පැහැදිලි කර දෙන්න ඕන'' යැයි ව්ලදිමීර් ඉල්යිච් පැවසීය.

ඔවුහු මේසය වටා වාඩිවී ලිවිය යුතු දේ ගැන පහත් හඬින් සාකච්ඡා කළහ. සංවිධානාත්මක ලෙස සටන් කළ යුතු කාලය පැමිණ ඇත. කම්කරුවන් වහල් බවෙන් මුදවාගැනීමේ කාර්‍යය කිසිවකුට කළ නොහැකිය. එය කළ හැක්කේ කම්කරුවන්ට පමණකි. සටන් කළ යුත්තේ මිට මෙළවූ අත්වලින් නොව, සංවිධාන මගිනි.

මැදියම රැය ළංවිය. ව්ලදිමීර් ඉල්යිච් ඉක්මනින් ලියන සැටි බාබුෂ්කින් බලා සිටියේය. හිටිහැටියේ ඔහු නිදිකිරා වැටෙන්නට විය.

''නැහැ සහෝදරය මම, නිකං.''

''නිකං තමා, ඒ වුණාට නිදවැටෙනවා! දැන් නිදගන්න. සහෝදරයට හෙට උදේ පාන්දර වැඩට යන්ට තියෙනව'' යැයි ව්ලදිමීර් ඉල්යිච් පැවසුවේ මඳ සිනා පාමිනි.

බාබුෂ්කින් නිදගත් අතර ව්ලදිමීර් ඉල්යිච් තමා ලියූ පත්‍රිකාව පිටපත් කිරීමට පටන් ගත්තේය. කම්කරුවන්ට ලෙහෙසියෙන් කියවීම පුළුවන් වන සේ ලොකු පැහැදිලි අකුරින් ලිවිය යුතුය. ඔහු පත්‍රිකා හතරක්ම පිටපත් කළේය.

හිටිහැටියේම පැක්ටරියේ නළා හඬ දසත පැතිරිණි. බාබුෂ්කින්ගේ කාමරයේ ජනේලය තුළින් එම හඬ ඔහුට ඇසිණි.

නේව්ස්කි නගර ද්වාරයට අයත් පෙදෙසේ කම්කරුවෝ අවදිවූහ.

''සහෝදරය නැගිටින්න!'' යැයි කියමින් ව්ලදිමිර් ඉල්යිච් ඔහු අවදි කළේය.

බාබුෂ්කින් නැගිට්ටේය.

ඇස් පිසදමා ගෙන ඔහු ව්ලදිමිර් ඉල්යිච් දෙස බැලුවේ සිහිනයක් යැයි සිතමිනි .ඒ ඔහුද? ඇත්තටම ඒ ව්ලදිමිර් ඉල්යිච්ය. ඔහු තම කාමරයේය. මේසය මත අත් අකුරින් ලියන ලද පැහැදිලි පත්‍රිකා හතරක් බාබුෂ්කින් දුටුවෙන්, පසුදින රැයෙහි සිදුවූ දේ මතක් විය.

''මේ පත්‍රිකා හතර කම්කරුවන්ට කියවීමට පුළුවන් වන ලෙස ඔවුන් අතර බෙද හරින්න ඕන. මීට වඩා වැඩි ගණනක් ලිවීමට බැරිවීම ගැන කනගාටුයි.''

ඔවුහු කාමරයෙන් පිටවූහ. අවට ඇඳිරි ය. අහසේ තරු දීප්තිමත්ව බැබළේ. කම්හල්වල දුම්බට, සුදු පැහැති දුම් ගුළි අහස දෙසට පිටකළේය. කිලිටි ඇඳුමින් සැරසුණු කම්කරුවන්ගෙන් වීදි පිරිණි. ව්ලදිමිර් ඉල්යිච් සහ බාබුෂ්කින් කම්කරු පිරිසට මැදිවිය.

බාබුෂ්කින් තම සාක්කුවෙන් පත්‍රිකාවක් බැගින් ගෙන තමා අඳුනන කම්කරුවන්ට දෙන්නට විය. ඔවුහු එය කියවා තම සගයන්ට දුන්නෝය. මේ විධියට පත්‍රිකා අති'නත යන්නට විය.

''අපේ පළමුවැනි උද්ඝෝෂක පත්‍රිකාව. බාබුෂ්කින් සහෝදරය, සුබ මොහොතින්!'' යැයි ඔහු තම කම්කරු සගයා අමතමින් පැවසීය.

## ''මිනෝගා''

දිගැති සිහින් මාලුවකු මිනෝගා නමින් හඳුන්වනු ලැබේ. සිහින් සිරුරකින් හෙබි ලස්සන තරුණියකවූ නදේෂ්ද කොන්ස්තන්තිනොව්නා කෘප්ස්කයා මෙනමින් හැඳින්වූයේ මන්දැයි කිම අමාරුය. පිටර්බූර්ග් නගරයේ මාක්ස්වාදී සංවිධානය ඇය හැඳින්වූයේ ''මිනෝගා'' යන නමිනි. ග්ලෙබ් ක්‍රිෂිෂානොව්ස්කි හඳුන්වනු ලැබුවේ ''සුස්ලික්'' (Gopher)යන නමිනි. ඔහු සැබැවින්ම එම සතාට සමාන වීද? කොහෙත්ම සමාන නොවීය. ව්ලදිමිර් ඉල්යිච් ''ස්තරික්'', හෙවත් මහල්ලා යන නම ලැබුවේ ඔහුගේ බුද්ධිය, දැනීම හා බහුශ්‍රැතත්ත්වය නිසාය.

පිටර්බූර්ගයේ අලෙක්සන්ද්‍රින්ස්ක් චතුරශ්‍රය සුදෝසුදු හිමෙන් වැසී, හිම සියා පිළිබඳ කතාව සිහිපත් කරවන නොවැම්බර් මාසයේ දවසක, ''මිනෝගා'' හෙවත් නදේෂ්ද කෘප්ස්කයා සන්සුන් ගමනින් නගරයේ ප්‍රසිද්ධ පුස්තකාලය ඉදිරිපිට ඔබ මොබ ඇවිදිමින් සිටියාය. ලොම් සහිත සත්ව හමකින් කළ කෙටි හිම කබායක් හැඳ සිටි ඇ හිස කේ කරල්

දෙකකට වෙන්කොට ගොතා හිම තොප්පියක් පැළඳ සිටියාය. දැඩි ශීතලෙන් දෑතේ ඇඟිලි ආරක්ෂා කර ගැනීම පිණිස ඇ ගෙනගිය මුප්ටි* නමින් හැඳින්වෙන ලොම් සහිත කවරය තුළ සටහන් පොතකි. කම්කරුවන්ගේ දුක් සහිත ජීවන තතු පිළිබඳ විස්තරයක් එහි ලියා ඇත. මේ විස්තර පත්‍රිකා පළකිරීම සඳහා පිළියෙල කරන ලදී.

මේ සටහන් පොත භාරදීම සඳහා ඇ ඔහු එන තුරු සිටින්නීය.

ව්ලදිමීර් ඉල්යිච්, බාබුෂ්කින් සමග එකතුව පත්‍රිකා හතරක් ලියා බෙදහැර දැනට වසරක් ගත වී ඇත. දැන් පීටර්බුර්ගයේ ''සටන්කාමී සංගමය'' එවැනි පත්‍රිකා සිය ගණනක් ලියා ගල් අච්චුවල මුද්‍රණය කොට රහසින් නගරය පුරා බෙදහැර තිබේ.

ව්ලදිමීර් ඉල්යිච් ප්‍රසිඩ පුස්තකාලයේ සිට මහ මගට බැස්සේය. නදේෂ්ද ක්‍රෘප්ස්කයා ඔහු දකින්නී නෙවා ගඟ දිගේ ගමන් කළාය. ගඟ අද්දර පාරකදී හමුවූ ඔවුහු නේවා නදියේ පහළට ගමන් කළහ. ව්ලදිමීර් ඉල්යිච් ඇගේ අතක් අල්ලා ගත්තේය.

''පුස්තකාලෙදී හොඳහැටි පොත් කියෙව්වද?'' ක්‍රෘප්ස්කයා ප්‍රශ්න කළාය. ඒ අතර ඇ ඉක්මනින් තම මුප්ටිය තුළ සඟවා තිබුණුපොත ඔහුගේ ඇඳුමේ අත තුළ එබීය.

''බොහොම හොඳා!'' මෙසේ පිළිතුරු දුන් ඔහු සටහන් පොත කබායේ අත තුළට රුවාගෙන සඟවා ගනිමින් ප්‍රශ්න කළේය: ''මේ පොතේ ඇති කරුණු හැබෑ ඒවාද?''

''ඔව්.''

''බොහොම ස්තුතියි'' ඔහු ඇට කීවේය.

හිම තුෂාරය සහිත මඳ පවනින් පීඩා ලැබ සිටි ඇගේ මුහුණ ලා රත් පැහැ ගෙන ඇත. ඇ ඔහු දෙස බලත්ම ඇගේ දෙනෙත් කාන්තිමත් ලෙස දිලිසිණි. ඇ වාම්ය, ඇගේ පෙණුම බැරෑරුම්ය! ව්ලදිමීර් ඉල්යිච් ඇ දැකීමෙන් සතුටක් ලැබීය. ඔහු පීටර්බුර්ගයට පැමිණ නොබෝ දිනකින් ඔවුනොවුන් හඳුණාගත්හ. ඔහු ඇය හඳුනන්නේ එද සිටද? තම ජීවිතයේ මුල සිටම ඔහු ඇය හඳුණන බව ඔහුට දැනෙයි. ව්ලදිමීර් ඉල්යිච් තම හැඟීම් හා සිතැඟියාවන් ගැන ඇ සමග සාකච්ඡා කිරීමට ආශා කළේය. නදේෂ්ද ක්‍රෘප්ස්කයා ඉතා ආශාවෙන් ඔහුට උදව් කළාය. දෙදෙනම එකම ව්‍යාපාරයක, එකම අරමුණක් සඳහා එක්වී වැඩ කළහ.

ව්ලදිමීර් ඉල්යිච් හිටිහැටියේම කිසියම් සංඥාවක් දීමට මෙන් තමාගේ අත මිරිකන සැටි ක්‍රෘප්ස්කයාට දැනිණි. ඔවුන් දෙදෙනා දෙස බලමින්

---

*ලොමින් සාදන ලද අත්වැසුම් විශේෂයෙකි.

පිටුපසින් ගමන් කරන පොලිස් ඔත්තුකරුවකු ඇගේ නෙතට ලක්විය. ඔහු කබා කර පටිය උස්සාගෙන ගමන් කළේය.

ව්ලදිමිර් ඉල්යිච් සැණෙකින් සාකච්ඡාව වෙන අතකට හරවමින් හඬ නගා කතා කරන්නට විය. ලිගෝව්කා වෙළඳ සැලක හිම තොප්පි ලාබෙට විකුණන බව ඇත්තදැයි ඇගෙන් ඇසීය. ඔත්තුකරුවා තවත් ළං වෙමින් ගමන් කළේය.

''වෙන්ව යමු!'' යැයි ව්ලදිමිර් ඉල්යිච් පහත් හඬින් පැවසීය.

ඔවුහු සමුගත්හ. ව්ලදිමිර් ඉල්යිච් තමා ඉදිරියේ වූ වීදියක් ඔස්සේ ගමන් කරන්ට වූ අතර පොලිස් ඔත්තුකරුවා ඔහු පිටුපසින් යන්නට විය. ඔහු වේගයෙන් ගමන් කොට අතුරු පාරකින් හැරී නොපෙනී ගියේය. ඔත්තු කරුවා මෙවැන්නක් බලාපොරොත්තු නොවූයෙන්, දිගටම ගමන් කළේය. අතුරු පාරේ ධනවතකුගේ බංගලාවක් දුටු ව්ලදිමිර් ඉල්යිච් ගෙවත්තට ඇතුළු විය. මුරුකරුවාගේ අසුන හිස්වී තිබෙන සැටි දුටු ඔහු වහාම එහි වාඩිවී පුවත්පතකින් මුහුණ වසාගෙන, එය කියවන බවක් අඟවමින් සිටියේය.

මොහොතකින් එතැනට පැමිණි ඔත්තුකරුවා ''මා ලුහුබඳිමින් ආ මිනිහා කොහිද? ඒකා මහ පොළොව පලාගෙන ගියාද?''යි තමාගෙන්ම අසන්නාක් මෙන් පුදුමව වටපිට බැලීය. ඔත්තුකරුවා ඔහු සොයමින් ඉවත ගියේය.

පොලිස් ඔත්තුකරුගේ විලාසය දුටු ව්ලදිමිර් ඉල්යිච්ට ඉබේටම සිනහ පහළවිය. මුරකරුවා එන්ට පෙර ගෙදර යා යුතුය. ක්‍රෘප්ස්කයා දුන් සටහන් පොත තවම තමා අතදැයි සොයා බැලූ හෙතෙම ඉක්මනින් ගෙදර ගියේය.

## අපේ ව්‍යාපාරය විනාශ කළ නොහැකිය

1895 දෙසැම්බර් 8 ද නදේෂ්ද ක්‍රෘප්ස්කයා නැවතී සිටි ගෙදර ''සටන්කාමී සංගමයේ'' සාමාජිකයිනගේ රැස්වීමක් පැවැත්විණි. (කම්කරු කාර්‍ය්‍යය) ''රබෝචෙ දේලො'' නමින් පුවත්පතක් පළ කිරීමට තීරණය වූයෙන් එහි පළමුවැනි කලාපයේ පළවිය යුතු ලිපි ගැන සාකච්ඡා කරන ලදී. සටන්කාමී නිර්භය කතු වැකිය ලියන ලද්දේ ව්ලදිමිර් ඉල්යිච් විසිනි.

''කම්කරු කාර්‍ය්‍යය'' රහස් මුද්‍රණාලයක මුද්‍රණය කිරීමට තීරණය විය. පින්ලන්ත මුදු බොක්කේ පීටර්බුර්ගයේ උප නගරයක එවැනි මුද්‍රණාලයක් සොයා ගන්නා ලදී.

විප්ලවවාදී කටයුතු ගැන ඉමහත් උනන්දුවකින් වැඩ කළ විසිතුන් හැවිරිදි අනටෝලි වනේයෙව්ට එම කාර්‍ය්‍යය භාර දුන්හ. වගකිවයුතු කටයුතු

ව්ලදිමිර් ඉල්යිච් ඔහුට පැවරිය. හෙට අනටෝලි වනේයෙව් එම ලිපි යන්ත්‍රාලයට භාරදෙනු ඇත. ඉක්මනින්ම කම්කරුවෝ තම පුවත්පතේ පළමුවැනි කලාපය කියවනු ඇත.

''සටන්කාමී සංගමයේ'' සාමාජිකයෝ බොහෝ රෑ වී ගෙවල් බලා ගියහ.

ව්ලදිමිර් ඉල්යිච් සහ නදේෂ්ද ක්‍රෘප්ස්කයා නොයෙක් දේ ගැන කතා කරන්නට වූහ. සහෝදරවරුන්ගේ යහපත් ගති ගුණ ගැන කතා කරන ඔහු ඔවුන්ට මුව නොසැහෙන සේ පැසසීය. ඔහු ජනතාවට ආදරය කළේය. කම්කරුවන් සංවිධානය වටා රුස්වන සැටි ඔහු ඇට විස්තර කළේය. බාබුෂ්කින් දක්ෂ, නිර්භීත සහෝදරයෙකි...

''ශුභ රාත්‍රියක් වේවා, නදේෂ්ද. හෙට ඔළුව පලාගෙන ඔබ ළඟට එන්නම්...'' යැයි ඔහු ඇගෙන් සමු ගනිමින් පැවසීය.

මහා මාර්ග පාළු වී තිබිණි. ඉඳහිට පහන් කණුවකින් කණමැදිරි එළියක් පිටවිය. එහෙත් තරුවල ආලෝකය දීප්තිමත්ය. ව්ලදිමිර් ඉල්යිච් ප්‍රසිද්ධ පුස්තකාලය දක්වා ගියේය. එතැනද පාළුය. ඔහු තනිවම ය. අලෙක්සන්ද්‍රින්ස්ක් උද්‍යානයේ දෙහි ගස්වල අතු හිමෙන් බරවී පහතට නැමිලාය. ගසක අත්තක් සෙලවී හිම කැට බිම වැටිණි. ව්ලදිමිර් ඉල්යිච් සැහැල්ලු සිතින් මඳ සිනා පෑවේය!

ගරෝහොව් වීදියේ පිහිටි තම කාමරයට ඔහු පැමිණියේ පමාවෙලාය. පොලිස් ඔත්තුකරුවන්ගෙන් බේරීම පිණිස ඔහුට නිතර පදිංචි ස්ථාන මාරුකරන්ට සිදුවූයෙන්, මේ කාමරයද ඔහු කුලියට ගත්තේ මේ නොබෝදය.

ගෙහිමි කාන්තාවගේ නින්දට බාධා නොකරනු වස් ඔහු දෙපයේ ඇඟිලි තුඩු වලින් ගමන් කරමින් තම කාමරයට ඇතුළු විය. නිදා ගැනීමට තරම් හිතක් නොවූයෙන් ව්ලදිමිර් ඉල්යිච් තම අනාගත කෘතියට අවශ්‍ය කරුණු සොයාගැනීම පිණිස පොත් කියවීමට තීරණය කළේය. ඔහු මහත් ආශාවෙන් පොතක් කියවා ඔරලෝසුව දෙස බැලීය. මැදියම් රැය පසුවී දෙකට ළංවී ඇත.

''නිදා ගන්ට ඕන'' මෙසේ සිතූ ඔහු දිගටම කියවන්නට විය.

ඔරලෝසුවේ බට්ටා හඬ නැගීය.

ව්ලදිමිර් ඉල්යිච්ට අමුතු හඬක් ඇසුණෙන් ඔහු පුදුමවී ඔරලෝසුව දෙසත් දොර දෙසත් බැලීය.

කාමරයේ දොර ඇරගෙන පළමුවෙන් ඇතුළු වූයේ වත්ත අතුගාන මිනිසාය. ඔහු පිටුපසින් සිවිල් ඇඳුමින් සැරසුණු මිනිස්සු දෙදෙනෙක්ද, පසුව පොලිස් නිලධාරියෙක්ද ඔහුගේ කාමරයට ඇතුළු වූහ.

සිරභාරයට ගැනීමේ බලපත්‍රය ඉදිරිපත් කරනලදි.

සිවිල් ඇඳුමින් සැරසී සිටි දෙදෙනා ව්ලදිමීර් ඉල්යිච්ගේ පොත්, කොට්ට මෙට්ට, ඇඳ ඇතිරිලි අවුස්සමින් සොයා බලන්නට වූහ. ලිපද, දුම් බටයද පිරික්සා බැලූහ.

බිත්තිය අසල සිටගත් ව්ලදිමීර් ඉල්යිච් නිහඬව කල්පනා කරන්නට විය.

ඔහු තම සගයින් ගැන සිතුවේය. ඔවුන්ට කුමක් වීද? ඔහු තනිවම සිර භාරයට ගත්ද නැතිනම් අන් අයත් අසුවීද? නදේෂ්දට කුමක් වීද? අපේ වැඩ සියල්ල විනාශ වීද? "නැත. අප විනාශ කිරීමට උන්ට බැරිය. අපේ ව්‍යාපාරය විනාශ කළ නොහැක. කම්කරුවන් ලක්ෂ ගණනින් නැගිට සිටිනු ඇත. රුසියාවේ සියලුම වැඩකරන ජනතාව නැගිට සිටිනු සහතිකය." ව්ලදිමීර් ඉල්යිච් එසේ සිතීය.

## අංක 193 සිර කාමරය

සිලිමට යටින් කුඩා කවුළුවකි. එය වසා යකඩ වැටකි. බිත්තියට සවිකළ යකඩ මේසයකි. එය අසල යකඩ පුටුවකි. එක් මුල්ලක පොත් ගොඩකි. සාර්ගේ හිරගෙදර කියවීමට අවසර තිබේ. ව්ලදිමීර් ඉල්යිච්ට වුවමනා පොත් විශාල ප්‍රමාණයක් ඔහුගේ සොහොයුරියෝ සහ නදේෂ්ද ගෙනාහ. එදින රැයෙහි නදේෂ්ද සිරභාරයට නොගති. ව්ලදිමීර් ඉල්යිච් සිරභාරයට ගත් විගසම ඔහුගේ මවද සොහොයුරියෝද මොස්කව් සිට පිටර්බුර්ගයට ආහ.

අද බ්‍රහස්පතින්ද. සිරකරුවන් බැලීමට අවසර ඇති එකම දවස ය. ව්ලදිමීර් ඉල්යිච් පොත් කියවීම පසෙක තබා යකඩ දොරට පිටදී සිට ගත්තේය. සිරගෙදර මුරකරුවා යකඩ දොරේ සිදුරෙන් බලමින් නිතර නිතර සිරකරුවන් ගැන සොයා බලයි. දොරේ සිදුර වැසෙන සේ ඔහු සිටගත්තේ එබැවිනි. මේසය මත තිබූ පාන් බෝලයක් ඔහු මිරිකත්ම, එයින් කිරි එළියට ආවේය. කිරි සහිත පාන් බෝල ඔහු හැඳින්වූයේ තීන්ත කුඩු හැටියටය. රහස් ලිපි ලිවීම සඳහා ඔහු තීන්ත වෙනුවට කිරි පාවිච්චි කළේය. පොතක මුද්‍රිත අකුරු පේළි අතරින් ඔහු කිරිවලින් ලිපියක් ලියුවේය. කිරි වේළී ගිය පසු කිසිවකුට නොපෙනේ. එය ගෙදර ගෙන ගොස් පහනේ මඳ ගින්නෙන් රත් කළ විට අකුරු පේළි කියවිය හැකිය. නදේෂ්ද හෝ සහෝදරියන් හෝ එය රත් කොට කියවනු ඇත. ව්ලදිමීර් ඉල්යිච් පෞද්ගලික ලිපියක් නොව පත්‍රිකාවක් ලියුවේය.

දෙසැම්බර් 8 ද මැදියම් රැයේ සිට පසුවද උදේ වන විට ''සටන්කාමී සංගමයට'' අයත් සාමාජිකයින් 160 දෙනකු සිරභාරයට ගන්නා ලදී. එහෙත් ''සංගමය'' විනාශ නොවිණි. ''සංගමය'' ස්ට්‍රයික් සටන් වැළක්ම සංවිධාන කළේය. වැඩ නවත්වා සිටි අයට ආයාචනයක් ව්ලදිමීර් ඉල්යිච් විසින් ලියන ලදී.

යකඩ දොරට දමා ඇති යතුරු ඉබ්බා ගැළවී, දොර හැරී, නිලධාරියෙක් ඔහු සිටි සිරකාමරයට ඇතුළු විය. කිරි සහිත පාන් බෝලය හෙවත් තීන්ත කුඩුව කටේ දමාගත් ව්ලදිමීර් ඉල්යිච් එය ගිල දැම්මේය.

මුරකරුවා ඔහුට ළංවී පිරික්සා බැලූ නමුදු සැක කටයුතු කිසිවක් නොදුටුවෙන් පිටව ගියේය.

ව්ලදිමීර් ඉල්යිච් තවත් පාන් බෝලයකින් තීන්ත කුඩුවක් සාද එයට කිරි පුරවා ලියන්නට විය.

පැයකින් නැවත සිර කාමරයේ දොර හැර ඇතුළු වූ නිලධාරියා ව්ලදිමීර් ඉල්යිච් බැලීමට කෙනෙකු පැමිණ ඇති බැව් පවසා ඔහු කැටුව ගියේය. යකඩ වැටවල් දෙකකට එහා සිටගත් ඔහු හමුවීමට පැමිණියේ ඔහුගේ පෙම්බරිය වන නාද්යා නොහොත් නදේෂ්ද ක්‍රූප්ස්කයා ය. අත් අල්ලා ගෙන හෝ අතට අත දී හෝ කතා කළ නොහැක. ඉඟි කළ හැකිය. සිනාසිය හැක. තම පෙම්වතා සිරභාරයේ සිටීම නිසා දුක්විය යුතු වුවද, ඈ මඳ සිනාවෙකින් ඔහුට ආචාර කළාය. ඔහු දක්ෂයෙකි! ඔහුගේ මනෝභාවය පහත වැටී නැත.

ඔහුගේ මව්, සොහොයුරියෝ ඔහුට සුබ පැතුම් එවන බව ඈ දන්වා සිටියාය.

යකඩ වැටවල් දෙක අතර ඇති පටු බිම් තීරුවේ සිටගෙන හැම වචනයකටම සවන් දෙන පොලිස් නිලධාරියාට නොඇසෙන සේ දේශපාලන කටයුතු ගැන කතා කරන්නේ කෙසේද?

''පුස්තකාලයෙන් ගෙනා පොත් අද මම අක්කටයි නංගිටයි යැව්වා. ඔව් මරියාටත් පොතක් යැව්වා.'' මෙසේ පැවසූ ව්ලදිමීර් ඉල්යිච් මහත් ඕනෑකමින් ඈ දෙස බැලීය.

''එයා විශේෂයෙන් මරියාගේ නම මතක් කළේ ඇයි? එයින් ඔහු කීමට අදහස්කළේ කුමක්ද? ආ! එයා ලියපු ලියුම හෝ පත්‍රිකාව මරියාට යැවූ පොතේ බලන්නට ඕනෑ'' යැයි නදේෂ්ද ක්‍රූප්ස්කයා සිතුවාය.

ව්ලදිමීර් ඉල්යිච් ප්‍රහේලිකා මගින් ඈ සමග කතා කරන්නට විය.

''මගේ හිර කාමරයේ නොම්මරය දන්නවද?'' ''ඔව්. සත්තකින්ම දන්නවා! එකසිය අනූ තුන!''

''ඇයි එයා එහෙම අහන්නෙ? නිකමට අහන්නෙ නැහැ. පොතේ

193 පිටේ ඒ පත්‍රිකාව හොයන්ට ඕන.'' නදේෂ්ද කෘෘප්ස්කයා මෙසේ සිතුවාය.

ඔවුන් දෙදෙනා මේ විධියට පොලිස් නිලධාරියාට නොතේරෙන ලෙස දෙශපාලන ව්‍යාපාරයේ වැඩ ගැන කතා කළහ.

පොලිස් නිලධාරියා බිත්ති ඔරලෝසුව දෙස බැලීය.

''කතා කිරීමේ වේලාව ඉවරයි!''

පැයක් ගෙවීගියේ නොදැනුවත්වමය! ඉවත්ව යාමට සිත් නොදෙයි. සිතට දුකකි.

''වලෝද්යා ආයුබෝවන්! හිත අධෛර්‍යය කරගන්ට එපා!'' සුබ පැතූ ඇ ඉවත නො ගියාය.

පොලිස් නිලධාරියා ඔහු කැටුව සිර කාමරය දෙසට ගමන් කරත්ම, ඔහු ඇය දෙස හැරී බැලීය. ඔහු ගෙනයන තුරු ඇ රැඳී සිටියාය.

ව්ලදිමීර් ඉල්යිච් සිරකාමරයට දමා දෙර අගුළු ලා පොලිස් නිලධාරියා පිටවිය. ඔහු සිර මැදිරිය තුළ හුදකලාව සිටගෙන ඇ හමුවූ සැටි සිතන්නට විය: ''ඔන්න දැන් ඇ සිරගෙදර මහ දෙරටුවෙන් පිටවී මහ මගට බැස්සා. දැන් ඇ (ශිම්භාන) ලේත්නියි උද්‍යානයට ගියා වෙන්නට ඇත''.

අඩ ඇඳිරියෙන් පිරි සිර මැදිරියේ ඔබ මොබ බොහෝ වේලාවක් සක්මන් කළ ව්ලදිමීර් ඉල්යිච් ඇ ගැන මහත් ප්‍රේමයකින් සිතන්නට විය.

## කොළ පැහැති පහන

සයිබීරියාවේ ෂුෂෙන්ස්කොයෙ ගමේ පුරා අවුරුද්දක් ව්ලදිමීර් ඉල්යිච් පිටුවහල් ජීවිතය ගත කළේය. පිටුවහල් දඬුවම ලැබීමට පෙර ඔහු මාස දහ හතරක් සිරකරනු ලැබ සිටියේය. පිටුවහල් කාලය ගෙවීමට තව අවුරුද්දක් ඇත.

1898 මැයි 7ද ව්ලදිමීර් ඉල්යිච් ''රුසියන් ධනවාදයේ සංවර්ධනය'' නැමැති ශාස්ත්‍රීය කෘතිය ලිවීමට පටන්ගත්තේය. රුසියාවේ ගම්වල හා නගරවල බලය වැඩිවැඩියෙන් ධනපතීන් හා කුලාකයන් අතට පත්වීගෙන යන සැටි කරුණු සහිතව ඔප්පුකොට පෙන්වූ එම කෘතිය පොදු ජනතාව වඩාත් දුගී දුප්පත්කමට භාජන වෙමින් පීඩනයට ගොදුරුවන සැටිද විස්තර කළේය.

දහවල් ආහාරයෙන් පසු ඔහුගේ කවුළුවකට කිසිවෙක් ඇඟිලි තුඩින් තට්ටු කළේය. ඔහු දු..ත් ගොවියකුවූ සොසිපාතිච්ය. ලොම් සහිත

හිම කබායක් ඇඳ තොප්පියක් හිස පැළඳ සිටි ඔහුගේ එක් උරයක දඩයම තුවක්කුවකි.

"ව්ලදිමීර් ඉල්යිච් යමුද කැලෑ තාරාවන් දඩයම් කරන්ට."

ව්ලදිමීර් ඉල්යිච් නොසන්සුන්තාවයකිනි. නදේෂ්ද ක෴ප්ස්කයා පිටර්බුර්ගයේ* සිට පැමිණිය යුතුව තිබුණද, ඇගේ නොපැමිණීම නිසා ඔහු කලබල වී සිටී. ඇද පසුව විප්ලවවාදී වැඩනිසා පිටර්බුර්ග් හිදී සිර දඬුවමක් ලැබුවාය. ඉන්පසු ඇටද පිටුවහල් ජීවිතයක් ගත කිරීමට සිදුවූයෙන් එම කාලය ෂූෂෙන්ස්කොයෙ ගමේ ගතකිරීමට ආණ්ඩුවෙන් අවසර ලබාගැනීමට ඕ සමත් වූවාය. ඈ එහි යන බව දන්වා බොහෝ කල් ගත වුණද තවම නොපැමිණියාය.

නොසන්සුන්තාවය තුනී කරගැනීම් වස් ව්ලදිමීර් ඉල්යිච් තම තුවක්කුවත් රැගෙන කාමරයෙන් පිටවිය.

"ඔහෙගෙ සපත්තු දඩයමට කියාපු බඩු" යැයි සොසිපාතිච් ඔහු දිරි ගැන්විය.

සැබැවින්ම ඔහුගේ සපත්තු දඩයම් කිරීම සඳහා පාවිච්චි කරන ඒවා විය. දණහිස දක්වා උසැති ඒවා ඇඳගෙන මඩ ගොහොරුවල යන්නට පුළුවන. පඳුරුවලට රිංගා කැලෑ තාරාවන් අල්ලා ගත හැක. ඔවුහු හැතැප්ම හතක් පමණ දුර පිහිටි ජේරොවෙ පොකුණට දඩයම් පිණිස ගියහ. එහි කොතරම් විශාල ප්‍රමාණයක් තාරාවන් සිටිත්දැයි කිවහොත්, පොකුණ අවට පෙදෙස තාරා පිහාටුවලින් වැසී තිබිණි.

එදින පැහැදිලි දවසකි. ඉර පැව්වද දැඩි උෂ්ණයක් නොදැනිණි. හිරු රැස් නිසා පොකුණ කොළ පැහැයෙන් දිලිසිණි. ඈත ක්ෂිතිජයේ ධවල වස්තුවක් හිරු එළිය නිසා බැබලෙන්නට විය. එය හිමෙන් වැසුණු සයාන කඳුය.

"ඔන්න පොකුණ. ඉලක්කය වරද්දන්නෙ නැතුව වෙඩි තියන්ට. පළමුවැනි වෙඩිල්ල වැරදුණොත් ඒක අසුබ ලකුණක්." මෙසේ කී ගොව්යා, "ව්ලදිමීර් ඉල්යිච්, තමුසෙ පළමුවෙනි වෙඩිල්ල විතරක් වරද්දන්නෙ නැතුව ඉලක්කෙට වෙඩි තියනවා" යැයි වැඩිදුරටත් කීවේය.

ඔහු තුවක්කුවත් රැගෙන බැද්ද මැද සිටගෙන සතුන්ගේ හඬට කන් දුන්නේ ඉමහත් සතුටිනි. කුරුල්ලන්ගේ ගී අලංකාරය; කොව්වෝරුවෙක් ගසකට කොටයි.

---

*පිටර්බුර්ග් — පෙට්‍රොග්‍රාඩය ක්‍රි:ව: 1703–1914 දක්වා මෙනමින් හැඳින්විණි. එය 1914–1924 දක්වා පෙට්‍රොග්‍රාඩය යන නමින්ද 1924සිට ලෙනින්ග්‍රාඩය යනුවෙන් ද හැඳින්වේ.

පොකුණ අසල පඳුරකින් හඬක් නැගිණි. අළු පැහැති විශාල පක්ෂියෙක් හඬනගා හෙමින් අහසට නැංගේය. තමාට අඩි විස්සකට ඉදිරියෙන් පියාඹන්නටවූ ඌට ව්ලදිමීර් ඉල්යීච් වෙඩි තැබීය. ඉලක්කය වැරදිණි!

වෙඩිතැබීමට ඔහු පමාවිය.

''අනේ ව්ලදිමීර් ඉල්යීච් වැඩේ සවුත්තු කළා නෙව!'' ගොවියා තම අසතුට පළ කළේය.

අසුබ ලකුණ නොතකා දඩයම සාර්ථක විය. තාරවුන් කීපදෙනෙකුට වෙඩි තබන ලදී. තේ කහට නිසා කළු පැහැගත් කේතලයක් රිටි දෙකක් අතරවූ හරස් රිටක එල්ලා ගිනි මැලයක් ගැසූහ.

සොසිපාතිච් ගොවිරාළ දඩයම් සරුවීම නිසා මහත්සේ ප්‍රීතිවූයේ, රටද එහි නැවතී තාරාවුන් දඩයම් කරන ලෙස ව්ලදිමීර් ඉල්යීච්ගෙන් ඉල්ලා සිටියේය. ගොවියාගේ ඉල්ලීම පිළිගැනීමට ඔහු කැමතිවූණද, ඉක්මනින් තම නවාතැනට යා යුතුය යන හැඟීමක් ඔහු තුළ ඇතිවිය.

සවස්වූයෙන් ගම්මු හරකුන් හා එළදෙනුන් ගෙවල් බලා දක්වූහ. ගෙවතුවල ගෙවිලියෝ කිරි දෙවූහ. කිරිබුරුලු වලින් පිටවූ කිරි භාජනවලට වැදෙත්ම හඬක් පිටවිය.

''ව්ලදිමීර් ඉල්යීච්, තමුසෙලගෙ ගෙදර පහන පත්තු කරලා'' යැයි ගොවියා පැවසීය.

ඔහුද එය දිටීය. ඔහු නැවතී සිටි ගෙදර ඔහුගේ කාමර දෙක තුළ පහන් දැල්විණි. පහනේ වීදුරු කවරය කොළ පැහැතිය. ඔහුගේ හිත මහත්වූ ප්‍රීතියකින් පිරී ගියේය.

ගෙදර එළිපත්තේ පඩිපෙළේ වැට අල්ලා ගෙන නදේෂ්ද ක්‍රෑප්ස්කයා ඔහු පැමිණෙන තුරු බලා සිටියාය. අළු පැහැති ගවොමක් ඇඳ සිටි ඈ සිහින්ය, සැහැල්ලුය.

''ආයුබෝවන්, නදේෂ්ද!'' හේ පැවසීය.

''වලෝද්යා'' ඈ ඔහු ඇමතුවාය.

''එන්න, එන්න, මෙහෙදි ඔහෙ කොතරම් වෙනස්වෙලා තියනවද කියල අපට පෙන්වන්න'' යැයි නදේෂ්දගේ මව — එලිසවේටා වසීලෙව්නා කාමරය තුළ සිට උස් හඬින් ඔහුට ඇසෙනසේ කීවාය. ''මනමාලි එයාව හොයාගෙන ඇවිල්ල. එයා ඇවිදින්න ගිහිල්ලා, දඩයම් කරනව.''

කාමරය තුළ කොළ පැහැති වීදුරු කවරය සහිත භූමිතෙල් පහනක් දැල්විණි.

''මේ ලාම්පුව ඔයාට තෑග්ගක්. කොළපාට ඇස්වලට සනීපයි නෙව.'' නදේෂ්ද ක්‍රෑප්ස්කයා පහන පෙන්වමින් පැවසුවාය.

මොස්කව් සිට සයිබීරියාවට පැමිණීම සඳහා දවස් දහයක් දුම්රියෙන් ගමන් කළ යුතුය. ඉන්පසු සැහෙන දුරක් නැවකින්ද, අස්රියකින්ද ගමන්

කළ යුතුය. වීදුරු කවර සහිත පහනක් මේ තරම් දුරක් ගෙනයාම ලෙහෙසි නොවේ. වීදුරු බිඳේය යන බිය නිසා නාදේෂ්ද ක්‍රෲප්ස්කයා එය නිතරම අතින් ගෙනගියාය.දැන් එම පහන ෂුෂෙන්ස්කොයෙ ගමට ගෙනැවිත් ඇත.

## පිටුවහල් ජීවිතය

නාදේෂ්ද ක්‍රෲප්ස්කයා සහ ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව් ෂුෂා ගං ඉවුරේ පිහිටි අළුත් ගෙයක පදිංචි වූහ.

එක් කාමරයක ඔහුට වැඩ කිරීම සඳහා ලියන මේසයක්ද, පොත් රාක්ක කීපයක්ද පිළියෙල කරන ලදී. ඔහුගේ ලියන මේසය උසය. එයට ළංවීම සඳහා පඩි පෙළක්ද විය. දෙපස ලී වැටකි. ලියන මේසය මත ෑ බන ලද පහන කොළ පැහැති වීදුරු කවරයකින් යුක්ත විය. ශීත සමයේ ෂුෂෙන්ස්කොයෙ ගමේ ගෙවල්වල පහන් වේලාසනින් නිවති. එහෙත් ව්ලදිමීර් ඉල්යිච් රෑ බෝවන තුරු පොත් කියවමින්, ලියමින් වැඩ කළේය...

ඔහු හිටගෙන ලිවීමට ආශා කළේය. විශාල වැදගත් ශාස්ත්‍රීය කෘතියක්වූ ''රුසියන් ධනවාදයේ සංවර්ධනය'' ඔහු මෙලෙස හිට ෙගන ලියුවේය. ලිපි හා පොත් ඉංග්‍රීසි බසින් තම බසට පරිවර්තන කළ ඔහු වෙනත් බොහෝ වැඩ කළේය. නාදේෂ්ද ක්‍රෲප්ස්කයා ඔහුට ඉතා අගනා සහකාරියක් වූවාය. කම්කරු ජීවිතය හොඳින් දැන සිටි ඈ කම්කරු ස්ත්‍රිය පිළිබඳ පොතක් ලියුවාය.

ඔවුන් එකට එක්වී වැඩකළේ ඉමහත් ප්‍රීතියකිනි. ඔහු උස ලියන මේසය අසල හිටගෙන ලියයි. ඈ වෙනත් මේසයක වාඩිවී ලියයි. දෙදෙනම එක්වී විවේක ගත්හ. කැලෑවේ ඇවිද්දහ. මෑත ෂුෂා ගඟේ හෝ ඈත යෙනිසෙයි ගඟේ හෝ ඔරු පැද්දහ. එකිනෙකාට පෙම්කළ තරුණ යුවළ මෙසේ ප්‍රීතිවූහ.

මද්දහන වන විට අමුත්තෙකු පැමිණියෙන් එලිසවේටා වසීලෙව්නා දොරට තට්ටු කළාය. යම්කිසි වැඩක යෙදෙමින් සිටි ඔහුට බාධා කිරීමට ඈ මැලි වූවාය. පොතක් ලියමින් සිටි ඔහු ඉන් ඈත් වීමට අකැමැතිවිය. අමුත්තා දුප්පත් ගොවියකු වූ බැවින් අන් සියලු කටයුතු පසෙක තබා ඔහුගේ වුවමනාව ඉටු කළ යුතුය. එලිසවේටා වසීලෙව්නා ගොවියා ගෙට කැඳෙව්වාය. පාණ්ඩු පාටින් යුත් ඒ ගොවියාගේ මුහුණ රැළි වලින් ගහණ වූවද ඔහු මහල්ලෙක් නොවීය. ඔහු දේව රූප සොයමින් වට පිට බැලුවද ඒවා නොතිබුණෙන්, ජනේලෙ දෙසට මුහුණ හරවා කුරුසියේ ලකුණ ඇඳ ගත්තේය.

''කරුණාකර වාඩිවෙන්න!'' ව්ලදිමීර් ඉල්යිච් ගොවියාට ආරාධනා කළේය.

පුටුවේ වාඩිවූ ගොවියා රතු ලේන්සුවකින් වසා තිබූ මැටි බඳුනක් පුටුවේ කකුලක් අසල තැබිය.

''අනේ මහත්තයො මම ආවේ ලොකු උදව්වක් බලාපොරොත්තුවෙන්. උපදෙසක් ලබාගන්න'' යැයි ගොවියා ඔහු අමතා පැවසිය.

ගොවියා බොහෝ ඈත සිට පැමිණියෙකි. ඔහු පළමුව ගමේ තොරතුරු ඇතුළු දිග කතාවක් කොට, පසුව තමාට උවමනා දේ ගැන කියන්නට විය. ඔහු මුහුණ පෑ අකරතැබ්බය මෙයය. ඔහු තම වැඩිමහල් දියණිය පොහොසත් ගොවි ගෙදරක මෙහෙකාරියක ලෙස වැඩට යැව්වේ අවුරුද්දකට රූබල් විස්සක වැටුපක් ලබාගැනීමේ පොරොන්දුවකිනි. ගොවි තරුණිය එකොළොස් මසක් මෙහෙකාර කම් කළ විට, ඇගේ මව අසනීප වූයෙන්, තම නංගිලා සහ මල්ලිලා බලාගැනීමටත්, රෝගී මවට හෙදකම් කිරීමටත් ඇයට ගෙදර පැමිණීමට සිදුවිය. පොහොසතා පොරොන්දු පරිදි මුදල් ගෙවීමට බැරිබව කියමින්, ඈ පොරොන්දු පරිදි පුරා වසරක් මෙහෙවර නොකළ නිසා තඹයකුදු නොගෙවන බව කියා සිටියේය.

''බලන්නකො මාස එකොළහක් වැඩ කරලත් මුදල් ගෙව්වෙ නැහැ නෙව! ඕක ඔහොම අතහරින්න පුළුවන්ද?'' ගොවියා ප්‍රශ්න කළේය.

''බැහැ. ඇත්ත වශයෙන්ම බැහැ!'' ව්ලදිමීර් ඉල්යිච් තීරණාත්මක ලෙස පැවසිය. ඔහු කාමරය තුළ සක්මන් කළේ කෝපයෙනි.

''අපි ඔය ගැන පාලක මණ්ඩලයට ලියමු. නීතිය අනුව වැඩකරන්ටයි කියල ඉල්ලා හිටිමු. නඩු මගට බසින බව කියා පොහොසතාට තර්ජනය කරමු'' යැයි ව්ලදිමීර් ඉල්යිච් පැවසිය.

මොහොතක් කල්පනා කොට තම ලියන මේසයට. ගොස් පැය බාගයකින් පෙත්සමක් ලියා ඔහු එය ගොවියා අත තැබීය. එය ගෙනයා යුත්තේ කොතැනටද, කතා කළ යුත්තේ කා සමගද, මොනවා ගැනද ආදී දේ ඔහු ගොවියාට විස්තර කර දුන්නේය.

''සාධාරණත්වය ඔහෙගෙ පැත්තෙ. පසු බහින්න එපා. පළමුවැනි පෙත්සම අහක දැම්මොත් ආයෙමත් ලියමු. නීත්‍යානුකූල ලෙස වැඩකරන තුරු අත් නොහරිමු. සාධාරණත්වය ඔහෙගෙ පැත්තෙ'' යැයි ව්ලදිමීර් ඉල්යිච් ගොවියාට කාරණා පැහැදිලි කර දෙමින් පැවසිය.

ගොවියා හිස්වැස්ම අතට ගෙන ස්තුති කළේය. බිම තබා තිබුණු මැටි බඳුන ගෙන නදේෂ්ද ක්‍රෘප්ස්කයා වෙත දිගු කරමින් මෙසේ කීය:

''කළගුණ සැලකීමක් වශයෙන් මේ වෙඬරු පිළිගන්න.''

"අනේ! අනේ! එහෙමත් පිළිගන්න පුළුවන්ද? මදෑ ඔහෙගෙ කල්පනාව!" නොසන්සුන්වූ ඈ කීවාය.

"එපා. වෙඩරු එපා!" ව්ලදිමීර් ඉල්යිච්ද කීවේය.

කළගුණ සැලකීමක් වශයෙන් දෙන තිළිණය ඔවුන් ප්‍රතික්ෂේප කරන්නේ මන්ද යන්න වටහා ගැනීමට ගොව්යා අපොහොසත් විය. පුදුම මිනිස්සු! ව්ලදිමීර් ඉල්යිච් පෙත්සම ලියා දුන්නා නෙවද? කට වචනයට පමණක් එම පෙත්සම ලියා දුන්නද?

දේශපාලන හිරකරුවකු වන ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව් පිළිබඳ සුහද හැඟීමක් ඇතිකර ගත් ගොව්යා පිටව ගියේය. ගොවීන්ට උදව්කළ ඔහු ෂුෂෙන්ස්කොයෙ ගමේ තමා ගත කළ පිටුවහල් ජීවිතය පිළිබඳ බොහෝ සුහද හැඟීම්ඇති කළේය.

## මැයි පළමුවැනිදා

ව්ලදිමීර් ඉල්යිච් පහුගිය අවුරුද්දේ මැයි දිනය ගතකළේ තනිවමය. මේ අවුරුද්දේ ඔහු සමග නදේෂ්ද ක්‍රෲප්ස්කයාද සිටින්නිය. මැයි පළමුවැනිද විප්ලවවාදී ලෙස උත්සවයක් පැවත්වීමට ඔවුහු ඉටා ගත්හ.

උදේ ආහාරයෙන් පසු ඔවුහු හොඳට ඇඳ පැළඳ ගත්හ. පිටුවහල් සිර දඬුවමක් ගත කරන පෝලන්ත ජාතික ප්‍රොමීන්ස්කිද මැයි දිනය නිමිත්තෙන් හොඳට ඇඳ කර පටියක් පවා පැළඳ සිටියේය. ඔහු ඔවුන් හමුවීමට පැමිණියේය:

"ඔබ දෙපොලට මැයි දින සුබ පැතුම්!"

තිදෙනම එක්ව පිටුවහල් සිර දඬුවමක් ගත කරන පින්ලන්ත ජාතික ඔස්කාර් එන්ග්බර්ග් හමුවීමට ගොස් ඔහුට සුබ පැතූහ.

එම වසරේ වසන්තය පමාවිය. ෂුෂා ගඟේ අයිස් කැට දියවී නැත. ඒවා එකිනෙකට හැප්පෙමින් තෙරපෙමින් යෙනිසෙයි ගඟට පාවිණි. අයිස් කැට එකටඑක හැප්පෙන හඬ ඇසිණි. මැයි දිනය ශීතල දවසක් වුවද, උත්සව සිරියක් පැවේය.

ඔස්කාර්ගේ ගෙදර බංකුවක් මත වාඩිවූ ඔවුහු මැයි සටන්කාමී ගීත ගැයූහ.

මැයි දිනයට ජයවේවා!<br>
ජනතා දුක නැතිවේවා!<br>
සාදුක හඬුළු හා හැමදෙන පිබිදෙව්,<br>
ධනපති යදම්න් රට දූය මුදවව්!

ඔවුහු මේ විධියට සටන්කාමී ගී සින්දු රාශියක්ම ගායනා කළහ.

ඔස්කාර් නැවතී සිටි ගෙදර උත්සව පැවැත්වීමෙන් පසු ඔව්හු තණ පිටියට ගියහ. ඈත සිට ගයන ''වර්ෂව්යාන්කා'' නැමැති විප්ලවවාදී ගීතයේ රාවය ඔවුන්ට ඇසිණි:

පිබිදෙව් පෙළෙන්නෝ කුසගින්නෙන්!  
පිබිදෙව් ලොවේ වහල්ලු!  
රෝසේ හඬයි යුක්ති කෝ  
බිහිවෙයි ලොවක් අළුතෙන්!

තණ පිටියේ පවත්වන ලද මැයි දින උත්සවය සටන්කාමී ස්වරූපයක් දැරීය. එදින ප්‍රීතිමත් දවසක් විය! රෑ බෝවන තුරුත් ව්ලදීමීර් ඉල්යිච්ට සහ නදේෂ්ද කෲප්ස්කයාට නිදගත නොහැකි විය. හැම දෙයක් ගැනම කතා කළහ. සිහින දුටහ. කම්කරු ජනතාව හා අනිකුත් වැඩකරන ජනතාව රතු කොඩි රැගෙන ගී ගයමින් පෙළපාලි යන දවසක් රුසියාවේ ඇති වේද?

පසු ද උදෑසන... මහ මග දූලි නගමින් දුවන අසුන්ගේ කුර ගැටෙන හඬ ඇසිණි. ෂුෂෙන්ස්කොයෙ ගමට පොලිස් නිලධාරියෝ සහ භටයෝ පැමිණියහ. අස්රියක් ව්ලදීමිර් ඉල්යිච් නැවතී සිටි ගේ අසල නවත්වන ලදී. කඩු පැළඳගත් පොලිස් භටයෝ දෙදෙනෙක් රියෙන් බිමට පැන්නාහ. පිටුපස ආසනයේ වාඩිවී සිටි මහත මිටි පොලිස් නිලධාරියාට රියෙන් බැසීමට ආධාර කරන ලදී.

ව්ලදීමිර් ඉල්යිච්ගේ කාමරයට වැදුණු පොලිස් නිලධාරියා ''පරීක්ෂා කරන්ට ආවා!'' යැයි කියමින් පොත් රාක්කය අසලට ගියේය.

පොත් රාක්කය තුළ නීති විරෝධී පොත්ද, නීති විරෝධී ලිපි හා ලියුම්ද, රහස් සංඥ අනුව ලිපි ලිවීම සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ආදියද ඇති බැවින් පොලීසියට අසුවුණොත් පිටුවහල් සිර දඬුවම තවත් වැඩි වනු ඇත. සමහර විට එම කාලය අවුරුදු කීපයකින් වැඩිවීමට ඉඩ තිබේ.

පොත් රාක්කය අසල පුටුවක් තැබූ ව්ලදීමිර් ඉල්යිච් ''කරුණාකරල උඩ ඉඳල පටන් ගන්නැ''යි පොලිස් නිලධාරියාට කීවේය.

පොලිස් භටයින් දෙදෙනාගේ ආධාරය ඇතිව හුස්ම ඉහළට ඇද ගනිමින් නිලධාරියා පුටුවට නැග ගත්තේය. පොත් රාක්කයේ උඩ සිට සොයාබැලීමට පටන් ගන්නා ලදී. පොත් ගොඩ විශාලය.

අඩ පැයක්, පැයක් පමණ පොත් පරීක්ෂා කළ පොලිස් නිලධාරියාට හති වැටිණි. භටයින්ට සොයා බැලීම කරන ලෙස දන්වා ඔහු වාඩිවිය. ඔහුට මහන්සියක් හා කාන්සියක් දැනිණි. සිය ගණනක් පොත්වල පිටුවෙන්

පිටුව පෙරළා බැලීම ලෙහෙසි වැඩක් නොවේ. පොලිස් නිලධාරියාට පොත් ගොඩ දෙස බැලීමට පවා සිත් නොදේ. වේලාව ගෙවී ගියේය.

පොත් රාක්කයේ පහළ තට්ටු පමණකි, ඉතිරිව ඇත්තේ. උල්යානොව් අඹු සැමි යුවළගේ ඉරණම දූන් දූන් අවදානමට මුණ පානු ඇත.

නදේෂ්ද කෘෘප්ස්කයා මඳ සිනහ පාමින් ඉදිරියට ආවාය:

''මෙතන මගේ පාසල් පොත්. මම පාසල් ගුරුවරියක්'' යැයි ඇ කීවාය.

''නවත්වාපල්ලා!'' යැයි කී පොලිස් නිලධාරියා අතක් වැනීය.

ඔහුට බඩගිනිය. වොඩ්කා වීදුරුවක් බීමට ඔහුට වුවමනා විය. ඔහු විඩාවෙනි.

පහළ තට්ටුවේ ඇති පොත් පෙරළා බැලීමට ඔන්න මෙන්න කියා තිබියදී පරීක්ෂණය නවත්වන ලදී. පහළ තට්ටුවේ නීති විරෝධී, රහස් ලියුම් සහ රසායනික ද්‍රව්‍ය තබා ඇත...

පොලිස් නිලධාරියා සහ භටයෝ දෙදෙන පිටව ගියහ.

පරීක්ෂණය අවසන් වන තුරු යාබද කාමරයට වී සිගරැට් බොමින් සිටි එලිසවේටා වසිලෙව්නා ඇතුළුවූවාය.

''අහු වුණාද?'' පහත් හඬින් ඇ ප්‍රශ්න කළාය.

''අහු වුණා! නැහැ මේ වතාවේ නොවේ'' යැයි ව්ලදිමීර් ඉල්යිච් සිනහ පාමින් පිළිතුරු දුන්නේය.

## අනටෝලි වනේයෙව්

සතියකට දෙවරක් ඔවුන්ට ලියුම් ගෙනෙන ලදී.

නැයෝ සහ සහෝදරවරු ලිපි එවූහ. ''සටන්කාමී සංගමයේ'' සාමාජිකයෝ පිටුවහල් සිර දඬුවම ලැබ එකිනෙකාට වයෝර්ස්ට් පනහ සියය බැගින් දුර බැහැර පෙදෙස්වල වාසය කළහ. සමහරු තවත් ඈතද, අන් සමහරු බොහෝ ඈත පෙදෙස්වලද, සදාකාලික හිමෙන් වැසි පෙදෙස්වලද තම සිර දඬුවම ගත කළහ.

තම වැඩිමහල් සොහොයුරිය වන ආන්නා උල්යානොවාගෙන් පාර්සලයක් වරක් ව්ලදිමීර් ඉල්යිච්ට ලැබිණි. කලින් තීරණය කර ගත් කුඩා සංඥාවක් අනුව එහි රහස් ලිපි ඇති බව ඔහු දැනගත්තේය. රසායනික බෙහෙත් යොදා බැලූ විට එය රහස් ලිපියක් බව පෙනිණි.

ඔහු කියවන්නට විය. ඔහුට නොදැනුවත්ම ඔහුගේ ඇස් බැම් ඉස්සී රැළි වැටුනේ අසතුට පළකිරීමටය. ආන්නා අක්කාගේ ලිපිය ඔහු සිත් නොගති. ඇ එම ලිපිය ''ක්‍රිඩෝ'' යන නමින් හැඳින්වූවාය. එහි තේරුම විශ්වාසය හෙවත් දෘෂ්ටියය.

මාක්ස්වාදයට විරුඬ මිනිසුන් කණ්ඩායමක් රුස්වී තිබෙන බවත්, සංඛ්‍යාවෙන් කුඩා වුවද ඔවුන් ඝෝෂා කරන බවත් ඇගේ එම ලිපියේ සඳහන් විය. ඔවුන්ගේ දේශපාලන දෘෂ්ටිය කුමක්ද? කම්කරුවන්ට දෙශපාලනයෙන් වැඩක් නැත. ඔවුන්ට විප්ලවය අවශ්‍ය නොවේ. ඔවුන්ට වුවමනා එකම දෙය වැටුප් වැඩියෙන් ලබාගැනීමය. ඒ සඳහා කම්කරුවෝ ධනපතීන් හා කම්හල් හිමියන් සමග සමාදනයෙන් විසිය යුත්තාහ.

මේ දෙශපාලන දෘෂ්ටිය ''ආර්ථිකවාදය'' නමින් හඳුන්වනු ලැබීය.

''මොනවා කරන්ටද? '' ව්ලදිමීර් ඉල්යිච් හඬනගා කියමින් කල්පනා කරන්නට විය. ''ඔවුන් විප්ලවවාදී මාවතෙන් කම්කරුවන්ව ඉවත් කරන්ට හදනවා!''

ව්ලදිමීර් ඉල්යිච් සමහර දවස්වලදී හඬනගා කල්පනා කරන බව නදේෂ්ද කෲප්ස්කයා දත්තිය. ඔහුට බාධා නොකළ යුතුය. ඔහු තීරණය ගැනීමෙහි සමත් වෙයි.

ඈ සිතුවා නිවැරදිය. ඔහු කාමරය තුළ ඔබ මොබ ඇවිදිමින් ගතයුතු තීරණය ගැන කල්පනා කළේය:

''සහෝදරවරු කැඳවා තීරණයක් ගනිමු. 'ක්‍රිඩෝ' සංවිධානය ගැන සාකච්ඡා කළ යුතුය. අපේ විරුඬත්වය ප්‍රකාශ කරන ආයාචනයක් රහසේ හැම කම්හලක් හා වැඩපොළක් පාසාම යැවිය යුතුය.

දෙදෙනම එකතුව පිටුවහලේ සිටින සහෝදරවරුන්ට ලියමින් එක්රුස්වීම සඳහා සුදුසු කරුණක් සොයාගෙන නිලධාරීන්ගෙන් අවසර ගෙන සූදනම් වන ලෙස දැන්වූහ. රුස්වීම පවත්වන්නේ කොහිද? ඉතාම හොඳ තැන ෂුෂෙන්ස්කොයෙ ගම බවට තීරණය විය. එහෙත් ෂුෂෙන්ස්කොයෙ ගමට වඩා යෙර්මකොව්ස්කොයෙ ගම යෝග්‍ය බව ව්ලදිමීර් ඉල්යිච්ගේ අදහස විය. එගම ෂුෂෙන්ස්කොයෙ ගමින් වියෝර්ස්ට් හැටක් දුරින් පිහිටියේය. ව්ලදිමීර් ඉල්යිච්ගේ මිතුරකුවූද, ''සටන්කාමී සංගමයේ'' සාමාජිකයෙකුවූද අනටෝලි වනේයෙව් පිටුවහල් සිරදඬුවම ගත කළේ යෙර්මකොව්ස්කොයෙ ගමේය. ඔහු සිරගෙදරදී බරපතල ලෙස ක්ෂය රෝගයට ගොදුරු වූයෙන් දැන්, අසාධ්‍ය තත්ත්වයක පසුවිය. ඔහුට ලෙඩ ඇඳෙන් නැගිටීමට පවා බැරිවිය.

ව්ලදිමීර් ඉල්යිච් රුස්වීම එම ගමේ පැවැත්විය යුතු බව කියා සිටියේ මේ හේතුව නිසාය.

වනේයෙව් සුදු පැහැති මෙට්ටයක් හා කොට්ට මත වැතිර සිටියද ඔහු සුදු රෙද්දටත් වඩා සුදුමැලිය, මලානිකය, කෙට්ටුය. ඔහුගේ ඇස්වල රෝගීමය කාන්තියකි. එහෙත් අනටෝලි වනේයෙව් ප්‍රීතියෙනි, සතුටිනි.

ඔහු ව්‍යාපාරයේ කටයුතු කරයි. ජීවත්වීමට, වැඩ කිරීමට, පොදු ජනතාවට සේවය කිරීමට ඔහු තුළ ඇත්තේ ඉමහත් ආශාවකි.

''ක්‍රිඩෝ'' නැමැති ආර්ථිකවාදී දේශපාලන මතය ගැන සාකච්ඡාකොට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමේ පෙත්සමට අත්සන් තබන ලදී. ඈත සයිබීරියාවේ විප්ලවවාදී ආයාචනය නගරවල කම්කරුවන් අතර බෙදහරිනු ඇත.

''සහෝදරවරුනි! ආර්ථිකවාදීන්ට කන් නොදෙන්න. අපට ඇත්තේ එකම විප්ලවවාදී මගක් පමණකි!''

රැස්වීමෙන් පසු ව්ලදිමීර් ඉල්යිච් ඉවත නොගොස් වනේයෙව්ගේ ඇඳ අසලින් වාඩි විය. තවත් දුබලවූ වනේයෙව් දහඩියෙන් තෙමී සිටී. දෙනෙත් සුදුමැලිය, ගිලී ගොසිනි.

අසරණ වනේයෙව් සාර් පොලිසියේ වධ බන්ධනවලට ගොදුරුව මාරක රෝගයකට බිලිවිය. වියලි දර කෝටුවක් වැනි ඔහුගේ අතක් තම අතින් ගත් ව්ලදිමීර් ඉල්යිච් එය සෙමින් පිරි මැද්දේය. ඔහු සමග අනාගත වැඩ කටයුතු ගැන සාකච්ඡා කළේය. පිටුවහල් සිර දඬුවම ඉක්මනින් ගෙවී යනු ඇත. ඉන්පසු කරන වැඩ ගැන ඔහු වනේයෙව්ට කීවේය. මාක්ස්වාදී කම්කරු පක්ෂයක් ගොඩ නගමු. අපේ නිර්ධන පංති පුවත් පතක් මුද්‍රණය කරමු. සාර්වාදයට එදිරිව සටන් කරමු.

වනේයෙව් මහත් ආශාවකින් හා වුවමනාවකින් ඔහුගේ කතාවට සවන් දුන්නේය. අගෝස්තු මාසයේදී සයිබීරියාවේ හවස හිරු බැස යන්නේ පමාවෙලාය. ඇදිර පැතිරිණි. ඈත ගොවි ගෙවල්වලින් ඇකෝඩියන් හඬ පැතිරිණි. අධික උණ නිසා වියලී පිපිරි ගිය දෙතොල් මතුරමින් පහත් හඬින් වනේයෙව් කතා කළේය.

''ව්ලදිමීර් නුඹට ස්තුතියි. නුඹ මට අමුතු පණක් ලබා දුන්නා. මා විශ්වාස කරනවා...''

අනටෝලි වනේයෙව්ගේ අවසාන ප්‍රීතිමත් සැන්දෑව එය විය.

සති තුනක් ගතවීමට පෙර මිය ගිය අනටෝලි වනේයෙව්ගේ සිරුර භූමදාන කරනු වස් ව්ලදිමීර් ඉල්යිච් හා නදේෂ්ද ක්‍රෑප්ස්කයා පැමිණියහ.

අනටෝලිගේ මළ සිරුර ඉදිරියේ සමුගත් ව්ලදිමීර් ඉල්යිච් මෙසේ පැවසීය:

''සොහොයුර අනටෝලි, ඉදිරියටත් අපි විප්ලවවාදී ව්‍යාපාරයේ නොකඩවා ක්‍රියා කරන්නෙමු.''

ශීත සමය ළං වී ඇති බව කියන නැවුම් හිම පියලි මළ සිරුරේ මුහුණ මත වැටුණද දිය නොවීය.

ලෝහමය පුවරුවක් ඔහුගේ සොහොන මත ව්ලදිමීර් ඉල්යිච් විසින්

සවි කරන ලදී. ''දේශපාලන සිරකරුවකුවූ 27 හැවිරිදි අනටෝලි අලෙක්සාන්ද්‍රවිච් වනේයෙව් 1899 සැප්තැම්බර් 8 ද මිය ගියේය. ඔබේ හිතවත් සගයා සමාදනයේ සැතපේවා.''

## නිදහස!

ගෙතුළ සිදුවූ දේ වටහා ගත නොහැක. මලු, පොත් මිටි, ආදී දේ හැම කාමරයකම ඇත. අවුල් ගොඩකි.

එලිසවේටා වසීලෙව්නාගේ අත් උදවුකාරිය වන උපුල්වන් ඇස් ඇති පාෂා උණු කඳුළු වගුරවමින් අඬන්නීය. පිටුවහල් සිර දඬුවම අවසානවූ බැවින් උල්යානොව් යුවළ පිටත්ව යාමට සැරසෙති.

ජනවාරි විසිනව වෙනිද හිරු උදවන්නටත් කලින්, ෂුෂෙන්ස්කොයෙ ගමේ ගම්වාසීන් තවම නිදිබරව සිටියදී, මුළු තැන් ගෙවල දුම්බටවලින් උදැසන දුම්වළා පිටවන්නටත් කලින්, අහස අඳුරු පැහැයෙන් තිබියදී උල්යානොව් යුවළ නැවතී සිටි ගෙදර සමීපයේ හිම යානා දෙකක් නවත්වන ලදී. හැම තැනම දුවමින් උදව් කරන පාෂා ඒප්‍රනයෙන් කඳුළු පිසදමා ගත්තාය. ව්ලදිමීර් ඉල්යිච් පොත් මිටි හා මලු ආදිය හිම යානයට ගෙන ගියේය. හැම කෙනෙක්ම ඔවුන්ට උදව් කළහ.

''දුර ගමනක් යන්ට ඉස්සෙල්ලා මොහොතක් වාඩි වෙන්ට ඕන'' යැයි කී එලිසවේටා වසීලෙව්නා වාඩි වුණාය.

අනිත් අයද ඈ අනුව යමින් නිහඬව වාඩිවූහ.

''දැන් ඉතින් ගමන් අරඹමු!'' කී ව්ලදිමීර් ඉල්යිච් නැගිට සිටියේය.

සයිබීරියාවේ ශීත සමය දැඩිය. හිම කබා වලට උඩින් අඳින දෙහී නැමැති විශේෂ හිම කබා පොරවා ගැනීමට ව්ලදිමීර් ඉල්යිච් කාන්තාවන්ට උදවු විය.

''ව්ලදිමීර් ඉල්යිච් ඔහෙට දෙහී හිම කබායක් නැති නිසා සීතල හැදේවි!'' යැයි ඔහුගේ නැන්දම්මා වන එලිසවේටා වසීලෙව්නා කීවාය.

''නිදහස ලැබුණු ප්‍රීතිය නිසා මගෙ ඇඟ රත්වෙලා. සයිබීරියානු ශීතලට මාව මෙල්ල කරන්න බැහැ.''

''අත්වල ඇඟිලිවත් උණුසුමට තබාගන්ට මුප්ටියවත් ගන්න!''

ඔහු සිනාසී කාන්තාවන් භාවිතා කරන හිම කවරයක්වූ මුප්ටිය රැගෙන හිම යානයට නැංගේය. අශ්වයෝ හිම යානා ඇදගෙන දුවන්නට වූහ.

ඔවුහු ෂුෂෙන්ස්කොයෙ ගම පසුකර සඳහටම ගියහ. අහස කෙමෙන් පැහැදිලි වෙන්ට පටන් ගති. නැග එන හිරුගේ රැස් වලින් නැගෙනහිර

අහස ලා රත් පැහැයක් ගත්තේය. වළාකුළුවල රිදී රේඛා පෙනිණි. හිරු අඳුර දුරු කරමින් තේජාන්විත ලෙස අහස ගත්තේය.

නිදහස ලැබූ ව්ලදිමීර් ඉල්යීච්ගේ සිත ප්‍රීතියෙන් පිනා ගියේය. සිර අඩස්සියෙන් නිදහස ලැබූ පළමුවැනි දවස! පාලකයන් බොරු චෝදනා ඉදිරිපත් කරමින් පිටුවහල් සිර දඬුවම් කාලය දිගු කරතියි බියවූ ව්ලදිමීර් ඉල්යීච් පසුගිය කාලයේදී කෙට්ටු වෙන්නට පටන් ගත්තේය.

ඔහු නිතර නිතර කල්පනා කළේ එක් දෙයක් ගැනය, එනම් පක්ෂය හා එය ප්‍රතිසංවිධානය කිරීම ගැනය. ඔහු පිටුවහල් සිර දඬුවම ගත කරන කාලයේදී, 1898 දී මින්ස්ක් නගරයේදී පක්ෂයේ පළමුවැනි සම්මේලන වාරය පවත්වන ලදී. එහෙත් පක්ෂයේ හැම සංවිධායකයකුම පාහේ ආණ්ඩුව සිරභාරයට ගත්තේය. පක්ෂය නැවත සංවිධාන කළ යුතුය. මේ සඳහා ගතයුතු පළමුවැනි පියවර පුවත්පතක් ආරම්භ කිරීමය. එය රහසේ මුද්‍රණය කොට බෙද හරින මාක්ස්දීවා පුවත්පතක් විය යුතුය. රුසියාවේ ප්‍රගතිශීලී හැම කොටසක්ම එක්සත් කිරීම මේ පුවත්පතට අයත්ය. ව්ලදිමීර් ඉල්යීච් කල්පනා කළේ මේ කාර්‍යය ගැනය.

මහ මග ඔස්සේ හිම යානා වේගයෙන් දිව්වේය. තැපැල් ස්ථානවලදී නවත්වා අලුත් අසුන් ලබාගෙන නැවත ගමන් ඇරඹූහ. සමහර විට ආහාර ගැනීම සඳහා හිම යානා නවත්වන ලදී. සයිබීරියානු ජාතික ආහාරයක්වූ පිල්මේනි ගෙන ඒමට අමතක වීම නිසා ඔවුහු කනගාටු වූහ. දැඩි ශීතට අසුව කොට්ටන් ඇට මෙන් ඝන වන පිල්මේනි රසවත් ආහාරයකි. රට ළූනු, ගම්මිරිස් ආදිය යොදා පිළියෙල කරන මේ ආහාර වර්ගය, හිම කුණාටුවලට මුණ පාමින් දුර ගමන් යන විට ඉතා අගනා රසවත් ආහාරයක් ලෙස පාවිච්චි හැකිය. පිල්මේනි ගෙනඒමට අමතක වීම දොම්සනට හේතු විය!

මිනුසින්ස්ක් නගරය බොහෝ ඈතය. මිනුසින්ස්ක් සිට වයෝර්ස්ට් තුන් සියයක් පමණ දුර ගිය පසු අචින්ස්ක් නගරය හමුවේ. දිවා රෑ දෙක්හි ඔවුහු හිම යානාවලින් ගමන් කළහ. හිරු එළිය සහිත දවස් පැහැදිලිය, අහස නිල් පැහැතිය. තුරු අතුවල හිම කැට අයිස් කරල් බවට පත්වී හිරු එළියේ කාන්තිය ලබමින් දිලිසේ. රාත්‍රිය සඳ පහනෙන් බැබළේ. විශාල ගෝලාකාර සඳ තරු අතරින් ගමන් කරන නෞකාවක් මෙනි. හිම යානා ඇදගෙන දුවන විට හඬ නගන කුඩා සීනුවල හඬ රාත්‍රියේදී වඩාත් ප්‍රිය බවක් ගෙනදේ.

පස් දවසක ගමනින් පසු හිමිදිරි පාන්දර ඔව්හු අචින්ස්ක් නගරයට ළඟා වූහ.

දුම්රිය ස්ථානයේ සීනුව හඬ නැගීය. දුම්රියක් එන බවට සංඥවකි.

දුම් ගුළි පිටකරමින්, මගීන් සහිත මැදිරි කීපයක් ඇදගෙන ස්ථානයට පැමිණි දුම්රිය යන්ත්‍රය බිම් අභුරු අළු වලින් හා තෙලින් නැවී ඇත. විනාඩියක් ගතවිය. නැවත දුම්රිය ස්ථානයේ සීනුව හැඬවිණි. බොහෝ කල් බලාපොරොත්තු වූ සිහිනය සැබෑවිය. ඉදිරියේ නව ජීවිතයකි.

## ගිනි පුපුර

සයිබීරියාවේ ගැඹුරු ආකරවල
ඔබේ ප්‍රෞඪ ඉවසීම තැන්පත් කරන්න
උසස් සිතැඟියාවන් හා
දුකින් පිරි ශ්‍රමය අපතේ නොයනු ඇත.

සාර්ගේ දුෂ්ට පාලනයට එදිරිව නැගී සිටි දෙසැම්බර්වාදී විප්ලවකාරීන් නෙර්චින්ස්කි ආකරවල වහල් වැඩට යැවූ විට රුසියානු මහා කවි පූෂ්කින් ඔවුන් ඇමතුවේ එලෙසය. දෙසැම්බර්වාදී කවියකු වූ ඔදොයෙව්ස්කි පූෂ්කින්ට මෙසේ පිළිතුරු යැවීය:

දුකින් පිරි ශ්‍රමය අපතේ නොයනු ඇත:
ගිනි පුපුරකින් මහ ගිනි පැන නගිනු ඇත!

ව්ලදිමීර් ඉල්යීච් තම පුවත්පතට ''ඉස්ක්‍රා'' හෙවත් ගිනි පුපුර යන නම තැබීය.

ඔහු ෂූෂෙන්ස්කොයෙ ගමේ සිටි කාලයේදී පුවත්පත පිළිබඳ හැම දෙයක්ම කල්පනා කොට ඇත. දැන් ඉතිරිව ඇත්තේ පුවත්පත නිර්මාණය කිරීම පමණකි. සයිබීරියාවේ සිට පැමිණි ව්ලදිමීර් ඉල්යීච් තනිවම ප්ස්කොව් හි පදිංචි විය. ඔහුගේ බිරිඳ නදේෂ්ද ක්‍රෘප්ස්කයා පිටුවහල් සිර දඬුවම ගෙවා අවසන් කොට නැති බැවින් ඇට එම කාලය ගෙවීම සඳහා උපා නගරයට යාමට සිදුවිය. ප්ස්කොව් නගරයේ පදිංචි වීමට ආණ්ඩුව ඔහුට බලය දෙන ලදින්, ඔහු එහි නැවතී (''ගිනි පුපුර'') ''ඉස්ක්‍රා'' පුවත්පත පිළිබඳ කටයුතු සංවිධාන කරන්නට විය. ලිපි හා වාර්තා ලියන ලේඛක පිරිසක් සංවිධාන කළ යුතුය. පුවත්පත බෙදහැරීම සඳහා ඒජන්තවරුන් සොයා ගත යුත්තේ, සාමාන්‍ය පුවත්පතක් මෙන් කඩවල තබා විකිණීමට අවසර නොදෙන බැවිනි. එසේ කළහොත් නැවත සිරගෙට නියම වනු ඇත. බෙද හැරිය යුත්තේ රහසිනි. බෙද හැරීම සඳහා සංවිධානයක් ඇති කළ යුතුය. පුවත්පතේ නඩත්තුව සඳහා මුදල් සොයා ගත යුතුය. ඔහු මුදල්ද සොයා ගත්තේය.

හැම දෙයක්ම සූදානම්ය. මාස හතරකදී ඔහු කළ වැඩ කන්දක් පෙරළා දැම්මාක් වැනිය.

''ඉස්ක්‍රා''ව මුද්‍රණය කළ යුත්තේ කොහිද? එවැනි පුවත්පතක් මුද්‍රණය කිරීම රුසියාව තුළ කළ හැකිද? සාර්ට විරුද්ධව, රදළයින්ට, ධනපතීන්ට හා පොලිස් නිලධාරින්ට විරුද්ධව එවැනි පුවත්පතක් පළකිරීමට ඔවුන් අවසර නොදෙනු ඇත. රුසියාව තුළ එය මුද්‍රණය කිරීම නොකළ හැක්කකි! එසේනම් මුද්‍රණය කරන්නේ කොහිද?

ව්ලදිමීර් ඉල්යිච් මේ ගැන සිතමින් වෙහෙසෙන්නට විය.

සහෝදරවරුන් සමග සාකච්ඡාකොට ඔවුන්ගේ උපදෙස් ලබාගත්තේය. හැම අංශයක් ගැනම සාකච්ඡාකොට පුවත්පත මුද්‍රණය කිරීම විදේශීය රටක කළ යුතු බව තීරණය කළහ. එහි පවා එවැන්නක් කළ යුත්තේ රහසේය. එසේ වුවද, විදේශීය රටවල රුසියානු පොලිස් ඔත්තුකරුවන්ගේ සංඛ්‍යාව අල්පය.

ප්‍රතිකාර ගැනීම පිණිස පිටරට යාමට වුවමනා සහතික වෙදුන්ගෙන් ලබාගත් ව්ලදිමීර් ඉල්යිච් තම බිරිඳගෙන් සමු ගැනීම පිණිස ඇය හමුවීමට ගියේය. නදේෂ්ද ක්‍රෘප්ස්කයා තව තව මසක් පිටුවහලේ ගත කළ යුතුය. දැන් ව්ලදිමීර් ඉල්යිච් රුසියාවෙන් පිටවී දුම්රියකින් ගමන් කරයි. බොහෝකල් ඔහුට පිටරට ජීවත්වීමට සිදුවේද? ඔව්. ඔහු බොහෝ කාලයක් පිටරට වාසය කළේය.

...ජර්මනියේ ලයිප්සිග් නගරය පටු වීදි වලින්ද, උග්‍ර කෝණාකාර පියසි වලින්ද, කම්හල් බොහෝ ගණනකින්ද, එයටත් වඩා වැඩි ගණනක් ලොකු කුඩා පොත් සාප්පුවලින්ද ගහණ නගරයකි. ගෙර්මන් රාවු නැමැති ජර්මන් ජාතිකයෙක් ලයිප්සිග්හි වාසය කළේය. තිස් පස් හැවිරිදි ඔහු නගරාසන්න කුඩා ගමක මුද්‍රණාල හිමියකි. ඔහුට අත්වූයේ එක් මුද්‍රණ යන්ත්‍රයක් වුවද එය විශාලය. කම්කරු ක්‍රීඩා පුවත්පතද, තවත් දැන්වීම් ආදියද එහි මුද්‍රණය කරන ලදී.

ගෙර්මන් රාවු සමාජ-ප්‍රජාතන්ත්‍රවාදියෙකි. රුසියාවේ සිට මාක්ස් වාදියකු පැමිණි බවත්, රුසියානු මාක්ස්වාදීන් පුවත්පතක් මුද්‍රණය කිරීමට තීරණය කර ඇති බවත්, ලයිප්සිග් නගරයේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු ඔහුට දැන්වූහ. ''ඉස්ක්‍රා'' හෙවත් ගිනි පුපුර පුවත්පතේ පළමුවැනි කලාපය ලයිප්සිග් නගරයේ මුද්‍රණය කිරීමට තීරණය විණි.

''රුසියානු සගයින්ට ආධාර කළ යුතුයැ''යි ලයිප්සිග්හි සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු ගෙර්මන් රාවුට දැන්වූහ.

රුසියාවේ සිට පැමිණි මාක්ස්වාදියා අනිකකු නොව ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව්ය. ඔහු ලයිප්සිග් නගරාසන්නයේ ගෙයක පදිංචි විය, දිනපතා

හිරු උදාවීමට කලින් නැගිට්ටේය. අවට ඇඳිරිය. කම්හල් වල නළා හඬ පවා නැසේ. කාමරය තුළ ශීතලය. තෙතමනය සහිත දෙසැම්බර් මාසයේ කාල ගුණය අහිතකරය.

භූමිතෙල් ලිපෙන් තේ උණු කරගත් ව්ලදිමීර් ඉල්යිච් එය ඇලුමිනියම් කෝප්පයකට වත්කොට ගෙන බී, ගෙර්මන් රාවුගේ මුද්‍රණාලය සොයා ගියේය. යා යුතු දුර ප්‍රමාණය හැතැප්ම හතරක් පමණ විය. මගීන් ගෙන යන අශ්ව කරත්ත හෝ හිම යානා හෝ නොතිබිණි. ඔහු පයින්ම ගමන් කළේය. පයින් ගමන් කරන්නෝද, බයිසිකල් වලින් යන කම්කරුවෝද ඒ මේ අත ගියහ. ගොවියෝ කරත්තවල එළවුළු හා පලතුරු පටවාගෙන වෙළඳ පොළවල් බලා ගියහ. ව්ලදිමීර් ඉල්යිච් නගර සීමාව දක්වා ගමන් කළේය. ඉදිරියේ ඇති පාළු බිම හිමෙන් පිරිලාය. තරමක් ඈතින් ඇති කැලෑව කළු පැහැතිය. ගම්වල පහන් ආලෝකය පෙනිණි. ගෙර්මන් රාවුගේ මුද්‍රණ යන්ත්‍රාලයේ කවුළු අතරින් භූමිතෙල් ලාම්පුවක ආලෝකය ඔහු ගේ නෙතට හසුවිය.

ගෙර්මන් රාවුගේ මුද්‍රණාලය එක් විශාල කාමරයකින් යුක්ත විය. ඉන් අඩක් පරණ මුද්‍රණ යන්ත්‍රයට වැසී ඇත. අකුරු අමුණන ලාච්චු දෙකක්ද එහි තිබිණි. යකඩ ලිපේ දර කෝටු 'පට''පට' යන හඬ නගමින් පුපුරමින් ගිනි මැලය වැඩි කරයි.

''අද බොහොම වැදගත් දවසක්'' ව්ලදිමීර් ඉල්යිච් ගෙර්මන් රාවු අමතා පැවසීය.

ඔහු හිස වැනීය. ඔව් සැබැවින්ම අද වැදගත් දවසකි. මෙතෙක් පුවත්පත පිළියෙල කිරීම සඳහා සූදානම් විය. එහෙත් අද...

අකුරු අමුණා පිළියෙල කොට ඇති යකඩ රාමුව මුද්‍රණ කම්කරුවෙක් යන්ත්‍රයට ගෙන ගියේය. එය යන්ත්‍රය මත තබා අතින් යන්ත්‍ර ක්‍රියා කරවනට විය. යන්ත්‍රය හඬ නගා වරක් භ්‍රමණය වෙත්ම, එක් පැත්තකින් මුද්‍රණය වුණු පුවත්පත් පිටුවක් එළියට ආවේය. එහි මුද්‍රණ තීන්ත තවම වේලී නැත. ''ඉස්ක්‍රා'' පුවත්පතේ පළමුවැනි කලාපය මුද්‍රණාලයෙන් පිටවිය. ව්ලදිමීර් ඉල්යිච් පතක් අතින් ගෙන එදෙස බොහෝ වේලාවක් බලාගෙන සිටියේ තමා දුටු එක් සිහිනයක් සැබෑවූ බැවිනි!

''අපට අපේම කම්කරු විප්ලවවාදී පුවත්පතක් තිබෙනවා! එය මව් බිමට පියාඹා ගියාවේ. ජනතාවගේ හදවත් හා බුද්ධිය අවදිකොට ඔවුන් විප්ලවය කරා ගෙනෙන්න!''

ව්ලදිමීර් ඉල්යිච් පුවත්පතේ නම හඬනගා කීවේය:

''ඉස්ක්‍රා.''

පුවත්පතේ ඉහළ දකුණු කෙළවරේ ලොකු අකුරින් මෙසේ මුද්‍රණය කර තිබිණි:

''ගිනි පුපුරකින් මහ ගිනි පැන නගිනු ඇත.''

## ලෙනින්

මගීන් ගෙනයන දුම්රියක් ජර්මනියේ කෙනිස්බර්ග් නගරයට ළඟා විය. තුන්වැනි පංතියේ දුම්රිය මැදිරියක කවුළුවක් අසල අසුනක වාඩිවී සිටි තරුණ මගියා නිදිකිරා වැටෙයි. මියුනික් නගරයේ සිට දුම්රියට නැගගත් ඔහුගේ දෙපා ළඟ ලොකු බෑගයකි.

කෙනීස්බර්ග් පැරණි නගරයකි. රතු උළු සෙවිලි කළ වහළවල් සහිත ගෙවලින්ද, දේවස්ථාන වලින්ද, ගලින් කළ බලකොටු වලින්ද පිරි මේ නගරයට බෝල්ටික් මුහුදේ සහ වරායේ හඬ ඇසේ. වරායේ නවතා ඇති නැව්වලින් එකක් ''ශුඩවූ මගීරීතාය''.

මියුනික් නගරයෙන් පැමිණි ජර්මන් ජාතිකයා වරායට නොගොස් ළඟම ඇති බීර තැබෑරුමකට පැමිණියේය. උමඟක පිහිටි එහි ජනයා බොහෝ වූහ. දුම්කොළ සුවඳින් වාතය අප්‍රිය බවක් ගෙනදිණි. මියුනික් නගරයෙන් පැමිණි ජර්මන් ජාතිකයා හිස් මේසයක් අසල වාඩිවී, තම අත වූ බෑගය මේසය යට තැබීය. ලිංගුස් හා ගෝවාද, බීර වීදුරුවක්ද මිළදී ගෙන ඔහු සෙමින් සෙමින් කෑවේය, බීවේය. බැලූ බැල්මට ඔහුට වැඩක් නැතිවාක් මෙනි. සමහර විට ඔහු කිසිවකු බලපොරොත්තුවෙන් සිටිනවා විය හැකිද? ඔව්, එසේය. ඔහු ''ශුඩවූ මගීරීතා'' නැවෙන් නැවියකු එන එනතුරු බලා සිටී. මේ නැවියා හමුවීම පිණිස ඔහු මියුනික් නගරයෙන් පැමිණියද, ඔවුන් මීට පෙර මුණ ගැසී නැත. තැබෑරුමට ඇතුළු වන හැම මිනිහා දෙසම මහත් වුවමනාවකින් බලන මියුනික් නගර වැසියා දකුණතින් හිසකේ පිරිමදියි. කීප වරක්ම දකුණු කනට උඩින් පිහිටි හිසකේ වැටිය අත ගායි. සැබැවින්ම කිසිවෙක් ඔහුගේ මේ ක්‍රියාව ගැන සැලකිලි නොදක්වූහ. මිනිහෙක් තම හිසකේ පිරිමැදීමේ විශේෂතාවයක් තිබේද? එහෙත් මියුනික් නගර වැසියා එය කළේ සංඥවක් හැඟවීම පිණිසය.

හිරු එළිය නිසා දුඹුරු පැහැගෙන ඇති හමක් ඇති නැවියෙක් තැබෑරුමට ඇතුළු වී වට පිට බැලීය. ඔහු දෙස බලමින් දකුණතින් දකුණු කන ඉහළ හිසකේ වැටිය පිරිමදින ජර්මන් කාරයා දැක, ඔහු වාඩිවී සිටි මේසය අසල පුටුවක වාඩිවිය. බෑගයට පයකින් තට්ටු කළ නැවියා මෙසේ කීය:

''මාර කුණාටුවක් නෙව.''

''නැව යන දිහාවට කුණාටුව හමනවා නම් නරක නැහැ.''

''හරියට හරි සහෝදරය, නැව යන දිහාවට.''

එකිනෙකා නොවරදවා හැඳින ගැනීම පිණිස මෙය කලින් පිළියෙල කරන ලද රහස් සංඥා විය. ඉන්පසු ඔවුහු සොහොවුරන් මෙන් හැසුරුණහ. ඔවුන් බීර තැබෑරුමට පැමිණියේ පොදු කටයුත්තක් සඳහාය.

ඉක්මනින්ම සාකච්ඡාව හමාර කළ ඔවුහු තැබෑරුමෙන් පිටවූහ. මේ වර බෑගය අතින් ගත්තේ මියුනික් නගර වැසියා නොව, නැවියාය. වෙනස කිසිවෙක් නොදුටහ. ඔවැනි දේ ගැන කවුරු බලත්ද? මිතුරෝ දෙදෙනෙක් කිසිවක් ගැන කතා කරමින් ගමන් කරති. හතර මං හන්දියකදී ඔවුහු එකිනෙකාගෙන් සමු ගත්හ. මියුනික් නගර වැසියා දුම්රියට නැගී ගෙදර බලා ගියේය. බෑගය ''ශුද්ධවූ මගීරීතා'' නැවෙන් ස්වීඩනයේ අගනුවරට — ස්ටොක්හෝම් නගරයට ගෙනයන ලදී.

එදවස රැයෙහි දැඩි සුළං පහර කුණාටුවක් දක්වා පරිවර්තනය වූයෙන් මුහුද කැළඹිණි. ''ශුද්ධවූ මගීරීතා'' නැවද කුණාටුවට හසුවිණි. මුහුද උමහක් මෙන් ඇදිරිවිය. නැවේ තට්ටු පවා කුණාටුවට හසුවුණු රැළිවලින් පීඩා ලැබීය.

මේ නැව ස්ටොක්හෝම් වරායට පැමිණියේ පැය හයක් පමාවෙලාය. ''සුඕමි'' නැමැති පින්ලන්ත නෞකාව හෙල්සිංපෝර්ස් බලා ගොස් දැනට බොහෝ වේලාවක් ගතවී ඇතිද!

''පමාවුණා!'' යැයි නැවියා තමාටම කියා ගත්තේ කනස්සල්ලකිනි.

හිටිහැටියේම ඔහු ''සුඕමි'' නැව දිටීය. එම නැව වාෂ්ප පිටකළේය. කුණාටුව නිසා එයද පමා වී ඇත. නැංගුරම් ගැළවීමට සූදනම් වන එම නැවට යන්නේ කෙසේදැයි බෑගය අතින් ගත් නැවියා කල්පනා කරන්නට විය.

''හෙමින් ඉදිරියට!'' කපිතන් අණ දුන්නේය.

නැවේ යන්ත්‍ර ක්‍රියාකාරී වී ඉදිරිපස අවර පෙති භ්‍රමණය වූයෙන් ජලය කැළතිණි.

''උප කපිතන් තුමනි!'' බෑගය අතින් ගත් නැවියා කෑගැසීය. ''කෙනීස්බර්ග් නැන්දගෙන් මහත්තයට තෑග්ගක්.''

නැවියා හති දමන්නට විය. බෑගය බරය. ''සුඕමි'' නැව හඬ නගමින් පිටවී යන්නට සැරසෙයි. ඔහුගේ වෑයම අසාර්ථක වීද?

නැත. අසාත්ථක නොවීය. හාස්කමෙකි. නැවියාගේ කෑගැසීම කපිතන්ට ඇසිණි...

''හෙමින්, පස්සට. නවත්වන්න!'' කපිතන් අණ දුන්නේය.

''උප කපිතන් තුමනි! නැන්ද ඔබ තුමාට උණුසුම් හිම කබායක් එවල තියෙනව'' නැවියා උස් හඬින් කීවේය.

නැව නවත්වන තැනෙහි සිටි මිනිස්සු හඬ නගා සිනාසුණහ. උප කපිතන් තැනට නැන්ද එවූ තෑග්ග ගැනීමට ''සුඕමි'' නැව ආපහු පැමිණීම නිසා ඒ නැවියන් සතුටු වූවාක් මෙනි. උප කපිතන් තැන බෑගය රැගෙන නැවියාට කෘතඥතාවය පළකරමින් අතක් වනා, තම කාමරයට බෑගය ගෙන ගොස් එහි තබා දොර අගුළු ලෑවේය.

බෑගය ''සුඕමි'' නැවෙන් ගෙනයන ලදී.

පින්ලන්තයේ හෙල්සින්ග්පෝර්ස් නගරයට මහ වැසි වසී. නගරයේ ගෙවල්වල හා ගොඩනැගිලි වල වතුර බට පිරී ඉතිරී ගොසිනි. පදික වේදිකාද වතුරෙන් යටවිණි.

''සුඕමි'' නැවේ උප කපිතන් තැන අස්රියකට නැගීම සඳහා වැහි කබායකුත් පොරවා ගෙන ඉක්මනින් පා තබයි. මොර සූරන වැස්ස! අතේ තිබෙන බෑගය තෙමුණොත් මහ විපතකි. නා කපන මහ වැස්ස ලෝකාන්තිමයේදී ගලන මහ ගංවතුරට සමානය. නිතර වැසි වසින පින්ලන්තයට පවා එය මහ වැස්සකි. රිය නැවතුම් පොළේදී ඔහු හමුවිය යුතු කම්කරුවා සොයමින් උප කපිතන් තැන වට පිට බලන්නට විය. නැව පැය කීපයකින් පමාවිය. ඒ සමගම මේ කාලකණ්ණි වැස්සද ඇරඹිණි. නගරයේ වීදි පාලුවෙලාය. පිටර්බුර්ගයේ කම්කරුවා මා එන තුරු නොසිටීද? මදැ සිදුවූ දෙයක හැටි! ඔන්න අස්රිය... කම්කරුවා එහි නැත. එවිටම ඉදිරිපස ගොඩනැගිල්ලක දොරටුවෙන් එළියට ආ කිසිවෙක් වට පිට බල ඔහුට ළං විය. ඒ පිටර්බුර්ග් නගර වැසි කම්කරුවාය.

''හරිම කාලකණ්ණි වැස්සක්. මම හොඳටම තෙතබරි වුණා...'' ඔහු කීවේය.

''කුණාටුව හන්ද පමාවුණා. කවදද ඔහෙ යන්නෙ?'' උප කපිතන් ප්‍රශ්න කළේය.

''අදම යනවා.''

''බොහොම හොඳා. දූන්ම විදුලි පණිවුඩයක් යවන්නම්.''

හිස වැනූ කම්කරුවා අස් රියකට නැග පිටවී ගියේය.

පැය කීපයකට පසු පින්ලන්තයේ සිට පිටර්බුර්ගයට යන දුම්රියකින් බෑගය ගෙන යනු ලැබීය.

පාළු පිට්ටනි, තෙතමණය සහිත ගම් හා දුවා නමින් හැඳින්වෙන ගිම්හාන විවේකාගාර හා බංගලා ළඟින් දුම්රිය පිටර්බුර්ගය බලා දුවන්නට විය. මේ පෙදෙස හොඳහැටි දන්නා පිටර්බුර්ග් නගර වැසියා කවුළුවෙන් එපිට නොබලා පුවත්පතක් කියවමින් බෙලොඕස්ත්‍රොව් දුම්රිය පොළට ළඟාවන තුරු බලා සිටියේය.

බෙලොඕස්ත්‍රොව් දුම්රිය නැවතුම් පොළේ සිට රුසියානු දේශසීමාව

ඇරඹිණි. එතැන දෙශසීමා නිලධාරීහු සහ තීරු බදු අයකරන පරීක්ෂකයෝද සිටියහ.

දුම්රිය මැදිරියට පරීක්ෂකයෙක් ඇතුළු විය.

''බෑග් එක අරිනවා.''

පිටර්බුර්ග් කම්කරුවා සන්සුන් ලෙස බෑගය හැරියේය.

යට ඇඳුම් දෙකක්ද, පැරණි මජ්ලරයක්ද චොකලට් පෙට්ටියක්ද විය. ඔහු බෑගයට තට්ටු කොට බැලීය. සැක කටයුතු කිසිවක් නොවූයෙන් ඔහු බෑගය වසන්නට ඉඩ හැර වෙනත් මගීන්ගේ බඩු මුට්ටු පිරික්සා බැලීමට ගියේය .

එදින පිබර්බුර්ගයට පැමිණි පිටර්බුර්ග් නගර වැසියා වසිලෙව්ස්ක් දූපතෙහි පිහිටි ගොඩනැගිල්ලක දෙවැනි තට්ටුවට නැංගේය. ''දන්ත වෛද්‍ය තැන'' යන නාම පුවරුවක් සහිත දොරක් අසලට ඔහු පැමිණියේය.

පළමු දෙවර දීර්ඝ ලෙස හඬ ඇසෙන සේ සීනුව නාද කළ පිටර්බුර්ග් කම්කරුවා තෙවැනි වර කෙටියෙන් සීනුව හැඬවීය.

මෙසේ හඬ නංවමින් ඔහු දුන් සංඥව මෙයය:

''බිය නොවන්න. ඔබගේ මිතුරෙක් පැමිණ සිටී.''

දෙස්තර දොර හැරගෙන පැමිණ මෙසේ පැවසීය: ''ඇතුල් වෙන්න ඔහෙ එනතුරු බලා ඉන්නව''.

මෙතැන දෙස්තර පදිංචිව සිටියද විප්ලවවාදීන් රහසේ රැස්වන ස්ථානයක් විය.

දෙස්තරගේ කාමරයේ තරුණියක් ඔහු බලාපොරොත්තුවෙන් සිටියාය.

''බෑගය දෙන්නැ''යි ඈ කීවාය.

තරුණිය බෑගය අතට ගත්තාය. කුණාටුව, මහ වැස්ස, දෙශසීමා පරීක්ෂණය! මේවා හැමටම මූණ දෙමින් ඔහු බෑගය ගෙනාවේය.

ඈ බෑගයේ තිබුණු යට ඇඳුම් ආදිය ඉවත් කළාය. මේ කුමක්ද? පිටර්බුර්ග් කම්කරුවා ඈ දෙස කපටි බැල්මක් හෙළා බෑගයේ පතුල පෑගීය. එවිට එය කුහරයක් විවෘත කරන පියනක් මෙන් හැරිණි. එතුළ එකිනෙකට තද වනසේ ''ඉස්ක්‍රා'' පුවත්පත් අසුරා තිබිණි. තරුණිය පිටපතක් අතට ගත්තාය.

මියුනික් නගරයේ මුද්‍රණය කරන ලද ගිනි පුපුර පුවත්පත රුසියාව තුළට ගෙනෙන ලද්දේ ඔවැනි අසීරු මාර්ග ඔස්සේය. කෙනිස්බර්ග්, ස්ටොක්හෝම්, හෙල්සින්ග්පෝර්ස් නගර ඔස්සේ පිටර්බුර්ගයට එම පුවත්පත නොයෙක් මිනිසුන් විසින් ගෙනෙන ලදී...

කාන්තාවන්ගේ හිස් වැසුම් සඳහාවූ පෙට්ටියකට තරුණිය විසින්

පුවත්පත් අසුරන ලදී. පෙට්ටිය පිරුණු පසු ඈ එය වටා පීත්ත පටියක් බැන්දය.

කම්කරු සංවිධානවලට පුවත්පත් ගෙන ගොස් බෙද දුන් ඈ ''ඉස්ක්‍රා'' (ගිනි පුපුර) පුවත්පත බෙදහරින ඒජන්තවරියකි. රුසියාවේ සියලු විශාල නගරවල රහසේ මේ පුවත්පත බෙද හරියේ එසේය.

නැව් හා දුම්රිය මගින්ද ගෙනගිය ''ඉස්ක්‍රා'' පුවත්පත රහසේ දෙශසීමාව හරහා රුසියාව තුළ ගෙනගොස් බෙද හරින ලදී.

රුසියානු කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ජීවිතය ඔවුන්ට පහද දී ඔවුන් පුබුදුවාලීමට ''ඉස්ක්‍රා'' පුවත්පත සමත් වූවාය.

''සාර්ට එදිරිව සටන් කරන්න! ධනපති පංතියට එදිරිව සටන් කරන්න!'' ''ඉස්ක්‍රා'' ආයාවනය එසේ විය.

දෙශපාලන පක්ෂයක් ගොඩ නැගීම සහ විප්ලවයට ජනතාව කැඳවීම ''ඉස්ක්‍රා'' පුවත්පත විසින් කරන ලදී.

''ඉස්ක්‍රා'' රුසියාවේ බලගතු කම්කරු පංති ව්‍යාපාරයක් සංවිධාන කළේය.

මේ ව්‍යාපාරයේ ප්‍රධානියා වූයේත්, ''ඉස්ක්‍රා'' පුවත්පතේ ප්‍රධාන කතුවරයා වූයේත් ව්ලදිමීර් ඉල්යීච්ය.

රුසියාවේ කම්කරුවන්ගෙන් හා පුවත්පතේ වාර්තාකරුවන්ගෙන් ව්ලදිමීර් ඉල්යීච්ට බොහෝ ලිපි, ලියුම් හා වාර්තා ලැබිණි. රුසියාවේ සිට රහස් සංඥා අනුව ලියන ලද ලිපි හා ලියුම් බොහෝ ගණනක්ද, කම්හල් හා පැක්ටරිවලින් වාර්තා හා ලිපි රාශියක්ද පුවත්පතට යවන ලදී. ව්ලදිමීර් ඉල්යීච් මේ ලිපි හා වාර්තා ''ඉස්ක්‍රාවේ'' පළ කරවිය. රුසියානු කම්කරුවන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු ව්ලදිමීර් ඉල්යීච් විසින් ලියන ලදී. ඔහු පුවත්පතේ කතුවරයා වශයෙන් ලිපි ලියා පළ කළේය. දෙශපාලනය හා විප්ලවවාදී සටන් ගැනද පොත් ලියුවේය.

1901 දෙසැම්බර් මාසයේ සිට ව්ලදිමීර් ඉල්යීච් උල්යානොව් තම ලිපි හා පොත් ලෙනින් යන නමින් පළ කළේය.

මේ ශ්‍රෙෂ්ඨ නාමය ගැන ලෝ ජනතාව පසුව දැනගනු ඇත.

## බොල්ෂෙවික්වරු

යුරෝපයේ කඳුකර රටක්වූ ස්විට්සර්ලන්තයේ නිල් පැහැති ජලයෙන් පිරි ජිනීවා වැව අසල ජිනීවා නමින් නගරයක් ඇතිවිය. ජිනීවා වැව අසල නගරයට තදසන්න පෙදෙසේ සෙෂෙරොන් ගමේ කුඩා නමුදු දෙමහල් ගෙයකි. එහි පියස්ස අනික් ගෙවල්වල මෙන්ම උළු සෙවිලි කර ඇත. කවුළු

නිල් පැහැති රෙදිවලින් ආවරණය කොට ඇත. ගෙවත්තේ කුඩා මල් පාත්තියකි.

මේ ගෙදර ''ඉල්යිච්'' දෙමහල්ලෝ පදිංචිව සිටියහ. ව්ලදිමීර් ඉල්යිච් සහ නදේෂ්ද ක෴ප්ස්කයා සගයින් විසින් හඳුන්වන ලද්දේ මේ නමිනි.

පළමුවෙන් මේ දෙපොළ මියුනික් නගරයේ පදිංචිව සිටියහ. මියුනික් පොලිසිය ''ඉස්ක්‍රා'' පුවත්පත රහසේ මුද්‍රණය කරන බව දැනගත් නිසා එනගරයෙන් පිටවී යාමට ඔවුන්ට සිදුවිය. එංගලන්තයට ගිය ලෙනින් යුවළ එහි අවුරුද්දක්ම නැවතී පුවත්පත මුද්‍රණය කළහ. එහි තවත් දුර නැවතී සිටීම අනතුරුදායක බව දැනුණු විට, ''ඉස්ක්‍රා'' පුවත්පතට අළුත් ක්ෂේම භූමියක් සෙවීම පිණිස හැම තැනම ගිය මේ යුවළ ජිනීවාහි කම්කරු ගම්මානයේ — සෙෂෙරොන්වල පදිංචි වූහ.

දෙමහල් කුඩා ගෙයි හැම කාමරයක්ම පිරික්සා බැලූ ව්ලදිමීර් ඉල්යිච් ''බොහොම හොඳා'' යැයි කීවේය. පහළ තට්ටුවේ මුළුතැන් ගෙය ලොකුය. ඉහළ තට්ටුවට නගින පඩිපෙළ පටුය. එහි කාමර කුඩාවුවද, පිරිසුදුය, එළිමහන්ය. බොහොම හොඳය. නිවිහැනේ නිහඬව වැඩකළ හැකිය.

ව්ලදිමීර් ඉල්යිච්ට වැඩ ගොඩකි. නිහඬතාවය ඉක්මනින් අවසන් විය. රුසියානු ගෙදරට බොහෝ අමුත්තන් පැමිණෙන සැටි ගම්හු දුටහ. 1903 ජූලි මාසයේදී ඔවුන් හමුවීමට පැමිණි අයගේ ගණන තව තවත් වැඩිවිය. ඔවුන් පැමිණියේ එක්කෙනා, දෙන්නා හෝ තුන්දෙනා හෝ බැගිනි. ඔවුන් ස්විට්සර්ලන්ත වැසියන් නොවන බව දැනගැනීම අපහසු නොවීය.ඔවුන් කතා කළේද විදේශීය බසකිනි, එනම් රුසියානු බසිනි. ඇඳුම්ද වෙනස්ය. ජිනීවා නගරයට පැමිණි රුසියානුන්ට එහි වූ හැම දෙයක්ම අළුත් දේ විය. හිරු එළිය සහිත අහස, ජනේල රෙදි, ගෙවතුවල මල් පාත්ති, ආදී හැම දෙයක්ම ඔවුන්ගේ සිත් ගත්තේය.

1903 ගිම්හානයේදී මෙතරම් විශාල සංඛ්‍යාවක් රුසියානුන් කිනම් හේතුවක් නිසා මෙහි පැමිණියහදැයි ගම්මු සමහර විට පුදුමයට පත්වූහ. පක්ෂයේ දෙවැනි සම්මේලනය සඳහා රුසියාවේ නොයෙක් පළාත් වලින් තෝරා පත්වූ නියෝජිතවරුන් මෙහි පැමිණි බව ඔවුහු නොදත්හ.

සම්මේලනය ඉදිරියේ ඇති ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීමටද, අදහස් හුවමාරු කර ගැනීමටද නියෝජිතයෝ ලෙනින් වෙත ආහ. අන් හැම කෙනෙකුටම වඩා සම්මේලනයට සූදනම් වූයේ ලෙනින් බව ඔවුහු දැන සිටියහ. ''ඉස්ක්‍රා'' පුවත්පතට ලෙනින් ලිපි බොහෝ ගණනක් ලියුවේය. ''කුමක් කළ යුතුද?'' යන මැයෙන් ඉතා අගනා පොතක් ඔහු ලියා පළ කළේය. දේශපාලන පක්ෂයක් ගොඩ නැගිය යුත්තේ කෙසේද යන්න

එමගින් පැහැදිලි කර තිබිණි. පක්ෂයේ ව්‍යවස්ථාව හා සටන්කාමී වැඩ පිළිවෙළද සාදන ලද්දේ ලෙනින් විසිනි.

"නව, වඩාත් හොඳ සමාජයක් සෑදීම සඳහා අපි සටන් කරමු: එම යහපත් සමාජයේ ධනවතුන් සහ දුප්පතුන් නොසිටිය යුතුය. හැම කෙනෙක්ම වැඩ කළ යුතුයැ"යි ලෙනින් පැහැදිලි කළේය.

පක්ෂයේ වැඩ පිළිවෙළ ගැන ඔහු කල්පනා කළේ සයිබීරියාවේ පිටුවහල් සිර දඬුවම ගතකරන විටය. නව සමාජයක් ගොඩ නැගීම සඳහා වඩාත් නිවැරදි ලෙස සටන් කළ යුත්තේ කෙසේද යන්න ගැන කතිකා කර ගැනීමට ඔහුට වුවමනා විය.

ජිනීවා සිට බෙල්ජියමේ අගනුවර වන බ්‍රසල්ස්වලට ගිය නියෝජිතවරු එහිදී පක්ෂයේ දෙවැනි සම්මේලනවාරයට සහභාගී වූහ. එය පවත්වන ලද්දේ විශාල අඳුරු ස්ථානයක්වූ පිටි ගබඩාවක් තුළය.

ගබඩාවේ දෙරවල් හැර පොළොව අතු ගා ශුද්ධ කරන ලදී. ලී වේදිකාවක් සාද විශාල ජනේලය රතු රෙද්දකින් වසා, ශාලාව තුළ ලී බංකු තබන ලදී. නියෝජිතයෝ ශාලාවේ අසුන් ගත්හ. රුසියාවේ පළමුවැනි මාක්ස්වාදියාවූ ගියොර්ගි ප්ලෙඛානොව් වේදිකාවට නැංගේය. බහුශ්‍රැතයෙකු හා විද්‍යාඥයකුවූ ප්ලෙඛානොව් මාක්ස්ගේ විප්ලවවාදී උගැන්වීම් විස්තර කරමින් ලෙනින්ටත් කලින් පොත් ලියා පළකළේය. පක්ෂයේ දෙවැනි සම්මේලනවාරය උත්සවාකාරයෙන් විවෘත කිරීමේ ගෞරවය ප්ලෙඛානොව්ට හිමිවිය. ඔහු සම්මේලනය අමතා අගනා කතාවක් කළේය.

හැම දෙනෙක්ම ඔහුගේ කතාවට ගෞරව පූර්වකව සවන් දුන්හ. ලෙනින් කොතරම් කැළඹුණේදයත්, ඔහු සුදුමැලි විය. එහෙත් ඔහුගේ දෙනෙත් දීප්තිමත් ලෙස බැබළිණි. පක්ෂය නැවත සංවිධානකොට පුනරුත්ථාපනය කරන පක්ෂ සම්මේලනයක් ගැන ඔහු සිහින දකිමින් සිටියේය. දැන් ඔහුගේ සිහිනය සැබෑ විය!

සම්මේලනය සිය වැඩ පටන් ගත්තාය. පළමුවැනි දවසේ සිටම වාද විවාද හා අරගල ඇරඹිණි.

ලෙනින්ගේ සටන්කාමී වැඩ පිළිවෙළට විරුඩ නියෝජිතවරුද වූහ.

ඔහුගේ වැඩපිළිවෙල අර්ත්‍ය එමෙන්ම නිර්භය ය. මේ නිසා වකිතයට පත් සමහර නියෝජිතවරු ලෙනින් සමග තර්ක කරන්ට වූහ. ලෙනින්ගේ මතය නිවැරදිය. එපමණක් නොව ඔහු කොතරම් තර්කානුකූල ලෙස හා උණුසුම් ලෙස කරුණු ගෙනහැර දක්වමින් කතා කළේදයත්, නියෝජිතයින්ගේ බහුතර සංඛ්‍යාව ඔහුට පක්ෂපාත වූහ. පක්ෂයේ වැඩපිළිවෙල හා ව්‍යවස්ථාව සම්මේලනයේ සාකච්ඡාවට භාජන විය.

මධ්‍යම කාරක සභාවට හා ''ඉස්ක්‍රා'' පුවත්පතේ කතු මඬුල්ලට සාමාජිකයින් තේරීම සඳහා චන්දය විමසන ලදී. සෑම ප්‍රශ්ණයකදීම තර්ක ඉදිරිපත් විය. පැහැදිලි තර්කානුකූල අගනා වාර්තාවක් ලෙනින් සම්මේලනයට ඉදිරිපත් කළේය. හැම දෙනෙක්ම මහත් වුවමනාවකින් එයට සවන් දුන්හ. සම්මේලනයේ රැස්වීම්වාර තිස් හතක් පැවැත්විණි. ලෙනින් වාර්තා, කතා හා පිළිතුරු ආදිය දෙමින් එක සිය විසිවරක් කතා කළේය. ඔහු නියෝජිතයින්ගේ සිත් දිනාගන්නා අන්දමින් කතා කළේය. නියෝජිතයින්ගේ බහුතර සංඛ්‍යාව ලෙනින්ගේ පැත්ත ගත්තේය. ඔවුන් බොල්ෂෙවිකයින් යන නමින් හැඳින්විණි. ඔවුහු විප්ලවය, ජනතා සැපත හා ලෙනින්ගේ වැඩ පිළිවෙලට පක්ෂපාත වූහ. පක්ෂයේ දෙවැනි සම්මේලනවාරයේදී ලෙනින්ගෙන් කැඩී ගිය අය අල්පතර සංඛ්‍යාවට අයත් වූ බැවින් ඔවුන් මෙන්ෂෙවිකයින් ලෙස හැඳින්විණි. මෙන්ෂෙවික්වරු විප්ලවවාදී සටන් වලින් ඈත්වූ අතර බොල්ෂෙවික්වරු ලෙනින් වටා රොක්වූහ.

සම්මේලනය තම වැඩ කටයුතු කරගෙන ගිය අතර පිටි ගබඩාව අසල සැක කටයුතු පුද්ගලයෝ හැසිරෙන්නට පටන් ගත්හ. ඔවුහු ජනේල හා දොර මුළු අස්සෙන් එබිකම් කරන්ට වූහ. රුසියානු විප්ලවවාදීන් කිසියම් ස්ථානයක රැස්වී සිටින බව දැනගත් බෙල්ජියම් පොලීසිය ඔත්තුකරුවන් රාශියක් එවීය. තව දුරටත් මෙහි වැඩ කටයුතු කරගෙන යාම අවදානම් සහිත වූයෙන් සම්මේලනය පැවැත්වීම සඳහා අළුත් ස්ථානයක් සොයා යාමට සිදුවිය. සම්මේලනයේ ඉතිරි වැඩ කටයුතු කරගෙන ගියේ ලන්ඩන් නගරයේදීය. ලෙනින් ජය ගත්තේය. ඔහු වටා අභීත, සටන්කාමී බොල්ෂෙවික්වරු ඒකරාශි වූහ!

...ලන්ඩනයේ නිතර වැසි වසී. ඒ දවස්වලද නොකඩවා හීන් පොද සහිත වැස්සක් වසින්නට විය. හැම නගර වැසියෙකුම කුඩ ඉහලාගෙන ගමන් කරන්නට වූයෙන්, මුළු නගරයම එකම කුඩයක් යටට වූවාක් මෙන් විය. මඳ වේලාවකට ලා මාන්ෂ් සිට උණුසුම් සුළඟක් හමයි. එවිට අහස පැහැදිලි වී හිරු රැසින් බැබළේ. එහෙත් නැවත අඳුරු වළා අහස ගනිත්ම, පොද වැස්ස පටන් ගනී.

සම්මේලනයෙන් පසු එවැනි පොද වැසි සහිත දවසක, හිරු වසා අඳුරු වළා පැතිර ගිය විටදී ලෙනින් තම සගයින් ඇමතිය:

''සහෝදරවරුනි! අවුරුදු විස්සකට පෙර මේ නගරයේදී කාල් මාක්ස් මිය ගියේය. අපි ඔහුගේ සොහොන වෙත ගොස් ඔහු සමරමු''.

ඔවුහු හැම දෙනම සොහොන වෙත ගියහ. එම සොහොන් බිම උතුරු ලන්ඩනයේ උස් කඳු වැටියක පිහිටා ඇත. එහි සිට ලන්ඩනය බැලිය හැකිය. අඟුරු දුම්වලින් කළු පැහැ ගත් ගොඩනැගිලි, කළු පැහැති වහලවල්, කම්හල්වල දුම් බට ආදිය පෙනිණි.

මාක්ස්ගේ සොහොනේ කිරි ගරුඬ පුවරුවකි. එය වටේ තණකොළ වැවී ඇත්තේ පින්තූර රාමුවක් මෙනි.

සොහොනේ හිස මත රෝස මල් සහිත පඳුරකි. මැලවී ගිය රෝසමල්වල පෙති අප්‍රාණික ලෙස සුළඟට වැනේ. නැවත වැසි පටන් ගනිත්ම මිනිස්සු කුඩ ඉහලාගෙන සෙමින් ගමන් කරන්නට වූහ.

හිස් වැස්ම අතට ගත් ලෙනින්, හිස පහත් කරගනිමින් පහත් ස්වරයෙන් රැස්වූ පිරිස ඇමතීය:

"අපේ ශ්‍රේෂ්ඨ ගුරුවරයා වන කාල් මාක්ස්ගේ උගැන්වීම් අපි අනුගමනය කරන බවට, ඔහුගේ සොහොන මත දිවුරා පොරොන්දු වෙමු. සටන්කාමී මාවතෙන් පිට නොගොස් ඉදිරියටම යමු සහෝදරවරුනි."

## පෙළපාලියට වෙඩි තැබීම

පිටර්බුර්ගයේ පුටීලව් කම්හලේ කිසිදු වරදක් නොමැතිව කම්කරුවන් තිදෙනෙකු අස්කරන ලදී. කම්කරුවන් බාස් උන්නැහේගේ හිතට නැල්ලීම අස්කිරීමට එකම හේතුව විය. මුළු මහත් කම්හලම නැගී සිටියේය.

"අපට කිසිදු අයිතියක් නැත. අපේ අයිතිය අපට දියව්. ගසාකන බාස් උන්නැහේලා භංගවේවා!" කම්කරුවෝ සටන් පාඨ ඉදිරිපත් කළහ.

පුටීලව් කම්හලේ හැම කම්කරුවෙක්ම එකාමෙන් නැගී සිට වැඩ වර්ජනය කළහ. කම්කරු සටන තවත් කම්හල් දෙකකටද පැතිරිණි. ඊළඟ දවසේදී පැක්ටරි, කම්හල් 360 ක කම්කරුවෝ වැඩ නවත්වා මහමගට බටහ. පිටර්බුර්ග් නගරය කැළඹිණි. හැම දෙනෙක්ම නොසන්සුන්තාවයකින් පසුවුණහ.

1905 ජනවාරි 9 ඉරිදා දස දහස් ගණනක් කම්කරුවෝ මහ මගට බටහ.

"සාර් රජතුමා හමුවෙලා අපේ දුක කියන්ට යනවා. සාර් අපේ තාත්තා. අපව බඩගින්නෙ මරාදමන්ට එතුමා ඉඩ තියන්නෙ නැහැ." මෙසේ පැවසූ කම්කරුවෝ සාර් රජු හමුවීමට ගියහ.

බොල්ෂෙවික්වරු සාර් රජ හමුවීමෙන් කම්කරු ප්‍රශ්න නොවිසඳෙන බව කලින්ම පැවසූ නමුදු එය කම්කරුවන් විසින් නොසැලකිණි.

"ජනතාව දුක් විඳින බව සාර් රජතුමාණෝ නොදත්හ. දැනගත් විගස

එතුමාණෝ නිසි පිළියම් යොදනසේක. දුෂ්ට බාස්ලා හා කම්හල් හිමියන් බයවනු ඇත. කම්කරු දුක ඉමහත් ''යැයි කම්කරුවෝ කියා සිටියහ.

කම්කරුවෝ සාර් රජුට පෙත්සමක් ඉදිරිපත් කරනු වස් මහ පෙළපාලියකට සූදනම් වූහ. පිටර්බුර්ග් නගරයේ හැම මුල්ලකින්ම කම්කරුවෝ පෙළපාලියට එක්වූහ. සාර්ගේ පදිංචි ස්ථානය වන හිම මාලිගය දෙසට ඇදී ගිය ජනයාගෙන් වීදි, මාවත්, චතුරශ්‍ර පිරිණි. ආගමික කුරුස කොඩි, දේවරූප, ආදිය පෙළපාලියේ ගෙනයන ලදී. කුරුස කොඩිවල රන් මුදුන් හිරු එළියට බැබළිණි. ගැහැනුන්ද ළමයින්ද පෙළපාලියට එක්වූ අතර සමහරු හඬ නගා යාච්ඤා කිරීමට හා ආගමික ගී ගැයීමටද පටන් ගත්හ.

පුදුම දර්ශනයෙකි! හැම සන්ධියකම සෙබළ බල මුළක් බැගින් ඇත. යුධායුධ සූදනම් කරලාය. සුදු පැහැති අත් වැසුම් පැළඳ ගත් නිලධාරීහු බල මුළු පෙරටු කොට සිටගෙන උන්හ.

මේ කාලයේදී ඈත පෙරදිග රුසියන් ජපන් යුඩය ඇවිල පැවතිණි. මුහුදේ සහ ගොඩබිමේ බිහිසුණු සටන් විය. ජපානය මීට වසරකට පමණ පෙර රුසියාවට පහර දීම නිසා මේ යුඩය ඇවිළිණි. රුසියානු යුඩ සෙනවිවරුන් යුඩයකට සූදනම්ව නොසිටි බව හෙළිදරව් විය. රුසියානු යුඩ හමුදව දවසෙන් දවස පරාජයෙන් පරාජයට මුණ පාමින් පසුබසින්නට පටන් ගත් අතර දස දහස් ගණන් රුසියානු භටයින් මරුමුවට පත්විය...

එසේවුවද, පිටර්බුර්ගයේ යුඩ සෙනවිවරු නිරායුධ කම්කරු ජනතාවට එදිරිව අවිගත් සෙබළ බල මුළු යෙදවූහ. ඔවුන් එසේ කරන්නේ ඇයි?

''නගරයේ සාමය රැකගන්න. අපේ පෙළපාලිය යුඩ හමුදවේ මහත්තුරු ආරක්සා කරනව වෙන්ට ඕන'' යැයි දේව මෑණියන්ගේ රූපය සහිත කුරුස කොඩියක් අතින් රැගෙන පෙළපාලියේ ගමන් කළ කම්කරුවෙක් පැවසීය.

සාර් රජුගේ හිම මාලිගය වටා විශාල ප්‍රාකාරයකි. එහි චතුරශ්‍රය අති විශාලය. කවුළු සිය ගණනක් චතුරශ්‍රයට මුණ ලා ඇත. චතුරශ්‍රය වසා ඇති සුදෝසුදු හිම මිනිස් පයට පෑගී නැත. මාලිගය වටා යුද භටයින්ගෙන් සෑදුණු ආරක්ෂක කවයකි. කුරුස කොඩි, දේව රූප හා පින්තූර රැගෙන යාච්ඤා කරමින් මාලිගා භූමියට කම්කරු මහා පෙළපාලිය ඇතුළු වෙත්ම සෙනවියෙක් අණ දුන්නේය. යුද භටයෝ තුවක්කු මානා ගත්හ.

''සහෝදරවරුනි! වෙඩි තියන්න එපා. අපි උඹල වගේම දුප්පත් උදවිය. අපි සාර් රජුට අපේ දුක කියන්ට යනව'' කම්කරුවෝ තුවක්කු මානා ගෙන වෙඩි තැබීමට සැරසෙන සෙබළුන් අමතාකීහ.

''නැවතියව්! මෙතැනින් එහා යන්ට එපා!'' නිලධාරියෙක් මහ හඬින් කෑගැසීය.

කම්කරුවෝ නැවතුණහ. විනාඩියක නිහඬතාවයකි. පිටුපස සිටි කම්කරුවෝ සෙබළුන් නොදුටුවහු, ඉදිරියට ගියහ.

''සාර්ට දෙවිපිහිට ලැබේවා!'' යන ගීය කම්කරුවෝ ගැයූහ.

ඉදිරියෙන් ගමන් ගත් කම්කරුවෝ සුදු ලේන්සු වනමින් මෙසේ කීහ:

''අපි සාමකාමී උදවිය. සාර් රජතුමාට පෙත්සමක් බාරදෙන්ට යනවා.'' ඔවුහු තම දේව රූප, ප්‍රතිමා, කුරුස කොඩි රැගෙන ඉදිරියට යාමට තැත් කළහ.

''වෙඩි තබව්!'' නිලධාරියා කෑගැසීය.

තුවක්කුවල වියලි හඬ ඇසිණි. තේරුම් රහිත කෙටි හඬකි. කම්කරුවන් විසිදෙනෙකු පමණ බිම ඇද වැටිණි.

''වෙඩි තබව්!'' දෙවැනි වරද නිලධාරියා අණ දුන්නේය.

වියලි හඬක් සමග වෙඩි පිටවිය.

''වෙඩි තබව්! වෙඩි තබව්! වෙඩි තබව්!''

පෙළපාලිකරුවෝ හිස් ලූ ලූ අත දිව ගොස් සැඟවීමට හා වෙඩි පහරින් බේරීමට තැත් කළහ. පුරුෂයෝ, ස්ත්‍රීහු හා මහල්ලෝ වෙඩි කා බිම ඇද වැටුණහ. හිම මාලිගය ඉදිරිපිට සුදෝ සුදු හිමෙන් වැසුණු චතුරශ්‍රය ලේ විලක් බවට පත්වූ අතර, එය මළ සිරුරු වලින් පිරිණි. එවිටම අමෝරා ගත් අසිපත් ඇති අසරු භටයෝ මාරයින් මෙන් නිරායුධ ජනතාවට පහර දුන්හ.

''සහෝදරවරුනි! අපි විනාශයි!'' යන හඬ දසතින් ඇසෙන්නට විය.

''මිනී මරුවනි! තොපට හෙණ වදීවි!''

''ඔන්න සාර්ගෙ හැටි! නුඹල කාවද විශ්වාස කළේ. දුෂ්ට මෘගයකුව විශ්වාස කළා!'' යැයි බොල්ෂෙවික්වාදී තරුණ කම්කරුවෙක් මහ හඬින් කීවේය.

සාර් තමන්ට වෙඩි තබා විනාශ කළ බව කම්කරුවෝ අවබෝධ කර ගත්හ. සාර් කෙරෙහි කම්කරුවන් තුළ තිබූ විශ්වාසය එද සිට සදහටම අහෝසි විය.

1905 ජනවාරි 9 වැනි ඉරිද සාර්ගේ මිනීමරු යුධ හමුදාව විසින් පීටර්බුර්ගයේ කම්කරුවන් දහසකට වැඩි ගණනක් වෙඩි තබා මරා දැමිණි. තුවාල ලැබූ සංඛ්‍යාව පන්දහසකට අධික විය.

එදින හවස් වන විට වීදිවල පහන් කණු උගලා පාරවල් හරහා දමා සාර්ගේ හමුදාවට එදිරිව සටන් කිරීම පිණිස කම්කරුවෝ කපොලු සාදගත්හ.

ජිනීවා නගරාසන්නයේ අරවා ගඟ අද්දර කරුෂ් නමින් මාවතෙකි. මෙය රුසියානුන් හැඳින්වූයේ කරුෂ්කා නමිනි. ස්විට්සර්ලන්තයට සංක්‍රමණය වුණු රුසියානු දේශපාලනඥයෝ මේ මාවතේ පදිංචි වූහ. ලෙනින් සමග එකට පිටුවහල් සිර දඬුවමක් ගතකළ ලෙපෙෂින්ස්කි යුවළ කරුෂ්කාහි අවන් හලක් ඇරඹූහ. මෙය රුසියානුන් රැස්වන තිප්පොලක් විය. පළමුවන තට්ටුවේ විශාල කාමරයකි. ජනේල වෙනුවට එහි ප්‍රදර්ශන කවුළු දෙකක් විය. පිරිසුදු දිගැති මේස කීපයකි. පියානෝවක්ද ඇත. මෙය හුදු අවන් හලක් පමණක් නොව බොල්ෂෙවික්වරුන්ගේ සමාජ ශාලාවක්ද විය. දේශන පැවැත්වීම, වෙස්දම් ඇඳීම් හා දේශපාලනය ගැන සාකච්ඡා කිරීම් මෙහිදී කැරිණි.

පිටර්බුගයේ වෙඩි තැබීම් හා කම්කරු ඝාතනය පිළිබඳ පුවත් ජිනීවා නගරයට ලැබුණු විගස සියලු බොල්ෂෙවික්වරු නිහඬව එම අවන් හලෙහි රැස්වූහ. කතාකළේ ටික දෙනෙකි. හැම දෙයක්ම නිසලය. ඔවුන්ගේ මුහුණු දැඩි විලාසයක් පෑය. මෙතෙක් නොවූ විරූ කිසියම් විශාල දෙයක් සිදුවූහයි බොල්ෂෙවිකයෝ අවබෝධ කර ගත්හ.

''ගෙදර! ඉක්මනින් ගෙදර යන්ට ඕන!'' ලෙනින් කල්පනා කළේය.

කිසිවෙක් දුක්බර හඬින් ගීයක් ගැයීය:

''මාරක සටනෙදි දිවි පිදුවා...''

හැමදෙනම ඔහු අනුව ගැයූහ:

''ජනතාවගෙ පොදු සැපත සඳහා
නිදහස සඳහා
දිවි පුද සටන් කරමු...''

බොහෝ දෙනෙක් කඳුළු සැලූහ.

''රුසියාවෙ විප්ලවයක් පටන් අරගෙන'' යැයි ලෙනින් පැවසීය.

විප්ලවය නැමැති ඒ ශ්‍රේෂ්ඨ වචනය උණුසුම් බවක් ගෙනදිනි. එය හදවතට කිට්ටු දෙයක් විය. එදින සවස ''වපිර්යොද්'' නැමැති පුවත්පතට ලෙනින් විශේෂ ආයාචනයක් ලියුවේය. ''වපිර්යොද්'' (ඉදිරිමග) පුවත්පත බොල්ෂෙවිකයින්ගේ නව පුවත්පත විය. ''ඉස්ක්‍රාව'' හෙවත් ගිනිපුපුර මෙන්ෂෙවිකයෝ අල්ලා ගත්හ.

ලෙනින් මෙසේ ලියුවේය: ''අවිගත් නැගිටීම ආරම්භ වී ඇත. බලයට එදිරිව බලය යොදවා ඇත. මාවත් ඔස්සේ අවිගත් සටන් ඇවිල පවතී. කම්කරුවෝ කපොලූ සාදති. වෙඩි හඬ ඇසේ. කාල තුවක්කු උණ්ඩ පුපුරයි.

ලේ ගංගාවක් මෙන් ගලායයි. නිදහස සඳහා කරන සිවිල් යුඩයක් ඇවිලිණි...

විප්ලවයට ජයවේවා!

නිර්ධන පංතික අවිගත් නැගිටීමට ජයවේවා!''

## මුහුදේ ලෙළදුන් රතු කොඩිය

ගිම්හාන කාලය අවසානයේ දවසකදී ලෙනින් හා ඔහුගේ බිරිඳ නැවතී සිටි නිවසේ සීනුව නාදවිය.

නොහඳුණන තරුණ පුද්ගලයකුට ගෙතුළට ආරාධනා කළ නදේෂ්ද කෲප්ස්කයා ලෙනින් ඇමතුවාය: ''වලෝද්‍යා ඔයා හම්බවෙන්ට ඇවිල්ලා''.

ඔහු තරුණය, මුහුණ වටකුරුය, ගැටවරයකුගේ මෙනි. දෙනෙත් අළු පැහැතිය, දීප්තිමත්ය, කළු පැහැති ඇස් බැම්වලට යටින් ඔහු තරමක් විස්මයෙන් බැලීය.

''ඔහෙගෙ පැමිණීම නිසා අපි බොහොම සන්තෝස වෙනවා'' යැයි තරුණ අමුත්තා අමතා ඈ කීවාය. ''හරිම හොඳ තරුණයෙක්. කෙළින් මිනිහෙක් බව එයාගෙ මූණෙන්ම පේනවා. මේ රටට ළඟදී ආපු කෙනෙක් බව.''

රුසියාව තුළ වැඩ නැවැත්වීම් දිගින් දිගටම පැවතිණි. බොල්ෂෙවික්වරු උපදෙස් ගැනීම සඳහා නිතර නිතර ලෙනින් සොයා ආහ.

කෲප්ස්කයාට පිටුපසින් තරුණයා කාමරයට ඇතුළු විය. ඔහු දෙර ළඟට මඳක් නැවතී, සෘජුව සිටගත්තේ, උඩුකය තරමක් පිටතට නෙරාගියේය. යුඩමය පුහුණුවක් ලැබූවකු බව ඉන් පෙනිණි.

''ඔහෙ කොහෙ ඉඳලද?'' ලෙනින් මඳ සිනා පාමින් අමුත්තාගෙන් ප්‍රශ්න කළේය.

''මම, අපනාසි මත්යූෂෙන්කෝ. 'පොතෙම්කින්' යුඩ නැවේ නාවිකයෙක්'' යැයි අමුත්තා කීවේ වාර්තාවක් ඉදිරිපත් කරන සෙබළෙකු මෙනි.

ලෙනින් සැනෙකින් ඔහුට ළංවී ඔහුගේ අතක් ගෙන ආචාර කළේය.

''පොතෙම්කින්'' යුඩ නැවේ විප්ලවවාදීන්ගේ නායකයා! නදේෂ්ද බලන්නකො කොතරම් තරුණද කියල...''

පැය බාගයකින් ඇලුමිනියම් කේතලය හඬ නගන්නට විය. පාන් සහ බටර් පිළියෙල කොට මේසය මත තබන ලදී.

නැවියා බටර් පාන් පෙති දෙක තුනක් කා තේ බිව් පසු ලෙනින් සන්සුන් ලෙස ඔහුගෙන් තොරතුරු අසන්නට විය: ''ආදරණීය මත්යූෂෙන්කො, ඉතින් අපට සිදුවූ දේ ගැන කියන්නකො!''

''පොටතම්කින්'' යුධ නැව හා එහි විප්ලවවාදී ඉතිහාසය ගැන මත්යුෂෙන්කො විස්තර කළේය.

රුසියානු යුධ නෞකා හමුදාවේ බලගතු අවියකි ''පොතෙම්කින''ය. එය සාදන ලද්දේ මෑතකදීය. සෙවස්ටෝපල් වරායේ නවතා තිබූ මේ යුධ නෞකාව විශාල කාල තුවක්කු වලින් යුක්ත විය. නැවියෝ හත්සිය හතළිස් දෙනෙක් මේ නැවේ සේවය කළහ.

රුසියාව පුරා කැරළි ඇතිවිය. ගම්වල ගොවීහු ඉඩම් හිමියනට හා රදළයින්ට එදිරිව කැරළි ගැසූහ. රුසියන් ජපන් යුධය ඇවිළිණි. ජපනුන් යුධයෙන් ජයගත් අතර රුසියන් යුධ හමුද බලවත් අලාභ හානි ලැබූහ. ට්සුසිම්ස්ක් බොක්කේ නෞකා සටනකදී රුසියන් යුධ නැව් කීපයක්ම විනාශ විය. සාර් ආණ්ඩුව කුණුවී දිරාපත් වූවකි. දෙවැනි නිකොලායි සාර් රජු ජනතාවගේ වෛරයට හා කෝපයට ලක් විය.

''පොතෙම්කින්'' නැවේ යුධ අණදෙන නිලධාරියා නැවියන් විප්ලවවාදීන් වෙතියි සිතා අන් හැමටම වඩා බිය වූයේ, යුධ නැව සෙවස්ටෝපල් වරායෙන් එපිට යුධාභ්‍යාස සඳහා ගෙනගියේය. ඔහු නපුරු, දුෂ්ට මිනිසෙකි. කම්කරුවන්ගෙන් හා වැඩ නැවැත්වීම් වලින් නැවියන් ඈත් කිරීම ඔහුගේ අදහස විය.

උදෑසන සංඥ නළාවල හඬ අනුව නැවියෝ අවදිවූහ. වැඩ නියම කරන ලදී. නැවියන් කණ්ඩායමක් නැවේ ඩෙක් තට්ටුව සේදීම පිණිස යවන ලදී

උඩ තට්ටුවේ සිට හමන කුණු ගඳක් ඔවුන්ට දැනිණි. ඩෙක් තට්ටුව සෝදමින් සිටි නැවියෝ උඩ තට්ටුවට නැග සොයා බැලූහ. යකඩ කොකුවල එල්ලා ඇති කුණු මස් කුට්ටි ඔවුන්ට දකින්ට ලැබිණි. ඒවායේ කොතරම් පනුවෝ සිටියහුදයත්, කහ පැහැ ගත් මස් කුට්ටි පණැති සතකු මෙන් දඟලන්නට විය. මේ දර්ශනය දුටු නැවියෝ පුදුම වූහ.

''ඔන්න අපට දෙන මස්වල හැටි!''

''පනුවො කන්ට අපට බැහැ. නිලධාරියො කාපුදෙන්!''

''ඒ ගොල්ලන්ට වෙනම කෑම දෙනව. අපට වගේ නොවේ.''

දහවල් ආහාර වේලාව පැමිණි විට, කෑම ගන්නා ශාලාවට නැවියෝ රැස්වූහ. ඔවුන්ට පනුවන් සහිත ගෝවා සුප් දෙන ලදී. පනුවන් දුටු නැවියෝ ආහාර ගැනීම වර්ජනය කළහ.

''කෑම නොකමුයි'' ඔවුහු කීහ.

නිහඬතාවයකි. එහෙත් එහි කිසියම් බියජනක බවක් ඇත. කෝකියා බියවී නිලධාරියාට අඬ ගැසීය. ඔහු පැමිණ නැවියන්ට පරුෂ වචනයෙන් බැණ වැදුනේය. එහෙත් නැවියන්ගේ දැඩි, සුදුමැලි මුහුණු දුටු ඔහු කලබල

වී අණදෙන නිලධාරි තැනට වාර්තා කළේය. උඩ තට්ටුවේ පෙළ ගැසී සිටින ලෙස දන්වන බෙර හඬ ඇසිණි. නැවියෝ උඩ තට්ටුවට දුව ගොස් පෙළට සිට ගත්හ. නැව වටේ නිල් පැහැති මුහුදය. අහස පැහැදිලිය. කුඩා දිය රළි ඇති විය. නැව වටේ පීනමින් සිටි ඩොල්ෆින් මාලුවෝ උඩ පැන්නහ.

''කැරළි කාරයෝ!'' අණදෙන නිලධාරියා බෙරිහන් දුන්නේය: ''මම තොපට පෙන්වන්නම් යුධ නැවක කැරළි ගහන හැටි! කවුද නායකයෝ?''

නාවිකයෝ නිහඬව ගල් ගැසුණාක් මෙන් සිටියහ. නිලධාරිහු තුවක්කු අරගෙන මුර සේවයේ යෙදුණහ.

''වැහි කබාය ගෙනෙන්!'' යැයි අණ දෙන නිලධාරියා කෑගැසීය.

මෙහි තේරුම කුමක්ද? ඔහු එල්ලා මැරීම සඳහා නැවියන් තෝරාගැනීම මෙහි අදහසය. දබරගිල්ල උලුක්කොට ''මූ නායකයා'' යැයි කී පමණින් ඔහු මරාදැමීමට අණදෙන නිලධාරියා සැරසෙයි.

වැහි කබාය ගෙනෙන ලදී. වැහි කබායෙන් වසනු ලබන නැවියා වරදකරුවෙකු ලෙස ප්‍රකාශ කොට නඩු නොඅසා එල්ලා මරා දැමීමට අණදෙන නිලධාරි අලුගෝසුවා සූදනම්ය.

හැම දෙනෙක්ම නිහඬ වූහ. දැන් දැන් තමන් මරණයට ගොදුරු වෙතියි ඔවුහු බියෙන් සැළෙමින් සිටියහ... ගැළවීමක් නැත. වටේටම නිල් පැහැති මුහුදය. පැහැදිලි අහස, දීප්තිමත් හිරු, මඳ පවන.

හිටි හැටියේම එක් නැවියෙක් ඉදිරියට පැන කෑගැසීය:

''සහෝදරවරුනි! කොතරම් කල් උහුලන්වද? අවි ගනිමු සෝයුරනි!''

මේ නිර්භය කතාව කළ පුද්ගලයා අපනාසි මත්යූෂෙන්කොය. ඔහු වහාම දුවගොස් තුවක්කුව ගත්තේය. නැවියන් ඔහු හැඳින්වූයේ නොසන්සුන් මිනිසා හැටියටය.

''අණදෙන නිලධාරි දුෂ්ටයා හංගවේවා! සාර් හංගවේවා! නිදහසට ජයවේවා!'' මත්යූෂෙන්කො සටන් පාඨ හඬ නැගීය.

පෙළගැසී සිටි නැවියෝ දුවගොස් තුවක්කු ගත්හ.

ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් නැවේ තැනක සැඟවී අත තිබූ රිවෝල්වරයෙන් වෙඩි තැබීය. වෙඩි පහර කෑ නාවිකයෙක් බිම ඇද වැටී මිය ගියේය. නාවිකයින්ගේ නායකයාවූ නිර්භය, ස්ථිර සටන්කාමී වකුලින්චුක්ය මෙසේ මරුමුවට පත්වූයේ. ඔහු බොල්ෂෙවික්වාදියෙක් විය.

''නුඹ මැරුවානම් නුඹටත් මරණය!'' මෙසේ කී මත්යූෂෙන්කො එක වෙඩි පහරින් නිලධාරියා මරා දැම්මේය.

නාවිකයෝ කුපිත වූහ, දුෂ්ට නිලධාරීන් කිප දෙනෙකු අල්ලා ගෙනැවිත් වෙඩි තබා මරන ලදහ. අණදෙන නිලධාරියා බියවී සැඟවුණේය. ඔව්හු ඔහු සොයා ගෙනවුත් මුහුදට වීසි කළහ.

''පොතෙම්කින්'' යුධ නැව නිදහස්ය. දැන් කුමක් කරමුද? නැවේ අණදෙන්නා කවුද? නැව ගෙන යා යුත්තේ කොහේද?

නාවිකයින්ගේ මණ්ඩලයක් තෝරා එහි නායකයා ලෙස අපනාසි මත්යූෂෙන්කෝ තෝරා පත්කර ගන්නා ලදී. ඔඩෙස්සාව බලා යාමට තීරණය විය. සාර් රජුගේ කොඩිය ගළවා විසි කොට, 1905 ජූනි 14 ද නාවිකයෝ තම විප්ලවවාදී ධජය එසවූහ.

යුධ නැව රතු කොඩිය සහිතව ඔඩෙස්සාව බලා වේගයෙන් යාත්‍රා කළේය. විප්ලවයේ ධජය හිරු රැසින් බැබළිණි. ප්‍රදීපයක් මෙන් එය මග ආලෝක කළේය. නිදහස සඳහා සටන් කරන ලෙස එය නැවියන්ට ආයාචනා කළාක් මෙනි.

නැව ඔඩෙස්සා වරායට ළං විය. රාත්‍රි අන්ධකාරය පැතිරිණි. ප්‍රොජෙක්ටර් පහන් අඳුරේ මග සොයාගැනීමට නැවට ආධාර විය. ප්‍රොජෙක්ටර් පහන් ඔඩෙස්සා නගරයේ අඳුරු වීදි හා කළු මුහුද ආලෝක කළේය. නැවේ කාල තුවක්කු ඔඩෙස්සා නගරයට වෙඩි තැබීම සඳහා එල්ල කරන ලදී. නගරයේ කම්කරුවන් ධනපති කම්හල් හිමියනට එදිරිව වැඩ නවත්වා දින කීපයකි. නගරයේ පොලිස් හා නිලධාරී පාලක කාර්යාලවලට වෙඩි තබා ඔවුන් විනාශකොට කම්කරුවන්ට ආධාර කරන ලෙස කම්කරුවන් ඉල්ලා සිටි නමුදු, නැවියන්ගේ නායක බොල්ෂෙවික්වාදී වකුලින්චුක් නිලධාරියකුගේ වෙඩි පහරින් මිය ගොසිනි, ඉතිරි නැවියන් තරුණය, පළපුරුදු අඩු අයය.

මේ අතර සාර් රජ පිටර්බුර්ගයේ සිට සෙවස්ටෝපල් යුධ නැව් කණ්ඩායමට අණ දුන්නේය:

''කැරල්ල වහාම මඩිනු!''

සෙවස්ටෝපලයේ තිබූ හැම යුධ නැවක්ම ''පොතෙම්කින්'' නැවට පහරදීම සඳහා ඉදිරියට යන්නට විය.

හතර වැනි දින උදෑසන ''පොතෙම්කින්'' නැවේ මුර භටයෝ ඈත එන නැව්වල කුඹ ගස් දුටහ. නැව් කීපයක් තම නැවට පහර දීමට එන සැටි ඔවුන්ට පෙනිණි.

මෙසේ සටන් පිණිස පැමිණි නැව්වල ගණන දහතුනකි.

''පොතෙම්කින්''හි අනතුරු හැඬවීමත් සමග නැවියෝ අවි ගත්හ. මීළඟට කුමක්ද?

''පොතෙම්කිනය'' නිහඬව නැව් හමුදව ඉදිරියට ගියේය. මත්යූෂෙන්කොගේ අණ අනුව සංඥා කරන ලදී: ''පොතෙම්කිනය'' ට පහර නොදෙන ලෙස සියලු නැව්වල අණදෙන නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිමු''.

නැව් දහතුනේම නාවිකයෝ ජය හඬ නගමින් ''පොතෙම්කිනය'' පිළිගත්හ. එක් නැවකින් සංඥාවක් ලැබිණි: ''අපිත් ඔබ සමග එක්වමු''.

මේ නැව හංස ධේනුවක් මෙන් කෙමෙන් ''පොතෙම්කිනය''ට ළං විය. නැවියෝ මහත්වූ ජය හඬ දුන්හ.

නෞකා කණ්ඩායමේ නිලධාරියාට තැති ගැනීමට හේතු තිබිණි: අනිත් නැව් පවා කැරැල්ලට එකතු වුණොත්? ඔහු මෙසේ අණ කළේය: ''නැව් කණ්ඩායම වහාම සෙවස්ටෝපලය දක්වා පසුබැසිය යුතුය.''

කැරළි ගැසූ රතු කොඩි රැගත් නැව් දෙකක් ඔඩෙස්සා වරායට ඇතුළු වුවද, නගරය අල්ලා නොගත්තේය. කිසිවක් බලාපොරොත්තු වූහ. අස්ථිර ගතියෙන් වැනුනහ... කුමක් කළයුතුදැයි ඔවුහු නොදත්හ.

''පොතෙම්කින්''යේ ඛණිජ තෙල් අවසන්වීමට ළංවිය. බීමට ගන්නා ජලය ඉවර වීගෙන ආවේය. නැවියෝ නොසන්සුන් වූහ. කුමක් කළ යුතුද?

''පොතෙම්කින්'' නැව සමග එක්වූ අනික් නැවේ නැවියෝ අධිෂ්ඨාන ශක්තියෙන් හීනවූවෝ, විප්ලවයේ රතු කොඩිය ඔවුහු ගළවා දමා යටත්වූහ.

''පොතෙම්කින්'' නැව වරායෙන් පිටවී මහ මුහුදට ගියේය.

මේ අතරතුරදීය, කැරළිකාර නාවිකයින්ට ආධාර ලබා ගැනීම පිණිස එහි නියෝජිතයෙක්, ලෙනින් හමුවීමට ජිනීවා නගරය බලා පිටත්වූයේ. ලෙනින් ඔහුට මෙසේ කීවේය: ''නිර්භය ලෙසත්, සීඝ්‍ර ලෙසත් ක්‍රියා කරන ලෙස නැවියන්ට වහාම දන්වා ඔවුන්ගේ සිත් දිනා ගන්න. ඔඩෙස්සා නගරය වහාම අප අතට ගත යුතුය...''

නියෝජිතයා නැවත ඔඩෙස්සා නගරයට පැමිණෙන විට ''පොතෙම්කිනය'' එහි නොතිබිණි. රතු කොඩිය සහිත යුධ නැව මුහුදට ගොසිනි.

නැවේ ඉතිරිව තිබුණේ වතුර ටිකකි. ඉක්මනින්ම යමක් කළ යුතුය. නැව පෙඩෝසියාවට පැමිණියේය:

''බීමට වතුර දෙන්න!''

පාලකයෝ ප්‍රතික්ෂේප කළහ: ''කැරළි කරුවන්ට වතුර නොදෙමු.''

නැවත රතු කොඩිය සහිත නැව මුහුදට ගියේය. අපරාජිත ඔවුනම යාමට තැනක් නැත. නැවියෝ නොසන්සුන් වූහ. පිළියම කුමක්ද?

එකොළොස් වැනි දින ''පොතෙම්කින්'' යුධ නැව රුමේනියාවට පැමිණියේය. පිටරටකි. විදේශීය වරායකි.

''පොතෙම්කින්'' නැවේ වීරයින්ගේ ශක්තිය සිඳී ගොසිනි. වතුර, බීම අඟුරු හා ආහාර කිසිවක් නැත.

''නැව අපට දීපල්ලා! අපි නුඹලාට නවාතැන් දෙන්නම්. සාර්ට නුඹලාව පාවා දෙන්නේ නැහැ.'' රුමේනියානු ආණ්ඩුව නැවට දන්වීය.

''පොතෙම්කින්'' නැවේ වීර නැවියෝ අවසාන රාත්‍රිය එහි ගතකළෝ, ස්වාධීන නැවෙන් සමුගත්හ! දවස් එකොළහක් තිස්සේ ''පොතෙම්කින්'' නෞකාවේ නාවිකයෝ සෙනවිවරුන්, යුධ නිලධාරීන්,සාර් හා ධනපතීන් බිය වද්දමින් වීරෝදර ලෙස සටන් කළහ.එම නැව විප්ලවයේ ධජයට පක්ෂපාතව ක්‍රියා කළේය.''පොතෙම්කින්''යුධ නැවට ජයවේවා!

## රහස් හමුවීම්

මොස්කව් සිට පිටර්බුර්ග් බලා සීඝ්‍රගාමී දුම්රියක් දුවයි. එය පිටත් වීමට තව ඇත්තේ විනාඩි හතරකි. මගීහු තමන්ට අයත් අසුන් වල වාඩිවූහ. මගීන්ට ආයුබෝවන් කීමට පැමිණි මිනිස්සු කාණ්ඩ ගැසී දුම්රිය මැදිරිවලට ඇතුළුවන දෙරටු අසල සිටියහ. අවසාන මැදිරිය අසල ඔත්තුකරුවෝ දෙදෙනෙකි.

''තවමත් නැහැ නෙව...'' හුස්ම හෙළමින් එකෙක් පැවසීය.

''අවසාන මොහොතේ දුවගෙන ඒවි. එතකොට බලාගත හැකි'' යැයි අනෙකා පැවසීය.

ඔවුහු තම තොප්පිවලට යටින් විපරම් බැලුම් හෙලූහ. වේදිකාවට තවත් මගීන් පැමිණ ඇත. එකෙක් පළල් උරතල සහිත මිටි මිනිහෙකි. ඔහුගේ එක් අතක බෑගයකි. අනික් අත ගමන් මල්ලකි. එවැනි කහපාට ගමන් මලු ඇත්තේ පිත්ලන්තයේය. ඔහු නිල් පැහැති ඇස් කණ්ණාඩි පැළඳ සිටී. අනිකා කොටු සහිත රෙද්දකින් මසන ලද කබායක් ඇඳ සිටී. ඔහු ජේත්තුකාරයෙකි.

නිල් ඇස් කණ්ණාඩි පැළඳ සිටි මිටි මිනිහා කිසිවක් කීවේය. ඔත්තුකරුවනට එය නැසිණි. ඔවුහු නොසන්සුන්වීමට පටන් ගත්හ. ඔවුන් ලුහුබැඳ ගිය පුද්ගලයා මෙහි පැමිණ නැත.නිල් පැහැති ඇස් කණ්ණාඩි පැළඳ සිටින මිනිහා කවුද? ඔත්තුකරුවන් බලාපොරොත්තු වී සිටි මිනිහා නොවේ, එසේවුවද සැක කටයුතු පුද්ගලයෙකි... ඔත්තු කරුවෝ නිල් කණ්ණාඩි කාරයා පිටුපසින් ගියහ.

දුම්රිය පිටත් විය. නිල් කණ්ණාඩි කාරයා බෑගයත් කහ පාට ගමන් මල්ලත් රැගෙන දුම්රියට නැග ගත් අතර ජේත්තුවට ඇඳ සිටි මිනිහා ඔහුගෙන් සමුගෙන වේදිකාවේ නැවතුණේය.

''මිනිහ ආවේ නැහැ නෙව'' බලාපොරොත්තු රහිත ලෙස ඔත්තුකරු පැවසීය. ''ඒ මිනිහා පිටර්බුර්ගය බලා යන බව ඔත්තුකාර සේවයේ ලොක්කන්ට වාර්තා කර ඇත. ආවේ නැහැ. මෙන්න ඔහුගේ ඡායා රූපය. මේ වගේ හැඩහුරුකම් ඇති මිනිහෙක් ආවේ නැහැ.''

ඔහු තම සාක්කුවෙන් ඡායා රූපයක් ගෙන බැලීය. එහි තිබුණේ පළල් හකු ඇට සහිත මුහුණකි. නළල පළල්ය. ඇස්බැම් විශාලය. දෙනෙත් උපහාසාත්මක බවක් පළකරමින් මඳ සිනා පාන සැටියකි.

"ලෙනින්-උල්යානොව්. ජිනීවා නගරෙ ඉඳල රුසියාවෙ කම්කරු කැරැල්ල මෙහෙයවන්ට ආවා. ලොක්කො කිවා නොවරදවා අල්ලා ගන්ට කියල. හෙට ආපහු එමු දුම්රිය පොළට" මෙසේ කී ඔත්තුකරුවා ඡායාරූපය සාක්කුවේ දමා ගත්තේය.

සීඝ්‍රගාමී දුම්රිය මග දෙපස කපු පැලවලට දුම් සහ කුඩා අඟුරු කැට විහිදුවමින් දුවයි. අහස පැහැදිලිය. තරු දිලිසේ. අවට වනය හිමෙන් වැසී ඇත.

දුම්රිය හඬ නගමින් වේගයෙන් දිවවේය. දුම්රිය යන්ත්‍රයේ පහන දෑවැන්ත සතෙකුගේ ඇසක් මෙනි. රෝද ටක් ටක් යන හඬක් පිටකරමින් භ්‍රමණය විය.

උදෑසන පිටර්බුර්ගයට පැමිණි, නිල් පැහැති ඇස් කණ්ණාඩි පැළඳගත් මිනිහා කුලී අස් රියකින් නගරයේ මැද පිහිටි ගෙයකට පැමිණියේය. එය ඔහුගේ නිවසද? කුඩා කාමරයකි. තුනී ඇඳ රෙද්දක් සහිත යකඩ ඇඳකි. කවුළුව අසල අතිශයින්ම කුඩා මේසයකි, පුටුවකි. වෙනත් ගෘහ භාණ්ඩ එහි නොතිබිණි.

මිනිහා තම ඇස් කණ්ණාඩි කුට්ටම ගළවා කහ පැහැති ගමන් මල්ලෙන් කඩදසියක් ගෙන යමක් ලියන්නට විය.

පැයකින් ඔහු සිටි කාමරයේ යතුරු සිදුර තුළ යතුරක් කරකැවෙන හඬක් ඇසිණි. දොර ඇර ගෙට ඇතුළු වූයේ නදේෂ්ද කෲප්ස්කයාය. ඈ හිම තොප්පියක් හා හිම කබායක්ද දෑතේ ඇඟිලි උණුසුම් කරන මුජ්ටියක්ද ඇඳ සිටියාය.

ලෙනින් නැගිට සිටියේය: "නදේෂ්ද, පෙම්බරිය!"

"මොස්කව් නගරෙදි ඔයාව පොලීසිය සෙව්වද?" කෲප්ස්කයා බියකින් ප්‍රශ්න කළාය.

"හොයන්ට බොහොම මහන්සි වුණා!" ලෙනින් පිළිතුරු දුන්නේය.

තම කැළඹීම සඟවා ගැනීමට තැත්කළ කෲප්ස්කයා ලෙනින්ගේ බෑගයේ බඩු අස්කිරීමට සැරසුණාය. "ඔයාට මොකටද නිල් පාට ඇස් කණ්ණාඩි?" ඈ ඇසුවාය.

"වෙස් වළාගැනීමට. ඔය ඇස් කණ්ණාඩි කුට්ටමට පින්සිදු වෙන්ට පොලිස් ඔත්තුකාරයින්ගෙන් බේරී ආවා, නදේෂ්ද!"

ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් සහ නදේෂ්ද කොන්ස්තන්ත්තිනොව්නා කෲප්ස්කයා ජිනීවා සිට රහසේ රුසියාවට පැමිණ ව්‍යාජ නම් සහ පාස්

පෝට් බලපත්‍ර ඇතිව පිටර්බුර්ගයේ වාසය කළහ. රහසේ හමුවූහ. ඔවුන්ගේ හමුවීම් හදිසි, කෙටි ඒවා විය.

මොස්කව් සිඩින් ගැන නදේෂ්දට කීමට ලෙනින් යුහුසුලු විය. ලෙනින් එහි ගියේ පාක්ෂික සහෝදරවරුන් සමග සාකච්ඡා කිරීමටය.

ඔක්තෝබර් මාසයේදී මොස්කව්හි දුම්රිය කම්කරුවෝ ස්ට්‍රයික් කළහ. පසුව මොස්කව්හි කම්හල්ද, ට්‍රැම්රථ සේවකයෝද, අස් රියැදුරෝද වැඩ නැවැත්වූහ. විදුලිය බල කම්කරුවන්ගේ වැඩ වර්ජනය නිසා නගරයද ඇඳිරි විය. නගරයේ ජල නල මාර්ග හිස් කරවමින් නල මාර්ග සේවක පිරිසද සටනට එකතු විය. මොස්කව් නගරයේ කම්කරු ජනතාව සමස්ත මහා වැඩ නැවැත්වීමක යෙදුනේය. ජනතා සටන කෙමෙන් ගම්වලටද පැතිරිණි.

විප්ලවීය සටන මොට්ටකර දැමීම පිණිස කපටි සාර් රජු ප්‍රකාශනයක් නිකුත් කළේය. කම්කරුවන්ට නිදහස හා අයිතිවාසිකම් දෙන බවට ඔහු ප්‍රකාශනයෙන් පොරොන්දු වුවද, එය රැවටීමක් විය. සාර් විශ්වාස නොකළ යුතු බව කම්කරුවෝ දැන සිටියහ. 1905 ජනවාරි මාසයේදී සාර් පිටර්බුර්ගයේ කම්කරුවන් මරා දැමූ සැටි ඔවුන්ට අමතක නොවීය.

1905 දෙසැම්බර් 7 ද දහවල් 12 ට මොස්කව් නගරයේ සමස්ත මහා වැඩ වර්ජනයක් අරඹන ලදී. ආණ්ඩුව කම්කරුවන්ට පහර දීමට යුධ හමුදා යෙදවීය. එවිට කම්කරු ආරක්ෂක භට කණ්ඩායම් ක්‍රියාකාරී විය. වීදිවල, චතුරශ්‍ර හා මහ මාවත්වල, පැක්ටරි හා කම්හල්වල කපොලු සෑදූ කම්කරුවෝ සටනට සූදානම් වූහ.

කැරළි ගැසූ කම්කරුවන්ගේ ප්‍රධාන බලය වූයේ මොස්කව්හි ප්‍රෙස්න්යා පෙදෙසේ කම්කරුවන්ය. කම්කරු පෙදෙසක්වූ මෙහි බොහෝ කම්හල් හා පැක්ටරි තිබිණි. ප්‍රෙස්න්යා පෙදෙසේ කම්කරුවෝ කම්කරු සෝවියට් සභාවක් පිහිටුවා ගෙන ප්‍රාදේශීය පාලන බලය සියතට ගත්හ.

පාබල හමුදා, අසරු භට හමුදා, කාල තුවක්කු භට හමුදා සහ කොසාක් හමුදා සාර් ආණ්ඩුව විසින් ලහි ලහියේ මොස්කව් නගරයට යවන ලදී. සාර්ගේ කාල තුවක්කු ප්‍රෙස්න්යා පෙදෙසේ කම්කරු ගෙවල්වලට හා පොදු නිවාස වලට වෙඩි තැබීය. ගිනි පෙට්ටි මෙන් ඒවා ගිනි බත් විය.

දවස් දහයක් තිස්සේ කම්කරුවෝ සහ බොල්ෂෙවික්වරු අවිගෙන සාර් හමුදාවලට විරුඬව සටන් කළහ. එහෙත් සාර්ගේ කාල තුවක්කු හමුදා සාපරාධී ලෙස වෙඩි තබමින් කම්කරු කැරළි මැඩ පැවැත්වීය.

කම්කරුවන් අවි නොගත යුතුව තිබුණේද?

''අවි නොගත යුතුයැ!''යි මෙන්ෂෙවික්වරු කීහ.

''ඔවුන් අවි නොගත යුතුව තිබුණේයැ''යි රුසියාවේ පළමුවැනි මාක්ස්වාදියා හැටියට ප්‍රකටව සිටි ප්ලෙඛානොව් පැවසීය.

රුසියාව පුරා කම්කරු විප්ලවවාදී සටන් පැන නැගින. ප්ලෙබානොව් බොල්ෂෙවික්වාදීන්ගෙන් වැඩි වැඩියෙන් ඈත් විය.

''කැරළි ගැසීම අවශ්‍ය විය. කම්කරුවන් අවිගෙන සටන් කිරීම නිවැරදිය. එය කළ යුතුව තිබිණි. කම්කරු පංතිය සටන්කාමී පළ පුරුද්දක් ලබා ඇතැ''යි ලෙනින් දෘඩ ලෙසම පවසා සිටියේය.

මොස්කව්හි අවි ගත් සටන් පිළිබඳව විස්තරයක් තම බිරිඳට කළ ලෙනින් එම සිඩීන් ගැන ඈ සමග සාකච්ඡා කළේය. ලෙනින්ගේ බිරිඳ නදේෂ්ද ක්‍රෲප්ස්කයා එවකට බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ලේකම් ධුරය දරූ අතර පක්ෂයේ සියලු සම්බන්ධකම්, හමුවීම් හා රහස් සංඥ ක්‍රම ආදී හැමදෙයක්ම මෙහෙයවමින් සිටියාය. ඈ ලෙනින්ගේ කිට්ටුතම සහකාරිය වූවාය.

දෙදෙනාම එක්ව වටිනා පාක්ෂික සහෝදරයකුවූ නිකොලායි බාවුමන් සිහි කළහ. ලෙනින් සමග එක්ව බාවුමන් බොල්ෂෙවික් පුවත්පතවූ ''ඉස්ක්‍රාව'' පළකිරීමට ක්‍රියා කළේය. පිටරට සිට පුවත්පත රුසියාවට ගෙන ඒම සඳහා සංවිධාන කටයුතුවල හේ යෙදුණේය. පොලිසිය ඔහු අල්ලා සිරගෙට දැමූ නමුදු ඔහු එයින් පැන ගියේය. ඔහු නැවතත් පක්ෂයේ වැඩ කළේය. සාර් පොලිසිය බාවුමන් නැවත වරක් සිරභාරයට ගත්තේය.

1905 ඔක්තෝබර් මාසයේදී ඔහු නිදහස් කරන ලදී. ඊට දවස් කීපයකට පසු පවත්වන ලද මහජන පෙළපාලියක් මෙහෙයවමින් සිටි නිකොලායි බාවුමන්ට කුලී මිනීමරුවෙක් යකඩ පොලු පහරක් ගැසීය. මාරක එම පහරින් ඔහු මැරී වැටිණි.

බොල්ෂෙවික්වාදී නිකොලායි බාවුමන්ගේ අවමගුල් පෙරහැරට දහස් ගණනක් කම්කරුවෝ සහභාගි වූහ. හේ නිර්භය, ලස්සන, නිර්මල විප්ලවවාදී වීරයෙක් විය...

''මෙවැනි මිනිසුන් නිසා අපේ පක්ෂය ශක්තිමත් වීයැ''යි ලෙනින් පැවසීය.

ලෙනින් හා බිරිඳ කවුළුව අසලට පැමිණියහ.

''බලන්න වලෝද්‍යා!'' ඈ තම සැමියාට කීවාය.

කවුළුවට විරුඩ පැත්තේ වීදියෙන් එහා හිම කබායක් සහ කොටු සහිත මප්ලරයක් ඇඳගත් මිනිසෙක් සිටගෙන සිටී. බැලූ බැල්මට ඔහුගේ පෙණුම යහපත් වුවද, ඔහු රුවක් මෙන් නොසැලී සිටී. ඔහුගේ සගයා පදික වේදිකාවේ ඔබ මොබ සක්මන් කරයි.

''පදිංචිය වහාම වෙනස් කරන්ට ඕන.'' ලෙනින් තම බිරිඳ අමතමින් කීවේය.

තමා විසින් ලියා නිම කරන ලද ලිපිය බිරිඳ අතට දුන් ලෙනින් කහ

පැහැති ගමන් මල්ල ඇඳ යටට තල්ලු කළේය. නදේෂ්ද නිහඬව ලිපිය තම සැට්ටය තුළ සඟවා ගත්තාය.

''ඉක්මනට දුවන්ට පුළුවන් නම්'' ඇ පැවසුවාය.

ලෙනින් නිසා ඈ නොසන්සුන් වූවාය.

සැම දවසක්, පැයක් හා විනාඩියක් පාසාම ලෙනින් සාර් පොලිසියට අසුවීමේ අවදානම වැඩි වෙන්නට පටන් ගත්තේය. දීඝ කාලීන සිර දඬුවමකට හෝ සදහටම සයිබීරියාවට පිටුවහල් කිරීමට හෝ ලෙනින් ගොදුරු විය හැකිය.

එහෙත් ඈ තම සිතෙහි ඇතිවූ නොසන්සුන්තාවය ගැන ඔහුට නොකීවාය. ඈ ඔහු හමුවීමට පැමිණියේ සහෝදරවරු කිසියම් ස්ථානයක ඔහු බලාපොරොත්තු වන බව පැවසීමටය. තම දුක්බර හැඟීම් යටපත් කරගෙන ඈ එම පණිවුඩය පමණක් ඔහුට දැන්වූවාය. මෙතැනින් වහාම ඉවත්ව යා යුතුය. දැනටමත් ඔත්තු කරුවන්ට ඉව වැටී ඇත...

ලෙනින් තම බිරිඳගේ අතක් ගෙන ඇට ළංවී මහ මග දිගේ ගමන් කළේය. ඔවුන් වමට හැරී ගමන් කළ යුතුව තිබුණද දකුණට හැරුණහ. ලෙනින් විවිධ ප්‍රසංගයක් පිළිබඳ කතාවක් ඇට කීවේය. එම විවිධ ප්‍රසංගය බැලීමට යමුයි ඔහු ඇට යෝජනා කළ විට ඈ හිස වනමින් ඊට එකඟ වූවාය. එහෙත් ඔත්තුකරුවන් ළංවී සිටින බව ඈ ඔහුට ඇසක් අඩවන් කරමින් සංඥ කළාය. කොටු සහිත මජ්ලරය ඇඳ සිටි පුද්ගලයා පෙර මෙන්ම එකතැන ගල් ගැසී සිටී. අනිකා නොඉවසුම් ලෙස දුවන්නට විය.

ලෙනින් කුලී අස්රියකට අඬ ගැසීය.

ළඟින් ගිය අස්රියක් නවත්වන ලදී. ඔත්තුකරුවන් සිටි තැනට අඩි කීපයක් ඈතින් නවත්වන ලද අස්රියට නැගීමට තම බිරිඳට උදවුකළ ලෙනින්, ඈ වාඩිවූ පසු තමාත් වාඩිවිය.

''සදෝවයා වලට යමු!'' යැයි ඔහු අස්රිය කරුට කීවේය. ඒ අතර ඔහු තම බිරිඳට පහත් හඬින් ජර්මන් බසින් මෙසේ පැවසීය: ''මේ ඔත්තුකරුවෝ හිම කුණාටුවට අහුවෙලා සීතලේ ගල් ගැහිලා යනවානම්, ඒ තරමට හොඳා.''

සදෝවයා දක්වා නොගොස් අතරමගදී අස් රියෙන් බැස පෙර සිටම තමා හොඳින් දන්නා ගෙවත්තකට නදේෂ්ද කෘෂ්ප්ස්කයා සමග ඇතුළු වී ඔත්තු කරුවන් රවටනු පිණිස වයිලෙට්ස්ක් දූපතට ගියේය. එය ජනවාරි මාසයේ දවසකි. පීටර්බුර්ගයේ එදවස හිරු එළිය තිබුණද දැඩි ශීත නිසා දෙකොපුල් විනිවිද යන්නට විය. වියලි හිම පියලි වැටිණි. නගරය සුදෝසුදු හිම සලුවකින් වැසුවාක් මෙනි.

''මේ හිම දර්ශනය නොදැක මට කාන්සියක් ඇතිවුණා'' යැයි ලෙනින් කීවේ ප්‍රබල හැඟීමකිනි.

''රුසියානු හිම. අපේ හිම!'' ඈද ඔහු අනුව පැවසුවාය.

අහම්බෙන් හෝ ඔවුන් දෙදෙනාට මෙසේ එකට ගමන් කිරීමට හා හමුවීමට හැකි වීම නිසා ඔවුහු ප්‍රීති වූහ.

ඈදිරි වැටෙන්ට පටන්ගත් විට ලෙනින් තම බිරිඳගෙන් ලැබුණු ලිපිනය බලා පිටත් වූයේ ඔහු පිටුපස ඔත්තුකරුවන් නොඑන බව පිරික්සා බැලූ පසුවය. පිටර්බුර්ගයේ බොල්ෂෙවික්වරු සහ දේශපාලනය අතින් දියුණු කම්කරුවෝ ලෙනින්ගේ කතාවක් ඇසීමට රැස්වූහ.

## නැවත පිටරට

අවුරුදු දෙකක් තිස්සේ රුසියාව පුරා කම්කරුවෝ හා ගොවියෝ කැරළි ගැසූහ. අවුරුදු දෙකක් තිස්සේ සාර් ආණ්ඩුව කැරළි මර්දනය කළේය, රුසියානු විප්ලවය විනාශ කළේය. පසුව පළිගැනීම් ආරම්භ විය: සමූහ වශයෙන් හිර භාරයට ගැනීම, පිටුවහල් කිරීම, දස දහස් ගණනක් එල්ලා මැරීම...

ලෙනින් පිටර්බුර්ගයට නුදුරින් පින්ලන්තයේ වාසය කරමින් බොල්ෂෙවික් පක්ෂයේ රහස්, නීති විරෝධී පුවත්පත වන ''ප්‍රොලිතාරියී'' පළ කළේය. එතැන සිට බොල්ෂෙවික් පක්ෂයේ පිටර්බුර්ග් මධ්‍යස්ථානය සමග සම්බන්ධකම් ඇති කර ගත්තේය. ලෙනින්ගේ දේශපාලන නියමයන් රැගෙන නදේෂ්ද ක්‍රෑප්ස්කයා පිටර්බුර්ගයට නිතර පැමිණියාය.

වරක් ඈ පිටර්බුර්ගයේ සිට ලෙනින් වෙත ගියේ මහත් කනස්සල්ලකිනි. සාර් ආණ්ඩුව ලෙනින් කෙරෙහි දැඩි කෝපයෙන් යුතුව ඔහු ඇල්ලීමට කටයුතු කරන සැටි ඈට දැනගන්නට ලැබිණ. හැම පොලිස් කාර්යාලයකටම යවන ලද නියෝගයක මෙසේ සඳහන් විය:

''බොල්ෂෙවික් නායක ලෙනින් සොයා සිරභාරයට ගනු!''

එවකට පින්ලන්තය සාර් අධිරාජ්‍යයට අයත්ව තිබිණ.

බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යස්ථානය යෝජනාවක් සම්මත කළාය: ලෙනින් විදෙශ ගතවිය යුතුය. පිටරට සිට ''ප්‍රොලිතාරියී'' පුවත්පත පළ කළ යුතුය.

''ආයුබෝවන්! ස්වීඩනයේදී නැවත හමුවෙමු''යි ක්‍රෑප්ස්කයා තම සැමියාගෙන් සමුගත්තාය.

බිරිඳ පසුව ස්ටොක්හෝම් නගරයට පැමිණෙනු ඇත. ලෙනින් තනිවම එහි පිටත්ව ගියේය.

ඒ 1907 දෙසැම්බර් මාසය. හෙල්සින්ග්පෝර්ස්හි සිට පින්ලන්තයේ අබෝ නගරය දක්වා දුම්රිය පිටත්විය.

කල්පනාවේ යෙදී සිටි ලෙනින් දුම්රිය කොරිඩෝරයේ සිටි මිනිසා නොදිටීය. ජනේල වීදුරුවෙන් එහා සිටි ඒ මිනිහා දෙස බැලූ සැටියේම ඔහු පොලිස් ඔත්තුකරුවෙකු බව ලෙනින් දැන ගත්තේය. ලෙනින්ට ඔවුන් අඳුනාගැනීමේ පුදුම ඉවක් තිබිණි. අබෝ නගරයේ දුම්රිය පොළේදී තමා සිර භාරයට ගැනීමට පොලිසිය සූදානමින් සිටිතියි ලෙනින් අනුමාන කළේය. ඔහු සමග දුම්රියේ ගමන් කරන ඔත්තුකරුවා දැනටමත් විදුලිය පණිවුඩයක් යවා ඇතැයි සිතිය හැකිය.

තත්ත්වය අසතුටුදායකය. අබෝ නගරයට පෙර තිබූ අවසාන දුම්රිය පොළද පසුකර ගොසිනි. දුම්රිය ලෙනින් පොලිසියේ මාර කටටම ගෙන යයි. ලෙනින් වීදුරුවට එහා කොරිඩෝරයේ සිටි ඔත්තුකරුවා දෙස බැලුවද, ඔහු පෙනෙන්ට නොසිටියේය. ඔහු තම අසුනේ වාඩිවී විවේක ගනී. තව පැයකින් ලෙනින් සිරභාරයට ගනු ඇත.

ලෙනින් තම කුඩා බෑගයත් රැගෙන අසුනෙන් නැගිට සිට, මැදිරියේ දොරටුව දෙසට සෙමින් ගමන් කළේය. දොර හැරියේය. කුඩා හිම කැට සහිත සුළඟක් හමයි. දුම්රිය වේගයෙන් දුවයි! දුම්රිය මැදිරිය ගමන් වේගය නිසා වැනෙයි. දෙපයින් සිටගැනීම පවා අපහසුය. ලෙනින් විනාඩි කීපයක් නැවතී සිටියේය. දුම්රියෙන් පැනීමට තීරණය කළේය. දුම්රිය රෝද පීලිවල ගැටෙන ශබ්දය ඇසේ. වංගුවෙන් හැරෙන විට දුම්රිය තරමක් වේගය අඩුකරන සැටියක් ඔහුට දැනිණි. සැබැවින්ම එසේ විය. වෙනත් මගක් නැතිය. ලෙනින් දුම්රියෙන් බිමට පැන්නේය. ඔහුගේ සිතෙහි චකිතයක් ඇතිවිය.

ලෙනින් වැටුණේ හිම පිරි වළකටය. හිම කබායේ කර පටිය තුළට හා හිම සපත්තු තුළට හිම පියලි ඇතුළු විය. ඔහු හිම ගොඩට යටවිය. වාසනාවකි! ඔහුගේ අත් පා නොකැඩිණි. අනතුරක් ඔහුට සිදු නොවිණ. දුම්රිය හූ හඬ නගමින් දිව ගියේය. අවසාන දුම්රිය මැදිරියේ පිටුපස ඇති රතු ලාම්පුවද නොපෙනී ගියේය. දුම්රියේ හඬ ඇත ගොස් නිහඬ විය. නැවත හිම වැස්ස පටන් ගැනිණි. අහස වළා රහිතය. තරු දීප්තිමත්ය. රැබෝ විය.

ලෙනින් හිම වළෙන් නැගිට හිම පිසදමා ගෙන දුම්රිය පාර දිගේ අබෝ නගරය දක්වා පයින්ම ගමන් කරන්නට විය. කොතෙක් දුර යා යුතුද? නගරය දක්වා යා යුතු දුර ප්‍රමාණය හැතැප්ම හයක් පමණ වේ. රාත්‍රිය හා හිම වැස්ස නොතකා විදේශීය රටක පයින් ගමන් කිරීම සතුටට කරුණක් නොවූවද, සාර් පොලිසියෙන් බේරීමට හැකිවීම වාසනාවකි. ලෙනින්

සමග දුම්රිය මැදිරියේ ගමන් කළ ඔත්තුකරුවාට කුමක් වීද? තමා අතුරුදන් වූ බැව් දැනගත් ඔත්තුකරු හැම දුම්රිය මැදිරියකම තමා සොයන විලාසය ලෙනින් සිතින් මවා ගත්තේය. ''අත්හැර දැම්මා නම් අඩුවම් විඳපන්!'' යැයි ලෙනින් කියමින් සිනාසුණේය.

අබෝ නගරය දක්වා ගොස් ස්වීඩනය බලා යන නැවක නැගීම පමණකි දැන් කළ යුත්තේ. අවදානම මග හැරිණි.

ලෙනින් නැවට නැගීමට පමාවිය. අවදානම මග හැරුණා නොව තමාට ළංවී ඇති බැව් ඔහුට දැනිණි. නැව් තොට පුරා රුසියන් පොලිස් කාරයෝ සහ ඔත්තුකරුවෝය. එය අහළකටවත් යාම නුවණට හුරු නැත. නගරයේද පොලිස් භටයෝය. අබෝ නගරයේ සිට ස්වීඩනයේ ස්ටොක්හෝම් නගරය දක්වා යාමට ලෙනින්ට ආධාර කරන ලෙස පක්ෂ මධ්‍යස්ථානයට දැන්වූ පින්ලන්ත ජාතික බොල්ෂෙවික්වාදියා ඔහුට ඒ බව දැන්වීය. වහාම අබෝ නගරයෙන් පිටවී යා යුතුය.

පින්ලන්ත ජාතිකයා මුහුදු තීරයේ මස් මරන ජනපදයකට ලෙනින් පිටත්කර යැවීය. මෙහි ගල්පර සහිත කුඩා දූපත් හා අඩ දූපත් සිය ගණනකි. කුඩා වරායවල් මුහුදු බොකු කිහිපයකි. මේ කුඩා හා විශාල දූපත් මුහුදේ ඈත පිහිටියේය. දැන් ඒ හැම දූපතක්ම හිමෙන් හා අයිස්වලින් වැසිලාය.

ස්වීඩනයේ නැව් නවත්වන ගල්පර සහිත එක් දූපතකට ලෙනින් ගෙන යාමට මස් මරන්නෝ දෙදෙනෙක් කැමති වූහ. අයිස් කඩන යන්ත්‍ර ඝන අයිස් තට්ටු කඩා නැව් ගමන සඳහා යාත්‍රා මාර්ග සාදයි. ස්වීඩන් නැව නවත්වන දූපත අසලින්ද එවැනි යාත්‍රා මාර්ගයක් තැනූහ.

මස් මරන්නෝ දෙදෙන ලෙනින් කැටුව පිටත්වූයේ ඇඳිරි වැටුණු පසුවය. ඊට පෙර එවැනි ගමනක් යාමට සැරසිණි නම්, එතරම් දැඩි නොවන අයිස් තට්ටු මත ගමන ගැන බොහෝ දෙනෙක් සැක කරනු ඇත. අයිස් තට්ටු තවම සෑහෙන තරම් ඝනවී නැත. සමහර තැන්වල එය බිඳී පුපුරා ගොසිනි. සමහර තැන්වල අයිස් තට්ටු වලට උඩින් මුහුදු ජලය මතුවෙලාය. තමන් මග පෙන්වන රුසියානුවා සාර්ට විරුද්ධව සටන් කරන්නෙකු බව මස් මරන්නෝ දැන සිටියහ. පින්ලන්ත වැසියෝ සාර්ට වෛර කළහ. රුසියානු සාර්ට එදිරිව මේ රුසියානුවා සටන් කරත් නම්,ඔවුන් ඔහුට හැම ආධාරයක්ම කරනු ඇත.

මස් මරන්නෝ දිග රිටිවලින් අයිස් තට්ටුවලට අනිමින්, ඒවායේ ඝනකම පිරික්සා බලමින් ප්‍රවේසමින් ඉදිරියට ගියහ. හැම පියවරක්ම තැබුවේ පිරික්සා බැලූ පසුවය. හිම කුණාටු නිසා කම්මුල් වලට දහසක් ඉඳි කටු අනින්නාක් මෙන් විය. අහස ඇඳිරිය. කුණාටුව තවත් දරුණු

විය. මුහුදේ සිට නැව්වල හඬ ඇසේ. හිම කුණාටු හා මීදුම අතරින් නැව් හිම හා අයිස් තට්ටු බිඳිමින් මුහුදු යාත්‍රා මාර්ගය සොයයි.

මෙතරම් අයහපත් කාලගුණය නොතකා තමාට ආධාර කිරිම ගැන මස් මරන්නන්ට ලෙනින් සිතින් කෘතඥතාවය දක්වීය. ''සහෝදරවරුනි, බොහොම ස්තුතියි!''

ඒ ඇඳිරි රැයෙහි තුනී අයිස් තට්ටු මත ඇවිදීම කොතරම් භයානකදැයි ලෙනින් නොදන සිටියේය. ඉදිරියෙන් ගමන් කරන මස් මරන්නෝ සහ පසුපසින් ගිය ලෙනින් නිතර රිටෙන් ඇන අයිස් තට්ටු පිරික්සා බැලූහ. හිටිහැටියේම... අයිස් තට්ටුවක් බිඳී ඉරි තැලිණි. වෙඩි තැබුවාක් වැනි හඬක් ඇසිණි. පයට යටවී ඇති අයිස් තට්ටුව දියවීයාමට පටන් ගත්තේය. බිඳී ගිය අයිස් තට්ටුව ජලයට යටවිය. ලෙනින් අත තිබූ රිට ගිලිහිණි. ලෙනින්ද යටට ගිලා බසින්නට විය.

තමා නැවත ගොඩ ආවේ කෙසේදැයි ලෙනින්ට කිව නොහැකිය. මස් මරන්නෙක් ඔහුට අත දී ඔහු සනැති අයිස් තට්ටුවකට ඇද ගත්තේය.

මස් මරන්නෝ දෙදෙනා ඔහුට පින්ලන්ත බසින් කතා කරමින් ඔහුගේ පිටට තට්ටු කළහ. ජර්මන් බසින්ද කතා කළහ: ''ගෙනොස්සෙ, ගෙනොස්සෙ... සහෝදරයා''.

ඔවුහු සතුටුවූහ. සාර්ට එදිරිව ජනතාව සඳහා සටන් කරන රුසියානු ගෙනොස්සෙට මුහුදට ගිලා බැසීමට ඉඩ නොදී, ඔහු බේරා ගැනීම ගැන මස් මරන්නෝ මහත්සේ ප්‍රිති වූහ.

ලෙනින් ස්වීඩන් නැව නවත්වන දූපත දක්වා මෙසේ ගමන් කොට, නැවකට නැග ස්ටොක්හෝම් බලා ගියේය. ඔහු නදේෂ්ද කෲප්ස්කයා එනතුරු එහි සිටියේය.

ඔවුහු නැවත ජිනීවා නගරයට ගියහ. නැවත විදේශවල වාසය කිරීමට ඔවුන්ට සිදුවිය.

රුසියානු විප්ලවයට පසු ලෙනින් හා ඔහුගේ බිරිඳ නදේෂ්ද ජිනිවා නගරයට පැමිණියහ. දෙසැම්බර් මාසයේදී ජිනීවා නගරය අතිශයින්ම සුන්දරය.

ශීත සමය වුවද ස්විට්සර්ලන්තයේ ජිනීවා නගරයේ හිම නැත. දැඩි සුළං හා කුණාටු පමණකි. පදිකවේදිකා මත ශීතල සුළං හා කුණු රොඩු සහිත කුණාටු හමයි.

නගර වැසියෝ තමන්ගේ ගෙවල්වලට වී සැඟවුණහ. වීදි හා මාර්ග හිස්ය. ජිනීවා නගරය පාලුවෙලාය.

## මව මුණගැසීම

1910 වසර ලැබීය. ලෙනින් නැවත ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරට පැමිණියේ මීට පෙර ඔහු යෙදුණු කටයුතු වලට වඩා හාත්පසින්ම වෙනත් කටයුත්තක යෙදීම පිණිසය.

ශරත් සමයේ දවසක ඔහු ඉමහත් ප්‍රීතියෙන් යුතුව නගරයේ මාවතක් ඔස්සේ ඉක්මනින් හා සතුටින් ගමන් කළේය.

ඔහු ගියේ කොහෙද? ස්වීඩන් ජනතා මන්දිරයේ නිතර නිතර කතා, දේශන හා වාර්තා ඉදිරිපත් කිරීමට ලෙනින්ට ආරාධනා කරන ලදී. විවිධ නගරවල කම්කරුවන් හා විප්ලවවාදී පක්ෂවල සාමාජිකයින් ඉදිරියේ නොයෙක්වර කතා කිරීමට ඔහුට සිදුවිය. ලෙනින් අද ගමන් කරන්නේ මහත් ප්‍රීතියකිනි. ඔහු ස්වීඩන් ජාතිකයින් දෙස බලමින් සතුටු සිතින් පා නගයි. ස්ටොක්හෝම් නගරය නොවිශාලය, නිසලය, එහි මාවත් පටුය, ඇදය, වංගු සහිතය. මේ හැම දෙයක්ම ලෙනින්ට හුරුය, පුරුදුය.

රතු, කහ සහ ලා රතු මල් වෙළඳාම් කරන්නියකු ඔහු දුටුවේය. ඒ තරුණියගේ දෙපා ළඟ මල් බඳුන් කීපයකි.

"කරුණාකරල මට මේ රතු රෝසමල් මිට දෙන්න." ලෙනින් ඇට කීවේය.

ලෙනින් බොල්ෂෙවික් පාක්ෂිකයින් ඉදිරියේ වාර්තාවක් කිරීමට ගියේ මල් මිටියකුත් රැගෙනය.

ජනතා මන්දිරයේ එක් කාමරයක මවු රටින් පැන ආ රුසියානු බොල්ෂෙවික්වාදීන්ගේ රැස්වීමකි.

"ලෙනින්! ලෙනින්!" රැස්ව සිටියහු හඬනගා කීහ.

රුසියානු බොල්ෂෙවිකයෝ ඔහු සාදරයෙන් පිළිගත්හ.

ඔහු පිළිගෙන ඔහුට අතදී ආචාර කිරීමට රුසියානු බොල්ෂෙවිකයෝ ඉදිරිපත් වූහ. හැම දෙනෙක්ම ලෙනින් දැන සිටියහ. ඔහු විසින් ලියන ලද පොත් හා ලිපි මගින්ද "ඉස්ක්‍රා", "වපිරියොඩ්", "නෝවයා ෂිස්න්", "ප්‍රොලිතාරියී", ආදී බොල්ෂෙවික් පුවත්පත් මගින්ද ඔවුහු ලෙනින් ගැන දැන සිටියහ. පක්ෂයේ සම්මේලනවලදී ඔහු දැන හැඳින ගත් අයද වූහ.

නොවිශාල කාමරයේ අවසාන පුටු පේළියක කාන්තාවෝ දෙදෙනෙක් වාඩිවී සිටියහ. ඉන් කෙනෙක් වයෝවෘඩ කාන්තාවකි. ඇ කළු පැහැති ගවොමක් ඇඳ සිටියාය. ඇගේ හැට්ටයේ කර රේන්ද ගෙතුමකින් නිමවන ලද්දකි. ඇගේ හිස කේ හිම මෙන් සුදු පැහැතිය. ඇගේ නාහය හා දෙතොල් සිහින්ය. දෙනෙත් කුඩාය.

''ලෙනින්!'' යැයි රැස්ව සිටියවුන් හඬ නගන විට ඇගේ මහලු මුහුණ මොහොතකට යෞවන බවක් දැරිය.

ඈ අසල වාඩිවී සිටියේ සිහින් දේහයක් ඇති, කළු පැහැති ඇස් ඇති තරුණ කතකි. ලෙනින්ගේ පැමිණීම නිසා ඇද මහත්සේ සතුටු වූවාය. ලෙනින් මහලු කාන්තාව ඉදිරියේ දණ ගසා රතු රෝසමල් මිට ඇගේ දෑතෙහි තැබීය.

''අම්මාත්, අක්කාත් රුසියාවෙ ඉඳල මාව බලන්ට ඇවිල්ලා'' යැයි ලෙනින් තම පාක්ෂික සහෝදරවරුන්ට දන්වීය.

''ඔහෙලගෙ පැමිණීම බොහොම හොඳා. අම්මේ ඔහෙගෙ පුතා නිසා ඔහෙට ආඩම්බර වෙන්ට පුළුවන්'' පැමිණ සිටි එක් බොල්ෂෙවික්වාදියෙක් ලෙනින් මාතාවට කීවේය.

ලෙනින් මේසය අසලට ගොස් වාර්තාව ඉදිරිපත් කළේය. එය ඉතා උසස්, අසමාන වාර්තාවකි. අම්මා තම පුතුගේ කතාවක් ඇසූ පළමුවැනි වාරය එයය. ඔහු තම සගයින් වන බොල්ෂෙවික් වාදීන්ටද, අම්මාටද කතා කළේය. ඈ තම දූ පුතුනට මවක් පමණක් නොව මිතුරියක්ද වූවාය. ඇගේ දරුවෝ හැම දෙනෙක්ම විප්ලවවාදීන් වූහ. ඈ ඔවුන් බැලීම සඳහා සාර්ගේ හිරගෙවල් වලට ගොස් ඔවුන්ට ආහාර පානාදිය සැපයූවාය. 1895 දී ලෙනින් සිර අඩස්සියට ගනු ලැබූ විට අම්මා තම පුතු බැලීමට පීටර්බුර්ගයට පැමිණියාය.

ලෙනින් තම වාර්තාව මගින් පක්ෂයේ තත්ත්වය පැහැදිලි කළේය. විප්ලවවාදී සටන් මාවතෙන් පිට පනින හැම මතයකටම විරුද්ධව සටන් කළ යුතු බව ඔහු කියා සිටියේය.

1905 රුසියානු විප්ලවය පරාජය වුවද, අපි පරාජිතවාදීන් නොවිය යුතු වෙමු.නිර්භය ලෙස ඉදිරියට යමු. අප ඉදිරියේ ඇත්තේ එකම මාවතකි...

ලෙනින් විප්ලවවාදී සටන් මාවත ගැන විස්තර කළේය.

වාර්තාවෙන් පසු පාක්ෂිකයෝ නැවත ඔහු වටකර ගත්හ. ඔහු තම සගයින්ගෙන් බේරී ජනතා මන්දිරයෙන් පිටවූයේ මහත් අමාරුවෙනි.

රෑ වෙන්නට පටන් ගෙන ඇත. නගරයේ ගෙවල්වල කවුළුවලින් මගට වැටෙන ආලෝකය මුදුය. ගෙවල්වල පහන් ලා රතු හා ලා නිල් පාටින් යුත් කවර වලින් වසා ඇත. වරායේ සිට සීතල මුහුදු සුළඟක් හමයි. යම්කිසි තැනෙකින් ගීත වාදනයක් ඇසේ.

ලෙනින්ගේ මව සහ සොහොයුරිය ඔහු එන තුරු මහ මග බලාගෙන සිටිති.

''අම්මේ, අම්මා මෙහෙ ආපු එක කොතරම් හොඳද. මම හරිම ප්‍රීතියකින්!'' තම මව වෙත පැමිණි ලෙනින් පැවසීය. ලෙනින්ට තම

ළමා විය ගැනත් මවගේ සෙනෙහස ගැනත් මතක් විය. ඈ කිසි දිනෙක කලබල නොවූවාය. සන්සුන් ඈ සාධාරණ ලෙස ක්‍රියා කළාය. අම්මාගේ කීමට හෝ අදහසකට හෝ එකඟනොවූ සැටියක් මතක් කිරීමට පවා ඔහුට බැරිය. මව සහ පුතු අතර හැමදම පැවතියේ එකඟතාවයකි.

"පුතා දන්නවද, මම නුඹගේ පොත් සහ ලිපි ඔක්කොම කියෙව්වා. නුඹගේ බුද්ධියටයි, නුඹලගෙ පරමාදර්ශවලටයි මම ගරු කරනව. අද මට දැනගන්ට පුළුවන් වුණා නුඹට නුඹගෙ සගයො ආදරය කරන හැටි." අම්මා පුතුට කීවාය.

මරියා අලෙක්සාන්ද්‍රව්නා උල්යානොවා හා මරියා දවස් දහයක් ස්ටොක්හෝම්හි ලෙනින් සමග ගත කළහ. ලෙනින් තම මව සහ සොහොයුරිය මුණ ගැසීමට පැරිස් සිට ස්ටොක්හෝම් දක්වා පැමිණියේය. දවස් දහය ඉක්මනින්ම ගෙවිණි.

රුසියන් නැව ස්ටොක්හෝම් නගරයෙන් පිටත්වූයේ උදේ පාන්දරය. ශරත් සමයේ උදෑසන මීදුම් සහිත විය. සුළං පහරට ගස්වල කොළ හැලිණි. මුහුදු බොක්කේ කුඩා දිය රැළි නොකඩවා පවතී. කුඩා බෝට්ටු හඬ නගමින් හබල් ගසති. නොසන්සුන්තාවයකි, අසතුටකි.

අම්මා තම පුතු කීප වරක්ම වැළඳගෙන නැවට නැගීමට පඩි පෙළ නැග්ගාය. පුතු නොහැඬුවද මහත්සේ කනගාටුවට පත්විය. අම්මා නැවේ සිට සුසුම් ලමින් සුදු ලේන්සුවක් වනයි. නැව බොහෝ වේලාවක් නවතා තිබුණද, ලෙනින්ට නැවට ඇතුළු විය නොහැකිය. නැව තුළ රුසියානු නීති, රීති බලපායි. එය රුසියානු භූමිය මෙනි. ලෙනින් නැවට ඇතුළු වූවහොත් ඔහු සිර භාරයට ගනු ඇත.

නැව පිටත්වීමේ නළාව හැඬවීය. මුහුදු ළිහිණියෙක් අප්‍රසන්න ලෙස හඬක් නැඟුවාය. නැව වරායෙන් පිටවිය.

"ආයුබෝවන් අම්මේ!"

ඔහු තම මව දුටු අවසාන වාරය එය විය...

## ලොන්ජියුමෝ ගම

රුසියාවෙන් පැන ගිය දේශපාලනඥයෝ දහස් ගණනක් ප්‍රංශයේ වාසය කළහ. ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව්-ලෙනින්ද ප්‍රංශයේ වාසය කරමින් දේශපාලන කටයුතුවල යෙදුණේය. 1911 වසන්තයේදී ලෙනින් සහ කෲප්ස්කයා ගිම්හාන කාලය ගත කිරීම පිණිස ලොන්ජියුමෝ ගමට ගියහ.

පැරිසියෙන් සැතැපුම් එකොළහක් පමණ දුරින් පිහිටි ගමකි

ලොන්ජියුමෝ. ගම දිගට මහ මගකි. මැදියම් රෑ පසුවන විට මග දිගට කරත්ත පෙළක් ශබ්ද නගන්ට පටන් ගනී. ගොවියෝ තමන් වැවූ ආහාර වර්ග වෙළඳාම් පොළට ගෙනයන ශබ්දයය, ඒ.

ලොන්ජියුමෝහි ගෙවල් ගඩොලින් තැනූ ඒවා වූ අතර දුමෙන් බැඳී තිබිණි. මේ දුම් පිටවූයේ ගමේ කුඩා හම් කම්හලෙනි. අවට ගස් හා මල් පැළද, තණද කළු පැහැගෙන තිබිණි. ඈත ගොවීන්ගේ එළවුළු කොටු සහ කුඹුරු නිල් පැහැයෙන් බැබළුණු බව නම් සැබෑය. ලෙනින් සහ කෘෂප්ස්කයා මෙහි පැමිණියේ විවේක ගැනීමට නොව, අසීරු කාර්‍ය්‍යයක් ඉටු කිරීමටය.

උදේ පාන්දර ලෙනින් අවදිවිය. ගිම්හාන කාලයේදී අරුණෝදය බොහෝ වේලාසනින් ඇතිවුණද එදින ගෙතුළ ඇඳිරිය, තෙතමණය තවමත් පැවතිණි. හරියට හිරු පායා නැතිවාක් මෙනි.

මේ වන විට නදේෂ්ද කෘෂප්ස්කයා උදේ ආහාරය පිළියෙල කොට ලෙනින් වෙත ගෙන ගියාය.

''මහත්තයා බොහෝ වේලා නිදියනවද? ඔහෙගෙ හැසිරීමට දෙන ලකුණු ප්‍රමාණය බින්දුවයි.'' ඔහු තමාටම දෙස් නගමින් කියා ගත්තේය. ඔහු ඉක්මනටම බිරිඳට උදවුවීමට ඉදිරිපත් විය.

මේසයට පිඟන් කෝප්ප හා සීනි භාජනය තබන විට, ඇය අතින් සීනි භාජනය ගිලිහිණි. ඔහු වහාම පහත් වී එය අල්ලා ගෙන සිනහ වෙමින් මෙසේ පැවසීය:

''කොහොමද මම විජ්ජා කාරයෙක් නොවේද?''

''බොහොම පහත් පෙළේ විජ්ජා කාරයෙක්.'' කෘෂප්ස්කයා කීවාය.

එම වසරේ වසන්ත සමය දැඩි උෂ්ණය සහිත විය. උදේ හිටම හිරු එළිය දැඩිවිය. ගොවිගෙදරක බල්ලෙක් වැටට හේත්තු වී හිරු රැස්වල පීඩාවෙන් වැළකීමට වැර දරයි. ඌ කට හැරගෙන දිව දිගු කරගෙන හති දමන්නට විය.

''කුක්කො උඹට රස්නෙද?..'' මෙසේ ඇසූ ලෙනින් බල්ලාගේ හිස අත ගෑවේය. පසුව ඔහු වැට අයිනේ බංකුව උඩ වාඩිවී සිටි හම් කම්හලේ කම්කරුවා දෙස බලා, ''සුබ උදෑසනක් වේවා!'' යි පැවසීය.

එය ඉරිදා දවසක් විය. කම්කරුවා වැටේ සෙවණට මුවා වෙමින් ඇට පැදුණු දෑත් දණහිස් මත තබා වාඩිවී සිටියේය. ඔහු පීඩාවෙන් හා වේදනාවෙන් පෙළෙන සැටියකි!

ඔවුන් අසලින් සුඛොපභෝගී අස් රියක් ගියේය. සුදු රේන්ද ගෙතුම් සහිත කුඩයක් ඉහළ ගත් කාන්තාවක් සහ ළමයින් කීප දෙනෙක් එහි වාඩිවී උන්හ. කම්කරුවා නැගිට කාන්තාව දෙස බලා හිස නමා ආචාර කළේය. ඈ යම්තමින් හිස වැනුවාය.

''කම්හල අයිතිකාර හාම්පුතාගේ පවුල'' ඔහු ගරු සරු ලෙස පැවසීය.

''ඒගොල්ලන්ට නම් විවේක ගන්නවයි කියන එක හරිම සැපතක්'' යැයි ලෙනින් උපහාසාත්මක ලෙස පැවසුවේ කම්කරුවා දෙස බලමිනි.

කම්කරුවා සන්සුන් ලෙස පිළිතුරු දුන්නේය:

''දෙවියන් වහන්සේ පොහොසතාවයි දුප්පතාවයි මැවුවා. එහෙම කළේ අවශ්‍ය හන්ද.''

තරමක් ඈතින් පිහිටි දේවස්ථානයක සීනු හඬ ඇසිණි. ඉරිද දේවමෙහෙයට ජනයාට ආරාධනා කරමින් දේවස්ථානයේ දෙරවල් හරින ලදී. කම්කරුවා කුරුසියේ ලකුණ ඇඳගනිමින් දේවස්ථානය දෙසට ගමන් කළේය:

''දෙවියන් වහන්සෙ ලෝකය මැවුවා. අපට පුළුවන්ද ඒක ප්‍රශ්න කරන්න?''

''මහත්තයා අදත් ස්කෝලෙ යනවද. නිවාඩු දවස් වලත් උගන්වනවද?''යි අසල්වැසි කොල්ලෙක් ලෙනින්ගෙන් ඇසීය.

ලෙනින්ගේ පාසල ලොන්ජියුමෝ ගමේ ඈත කෙළවර පිහිටියේය. පෙනුම අනුව එය පාසලක් නොවීය. එය පැරණි හෝටලයකි. වත්ත මැද ලී මඩුවකි. අස් රිය පැරිසියට යන එන ගමන් මෙහි නැවැත්වීය. අස් ගොව්වෝ සහ රිය කරුවෝ මෙහි නැවතී අසුන්ට අහරදී දුම් පානය කළහ. මෙය බොහෝ කලකට පෙර සිදුවූවකි...

1911 වසන්තයේදී ලෙනින් මේ ලී මඩුව පාසලක් සඳහා කුලියට ගත්තේය. ඔහුගේ ගෝල පිරිස මඩුව පිරිසුදු කොට ලී වේසයක් සෑදූහ. අවට ගෙවල්වලින් පුටු සහ බංකු ලබාගත්හ. ලෙනින්ගේ පාසල පටන් ගත්තේ ඒ විධියටය.

පාසල් ශිෂ්‍යයෝ රුසියන් කම්කරුවෝ වූහ. ඔවුහු රුසියන් පොලිසියට හා සාර් ආණ්ඩුවට හොරෙන් රුසියාවේ නොයෙක් නගරවලින් මෙහි පැමිණියහ. ගුරු මණ්ඩලය ලෙනින්, කෲප්ස්කයා හා අනෙකුත් පාක්ෂික සහෝදරවරුන්ගෙන් යුක්ත විය.

ලෙනින් එදින පංතිය පටන්ගැනීමට පාසලට එන විට, සිසුහු තම ආසනවල වාඩිවී සිටියහ. පාසල් ළමයි ගුරුතුමා පංති කාමරයට ඇතුළු වන විට නැගිට සිටින්නා සේම, ලෙනින් පැමිණිවිටද ඔවුහු නැගිට සිටියහ. සිසුන් හැම කෙනෙකුම පාවහන් රහිත විය. ලොන්ජියුමෝහි උෂ්ණය නිසා ගමේ හැම කෙනෙක්ම පාවහන් රහිතව ඇවිද්දහ.

තරුණ කම්කරු සිසුහු මහත්වූ ආශාවකින් පාඩම් වලට හා දේශනවලට සවන් දුන් අතර ලෙනින්ට ගරු කළහ.

''දෙවියන් වහන්සේ පොහොසතුන් හා දුප්පතුන් මැවුවා. එසේ කළේ එය අවශ්‍ය හන්ද'' ලෙනින් එදින පාඩම පටන් ගනිමින් පැවසීය.

ලෙනින්ගේ දෑස් තරමක් හැකිළිණි. මුහුණේ උපහාසාත්මක සිනහවක් ඇතිවිය. සිසුහු නිහඬවූහ.

''එක් ප්‍රංශ කම්කරුවෙක් අද මට එහෙම කීවා'' යැයි තරමක් නිහඬව සිටි ලෙනින් පැවසීය.

''ආ! එහෙමද! හරිම සෙවල අදහසක් නෙව!''

''ලෙනින් සහෝදරය ඔය ප්‍රංශ කම්කරුවා නොදියුණු කෙනෙක්. අප ළඟට එවන්න. අපි එයාට හොඳ පාඩමක් උගන්වන්ට.''

එක් සිසුවෙක් නැගිට සිටියේය:

''මමත් හම් පදම්කරන කම්කරුවෙක්. මා හිතනවා අපට දෙවියන්ගෙ නීති නුසුදුසු බව. ධනපති බලතල උදුරාගෙන අළුත් සමාජයක් ගොඩ නගන්ට ඕන.''

''හරියට හරි!'' අනිත් අය එකහ වූහ.

දේව නියමය පිළිබඳ පටන්ගත් විවාදය සාර්ථක විය. ලෙනින් විවාදයට කන් දෙමින්, එය නිසි මග යොමු කරමින් සතුටු විය.

''එහෙනම් ධනපතියන් හා දුප්පතුන් ඉඳීම අවශ්‍ය නැද්ද?'' ලෙනින් ප්‍රශ්න කළේය.

ගුරුවරයා සිසුන්ට නොදනුවත්ම වාගේ දෙශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබඳ මූලික පාඩම ඇරඹීය. සමාජමය නිෂ්පාදනය පිළිබඳ විද්‍යාව ගැන ඔහු කරුණු කියාදීමට පටන්ගත්තේය.

ලෙනින් ඔවුන්ට මාක්ස්වාදය ගැන අවබෝධයක් දුන්නේය. කම්කරුවන් උගත්, බුධිමත්, දක්ෂ අය විය යුතුය. දෙශපාලන ප්‍රශ්න ඉතා හොඳින් අවබෝධ කරගත යුතුය.

''දෙවියනි පිහිට වන සේක්වා!'' යි කියන අර ප්‍රංශ කම්කරුවා මෙන් කිසිවක් ඉගෙන නොගෙන විප්ලවය සඳහා සටන් කළ හැකිද? රුසියාවේද එවැනි කම්කරුවන් හිඟ නැත. නොදියුණු බව විප්ලවවාදී සටන්වලට බාධාවකි.

''කම්කරුවන් උගත යුතුයැ''යි ලෙනින් පැවසීය.

පැරිසිය අසල ලොන්ජියුමෝ ගමේ පාක්ෂික පාසලක් ලෙනින් විසින් අරඹන ලද්දේ මේ නිසාය. මෙහි හාර මසක් උගත් කම්කරුවෝ රුසියාවට ගොස් කම්කරු පංතිය තුළ විප්ලවවාදී අදහස් හා උගැන්වීම් පතුරුවා හැරියහ.

සාමාන්‍ය ගමක්වූ ලොන්ජියුමෝ ලෝක ජනතාව අතර ප්‍රසිඩියට පත්වුණේ බොල්ෂෙවික් පක්ෂයේ පළමුවැනි දෙශපාලන පන්ති ලෙනින් එහිදී ඇරඹූ බැවිනි.

## යුද විරෝධී යුද්ධය

''අනේ අම්මේ මෙතරම් විශාල අනතුරකින් බේරුණු එක විශ්වාස කරන්නවත් බැහැ!''

කෲප්ස්කයා තම සැමියා දෙස බැලුවාය. ඔහු ඈ සමගය. සිර ගෙදර නොවේ. අනතුරින් ගැළවිණි.

''පහුගිය දේ අමතක කරන්ට පවා අමාරුයි'' ඔහු ඇට කීවේය. ''නදේෂ්ද බලන්න සරත් සමයෙදි බර්න් නගරය කොතරම් අගේද!''

ලෙනින් සහ බිරිඳ නැවත ස්විට්සර්ලන්තයේ අගනුවරවූ බර්න් නගරයට පැමිණියහ. ලෙනින් සිර භාරයේ පසුවුණේ මීට දින කීපයකට උඩදීය. පෝලන්තයේ පොරොනින්හිදී ඔහු සිර භාරයට ගන්නා ලදී.

ජනපදයක් යැයි කිව හැකි තරම් කුඩා නගරයකි පොරෝනින්. එවකට මේ නගරය ඕස්ත්‍රියානුන්ට යටත් ව තිබිණි. 1914 අගෝස්තු මාසයේදී පළමුවැනි ලෝක යුද්ධය පටන් ගන්නා ලදී.

රුසියානුවෝ, ජර්මන්නු, ප්‍රංශයෝ, ඉංග්‍රීසිහු, ඕස්ත්‍රියානුවෝ හා හංගෙරියානුවෝ ලක්ෂ ගණන් තම බිරියන්, මව්වරුන්, සොහොයුරියන් හඬව, හඬවා යුඩයට ගියහ. ඔවුන්ගෙන් සමහරෙක් තම බිරියන්ගෙන්, මව්වරුන්ගෙන් හා සොහොයුරියන්ගෙන් අවසාන වරට සමුගත්හ. රුසියාවේ රිසාන්, තුල්ස්ක් හා යරාස්ලාව් වැනි පළාත්වලින් ගැමියන්ද, යුඩායුධ විශාල වශයෙන්ද යුද පෙරමුණට යවන ලදී.

පළමුවැනි ලෝක යුඩය පටන්ගත් විගසම ඕස්ත්‍රියානු පොලීසිය ලෙනින් සිරභාරයට ගත්තේය. රුසියානුවෙක් නිතර ලියමින් ඒවා රුසියාවට තැපැල් කරයි. එසේනම් ඔහු ඔත්තුකරුවෙකු විය යුතුය. ඔප්පු කරන්නේ කොහොමද? ඔප්පුකිරීම් අවශ්‍ය නැත! පොලීසිය ඔහු ගැන වාර්තා කළානම් ඔහු ඔත්තුකාරයෙක් තමා.

ඔත්තු බැලීමේ වරදට මරණ දණ්ඩනය නියම කරනු ලැබේ .ලෙනින්ට මරණ දණ්ඩනය ලැබීමේ තර්ජනයකි. නදේෂ්ද කෲප්ස්කයා ඉමහත් දුකකින් තැවුණාය. සති දෙකක් තිස්සේ ලෙනින් මරණ දණ්ඩනයට ගොදුරුවීමේ තර්ජනයට මූණ පාමින් සිටියේය. සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සහෝදරවරු ඔහු වෙනුවෙන් පෙනී සිට කරුණු ඉදිරිපත් කළහ. ලෙනින් සිරගෙදරින් නිදහස් විය.

ලෙනින් සහ බිරිඳ යුඩයට සහභාගී නොවුණු මධ්‍යස්ථ ස්විට්සර් ලන්තයේ අගනුවර වන බර්න් නගරයට ආවේ පසුගියදය. මෙහි පිරිමි යුඩයට නොගියහ. ගැහැණු අඬා නොවැළපුණහ.

ඔවුහු උදේ නැගිට ආහාර ගෙන ගෙයින් පිටවූහ. දේවස්ථාන

දේවමෙහෙයට බැතිමතුන්ට අඬගසමින් සීනු හැඬවීය. ඒ හඬින් පිටවන නාදය බර්න් නගරය පුරා රැව් දිණි.

ලෙනින් සහ ක්‍රෘප්ස්කයා අන් හැම වතාවකදී මෙන්ම බර්න් නගරාසන්නයේ පටු වීදියක් වන ඩිස්ටෙල්වෙග්හි පදිංචි වූහ. මෙහි සුඛෝපභෝගී මන්දිර නොවීය.

ඩිස්ටෙල්වෙග් වීදිය දිගේ මේ දෙදෙන විනාඩි දහයක් ගමන් කරත්ම නගර සීමාව අවසන් විය. සැප්තැම්බර් මාසය වූ බැවින් ගස් වල කොළ රන්වන් හා ලා රත් පාටින් බැබලෙන්නට විය. නගරය අසලම බැද්දක් විය. එහි උස කන්දක්ද වංක ගිරිය වැනි මගෙක්ද විය.

ලෙනින් මෙහිදී නැවතුණේය.

''නදේෂ්ද මෙතැනද?'' අඩි පාර දෙස පිරික්සුම් ඇසකින් බැලූ ලෙනින් තම බිරිඳගෙන් ඇසීය. ගලා බසින කුඩා දිය පාරෙන් පැන අඩි විස්සක් පමණ ගොස් පඳුරු කීපයක් අතින් ඇත් මෑත් කොට බැලූ විට සමතලා තණ පිටියකි. කබා සහ වැහි කබා බිම එළාගෙන මිනිස්සු කීපදෙනෙක් බිම වැතිර සිටිති.

''ආයුබෝවන් සහෝදරවරුනි!'' යි ලෙනින් පිරිස අමතමින් පැවසීය.

වියලි අත්තක් කැඩෙන හඬක් ඇසිණි. නත්තල් ගසක අතු අතරින් හිසක් එබී බැලුවේය. පඳුරකින් මිනිසෙක් එළියට ආවේය. විනෝද ගමන් යන විට ගෙනයන ආහාර මල්ලක් ඔහු අත විය.

ඊයේ බර්න් නගරයට පැමිණි ලෙනින් රැස්වීමක් තැබිය යුතුයැයි බොල්ෂෙවික්වාදී සගයකුට දන්වීය. ඔහු තමාගේ කිට්ටු සගයාට දන්වීය. මේ විධියට රැස්වීම පිළිබඳ දැන්වීම කටින් කට පැතිරිණි:

''සහෝදරවරුනි! හෙට බර්න්හි බැද්දේදී රැස්වෙමු!''

බොල්ෂෙවික්වරු නියමිත වේලාවට රැස්වූහ. හැම දෙනෙක්ම ලෙනින්ගේ කතාව ඇසීමට ආශා කළහ.

''රුසියානු සහ අනිකුත් ජනතාවන් මත යුධයක් පටවා ඇත. යුධය නිසා ලාභ කාටද? ධනපතීන්ටය. යුධය නිසා ධනපතීහු කෝටි ගණනින් මුදල් උපයා ගනිති. ඔවුහු තම ලාභ තර කර ගැනීම සඳහා අලුත් වෙළඳ පොළවල් අල්ලා ගැනීමට ඉදිරිපත් වී සිටිති. තමන්ගේ මවුබිම රකගනිල්ලා! යැයි කියමින් ධනපතීහු කම්කරුවන් හා හටයින් රවටති. මෙය ඇත්ත වශයෙන්ම තම මවුබිම රැකීමක් නොව ධනපතීන්ට ලාභ ලබාදෙන වෙළඳ පොළවල් රැකීමක්. දැන් තමන් සතු අවි තම රටවල ධනපතීන්ට හා රජවරුන්ට විරුද්ධව එල්ල කරනු. අසාධාරණ යුධය හංගවේවා! යුධයට එදිරිව යුද කරමු!''

එද බර්න්හි පැවැති රහස රැස්වීම අමතා ලෙනින් කළ කතාවේ හරය

එසේ විය. මේ ගැන ලිපි හා පොත් ලියුවේය. රුසියාව තුළ සංවිධාන වෙමින් සිටි බොල්ෂෙවිකයිනට ඒවා යැවීය. යුද විරෝධී යුධය නැමැති පත්‍රිකා බොල්ෂෙවික්වරු සෙබළුන් හා කම්කරුවන් අතර බෙද හැරියහ.

යුද භටයෝ යුද විරෝධී සඟරා හා පොත් පත් කියවන්නට වූහ. "තමන්ගේ රටවල සිටින ධනපතීන්ට හා ඉඩම් හිමියන්ට විරුඬව තුවක්කු පාවිච්චි කළ යුතුද? සාර් රජ බලයෙන් පන්නා දමා නව සමාජයක් ගොඩ නැගිය යුතුය."

## පෙබ්‍රවාරි විප්ලවය

බර්න්හි වාසය කරද්දී ලෙනින් අධිරාජ්‍යවාදය ගැන පොතක් ලියුවේය. මංකොල්ලකාරී යුඩ නොකර ධනපතීන්ට නොසිටිය හැකි බව ඔහු තම කෘතිය මගින් පෙන්වා දුන්නේය. පිටරටවල් අල්ලා ගන්නා ඒකාධිකාරී ධනපතීහු ඒවා යටත් විජිත බවට පෙරළති. ලෝකය තමන් අතර බෙද ගැනීමට ඔවුහු පොර කති. වැඩි ලාභ ලබාගත හැකි වෙළඳ පොළ අල්ලා ගැනීම සඳහා ඔවුහු කෝටි ගණනින් මිනිසුන් මරාදැමීමට වුවද පසුබට නොවෙති. අනාගතයේදී මෙවැනි මංකොල්ලකාරී යුඩ වැඩි වනු ඇත. මේ නිසා අධිරාජ්‍යවාදය ජාතීන් පෙළයි. එහෙත් කම්කරු පංතියේ ශක්තිය හා බුඩිය වැඩෙමින් තිබෙන බැවින් සමාජවාදී විප්ලවය ළං වෙමින් පවතී.

මේ පොත ලියා නිම කිරීමට ගැඹුරු ලෙස ඉතිහාසය දැනගත යුතු විය. ලෙනින් පොත් ගොඩක් කියවමින් අවශ්‍ය කරුණු රැස්කරන්නට විය.

ලෙනින් තම බිරිඳ සමග සූරික් නගරයට ගියේය. එහි සති දෙකක් පමණ නැවතී තමාට අවශ්‍ය කරුණු එක්රැස් කර ගත හැකිවෙතියි සිතූ නමුදු ලෙනින්ට එහි අවුරුද්දක්ම නැවතීමට සිදුවිය. සූරික් පුස්තකාලය ස්විට්සර්ලන්තයේ ඉතාම පොහොසත් පුස්තකාලය වූ බැවින් ලෙනින්ට අවශ්‍ය සියලු පොත් පත් සඟරා ආදිය ලබා ගැනීමට මෙහිදී පුළුවන් විය. නගරය විශාලය, කම්හල් හා කම්කරුවන් බොහෝය.

හවස ඇඳිරිවැටෙන තුරු පුස්තකාලයට වී තමාට වුවමනා කරුණු එක්රැස් කරන ලෙනින් ගෙදර ආවේ ආහාර ගැනීමට පමණකි. ඔහු නැවත තම මාහැඟි කෘතිය පිළිබඳ කටයුතුවල යෙදුණේය.

චෙස්නට් ගස් සහිත පටු වේදිකාවක් පුස්තකාලය දක්වා ඇත. දවසකට හතර වරක් කුළුණු සහිත නගර ශාලාව හා පැරණි දේවස්ථානය අසලින්ද, දිරාපත්වුණු ගෙවල් අසලින්ද ඔහු ගමන් කළේය.

අලංකාර නමුදු නිතර වෙනස්වන සූරික් වැව නුදුරින් පිහිටා ඇත. සමහර දවස්වලදී කෝපවන සූරික් වැව වෙරළ ආක්‍රමණය කරමින් රළ

නගයි. එවිට වැව අසලට පවා යා නොහැක. සන්සුන් වූ විට, හිරු එළිය නිසා වැවේ ජලය දිලිසේ. එවිට එය සොබාදහමේ සුන්දර වස්තුවකි! ලෙනින් ස්විට්සර්ලන්තයේ දෙශගුණය නිසා ප්‍රීතිවිය. එහෙත් ඔහු රුසියාව ගැන නිතර සිහිකරමින් කාන්සියෙන් පෙළෙන්නට විය.

දවසක් ද ලෙනින් දිවා භෝජනයෙන් පසු පුරුදු පරිදි පුස්තකාලයට යාමට සැරසෙත්ම, කිසිවෙක් දෙරට මහ හඩින් තට්ටු කොට වේගයෙන් ගෙට ඇතුළු වූහ. ඔහු ලෙනින් හඳුනන දේශපාලන සගයෙකි.

''ආරංචි වුණාද? නැතිද? ඇහුණෙ නැතිද? රුසියාවෙ විප්ලවයක් ඇතිවෙලා.''

ලෙනින් තම හිස් වැස්ම අතට ගත්තේය. නදේෂ්ද කෲප්ස්කයා කබාය හැඳ ගත්තාය. හිරු රැස් නිසා රිදී කඳක් මෙන් දිලිසෙන වැව අසලට ඔවුහු ගියහ. සුදු හංසයෝ ආඩම්බර ලෙස විලෙහි පිනමින් සිටියෝය.

ලෙනින් වැව අසල වූ කඩයකට ගොස් පුවත්පත් කීපයක් මිළදී ගත්තේය.

ඔහු 1917 පෙබ්‍රවාරි මාසයේදී රුසියාවේ ඇතිවූ විප්ලවය පිළිබඳ පුවත් හා විදුලි පණිවුඩ කියැවූයේ මහත්සේ ප්‍රීතියට පත්විය.

''විප්ලවය සිදුවුණා!'' ලෙනින් පැවසීය.

රුසියාව සමග කිට්ටු සබඳකම් ඇතිකර ගෙන සිටි ලෙනින් එහි මෝරා වැඩෙමින් පැවති විප්ලවවාදී සටන් සංවිධානවලට නායකත්‍වයක් දුන්නේය. ඔහු විප්ලවය ළංවී ඇති බව දැන සිටියද, දැන් රුසියාවේ විප්ලවය පටන් ගත් බව දැනගැනීම නිසා මහත්සේ නොසන්සුන් විය.

රුසියාවේ මින් පෙර නොවූ විරූ කිසිවක් සිදුවන බවට සැක නැත. ඉක්මනින්ම ගෙදර යා යුතුය! මෙහි සිටීමෙන් පලක් නැත. වහාම රුසියාවට යා යුතුය. ලෙනින් තම ජීවිතයම රුසියාවේ විප්ලවයක් බිහි කිරීම සඳහා යෙදවූයේය. ඔහුගේ මුළු ශ්‍රමයම විප්ලවයකට කැපවිය! රුසියාවට ආපසු යන්නේ කොහොමද?

ලෙනින් නොසන්සුන් විය. ඔහුට නින්ද නොගියේය. කෙට්ටු විය.

බොහෝ වෙහෙස මහන්සිවී ස්විට්සර්ලන්ත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සහෝදරවරු, එරට නැවතී සිටි රුසියානු විප්ලවවාදීන්ට සියරට යෑමට අවසර ලබා දීමට සමත් වූහ.

දුම්රිය පිටත්වීමට පැය දෙකකට කලින්, ලෙනින්ට අවසර ලැබුණේ. ඒ කාලය තුළදී ඔහු ගමන් මල්ල පිළියෙල කොට, පුස්තකාලයෙන් ලබා ගත් පොත් ආපසු භාරදී, ගෙහිමියාට කුලී ගෙවා ගෙය භාරදී, හනිකට ගමනට සූදනම් විය. නියමිත වේලාවට දුම්රියට නැග ගත්තේය. සූරික්

සිට බර්න් හරහා රුසියාවට ගිය දුම්රියක ලෙනින් සහ තවත් දේශපාලනඥයෝ තිස් දෙනෙක් වූහ.

''දයාන්විත ලෙස අපට සලකා නවාතැන් දීම ගැන කෘතඥතාවය පළ කරමුයි'' ලෙනින් තම ස්විට්සර්ලන්ත සගයින්ට දන්වා යැවීය.

දුම්රිය හඬ නගමින් ස්විට්සර්ලන්තයේ සුන්දර වැව් හා අහස සිප ගන්නා ගිරි ශිඛර පසුකරමින් දුවන්නට විය.

ජර්මනිය පසුකර යත්ම බෝල්ටික් මුහුදු වෙරළ පෙනෙයි. මයින් වෙඩි දමා ඇති බෝල්ටික් මුහුද නැවකින් තරණය කළ ඔවුහු ස්වීඩනයට ආහ. ඉන්පසු පින්ලන්තයටද, දිගු, අවදනම් සහිත අසීරු ගමනකින් පසු පෙට්‍රොග්‍රාඩයටද පැමිණියහ.

දේවදර හා නත්තල් ගස්වලින් පිරි වනය දුම්රිය මැදිරියේ කවුළුවට පෙනේ. සුදෝ සුදු හිම තට්ටු පොළොව වසා ඇත. ටෝර්ප් ගොහොරු කළු පැහැතිය.

''රෑ වන විට පෙත්රොග්‍රාඩ්වලට යන්නට පුළුවන් වේවි. හැම දෙනෙක්ම නිදි ඇතැ''යි කෘෘප්ස්කයා කීවාය.

කණමැදිරි ආලෝකය නිසා විශාල ගොඩනැගිලි පවා පැහැදිලිව නොපෙනේ. ගබඩා, ඩිපෝ... දුම්රිය ගමන් වේගය අඩුකොට පින්ලන්ත දුම්රිය පොළට පැමිණියේය. දුම්රිය යන්ත්‍රයක් රාත්‍රි නිහඬතාවය බිඳෑමින් මහ හඬක් ඇති කළේය. දුම්රිය සෙමින් සෙමින් වේදිකාවට ළං විය. එය වාෂ්ප පිටකළේ මිනිසෙකු හුස්ම ඉහළ පහළ අදින්නාක් මෙනි... සංගීත වාදනයක් ඇසෙන්නේ කුවර හේතුවක් නිසාද? ''මර්සෙලියෙස්'' විප්ලවීය ගීතයේ ස්වර මාලා රචනය වාදනය වේ.

''ආචාර පෙළපාලිය සීරුවෙන්!'' අණදෙන නිලධාරියා අණ දුන්නේය.

වේදිකාව ජනයාගෙන් පිරිලාය. කම්කරුවෝ සහ රතු හට හමුදවේ ස්වේච්ඡා සේවකයෝද එහි වූහ. ක්‍රොන්ෂ්ඩාට් නාවිකයෝ පෙළ ගැසුණහ.

''සීරුවෙන්!'' අණදෙන නිලධාරියා හඬ නැගීය.

හැම දෙයක්ම නිහඬ විය. රතු භටයෝ, සහ නාවිකයෝ ආචාර පෙළපාලිය සඳහා සීරුවෙන් සිට ගත්හ.

ලෙනින් දුම්රිය මැදිරියේ දොරටුවට ආවේය. තමා පිළිගැනීමට කර ඇති සූදානම නිසා ඔහු විස්මයට පත්විය.

''සහෝදරවරුනි!..''

''ලෙනින්ට ජයවේවා! යුධය භංගවේවා! විප්ලවයට ජයවේවා!'' යි මහ සෙනග මහ හඬින් කෑගැසීය.

දුම්රිය පොළ ඉදිරිපිට චතුරශ්‍රය ලක්ෂ සංඛ්‍යාත ජනකායකින් පිරී ඉතිරී ගොසිනි. මහා සාගරය ගොඩ ගැලූ කලෙක මෙනි. රාත්‍රී අන්ධකාරය

නැති කරමින් පන්දම් රැගත් දස දහසක් අත් පෙළපාලිය ආලෝක කළේය.

දුම්රිය පොළ අසල ලෝහමය කුළුණක් අසල සවචයන්ගෙන් යුත් යුධ රථයකි. එහි මැෂින් තුවක්කු නිහඬය. එම යුධ රථයද බොල්ෂෙවික් පක්ෂයේ හා කම්කරු පංතියේ නායකයා පිළිගැනීමට පැමිණි භටයින් විසින් ගෙනෙන ලද්දකි. කම්කරුවෝ හා යුද භටයෝ ලෙනින් වඩා ගෙන ගොස් යුධ රථයේ කුළුණ මත තැබූහ. ඔහුට අත දී ආචාර කිරීමට දස දහසක් දෙනා ඉදිරිපත් වූහ. නෙත් ලක්ෂ ගණනක් ඔහු දෙසට යොමුවිය.

යුධය හා විනාශය නිසා දැඩි දුකට හා පීඩාවට භාජන වී සිටින හැම කම්කරුවෙකුම බද වැළඳ ගැනීමට ඔහුට සිත්විය.

''සහෝදරවරුනි! සාර් පන්නා දමා ඔබ විප්ලවයක් කර ඇත. එහෙත් රටේ පාලන බලය අල්ලාගත් ධනපතියෝ අප පාලනය කිරීමට හදති. අපට වුවමනා වැඩ කරන ජනතාවගේ පාලනයකි. පැය අටේ දවසකි. ඉඩම් ගොවීන්ට බෙදා දිය යුතුය. කුස ගින්නේ සිටින්නන්ට ආහාර දිය යුතුය. ජනතාවට සාමය ලබා දිය යුතුය. අපට වුවමනා කරන්නේ සමාජවාදී විප්ලවයකි'' ජනතාව ඇමතූ ලෙනින් පැවසීය.

''ජයවේවා! ලෙනින්ට ජයවේවා!'' ජනතාව කෑගැසූහ.

එය මහ රෑ පැවැති යෝධමය මහජන රැස්වීමකට වඩා වසන්තයේ උදෑසනක පැවැති ප්‍රීතිමත් උත්සවයකට සමාන විය.

ලෙනින් රැගත් යුධ රථය උත්සවාකාරයෙන් ගමන් කරන්නට විය. ලෙනින් සදහටම සියරට පැමිණියේය.

## සමාජවාදී විප්ලවයට ජයවේවා!

ලෙනින් අවදි වී හිස ඔසවා බැලීය. කාමරය පිරිසුදුය, වාමය, බිත්ති කඩදසි සුදු පැහැතිය. නොවිශාල ලියන මේසයකි. ඒ මත පුවත්පත් කීපයකි. ජනෙල් පඩිය මත මල් බඳුනකි. මුල්ලේ ඇති ඇඳි පුටුව තද රතු සේද රෙද්දකින් වසා ඇත.

''මා කොහිද? මම සිහිනයක් දකින්නෙම්ද?''

නැත. ලෙනින් දුටුවේ සිහිනයක් නොවේ. ඔහු තම අක්කා වන ආන්නා ගේ ගෙදරට විත් සිටී. මෙය ආන්නා සහ ඇගේ සැමි මාක් එලිසාරොව් පදිංචි නිවසය.

ඔහුට ඊයේ සිදුවූ දේ සිහි විය. අතිශයින් ප්‍රීතිමත් හමුවීමකි. ලෙනින් රැගත් ලෝහ තහඩු වලින් ආරක්ෂා කරනලද යුධ රථය ක්ෂෙසින්ස්කයාගේ මාලිගයට ගියේය. දැන් එම මාලිගය බොල්ෂෙවික්

පක්ෂයේ පෙත්රොග්‍රාඩ් නගර සභාවේ හා මධ්‍යම කාරක සභාවේ කාර්‍යාලයය.

ලෙනින් රැගත් යුධ රථය සෙමින් ධාවනය කරන ලදී.

මැදියම් රැය වූ හෙයින් බොහෝ ගෙවල්වල පහන් දල්වා තිබිණි. මහා මාර්ග ජනයාගෙන් පිරිලාය.

"ලෙනින්!" ජනතාව කෑ ගැසූහ.

මධ්‍යම කාරක සභාවේ කාර්‍යාලයේ සඳළුතලයට නැගි ලෙනින් කම්කරු පංතිය හා සමාජවාදී විප්ලවය පිළිබඳ කරුණු විස්තර කරමින් කතා කළේය. ඔහුගේ කතාව පැහැදිලිය, වේගවත්ය.

නෙවා ගඟ හා පෙට්‍රොපාව්ලව්ස්ක් බලකොටුවට නුදුරින් පිහිටි ක්ෂෙසින්ස්කයාගේ මාළිගය අවට මිනිස්සු සිය ගණනක් රැස්වූහ.

"ලෙනින් එන්න! ලෙනින් කතාවක් කරන්න!" ඔවුහු නැවත නැවතත් ඉල්ලා සිටියහ.

ලෙනින් කීප වරක්ම සඳළුතලයට පැමිණියේය. ඇඳිරිය නොපැවැති නම්, පෙට්‍රොපාව්ලව්ස්ක් බලකොටුවේ රන් කොත් කැරලිද, දුවැන්ත බිත්තිද දැකිය හැක. මේ බලකොටුව සාර් රජ සිරගෙයක් ලෙස පාවිච්චි කළේය. ලිං වැනි ශීතල සහ තෙතමනය සහිත සිර කුඩුවල දුක් විඳ මිය ගිය බුධිමත් හා ගුණවත් දේශපාලන හිරකරුවන්ගේ ගණන සුළු පටු නොවේ. දැන් එම බලකොටුව බිහිසුණු නැත. එහි තර්ජනාත්මක බව පහව් ගොසිනි.

"යටගියාව නැවත නොඑයි. සහෝදරවරුනි ඉදිරියට යමු! සමාජවාදී විප්ලවයට ජයවේවා!" ලෙනින් රැස්වූවන් අමතා කීය.

පෙත්රොග්‍රාඩයේ සියලු බොල්ෂෙවිකයෝ මාළිගයේ රැස්වී ලෙනින්ට පිටවී යාමට ඉඩ නොදුන්හ.

උදේ පහට පමණ විඩාපත් එහෙත් ප්‍රීතියෙන් සිටි ලෙනින් සහ කෲප්ස්කයා ගෙදර ගියහ. අවසානයේදී මවුබිමට පැමිණ ඇත! මේ කාලය තුළදී විඳි දුක් ගැහැට කොපමණද! රුසියානු ජීවිතයේ විශාල වෙනසක් සිදුවී තිබේ...

නොසන්සුන්තාවය නිසා ලෙනින්ට නිදා ගැනීමට පවා අපහසු විය. ඔහු නිදිකිරා වැටෙමින් සිට පැයක් පමණ වේලා නිදාගෙන නැවත අවදිවිය. ගෙතුළ හැම දෙයක්ම නිහඬය.

හඬ පිට නොවන සේ සෙමින් කොරිඩෝරය දිගේ ගමන් කළ ලෙනින්ට තම ගෙය දැනුණේ මහා සාගරයක ගමන් කරන නැවක් මෙනි. පටු දිගැති කොරිඩෝරය, දෙපස ඇති කාමර, කෙළවර ත්‍රිකෝණාකාර අවන් හල, සඳළුතලය මේ හැම දෙයක්ම නැවකට බොහොසෙයින්ම සමානය. අවන්

හලේ පියානෝවකි. උල්යානොව් පවුල වාසය කළ හැම ගෙදරකම පියානෝවක් තිබිණි. ඔවුහු සංගීතයට ඇලුම් කළහ.

ලෙනින් ස්වර මාලා රචන අතට ගත්තේය. ඒවා ඔහුගේ මවට අයිතිය. මව මිය ගියේ මීට හත් මසකට උඩදීය. කෲප්ස්කයාගේ මවද මිය ගොසිනි.

නැවේ ඇනියකට සමාන ගෙයි කෙළවර කොටස දෙස ලෙනින් බැලුවේ දෙම්නසකිනි. ලෙනින්, මව පැද්දෙන තොටිල්ලක වාඩිවී පොතක් කියවන සැටිද, සළුවක් පොරවා ගෙන ශීතලෙන් ගැහෙමින් තම දරුවන් නිසා නිතර දුක්වන සැටිද, සිහි කළේය. ඇගේ දූ පුතුන්ගෙන් එකෙක් සිරගෙදරය, තවකෙක් පිටුවහලේය. ඈ දූ පුතුන්ට ආහාර පානාදිය රැගෙන සිරගෙයක් ගානේ ඇවිද්දය. අම්මා! රත්තරන් අම්මා! පිටර්බුර්ග්, මොස්කව්, කීයෙව්, සරාටොව්... ඉරණම විසින් ඈ කිනම් නගරවලට ගෙනයනු ලැබීද!

ලෙනින් ස්වර මාලා රචන පියානෝව මත තබා නිද සිටි කාමරයට පැමිණියේය. ආන්නා අක්කා විසින් ඔහුට හා කෲප්ස්කයාට පිළියෙල කර දුන් කාමරයේ කලින් වාසය කළේ ඔහුගේ මවය. ඈ තම අවසාන කාලයේදී පාවිච්චි කළ කාමරය. ඇඳි පුටුවේ තද රතු පාට සේද පුටු රෙද්ද මැසුවේත්, එයට මල් ගෙත්තම් කළේත් අම්මාය. ඈ සේද රෙද්දට කැපෙන මල් තෝරාගත්තාය... මොහොතකට තම මව දැක ගැනීමටත් ඇගේ මුදු මොළොක් දෑත් සිප ගැනීමටත් ඔහු තුළ ආශාවක් උපණි.

ඉක්මනින්ම ගෙදර උදවිය අවදි වූහ. එහෙත් අද උදෑසන ඊයේ මෙන් නොවීය. ප්‍රීතිය හා සන්තෝෂය අද නැත. ගෙදර හැම දෙනෙක්ම සෙමින් කතා කළහ.

පෙත්රොග්‍රාඩයේ ලිගොව්කා පෙදෙසේ සිට වෝල්කොව් සුසාන භූමිය දක්වා ඇති මහ රස්තාන්තයා වීදිය නමින් හැඳින් වේ. අවසන් ගමන් යන අය ගෙන යන්නේ මේ වීදිය ඔස්සේය. එය සමුගැනීමේ වීදිය යන අරුතයෙන් හැඳින්වන්නේ එබැවිනි.

සොහොන් බිමේ හිම තවම දියවී නැත. සමහර තැන් වල තුනී අයිස් තට්ටු වලින් වැසුණු වලවල්ය. මවගේ සොහොනේ හිස මත ගසක අත්තක් සිටුවා ඇත. ඒ අසලම තවත් කුඩා සොහොනකි. එය ලෙනින්ගේ නැගනිය වූ ඕල්යා උල්යානොවාගේය.

හිස් වැස්ම අතට ගත් ලෙනින් බොහෝ වේලාවක් යන තුරු මවගේ සොහොන ළඟ සිටගෙන සිටියේය.

ඔහුට ළමා කාලය සිහිවිය. සිම්බීර්ස්ක්හි ගෙදර. කෑම කාමරයට ඉහළින් එල්ලා තිබූ පහන. ළමයින් වටකර ගෙන අම්මා පොතක ඇති රසවත් කතාවක් කියවන්නීය. ළමයි මහත් වුවමනාවකින් සවන්

දෙති. අම්මා කොතරම් ලස්සනට පොත කියවන්නීද? ඇගේ කට හඬ පියකරුය.

තමා සිරභාරයේ සිටින විට මව පැමිණි සැටි ඔහුගේ මනැසට නැගෙයි:

''සිරකරු උල්යානොව් හමුවෙන්න අම්මා ඇවිල්ලා!'' සිර කාමරයේ දොර අගුළු හරින ගාඩ් තැන ගොරහැඩි ලෙස කියයි.

හමුවන වේලාව පමා නොකිරීම පිණිස ඔහු හිරගෙදර කොරිඩෝරය දිගේ ඉක්මනින් ගමන් කරයි. පිළිසඳර ශාලාව ඇඳිරිය. එහි සීලිම පහත්ය. හිරකරුවන් යකඩ වැටවල් දෙකකින් වෙන්කර ඇත. වැටට එපිටින් අම්මාගේ මූණ පෙනේ. ඇගේ දෙනෙත් දයාබරය. ''පුතේ නුඹේ සැප සනීප කොහොමද? මම නුඹට කෑම ටිකක් ගෙනාවා. ඉල්ලූ පොත් ගෙනාවා...''

අම්මේ, දයාබර අම්මේ! ඔබ අපේ නව ජීවිතය නොදැකම මිය ගියා. කොතරම් වේදනාවක්ද, කනගාටුවක්ද. අම්මේ ඔබේ දයාගුණය හා බුද්ධිය මට කිසිදක අමතක නොවේ.

## පාලන බලය සෝවියට් සභාවලට

වෝල්කව් සුසාන භූමියේදී මවගෙන් සමුගත් ලෙනින් සිද්ධාන්තයක් ඉදිරිපත් කොට කතාකිරීම සඳහා බොල්ෂෙවික්වාදීන්ගේ රැස්වීමකට ගියේ, 1917 අප්‍රේල් 4 දය. ඔහු එදින ඉදිරිපත් කළ සිද්ධාන්තය, ''අප්‍රේල් සිද්ධාන්ත'' නමින් හැඳින්වුණේ මේ නිසාය. ඔහු එය ලිවීම ආරම්භ කළේ දුම්රිය මැදිරියේදීය. බොල්ෂෙවික් පක්ෂය හා ජනතාව සාර් පන්නා දැමීමෙන් පසු ක්‍රියා කළ යුතු අන්දම පිළිබඳ නියම වැඩපිළිවෙලක් මේ සිද්ධාන්තය මගින් ලෙනින් සංක්ෂෙප ලෙස ඉදිරිපත් කළේය.

තාවකාලික ආණ්ඩුව පාලන බලය සියතට ගත්තේය. තාවකාලික ආණ්ඩුවේ සාමාජිකයෝ කවුද? ඉඩම් හිමියෝ සහ ධනපතියෝය. ධනපතියා ධනපතියාට අදියි. ගොවීන් හා කම්කරුවන් ගැන කටයුතු කිරීමට ඔවුන් ඉදිරිපත් වේද? තාවකාලික ආණ්ඩුව ධනපතීන්ගේ හා ඉඩම් හිමියන්ගේ අයිතිවාසිකම් සඳහා ක්‍රියා කරයි. එසේ නම් බොල්ෂෙවික් පක්ෂය තාවකාලික ආණ්ඩුවට ආධාර දෙන්නේ කවර හේතුවක් නිසාද? පක්ෂය ආණ්ඩුවට ආධාර නොදෙනු ඇත. කම්කරු, සෙබළ හා ගොවි නියෝජිතයින්ගෙන් යුත් සෝවියට් සභාවලට ආධාර දෙමු. මේ කාලයේදී සෝවියට් සභා එතරම් ශක්තිමත්ව නොතිබිණි. මෙන්ෂෙවිකයින් හා බොල්ෂෙවික් විරෝධී මත දරන්නන් බොහෝ ගණනක් සෝවියට් සභා තුළ සිටියහ.

''සෝවියට් සභාවල ශක්තිය දියුණු කළ යුතුයැ!''යි ලෙනින් කීවේය.

මෙහි තේරුම කුමක්ද? සෝවියට් සභාවලට වැඩි වැඩියෙන් බොල්ෂෙවික්වරුන් පත්කොට මෙන්ෂෙවිකයින් පන්නා දැමීමය. එවිට සෝවියට් සභාවල බලය යොදවා දුප්පත් ගොවීන්ට රදළ ඉඩම් හිමියන්ගේ ඉඩම් බෙදදිය හැකිය. ධනපතීන්ගේ කම්හල් කම්කරුවන්ට පවරා දිය හැකිය. මේ විධියට ඉඩම් හා කම්හල් ජන සතු කළ පසු යුධය ඉවර කළ හැකිය.

බොල්ෂෙවික් පක්ෂයට හා කම්කරුවන්ට ලෙනින් දුන් උපදෙස් එසේ විය.

ලෙනින් ඉදිරියේ සංකීර්ණ කාර්‍යයකි. ඔහු තම භාරදූර කාර්‍යය ගැන අවබෝධ කර ගත්තේ නොසැලී සිටියේය.

බොල්ෂෙවික් පක්ෂය තමන්ගේ පක්ෂය බව කම්කරුවෝ තේරුම් ගත්හ. හැම ගොවියකුටම මෙය තේරුම් ගැනීම අපහසු විය. මෙන්ෂෙවික්වරු හා ධනපති දේශපාලනඥයෝ ගොවීන් නොමග යැවූහ. තම පුවත්පත් මගින් බොල්ෂෙවික්වරුන් ගැන අමූලික බොරු ප්‍රචාරය කළහ. යුධය දිගටම කරගෙන යා යුතුයැයි කියා සිටියහ. ධනපති ආණ්ඩුවට පක්ෂවූහ. බොල්ෂෙවික් පක්ෂයටද පුවත්පතක් විය. එය ''ප්‍රව්දා'' නමින් හැඳින් විණි. මොයිකා ගඟ අසල කාමර තුනක කාර්‍යාලයක ''ප්‍රව්දා'' පුවත්පත මුද්‍රණය කොට ජනතාවට ඇත්ත පහදා දෙන ලදී.

ලෙනින් ''ප්‍රව්දා'' කාර්‍යාලයට විත් දිනපතාම ලිපි දෙක තුන බැගින් ලියමින් පක්ෂයේ ප්‍රතිපත්තිය ජනතාවට පැහැදිලි කළේය. පෙත්‍රොග්‍රාඩයේ කම්හල්වලට ගොස් කම්කරුවන් අමතා කතා කළේය. ඔහු කොතරම් පැහැදිලි බසින් තම පක්ෂයේ ප්‍රතිපත්ති පැහැදිලි කළේදයත්, දස දහස් ගණන් කම්කරු හා ගොවි ජනතාව පක්ෂය වටා එක්රැස් වන්නට වූහ.

ලෙනින් රුසියාවට පැමිණ තෙමසක් ගත වෙත්ම, රටේ දේශපාලන තත්ත්වය බෙහෙවින් වෙනස් විය. බොල්ෂෙවික් පක්ෂය, ලෙනින් සහ ඔහුගේ සගයෝ නව ජයග්‍රහණයන් ලබාගත්හ. යුද භටයෝ යුධ කිරීම ප්‍රතික්ෂේප කළහ. කම්කරුවෝ ධනපතීන්ට අයත් කම්හල් හා පැක්ටරිවල වැඩ කිරීමට අකැමති වූහ. ගොවීහු ඉඩම් ඉල්ලා සිටියහ.

ගිම්හානයේ එක් දවසක පෙත්‍රොග්‍රාඩයේ කම්කරුවෝ තම අයිතිවාසිකම් ඉල්ලමින් මහ මගට බටහ. බොල්ෂෙවික්වරු මේ පෙළපාලිය කලින් සංවිධාන නොකළද, එය සාමකාමී ලෙස පැවැත්වීමට ක්‍රියා කළහ. ''පාලන බලය සෝවියට් සභාවලට පවරනු!'', ''ධනපති ඇමතිවරුන් හංගවේවා!'', ''ආහාර, සාමය හා නිදහස!''

ලක්ෂ ගණන් කම්කරුවෝ දැඩි ආත්ම විශ්වාසයකින් යුතුව ගමන් කළහ.

තාවකාලික ආණ්ඩුවේ ඇමතිවරු බියසුලු නිවටයින් මෙන් හැසුරුණහ. තමන් විප්ලවවාදීන් යැයි කියා ගත්තද, 1905 දී සාර් රජ ක්‍රියා කළාක් මෙන්, සාමකාමී, නිරායුධ කම්කරු පෙළපාලියට වෙඩි තබන ලෙස අණකළේ නිවටයින් මෙනි.

මේ ඛේදවාචකය සිදුවූයේ 1917 ජූලි 4 දය.

ජූලි 5 ද ලෙනින් ''ප්‍රව්ද'' පුවත්පතේ කතෘ මණ්ඩලීය කාර්යාලයට ගියේ, පුවත්පත පිළිබඳ උපදෙස් දීමට හා අළුත් පිටපත් බැලීමටය.

...යුධ රථයක් පුවත්පත් කාර්යාලය ඉදිරිපිට නවත්වනවාත් සමගම, නිලධාරි පිරිසක් ඉන් එළියට විත් කාර්යාලයට කඩා පැන්නේය. තුවක්කු හා බයිනේත්තු රැගත් යුන්කර්වරු කෑගැසූහ:

''ලෙනින් කොහිද?''

වාසනාවකට මෙන් ලෙනින් එහි නොසිටිය. යුධ නිලධාරි පිරිස පුවත්පත් කාර්යාලයට කඩා වදින විට, ලෙනින් කාර්යාලයේ වැඩ අවසන් කොට ගෙදර යමින් සිටියේය. ලෙනින්ගේ බිරිඳ සහ අක්කා ඔහු එනතුරු නිහඬව හා කැළඹීමෙන් යුතුව සුදුමැලිවී බලා සිටියහ.

''වලෝද්‍යා, තාවකාලික ආණ්ඩුව නුඹව සිරභාරයට ගැනීමට වරෙන්තු නිකුත් කරලා.''

එවිටම ගෙදර දොර සීනුව හැඬවිණි. ක්‍රෲප්ස්කයාත්, ආන්නා උල්යානොවාත් තැති ගත්හ.

''ඔයාව හිරබාරයට ගන්ට ඇවිල්ලද?'' ක්‍රෲප්ස්කයා ඇසුවාය.

ලෙනින් නිහඬව කාමරයට ගොස් පොලීසියට හා ඔත්තු කරුවන්ට අසු නොවනසේ ලියවිලි ඉරා දැමීමට සූදනම් විය.

''දොර හරින්න!'' බැරෑඩි කට හඬකින් යමෙක් කීහ.

''ස්වෙර්ඩ්ලොව්! ඔව් ඒ ස්වෙර්ඩ්ලොව් තමා!'' යැයි ලෙනින්ගේ අක්කා — ආන්නා උල්යානොවා කීවාය.

ලෙනින් සිරභාරයට ගැනීමට හෝ ගෙය පිරික්සා බැලීමට හෝ නොපැමිණි නිසා ඔවුහු තුටුවූහ.

''යාකොව් මිහයිලොවිච්, එන්ට එන්ට'' යැයි දෙදෙනම එකවර කියමින් කළු පැහැති ඇස් ඇති උපැස් යුවළක් පැළඳ සිටි පුද්ගලයාට ආරාධනා කළහ.

යාකොව් මිහයිලොවිච් ස්වේර්ඩ්ලොව් තරුණයෙකි. බාල වියේ සිටම ඔහු බොල්ෂෙවික් පක්ෂයට බැඳී කටයුතු කළේය. සාර් ආණ්ඩුව මේ විප්ලවවාදී තරුණයාව ඈත සයිබීරියාවේ නරීම්ස්කි පෙදෙසට පිටුවහල්

කළේය. හතර වරක්ම හිරගෙදරින් පැන යාමට ඔහු තැත්කළ නමුදු අසාර්ථක වුවද, පස්වැනි වර ඔහු සමත් විය...

ඔහුට වැඩි කලක් නිදහසේ කටයුතු කළ නොහැකි විය. මේ වර ඔහු පිටුවහල් කළේ තුරුහාන්ස්ක් පෙදෙසටයි. එහි ගිය හැම සිරකරුවෙකුටම අකල් මරණය නියතය.

පෙබ්‍රවාරි විප්ලවය ඔහු නිදහස් කළේය. දක්ෂ, බුඩිමත් ස්වෙර්ඩ්ලොව් බොල්ෂෙවික් පක්ෂයේ නායකයෙකි, ලෙනින්ගේ සහකාරයෙකි.

''ප්‍රව්ද'' පුවත්පත් කාර්‍යාලයට කඩා පැන්න යුන්කර් යුධ නිලධාරීහු බයිනෙත්තු වලින් ඇන එහි වූ හැම දෙයක්ම විනාශ කළහ. නගරය පුරාම බොල්ෂෙවික්වරුන් සිරභාරයට ගන්නා ලදී. ගෙවල්වලට කඩා පැන පිරික්සා බැලීම ආරම්භ විය. කොයි මොහොතේ වුවද ලෙනින් සිර භාරයට ගැනීමට ඉඩ ඇත. ලෙනින් සහෝදරය ඉක්මනින් පැනගොස් සැඟවිය යුතුය!

ලෙනින් කල්පනා කරමින් නිහඬවිය. නැවත විප්ලවවාදීන් සිරභාරයට ගැනීම පටන් ගෙන ඇත. පැනයාම්. හිරගෙවල්. පොලීසිය. නැවත සැඟවීම්.

ලෙනින් තරමක අස්ථිර ගතියක් පෑවේය. එහෙත් තර්ජනය බරපතලය. දුටු තැන සිරභාරයට ගැනීමට නියම කොට ඇති පුද්ගලයකු නඩු විසඳීමක් නැතිව වුවද මරා දැමිය හැකිය.

''ලෙනින් සහෝදරය වහාම පැනල යන්ට ඕන.'' ස්වෙර්ඩ්ලොව් දැඩි ලෙස කියා සිටියේය.

ඔහු තම උඩු කබාය ගෙන ලෙනින්ගේ දෙවුර වැසීය.

''පිට කෙනෙකුගෙ කබායක් ඇඳගෙන යනකොට එකපාරටම අඳුනාගන්ට බැහැ.'' ඔහු පැවසීය.

ලෙනින් කබාකර ඔසවා ගෙන තම බිරිඳ සහ අක්කා සිප වැළඳ ගත්තේය. මුහුදේ යාත්‍රා කරන නැවකට සමාන මේ ගෙදර තෙමසක් තමාට නවාතැන් දීම ගැන තම වැඩිමහල් සොහොයුරියට ස්තුති කළ ලෙනින් එදෙස බැලුවේ සමුගන්නා අයුරිනි.

ස්වෙර්ඩ්ලොව් සමග ලෙනින් ගෙදරින් පිටවිය. නීති විරෝධී ලෙස සැඟවී දේශපාලන කටයුතු වල යෙදීම සඳහා ඔහු වෙනත් තැනකට ගියේය.

## රස්ලිව් වැව

පෙත්‍රොග්‍රාඩය අසල, පින්ලන්ත දේශසීමාවට නුදුරින් පිහිටි සෙස්ට්‍රරේට්ස්ක් ජනපදයේ යුධායුධ සාදන කම්හලක් විය. බොල්ෂෙවික් පක්ෂයේ සාමාජිකයෙක් වන නිකොලායි එමිල්යානොව් මේ කම්හලේ

තිස් වසරක් සේවය කළේය. ඔහු පදිංචිව සිටියේ රස්ලිව් ගමේය. එහි සිට අඩ පැයක ගමනින් පසු ඔහු කම්හලට පැමිණියේය. එහි වූ වැව රස්ලිව් යන නමින් හඳුන්වන ලද බැවින් ගමද එනමින්ම හැඳින්විණි. හැතැප්ම පහක් පමණ දිගැති රස්ලිව් වැව හිරු එළිය ඇති දවස්වලදී අහසමෙන් නිල් පැහැයෙන් දිලිසිණි.

දිනක් බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නියෝජිතයෙක් එමිල්යානොව් හමුවීමට පැමිණියේය. ප්‍රතිවිප්ලවවාදී තාවකාලික ආණ්ඩුවේ හිංසා පීඩාවලින් පක්ෂයේ නායක වී. අයි. ලෙනින් ආරක්ෂා කරගත යුතුය යන යෝජනාවක් මධ්‍යම කාරක සභාව සම්මත කළාය.

''එමිල්යානොව් සහෝදරයා, ලෙනින්ගෙ ආරක්ෂාව තමුසෙට භාරකරනවා.'' නියෝජිතයා ඔහුට කීය.

ලෙනින්ව තම ගෙවත්තේ පිදුරු මඩුවේ සඟවා තබාගත යුතුයැයි එමිල්යානොව් තීරණය කළේය.

මේ ක්‍රමය නුසුදුසු එමෙන්ම භයානක බව ඉක්මනින්ම ඔහුට අවබෝධ විය. වටේටම අසල්වැසියන්ය. අවට ගෙවල්වල කොල්ලෝ නිතරම ගෙවත්තට වැදී සෙල්ලම් කරති. එමිල්යානොව්ට දූ දරුවන් හත් දෙනෙකි. ඔවුන්ගේ යහළුවන්ගේ හා යෙහෙළියන්ගේ ගණන විශාලය. ලෙනින්ගේ ආරක්ෂාව සඳහා වෙනත් ස්ථානයක් තෝරාගත යුතු බව ඔහු තීරණය කළේය.

උදේ හිරු පායන්නටත් කලින් එමිල්යානොව් ලෙනින් අවදි කළේය. රස්ලිව් වැව සිහින් මීදුමකින් වැසිලාය. තම ගෙය පිටුපස පිහිටි වැවට ගිය ඔහු ඔරුව ලිහා ගෙන, ලෙනින් එහි නංවා ගෙන, ශබ්දය පිට නොවන සේ හබල් ක්‍රියා කරවමින් එගොඩට පැද්දේය. රස්ලිව් වැව විශාලය, පාලුය, තවම හිරු පායා නැත. අවට ගෙවල්වල මිනිස්සු නිදති. පක්ෂීන් පවා අවදිවී නැත. නැගෙනහිර අහසේ අරුණෝදය යම්තමින් පෙනේ.

ලෙනින්ව වැවේ එගොඩට ගෙනයාමට එමිල්යානොව් යුහුසුලු විය. වියෝර්ස්ට් හතරක් පමණ ඔරුව පැද්ද යුතුය. උදේ පාන්දර නොහඳුණන පුද්ගලයෙකු, අප්‍රසිඩ හේතුවක් නිසා යම්කිසි අප්‍රසිඩ ස්ථානයකට ගෙනයතියි අසල්වැසියන් සැක කිරීමට ඉඩ ඇති බැවින් ඔහු නොසන්සුන් විය. ලෙනින් වහාම සිරභාරයට ගත යුතුය යන ප්‍රකාශනය හැම පුවත්පතකම පළවී තිබිණි. නොයෙක් විධියේ මිනිසුන් මුණ ගැසීමට ඉඩ ඇත... එමිල්යානොව් ඉක්මන් වූයේ මේ හේතුව නිසාය.

ලෙනින් නිහඬව ඔරුවේ වාඩිවී සිටියේය. සුළං හමත්ම මීදුම චලනය වන්නට විය. අරුණෝදය වඩාත් ලා රත් පැහැයෙන් දිලිසෙන්නට විය. වැවේ ඉවුර වඩාත් පැහැදිලිය.

මේ නිසල නිහඬ පැයේදී ලෙනින්ට තම අතීතයත්, සුහද මිතුරනුත් සිහි විය. පිටර්බුර්ගයේ කම්කරුවෙකුවූ බාබුෂ්කින් ඔහුට මතක් විය. ''සටන්කාමී සංගමයේ'' පළමුවැනි කැලෑ පත්‍රිකාව බාබුෂ්කින් සමග එක්වී ලියූ සැටි ඔහු සිහි කළේය. පසුකලෙක ඉවාන් බාබුෂ්කින් නිර්භය බොල්ෂෙවික්වාදී කම්කරු නායකයෙක් වී සටන් මෙහෙයැවීය. 1906 දී සාර් ආණ්ඩුව නඩු විභාගයක් නොමැතිව බාබුෂ්කින් එල්ලා මරා දැම්මේය.

''පොතෙම්කින්'' යුධ නැවේ කැරැල්ල ගැන විස්තර කිරීමට ජිනීවාහිදී ලෙනින් හමුවූ නාවිකයකු වූ අපනාසි මත්යූෂෙන්කො! පසු කලෙක මත්යූෂෙන්කො රුසියාවට ගිය විට සාර් ආණ්ඩුව ඔහුවත් එල්ලා මැරීය.

ඊළඟට ලෙනින්ගේ මනැස ඉදිරියේ ඉවාන් යාකුතව්ගේ සේයාව මැවිණි. 1905 රුසියානු විප්ලව සමයේදී තරුණ ඉවාන් උපා නගරයේ කම්කරු සමූහාණ්ඩුවක් පිහිටුවීය. විප්ලවය පරාජය වූ පසු ඉවාන් යාකුතව් හිරගෙදර වාසලේදී එල්ලා මරා දමන ලදී. විප්ලවය වෙනුවෙන් ජීවිත පුද කළ දස දහස් ගණන් කම්කරු සොහොයුරනි, ඔබ හැමට සදා කීර්තිය ලැබේවා! ඔබගේ නම් අමරණීයය.

එමිල්යානොව්ද කම්කරුවෙකි. ඔහු තම ජීවිතය පරදුවට තබා ලෙනින් ආරක්ෂා කිරීමෙහි යෙදී සිටී. ධනපති ආණ්ඩුවෙන් තමා රැකීම සඳහා අභීත සටනක් කරන එමිල්යානොව් ගැන ලෙනින් කල්පනා කරයි. ආණ්ඩුවට ඔහු අසුවුණොත් ඔහුට මරණය නියතය. එවිට ඔහුගේ දූ දරුවන් හත්දෙනාම අනාථයින් වනු ඇත.

''එමිල්යානොව් සහෝදරයා, ඔහෙට බොහොම ස්තුතියි!''ලෙනින් ඔහු දෙස කෘතඥතා පූර්වකව බලා පැවසීය.

එමිල්යානොව් ලෙනින් දෙස බැලුවේ පුදුමයෙනි:

''මොකද සහෝදරය, එහෙම කියන්නෙ. ඔහෙව ආරක්ෂා කිරීම මට ලොකු ගෞරවයක්!''

ඔරුව එගොඩට පැදිණි.

වැව අසලම වනයකි. එය වනයක් නොව බෑද්දකැයි කිව හැකි තරම් කුඩාය. එහි බර්ච් ඇතුළු උතුරු ශීත කලාපයේ වැවෙන ගස් වර්ග කීපයක්ම දැකිය හැකි විය.

ඔරුවේ තිබුණු ආහාරද, කොට්ට හා මෙට්ටයක්ද, පොරවනයක්ද වියෝර්ස්ට් බාගයක් පමණ බෑද්ද තුළට ඇදගෙන ගියහ. ලෙනින් කඩදාසි කීපයක් සහ නිල් පැහැති කවරයක් සහිත කොපි පොතක්ද කිහිලි ගන්නා ගෙන ගමන් කළේය.

අවුරුද්දක් පමණ ස්විට්සර්ලන්තයේ සූරික් නගරයේ නැවතී, එහි

මහජන පුස්තකාලයට දිනපතා යමින් දහසක් පොත් කියවමින්, උපුටාගත් කරුණු ඔහු කිහිලි ගන්නාගත් නිල් පැහැති කොපි පොතේ සටහන් කර ගෙන ඇත. දැන් එය ලෙනින්ට මාහැඟි වස්තුවකි.

එසේවුවද, එමිල්යානොව් ඔහු ගෙනයන්නේ කොතැනටද? බැද්ද දිගේ ඇවිදින විට පාළු විශාල තණ පිටියක් හමුවිය. එහි අතුසෙවිලි කළ පැළකි. පැළ අසල වලක් හාරා දෙපසින් කෝටු දෙකක් සිටුවා ඒ කෝටු දෙක සම්බන්ධ කොට තවත් කෝටුවක් රඳවා ඇත. හරස් කෝටුවේ කේතලයක් එල්ලා තිබේ. මෙය තමා කුස්සිය.

''මගේ නවාතැන නම් හරිම ඉස්තරම්. එමිල්යානොව් සහෝදරයා මීට වඩා හොඳ තැනක් හීනෙකින්වත් හිතන්න බැහැ.'' ලෙනින් පැවසීය.

''අන්න අර දෑකැත්ත පේනවද?'' එමිල්යානොව් අඩි කීපයක් දිගැති රිටක් සහිත දිග දෑකැත්තක් පෙන්වමින් ප්‍රශ්න කළේය.

''ලෙනින් සහෝදරය, මම ඔහෙව තණකොළ කපන කුලී කම්කරුවෙක් හැටියට වැඩට ගත්තා. තේරුණද? ඒ හන්ද තණකොළ කපන්ට ඕන. කැලෑවට එනවා හතු සහ පලු වගී එකතු කරන මිනිස්සු. උන් මේ පැත්තෙ ආවොත් ඔහෙ වචනයක්වත් කතා කරන්ට එපා. මම කුලී වැඩට අරගෙන ඉන්නෙ පින්ලන්ත ජාතිකයෙකුව. ඉතින් ඔහෙ පින්ලන්ත කාරයෙක් හන්ද රුසියානු වචනයක්වත් දන්නෙ නැහැ. බැරිවෙලාවත් එහෙම කතා කරන්න එපා.''

කීප වරක්ම ලෙනින්ගේ හිස සිට දෙපතුල දක්වා මහත් ඕනෑකමකින් බැලූ එමිලියානොව් නැවත වරක් ඔහු දෙස පරික්ෂාකාරී ලෙස බැලීය.

ලෙනින් තම යටි රැවුළ සම්පූර්ණයෙන්ම කපා දමා උඩු රැවුළ කොටට කපා ඇත. ඔහුගේ උඩු කය වසා ඇත්තේ පරණ කම්කරු කබායකිනි.

''ඔහෙ පින්ලන්ත කම්කරුවෙකුට බොහොම සමානයි'' එමිල්යානොව් කීවේය. ''රෑ වුණාම නැතිනම් එළිවෙන යාමෙට කෑම ගේන්නම්.''

''පත්තර! හොයා ගන්ට පුළුවන් හැම පුවත්පතක්ම ගෙනෙන්ට!'' ලෙනින් තම ආරක්ෂකයාට කීවේය. ''තව එක ප්‍රශ්නයක් තියෙනව. ඔහෙගෙ කුලී කම්කරුවාට හුඟාක් ලියන්ට ඕන. කොහෙ ඉඳගෙනද ලියන්නෙ?''

''අන්න අතන!'' යැයි එමිල්යානොව් කීවේ සතුටකිනි.

පඳුරු සහ අතු කීපයක් ඈත් මෑත් කොට ගත්විට ගස් කපා පැළැටි උදුරන ලද කදිම චතුරශ්‍රයකි. එහි ගස් කොට දෙකකි. එක් කොටයක් උසය, අනික පහත්ය. උසැති ගස් කොටය මේසය මෙන්ද, පහත් කොටය පුටුව මෙන්ද පැවිච්චි කළ හැකිය.

''මේක තමා ඔහෙගෙ ලියන මේසය. කාටවත් පේන්නෙ නැහැ. නිහඬව කල්පනා කරන්ට පුළුවනි''යි එමිල්යානොව් තම පක්ෂයේ නායකයාට කීවේය.

පැල්පත අතු ගා ගුඩ කොට, බඩු බාහිංදය නිසි තැන්වල තබා එමිල්යානොව් පිටිත්විය. ඔහුට ඇයුබෝවන් කීමට ලෙනින් ඔහු සමග රස්ලිව් වැව දක්වා ගොස් ඔරුව පදිමින් යන තම සගයා නොපෙණෙන තෙක් බලා සිටියේය.

ඔරුව නොපෙනී ගිය පසුද අතක් වැනූ ලෙනින් ඉක්මනින් තම ලියන මේසය වෙත ගොස්, සටහන් සහිත නිල් පැහැති පොත දිග හැරියේය. නිර්ධන පංති ආඥාදායකත්වයක් සඳහා කම්කරුවන් සටන් කළ යුත්තේ කෙසේද යන්න ගැනත්, කම්කරු රජයක් ගොඩ නගන්නේ කෙසේද යන්න ගැනත් ලෙනින් පොතක් ලියුවේය.

## දුම්රිය කම්කරුවා

ලෙනින් සැඟවී වැඩ කළ යුතු යැයි පක්ෂයේ මධ්‍යම කාරක සභාව තීරණය කිරීම නුවණට හුරු ක්‍රියාවක් විය. ලෙනින් ගෙදරින් පිටත්ව ගිය දවසට පසුද යුන්කර්වරු ලෙනින් සෙවීම පිණිස ආන්නා උල්යානොවාගේ ගෙදරට කඩා පැන්නහ.

ලෙනින් රස්ලිව් වැව අසල පැල්පතෙහි වාසය කළේය. මාර සේනාවක් මෙන් රෑ දවල් නොතකා මදුරුවෝ ලෙනින්ට පහර දෙමින් ඔහුගේ ලේ උරා බීවෝය.

''තාවකාලික ආණ්ඩුවෙන් බේරෙන්නට පුළුවන් වුණත්, මදුරුවන්ගෙන් බේරෙන්නට බැහැ'' මදුරුවන්ගේ පීඩාවට භාජන වුණු ලෙනින් පැවසීය.

සමහර දවස්වලදී ධාරානිපාත වැස්ස ඉමක් නැතිව වසී. එවිට පැල්පත තුළට වී සිටිය යුතුය. කේතලය ලිප තබා ගිනි අවුළුවා ගැනීමට පවා බැරි තරමට තෙත්වෙයි. උණුසුම්වීමට හෝ උණු තේ උගුරක් බීමට හෝ ඔහුට බැරිවූ වාර අපමණය. එහෙත් අධෛර්යයට පත්නොවූ ලෙනින් අතිශයින්ම අවශ්‍ය වැඩ ගොඩක් කළේය. ලිපි ලියුවේය. පොතක් ලිවීම ගැන කල්පනා කළේය. තමා බැලීමට පැමිණි පාක්ෂික සහෝදරවරුන්ගේ මාර්ගයෙන් පෙත්‍රොග්‍රාඩ්හි පවත්වනලද බොල්ෂෙවික් පක්ෂයේ හයවැනි සම්මේලනයට ලෙනින් නායකත්වය දුන්නේය. ඔහු එම සම්මේලනයට තම අදහස් හා උපදෙස් යැවීය.

''නිර්ධන පංතිය දුප්පත් ගොවි ජනතාව සමග අවිගත් නැගිටීමක් මගින් ආණ්ඩු බලය ගත යුතුය.'' පක්ෂයේ සම්මේලනය ඉදිරියේ ලෙනින් ඉදිරිපත් කළ අනගිතම කාර්යය භාරය එයය. සම්මේලනය එය අනුමත කළේය.

''මේ සටන සඳහා අප පක්ෂය ඉදිරියට යන්නේ ළෙළදෙන ධජ අතැතිවය... පැරණි ලෝකය අභාවයට යන වේලාව පැමිණ ඇත.'' සම්මේලනයේ ආයාචනය එය විය.

ලෙනින්ට බියවූ තාවකාලික ධනපති ආණ්ඩුව ඔහුට වෛර කළේය. බොල්ෂෙවික් පක්ෂය තීරණාත්මක ලෙස මෙහෙයවන්නා ලෙනින් බව ධනපති ආණ්ඩුව දැන සිටියේය. පොලිස් ඔත්තුකරුවන් සිය ගණනක් ලෙනින් සෙවීම සඳහා යොදවන ලදී.

රස්ලිව් වැව අසල පැල්පතේ සිටීම අවදානම් සහිත විය. ගිම්හානය අවසාන වී ශරත් සමය පැමිණෙන්නට විය. රෑ කාලය වැඩිවෙන්නට පටන්ගත් අතර ශීත අධික විය. දිවා රෑ දෙක්හි වසින්නට විය. ගස්වල කොළ හැලිණි.

පැල්පතෙන් තවත් දුර බැහැර පෙදෙසකට ලෙනින් යැවිය යුතුයැයි පක්ෂයේ මධ්‍යම කාරක සභාව තීරණය කළාය.

දවසක්ද එමිල්යානොව් හිමිදිරි පාන්දර කම්හලේ අධ්‍යක්ෂකගේ කාමරයට ඇතුළු විය. මෙතරම් හිමිදිරි පාන්දර අධ්‍යක්ෂක වැනි ලොක්කෝ වැඩට නොඑති. එමිල්යානොව්ට ඕනෑකර තිබුණේ අධ්‍යක්ෂක නොව ඔහුගේ කාමරයට ඇතුළුවීමය. මුරකරුවා එමිලියානොව් හඳුණන බැවින් ඔහුට අධ්‍යක්ෂකගේ කාර්යාල කාමරයට යාමට අවසර දුන්නේය. තමාට පින්ලන්තයට යාමට අවසර පතක් ලබාගැනීමට පැමිණි බව ඔහු මුරකරුට කීවේය. ඇත්ත වශයෙන්ම ඔහුට අවසර පතක් අවශ්‍යව තිබිණි. කම්හලේ වැඩකරන සමහරු පින්ලන්තයට අයත් පෙදෙස්වල වාසය කළහ. කම්හලේ අධ්‍යක්ෂක වරයා එම පෙදෙස්වලට යාමට මේ කම්කරුවන්ට අවසර පත් නිකුත් කිරීම සිරිතක්ව පැවතිණි. අධ්‍යක්ෂකගේ මේසය මත අවසර පත් කීපයක්ම තිබිණි. එමිල්යානොව් තම අතට අසුවුණ අවසර පතක් ගෙන සාක්කුවේ දමාගෙන කාර්යාල කාමරයෙන් පිටවිය. ඔහු පැල්පතට පැමිණ එම අවසර පත ලෙනින් අත තැබීය. ව්ලදිමීර් ඉල්යිච් උල්යානොව් ලෙනින් කොන්ස්තන්තින් පෙත්‍රොවිච් ඉවනෝව් බවට පත්විය. ඔහු තම උඩු හා යටි රැවුළු බූගා දමා ඇස් බැම් සිහින් කළේය. තම පළල් නළල වැසෙන සේ බොරු කොණ්ඩයක් පැළඳ ගත්තේය. හිස් වැස්මකින් හිස වසාගත් ලෙනින් දැන් අමුතුම මිනිහෙකි. ඔහුගේ බිරිඳ — නදේෂ්ද ක්‍රෘප්ස්කයාට පවා ඔහු හඳුණා ගැනීමට බැරිය.

හවස ඇඳිර පැතිර ගිය පසු ලෙනින් රස්ලිව් වැවේ තම නිවාසය අතහැර බැද්ද හරහා දුම්රිය මග දෙසට ගමන් කළේය. ඔහු කැටුව එමිල්යානොව් සහ තවත් පින්ලන්ත සහෝදරවරු දෙදෙනෙක් ගමන් කළහ. මුලදී

අනතුරු රහිතව ඔවුහු ගමන් කළහ. ශරත් සමයේදී වේලාසනින් ඇඳිරි වෙයි. ඇහැට ඇන්නත් නොපෙනෙන තරම් කළුවර වෙලාය. හිටිහැටියේම අඳිපාර නැතිවිය. අතරින් පතරින් ගස් සහිත පෙදෙසකට ඔවුහු පැමිණියහ. පයින් ගමන් නොකළ හැකි තරමට ඝනව පඳුරු වැවී ඇත. මේ කුමක්ද? මේ කුමක්ද?.. දුම් සුවඳක් වහනය විය. ගිනි මැලයක්ද නැතිනම් ස්වභාවික ගින්නක්ද? ගමන් කරත්ම විෂ සහිත සුවඳක් වැඩි වැඩියෙන් දැනෙයි. හුස්ම ගැනීම පවා අමාරුවිය. ඇස් පෙනීම හීන විය.

"ආපහු යමු! ටෝර්ප් ගිනි ගන්ට පටන් අරගෙන." එමිල්යානොව් කීවේය.

ටෝර්ප් ගිනි තරම් බියජනක කපටි සතුරෙක් තවත් නොමැත! ගින්න පැතිරෙන්නේ පොළොව යටිනි. පොළොව ගිනි රත්වී ගින්න පතුරුවා හරී. හිටිහැටියේම එම ගින්න මහා ගිනි සිළුවක් මෙන් මතුපිටට පැන නැග අවට හැම දෙයක්ම විනාශ කරයි.

"ලෙනින් සහෝදරයා! සහෝදරවරුනි! ආපසු යමු..."

ඔවුන්ට හුස්ම ගැනීම පවා අමාරුය. දුමෙන් වැසී ඇති පෙදෙස හරහා අන්ධයින් මෙන් අතපත ගාමින්, එකිනෙකාගේ ඇඟේ හැප්පෙමින්, වැටෙමින්, නැවත නැගිට සිටිමින්, අසීරුවෙන් ගමන් කළහ.

දුම් සහිත පෙදෙස ක්‍රමෙන් අඩුවිය. දැන් ඔවුහු දුම් රහිත පෙදෙසට ආහ. දැන් ඔවුන්ගේ පයට ටෝර්ප් සහිත මඩ නොපැගේ. ගිනි ගත්නාසුලු ටෝර්ප් මුසු බිමෙන් ඔවුහු ඈත්වූහ.

විෂ වායුව සහ අසීරු ගමන නිසා දුබලවූ ඔවුහු විවේක ගැනීමට බිම වාඩිවූහ.

පසුදින රාත්‍රී එක පසුවී විනාඩි පහළොවට පෙත්‍රොග්‍රාඩයේ සිට උදේල්නි දුම්රිය නැවතුම් පොළට දුම්රියක් පැමිණියේය. එය පින්ලන්තය දක්වා යන දුම්රියකි. එය පදවන්නා පින්ලන්ත ජාතික ගුගෝ යාලවාය. බොල්ෂෙවික් සාමාජිකයෙක් වූ ගුගෝ පෙත්‍රොග්‍රාඩයේ වාසය කළේය. ඔහු අන් හැම දුම්රිය යන්ත්‍රයකටම වඩා ඇලුම් කළේ අංක 293 දරන යන්ත්‍රයටය. එහි දුම්බටය පුනෝලයක් මෙන් ඉහළ සිට පහළට තුනීය. දෙපස ගෝලාකාරය, උණුසුම්ය. උදේල්නි දුම්රිය පොළ අසල මං සන්ධියේදී ගුගෝ තම දුම්රිය නැවැත්විය. හිස පිටතට දමා වටපිට බැලීය. මං සන්ධිය අසල සිටගෙන මිනිහෙක් සිගරැට්ටුවක් උරයි. තවකෙක් පහන් ආලෝකයෙන් පුවත්පතක් කියවයි. ඔහුට කලින් ලැබුණු සංඥ සලකුණු අනුව සියල්ල න්වැරදිය. තමා දකින මේ පුද්ගලයින් දෙදෙනා ලෙනින්ගේ ආරක්ෂාවට පැමිණි අය විය යුත්තාහයි ගුගෝ සිතීය. එකෙක්

දුම් බොයි අනිකා පුවත්පතක් කියවයි ''එසේවුවද ලෙනින් කොහිද?'' මෙසේ සිතූ ගුගෝ නොසන්සුන් විය.

ඒ මොහොතේදී දුම්රිය වෙත පළල් උරතල ඇති මිටි මිනිහෙක් ආවේය. කම්කරු ඇඳුමකින් හා කැප් තොප්පියකින් සැරසී සිටි ඔහුගේ නළල කෙස් රොදකින් වැසිලාය. ඔහු තම බලපත්‍රය පෙන්වා යන්ත්‍රයට නැග ගත්තේය.

''ආයුබෝවන්! මගේ නම ඉවනෝව්. ඔහෙගෙ අත් උදවුකාරය හැටියට ලිපට දර දැමීමට ආවා.''

''ආයුබෝවන් පයර් මැන් සහෝදරයා!'' ගුගෝ තම අත් උදවුකාරයා අමතා පැවසීය.

දුම්රිය යන්ත්‍රයේ ලිපට දර දැමීමට පැමිණි ලෙනින් හෙවත් ඉවනෝව් තම උඩු කබාය ගළවා නියම කම්කරුවෙකු සේ දුම්රිය යන්ත්‍රයේ උදුන අසල දර ගොඩ ගසන්නට විය. දුම්රිය හූ හඬක් නංවා වේගයෙන් දුවන්නට විය.

බෙලොඕස්ත්‍රොව් දුම්රිය පොළ දක්වා කරදරයක් නැතිව යාමට හැකිවිය. රුසියානු දේශසීමාවේ දුම්රිය පොළක්වූ මෙහි පොලිස් නිලධාරීහුද, යුන්කර්වරුද බොහෝ වූහ. දුම්රිය නැවැත්වූ විගසම ඔවුහු මැදිරිවලට කඩා පැන බලපත්‍ර පරීක්ෂාකරන්නට වූහ. කොන්දෙස්තරවරු නළා පිඹිමින් ලන්තෑරුම් වනමින් ඒ මේ අත ගමන් කළහ.

''ඔවුන්ට අපේ මැෂිම ළඟට එන්ට ඉඩතියන්න හොඳ නැහැ. බල පත්‍රයක් තිබුණත් ඕකුන්ගෙන් ඈත්වෙන එක හොඳා'' යැයි ගුගෝ කීවේය.

ඔහු එළියට පැන දුම්රිය යන්ත්‍රය මැදිරිවලින් ගළවා වතුර පුරවන තැනට එය පදවාගෙන ගියේය. යන්ත්‍රයේ වතුර ටැන්කියට වතුර පුරවන බවක් අඟවමින් ඔහු එතැන බොහෝ වේලාවක් සිටියේය.

පළමුවැනි වරට සීනුව හඬවන ලදී. පොලිස් නිලධාරීහු තවමත් බලපත්‍ර පරීක්ෂාකිරීම නොනැවැත් වූහ. කිසිවකු දුම්රිය මැදිරියකින් එළියට ඇද දැමූහ. මුළු දුම්රිය පොළම කැළඹිණි.

දෙවැනි වරටද සීනුව හැඬවිණි. දුම්රිය පිටවීමට විනාඩියකට කලින් ගුගෝ තම දුම්රිය යන්ත්‍රය දුම්රිය මැදිරි වලට අමුණා ගමනට සූදනම් විය. තුන්වැනි වරට සීනුව නාද වනවාත් සමගම දුම්රිය යන්ත්‍ර හූ හඬ නැගීය. ''නුඹලගේ ඇස් වලට වැලි ගැහුවා!'' යි පොලිස් නිලධාරීන් හා යුන්කර්වරුන් දෙස බැලූ ගුගෝ ඔවුන්ට විහිළු කරමින් කීවේය.

දුම්රිය හඬ නගමින් දුවන්නට විය. රෑ බෝ විය. අගෝස්තු මාසයේ පැහැදිලි අහසේ තරු බබලන්නට වූ අතර ලෙනින් දුම්රිය යන්ත්‍ර කාමරයේ කවුළුවෙන් හිස එළියට දමා පිරිසුදු, ප්‍රණීත වාතය ආශ්වාස කළේය.

ඔවුහු ඉක්මනින්ම පින්ලන්තයට පැමිණියහ.

## පුදුම ආරක්ෂකයා

පින්ලන්තයේ ප්‍රධාන නගරයක්වූ හෙල්සින්ග්පෝර්ස්හි පොලිස්පතියා හැටියට සේවය කළේ තරුණයෙක් වූ ගුස්ටාව් රෝව්යෝය. දවසක්ද පින්ලන්තයේ අග්‍රාණ්ඩුකාර තැන්පත් රුසියානු නිලධාරියා පොලිස්පති රෝව්යෝ කැඳවීය. එවකට පින්ලන්තය රුසියාවට යටත් රටක්ව පැවතියේය.

අග්‍රාණ්ඩුකාරයා ඊයක් මෙන් ඍජුය. රෝව්යෝ දුටු ඔහු තවත් ඍජුව සිටගනිමින් වැදගත් ලෙස මෙසේ පැවසීය:

''පෙත්රොග්‍රාඩ් නගරයෙන් රහස් නියමයක් ලැබී තිබෙනව.''

''එහෙමයි'' පොලිස්පති හූ මිටි තැබීය.

''ලෙනින්ව හඳුණනවද?'' අග්‍රාණ්ඩුකාරයා ප්‍රශ්න කළේය.

රෝව්යෝ තම නිකට අත ගා තරමක් ඇද-පැද අඳුණන බව පැවසීය. ඔහුගේ ඡායාරූපය හැම පුවත්පතකම පළවී ඇත. තාවකාලික ආණ්ඩුව ඔහු ඇල්ලීමට වරෙන්තු නිකුත් කර ඇත.

''ලෙනින් හෙල්සින්ග්පෝර්ස් නගරයේ සැඟවී ඇතැයි සැක කරනවා.'' අග්‍රාණ්ඩුකාරයා කීය.

නිහඬවූ රෝව්යෝ මහත් ඕනෑකමකින් අග්‍රාණ්ඩුකාරයා දෙස බලා සිටියේ ඔහුගේ නියමය දැනගනු රිසියෙනි.

''තමුසෙ වහාම සුදුසු පියවර ගත යුතුයි.''

''එහෙමයි අග්‍රාණ්ඩුකාර තුමනි!''

''ලෙනින් තමුසෙගෙ අතට අහුවුණොත්...''

''ලෙනින් මගේ අතට අහුවුණොත් අවශ්‍ය හැමදෙයක්ම කරන්නම් අග්‍රාණ්ඩුකාර තුමනි!''යි රෝව්යෝ කීවේය.

''මතක තබාගන්න ලෙනින්ව අල්ලා දුන්නොත් ලොකු මුදලක් ලැබෙවි.'' අග්‍රාණ්ඩුකාරයා ත්‍යාගිශීලි බවක් පෙන්වමින් පැවසීය.

රෝව්යෝ හිස නමා ආචාර කොට අග්‍රාණ්ඩුකාරයාගේ කාර්‍යාලයෙන් පිටවිය. ඔහු තම නළලෙන් හා බෙල්ලෙන් ගැලූ දහඩිය බිංදු පිසදමාගත්තේ කොටු සහිත ලේන්සුවකිනි.

අග්‍රාණ්ඩුකාරයාගේ කාර්‍යාලයෙන් පිටවුණු රෝව්යෝ තම කාර්‍යාලයට නොගොස් දුම්රිය පොළට ගියේය. හෙල්සින්ග්පෝර්ස් පෙත්රොග්‍රාඩ් තැපැල් දුම්රියට පිටත්වී යාමට වේලාව නොපැමිණියද, එහි සේවක පිරිස සූදනමින් සිටියහ. දුම්රිය වේදිකාවට ගිය රෝව්යෝ, මන්දෝත්සාහි, නිදිමත පෙණුමකින් යුත් දුම්රිය තැපැල් සේවකයා එනතුරු බලා සිටියේය. ලෝකය විනාශවුණත් කලබොල නොවන මිනිහෙකුවූ තැපැල්කරු,

පොලිස්පති රෝව්යෝත් සමග සෙමින්, සෙමින් දුම්රිය වේදිකාවේ ගමන් කළේය. විනාඩියකින් රෝව්යෝ තැපැල්කරුට පැකැට්ටුවක් දුන් අතර, ඔහු විදුලිය වේගයෙන් එය තම කමිසය යට ඔබා ගත්තේය.

"අර මිනිහගෙන් ඉස්සර ලිපිනයටමයි." රෝව්යෝ පැවසීය.

"පැහැදිලියි" තැපැල්කරුවා රෝව්යෝට කීවේ, තවත් පැකැට්ටුවක් ඔහු අත තබමිනි. රෝව්යෝ එම පැකැට්ටුව සඟවා ගත්තේය. පොලිස්පති රෝව්යෝ ඉන්පසුද ගියේ තම කාර්යාලයට නොවේ.

ඔහු ආහාර ගබඩාවකට ගොස් බිත්තර දහයක්ද, බටර් රාත්තල් කාලක්ද පාන් ගෙඩියක්ද මිළදී ගත්තේය.

"දැන් ඉතින් ගෙදර යමු!" රෝව්යෝ තමාටම කියා ගනිමින් පා තැබීය. ඔහු ප්‍රධාන මාර්ග ඔස්සේ නොගොස් නොයෙක් අතුරු මාර්ග ඔස්සේ ගමන් කරමින් වට රවුමට ගියේය. කිසිවෙක් ඔහුගේ මේ හැසිරීම දකිත් නම් පුදුම වනු ඇත. එහෙත් නගරයේ පොලිස්පතියා ගැන ඔත්තු බලන්නේ කවරෙක්ද? නගරයේ හැම දෙයක්ම සුදුසු පරිදි තබා ගැනීම වස් අනිත් පුරවැසියන් ගැන ඔත්තු බැලීම ඔහුගේ කාර්යයයි.

"රහස් නියමයක්, ආ? මදැ කොළා!" භාග්නෙස්ක් චතුරශ්‍රයේ පිහිටි ගොඩනැගිල්ලක පස්වැනි මාලයට නගිමින් රෝව්යෝ අග්‍රාණ්ඩුකාරයාගේ කතාව මතක් කරන්නට විය. එහි ඔහුගේ නිවෙසය තනි කාමරයකින් හා කුස්සියකින් යුත් මෙහි ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් වාඩිවී සිටින බව අග්‍රාණ්ඩුකාරයා දනිත් නම්, මොනවා වේද! පොලිස්පති රෝව්යෝගේ ගෙදර වාඩිවී සිටින ලෙනින් "රජය හා විප්ලවය" නැමැති පොත ලියයි. සූරික්හි පුස්තකාලයේ ලියාගත් නිල් පැහැති සටහන් පොත රස්ලිව් වැවේ පැල්පතේ සිට මෙතැනටද පැමිණ ඇත.

රෝව්යෝ සෙමින් කැස්සේය. ලෙනින් නැගිට සිටියේය.

"තැපැල් ගෙනාවාද?"

"තැපැල් ගෙනාවා. ලෙනින් සහෝදරය අපි ඉස්සෙල්ලා මොනවාහරි කමු" රෝව්යෝ යෝජනා කළේය.

"ඉස්සෙල්ලා බලමු අපේ තැපැල. දෙන්න, දෙන්නැ"යි ලෙනින් රෝව්යෝගෙන් ඉල්ලා සිටියේය.

රෝව්යෝ සාක්කුවෙන් පැකැට්ටුව එළියට ගන්නා තුරු නොඉවසිලිමත්වූ ලෙනින් දෑත් පිරිමදින්නට විය.

"ඔහෙ බාරදුන්න පැකැට්ටුවට හරියන්න මෙන්න මේක බාර ගන්නැ" යි කී රෝව්යෝ තමාට දුම්රිය පොළේදී තැපැල්කරුගෙන් ලැබුණු පැකැට්ටුව ලෙනින් අත තැබීය

එහි ලියුම් කීපයකි. ලෙනින් එක් ලියුමක් ගෙන ඉක්මනින් කියැවීය.

අනික රහස් ලියුමකි. එය කියැවීම පිණිස පහනකින් එය රත්කළ යුතුය. එවිට කොළයේ ලියා ඇති අකුරු දිස්වේ. ලෙනින් රහස් ලියුම පහනට අල්ලා කියවන්නට විය:

"ඔව්. ඔව්. බොහොම වැදගත් ආරංචි."

පෙත්රොග්‍රාඩ් හා මොස්කව් නගරවල බොල්ෂෙවිකයින් සෝවියට් සභාවලට වැඩි වැඩියෙන් තෝරා පත්වී ඇති බවත්, ඒවා සම්පූර්ණයෙන්ම බොල්ෂෙවික් පක්ෂයට පක්ෂපාත වී ඇති බවත් එම ලිපියෙන් කියැවිණි. මහජනතාව ධනපති ආණ්ඩුව කෙරෙහි විශ්වාසය නොතබන අතර වැඩි වැඩියෙන් බොල්ෂෙවික් පක්ෂය කෙරෙහි විශ්වාසය තබන බව පෙත්රොග්‍රාඩ් ලිපියෙහි සටහන් වේ.

පොලිස්පති රෝවියෝ අග්‍රාණ්ඩුකාරයා හමුවීමට යන විට ඇඳි කබාය ගළවා දමා, කමිස අත් ඉහළට නවා කුස්සියට ගොස් ආහාර පිසීමට සූදනම් විය.

පොලිස්පතියා අග්‍රාණ්ඩුකාරයා සමග මිත්‍රවනවා වෙනුවට ලෙනින් සමග මිත්‍රවීම පුදුමයක් නොවේද?

දැන් පොලිස්පති ධූරය දරන තරුණ රෝවියෝ පරම්පරාගත නිර්ධනයෙකි. අවුරුදු දහඅටේ සිට උදුන් කම්කරුවෙකු ලෙස වැඩකළ ඔහු විප්ලවවාදී ව්‍යාපාරයේ ක්‍රියාශීලි විය. සාර් රජු පන්නා දැමීමෙන් පසු නගරයේ කම්කරුවෝ රෝවියෝ පොලිස්පති ධූරයට පත්කර ගත්හ.

දැන් ඔහු ඇත්ත වශයෙන්ම මහජන මිලීෂියා හමුදාවේ ප්‍රධානියා වූවද, පරණ පුරුද්ද අනුව අග්‍රාණ්ඩුකාරයා සහ තවත් බොහෝ දෙනකු විසින් ඔහු පොලිස්පති ලෙස හඳුන්වනු ලැබීය.

බිත්තර බැද ආහාර පිස රෝවියෝ ලෙනින්ට දහවල් ආහාරය සඳහා ආරාධනා කළේය.

තමාට ලැබුණු ලියුම් නිසා ලෙනින් ප්‍රීතියෙනි. ඉක්මනින්ම නැවත රුසියාවට යාමට ඉඩ ලැබෙනු ඇත . බොල්ෂෙවික් පක්ෂය රුසියානු කම්කරු පංතිය සටනට කැඳවා, තාවකාලික ධනපති ආණ්ඩුව පරාජය කොට, කම්කරු සමාජවාදී ආණ්ඩුවක් පිහිටුවනු ඇත. ලෙනින් මේ ගැන ලියා රහසින් ඒවා පෙත්රොග්‍රාඩයට යැවීය. ඔහු තම පොත ලියුවේය.

රෝවියෝ ආහාර ගනිමින් අග්‍රාණ්ඩුකාරයා කී කතාව ලෙනින්ට දැන්වීය. දෑස් හකුළුවාගෙන ප්‍රීතියෙන් කතාව අසාගෙන සිටි ලෙනින් මෙසේ පැවසීය:

"ජීවිතයේ ඔහොම දේ සිදුවෙනවා. ඔබ යනවා අග්‍රාණ්ඩුකාරයා ළඟට වාර්තා කරන්න. ඒ වුණාට ගෙදරදී එයා කාවද පිළිගන්නේ?"

"කාවද? ගරු කටයුතු පින්ලන්ත පූජකයෙකුව" පොලිස්පති පිළිතුරු දුන්නේ සන්සුන් ලෙසිනි.

ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් කොක් හඬ ලමින් සිනාසුණේය. රෝවියෝ කීවේ සැබෑවකි. ලෙනින් හෙල්සින්ග්පෝර්ස් නගරයට පැමිණියේ පාදිළි කෙනෙකු මෙන් වෙස් වෙලාගෙනය. රස්ලිව් වැව අයිනේ සැඟවී සිටි පසු ලෙනින් පැමිණි ගමට, පින්ලන්ත සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීහු ආධුනික නළුවන් කීප දෙනෙකු එවූහ. කම්කරුවන්වූ මොවුන් ලෙනින්ව පාදිළි කෙනෙකු ලෙස ඇන්ද වීය. පාදිළි තැනට වුවමනා ලෝගු, තොප්පි ආදී හැම දෙයක්ම ඔවුහු නගරයෙන් ගෙන ආහ. බොරු ඇස් බැම් අලවා, බොරු කොණ්ඩයක් පළඳවා ලෙනින් නියම පාදිළි කෙනෙකු කළහ. දේවමෙහෙය සඳහා ඔහු ඕනෑම දේවස්ථානයකට වුවද යැවිය හැක! දැන් ලෙනින්ට තවත් බොරු කොණ්ඩයක් ඇන්දවීමට සිදුවී ඇත.

නොබෝ දිනකින් පොලිස්පති ගුස්ටාව් රෝවියෝ ලෙනින් කැටුව කරනැවැමියකු වෙත ගියේය. ඔහු පිටර්බුර්ගයේ උපන්නෙකි. ඔහු රඟ හලක සේවය කළ අතර අගනුවර රදළ සිටුවරුන් හා කුමාරයන් තිරිහන් කරමින් ඔවුන්ගේ පැසුණු හිස කේ කළු කළේය. රැවුළු පාට කළේය. බොරු කොණ්ඩ සාද දුන්නේය.

"ඔහෙට බොරු කොණ්ඩ මොකටද, ඔහෙ තවම තරුණයි නෙව" කරනැවැමියා ලෙනින්ට කීය.

"මට ඕන තරමක් නාකි වෙන්න" ලෙනින් තම අදහස කියා සිටියේය.

"මොකටද? මොන හේතුවක් නිසාද?" විස්මයට පත් කරනැවැමියා ඇසීය.

"තලත්තැනියෙක් වගෙ පෙනී හිටින්ට මම ආසයි. අවුරුදු හැටක් විතර වයසැති මිනිහෙකුට සමාන පෙණුමක් මට ඕන." ලෙනින් කීය.

"අවුරුදු හැටක්? නාකියෙක්? ඒ වගෙ දෙයක් මම කරන්නෙ නැහැ! තරුණ උදවිය නාකි කරන්ට මට බැහැ. මගේ රස්සාව නාකි උදවියට තරුණ පෙනුම ලබාදීමයි." කරනැවැමියා ලෙනින්ගේ ඉල්ලීමට විරුඬවිය.

"ඔහෙගෙ රස්සාව බොහොම උසස්. දැන් මගේ ඉල්ලීම කරුණාකරල ඉටු කරන්න!"

කරනැවැමියා තම විස්මය පළ කරමින් "ඕහ්!" "ආහ්!" කියමින් විරුඬ වුවද, පසුව සිනහවෙමින් ලෙනින්ගේ ඉල්ලීම ඉටු කිරීමට කැමතිවිය. පොලිස්පති රෝවියෝ ලෙනින් ගැන කල්පනා කළේය:

"තව බොහෝ කාලයක් බොරු කොණ්ඩ ඇඳීමට හා වෙස් වෙලාගැනීමට ඔහුට සිදුවේද? තැනින් තැන යාමට සිදුවේද?"

## නැවත සැඟවී වැඩකිරීම

වීබොර්ගයේ පැරණි මාවත් ඔස්සේ දැඩි ශීත සුළං හමයි.

මෙවැනි දැඩි ශීත කාල ගුණයක් පැවැති දවසක උසැති, ප්‍රීතිමත්, හුරුබුහුටි, දක්ෂ එයිනො රහියා පිටර්බුර්ගයේ සිට වීබොර්ගයට පැමිණියේය.

ගිම්හානයේ අවසානයේදී එමිල්යානොව් සහ තවත් පින්ලන්ත සහෝදරවරු දෙදෙනෙක් ලෙනින් කැටුව රස්ලිව් වැවේ සිට වනය හරහා ගමන් කළහ. මේ දෙදෙනාගෙන් කෙනෙකි එයිනො රහියා. ඔහු පිටර්බුර්ගයේ කම්හලෙක වැඩ කරන්නෙකි, බොල්ෂෙවික්වාදියෙකි. පක්ෂයේ මධ්‍යම කාරක සභාව ලෙනින්ගේ පණිවුඩකරු හැටියට රහියා පත් කළේය.

දැන් පෙත්රොග්‍රාඩ් සිට වීබොර්ගයට රහියා පැමිණ සිටින්නේ ලෙනින් කැටුව යාමටය. ලෙනින් පින්ලන්තයේ හෙල්සින්ග්පෝර්ස් සිට වීබොර්ග් නගරයට ආවේ රුසියාවට වඩාත් ළංවී වැඩකිරීමටය. ඔහු රුසියාවට යාමට මහත් වුවමනාවක් දක්වූ අතර එම දිනය ආසන්න විය.

ලෙනින් මහත් සේ කැළඹී සිටියද, රහියා පර්වතයක් මෙන් නිසලව සිටියේය.

''දුම්රිය පොළ දිහාට යමුද?'' ඔහු ලෙනින්ගෙන් ඇසීය.

උස මිනිහෙකුවූ රහියා දුරින් දුර අඩි තබමින් ගමන් කළේය. ඔහු පිටතින් සන්සුන්ව සිටියද අභ්‍යන්තරයෙන් කැළඹී සිටියේය. ලෙනින්ද තම කැළඹීම සහ නොසන්සුන්තාවය නොපෙන්වමින් දුම්රිය පොළට ආවේය.

ඔවුහු නිහඬව පින්ලන්ත දුම්රිය පොළක් දක්වා පැමිණියහ. දුම්රිය මැදිරියේ වාඩිවී සිටියෝ පින්ලන්ත ජාතිකයෝය. ලෙනින් පින්ලන්ත බස නොදත් බැවින් නුවමනා අවධානයෙන් බේරීම් වස් නිහඬව සිටීම නුවණට හුරුවිය.

ඉඳහිට තම සාක්කුවට අත දමන ලෙනින් යතුර තිබේදැයි පිරික්සා බලයි. පෙත්රොග්‍රාඩ් නගරාසන්නයේ කම්කරුවෙකුගේ ගෙයක යතුරකි, ඒ.

දුම්රිය පොළට ළඟාවිය. රහියා නැගිට ඉක්මන් ගමනින් දුම්රිය මැදිරියේ දොර ළඟට ගිය අතර ලෙනින් ඔහු පිටුපසින් පා නැගීය. එම දුම්රියෙන් බැස්ස විගසම පෙත්රොග්‍රාඩයට යන අංක 293 දරණ දුම්රිය යන්ත්‍රය ලෙනින්ට පෙනිණි. ''ආයුබෝවන් පැරණි මිත්‍රය! තව වරක් මට උදව් වෙයන්!'' ඔහු සිතින් දුම්රියට කතාකළේ තම කිට්ටු මිතුරකුට කතා කරන්නාක් මෙනි.

දුම්රිය යන්ත්‍රයේ කවුළුවෙකින් හිස පිටතට දමා ගෙන ගුගෝ යාලවා වටපිට බැලීය. ඔහුගේ විලාසය බැරෑරුම් වුවද රහියා දුටු ඔහු තවත් විමැසිල්ලෙන් බලන්නේ තමාගේ පැරණි අත්උදවුකාරයාද දිටීය. ''ඔහෝ මගේ අත් උදවුකාරයා ඉක්මනටම නාකි වෙලා, කෙසුත් පැහිලා'' ගුගෝ කීවේ මඳ සිනා පාමිනි.

රුසියාවෙන් පිටවී යන විට ගිය දුම්රියෙන්ම, ලෙනින් නැවත රුසියාවට ආවේය. ඔහු පිටවී ගිය උදේල්නයා දුම්රිය පොළට නැවත පැමිණියේය.

උදේල්නයා දුම්රිය පොළේ සිට යා යුතු තැනට සැතැපුම් පහක් පමණ ගමන් කළ යුතුය. ඔක්තෝබරයේ කාලගුණය රළුය, සීතල දැඩිය. සුළං හැමීම චණ්ඩය. වීදි හා මාර්ග හිස්ය. හූ හඬ නගමින් කුණාටු හැමීය.

ලෙනින්ගේ බිරිඳ කෲප්ස්කයා කලින් නියම කරගත් තැනක ඔහු එනතුරු බලා සිටියාය. ඇ ශීත කාලයට ඔබින උඩු කබායක් හා වටකුරු තොප්පියක් ඇඳ සිටියාය. ඇ අත්වැසුම් ඇඳ නොසිටි නිසා ඇගේ අත් හිම කැටි මෙන් ශීතල වී තිබිණි. ලෙනින් ඇගේ අතක් ගෙන මහ මග දිගේ ඇවිද්දේය. දවස තිස්සේම විප්ලවවාදී කටයුතු වල යෙදී සිටින කෲප්ස්කයාට අන් දේ ගැන නිතර අමතක වෙයි. පක්ෂය නියම කරන තැනට ගොස් වැඩ කිරීමට ඇ නිතර සූදනමින් සිටියාය.

සෙර්දෙබොල්ස් වීදිය හා සම්ප්සොනොව්ස්ක් මහ මාවත අතර ඇති සන්ධියේ ගඩොලින් සාදන ලද විශාල ගෙය මූසල පෙනුමකින් යුක්තය. තට්ටු හතරකින් යුත් මේ ගෙය අවටැති කුඩා ලීගෙවල් සමග සසඳා බලන විට, යෝධයෙකි.

ලෙනින් තම බිරිඳ සමග එම ගෙදර දෙරටුව ළඟට ගියේ තම ජීවිතය මුලුල්ලේම එහි වාසය කළ කෙනෙකු මෙනි. තමාට භාරදුන් වැඩ කොටස සපුරා ලූ එහිනො රහියා සම්ප්සොනොව්ස්ක් මහා මාවතෙන් හැරී යන්නට ගියේය. ලෙනින් හා කෲප්ස්කයා පියගැට පෙළ ඔස්සේ හතරවැනි මාලයට නැග්ගාහ. කලින් තමාට ලැබුණු යතුරෙන් දෙර හැරිය ලෙනින් කොරිඩෝරය දිගේ ගමන් කළේ තමාට නියමකොට තිබුණු කාමරයට යාමටය. කොරිඩෝරය කෙළවරේ වම්පස පිහිටි හතරවැනි කාමරය දෙසට ඔවුහු ගියහ. ලෙනින්ගේ බිරිඳගේ මිතුරියක් වූ මර්ගරීතා පොපානවා හැර එම කාමරයේ අන් කිසිවෙක් නොමැති බව කෲප්ස්කයා ඔහුට කියා ඇත.

ලෙනින් දෙර ඇරිය විගසම එහි කීපදෙනෙකු මහ හඬ නගමින් සිනාසෙන හඬ ඇසිණි. හේතුව කුමක්ද? විවර වූ දෙර පලුවකින් කොරිඩෝරයට ආලෝකය වැටිණි. කෑම මේසය අසලවූ පහන දල්වා

තිබුණු අතර මේසය වටා ස්ත්‍රීහු කීපදෙනෙක් වාඩි වී සිටියහ. කතා බහ අනුව ඔවුහු ගුරුවරියෝ විය යුත්තාහ.

''අපේ වෘත්තියේ පරමාර්ථය, ආදරණීය මිත්‍රවරුනි...'' ලෙනින්ට ඇසිණි.

ලෙනින් සැබවිය යුතු ගෙදර රැස්වීමකි! ඔහු එන දවසේදීම රැස්වීම පැවැත්වීම පුදුම දෙයකි! ලෙනින් කොරිඩෝරය දිගේ ගමන් කොට මහල්ලෙකු මෙන් තරමක් කුදු විය. පැසුණු හිසකේ සහිත බොරු කොණ්ඩයක් පැළඳ සිටි ලෙනින් දුන් ඉක්මන් ගමනින් යන මහල්ලෙකි.

ලෙනින් තමාට නියම කොට තිබුණු කාමරයට ඇතුළු වූ සැටියේම ක්‍ෂෂෙස්කයා තම විස්මය පළ කළාය: ''අනේ දෙවියනේ මර්ගරිතා මාව රවටපු හැටි!''

''ඔව්.'' ලෙනින් පැවසීය.

ඔහු තම බිරිඳ සැනසීමට ඉදිරිපත් නොවූයේ, අවදානමක් නොතිබුණද, මෙවැනි අවදානම් සහිත කාලයකදී ඉන් අන්තරායක් විය හැකි බැවිනි.

''මෙය මගේ අවසාන සැඟවුම් ස්ථානය කියා මා හිතනවා'' යැයි ලෙනින් පැවසීය.

කවුළුව හැරියේය. සුළං පහරට කොළ සැළේ.

''මෙය මගේ අවසාන සැඟවුම් ස්ථානය විය යුතුය.'' ඔහු නැවත කීය.

''හොඳටම භයානකයි. හොඳටම!'' ක්‍ෂෂෙස්කයාට ඉබේටම කියැවිණි.

ඇගේ දෙනෙත්වල බිය ලෙනින් දුටුවේය. ඈ කීවේ ඇත්තය. සෙර්දෙබෝල්ස්කි වීදියේ පිහිටි මේ ගෙදර නැවතී සිටීම රස්ලිව් වැව අසල හෝ හෙල්සින්ග්ෆෝර්ස්හි හෝ නැවතී සිටීමට වඩා භයානක බව සත්‍යයකි. තාවකාලික ආණ්ඩුවේ පොලිස් ඔත්තුකරුවෝ හැම තැනම ලෙනින් සොයමින් ඇවිදිති.

මෙතැන කොතරම් අවදානම් සහිතදයත්, පින්ලන්තයේ සිට නැවත රුසියාවට පැමිණි ලෙනින් කොහි සිටිත්දැයි රුසියානු බොල්ෂෙවික් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෝ පවා නොදත්හ.

ලෙනින් සිටි තැන දැන සිටියේ ඔහුගේ බිරිඳ සහ පණිවුඩකරු එයිනො රහියාත් පමණකි.

## විප්ලවය ආසන්න වීම

දවස් කීපයකට පසු එයිනො රහියා ලෙනින් රහස් රැස්වීමකට කැඳවාගෙන යාම සඳහා පැමිණියේය. රෑ බෝවිය. කඩ සාප්පු වසා දමා තිබිණි. පාන් කඩයට යන මග සලකුණු කරන පෝලිමක් සහිත දුන්වීමක්

තැනෙක අලවා තිබිණි. දෙර අගුළු ලා ඇත. දෙරවල් වසා ඇතුළු පැත්තෙන් හරස් පොලු දමලාය. එහෙත් දිග පෝලිමක් — මෙහි වැඩිකොට ස්ත්‍රීන්ය — පාන් කඩයේ පිටුපස දෙර දක්වා සෑදී තිබුණේය. දැඩි ශීතලෙන් ආරක්ෂා වනු පිණිස ඔවුහු කබා ඇඳ සළු පොරවාගෙන සිටියහ. හැම පාන් කඩයක් සහ බේකරියක් ළඟම මෙවැනි පෝලිමක් බැගින් විය. පිටර්බුර්ගය පෝලිම වලින් පිරි නගරයක් බව එකවරම පෙනියයි. ගැහැණු, පිරිමි, මහල්ලෝ සහ බාලයෝද නිහඬව ඉවසිලිමත්ව පෝලිම්වලට වී වෙවුලමින් සිටියහ. පිටර්බුර්ගයේ පාන් පාලනය කිරීමට පටන් ගෙන දැන් බොහෝ කල්ය. මුලදී සලාක පොතකට පාන් රාත්තල් බාගය බැගින්ද පසුව රාත්තල් කාල බැගින්ද දෙන ලදී. පමාවුණොත් එයද නොලැබේ. ගැහැණුන් රැයින්ම පෝලිමේ සිටගන්නේ මේ නිසාය. ඔවුහු මහත් අමාරු තත්ත්වයකට වැටී සිටිති. පිරිමි යුධ පෙරමුණට ගොසිනි. සැමියන්, පුතුන්, පියවරුන් හැමදෙනෙකුම සාර්ගේ නියමය පිට යුද පෙරමුණට යවන ලදින් ඔවුන් ගැන තොරතුරක් පවා නැත. ජර්මනියට එදිරිව කරන යුධය සඳහා හැමදෙයක්ම යොදවා ඇත.

''රටතුළ තත්ත්වයද එතරම් හොඳ නැහැ. ධනපතියො කම්හල් වහන්ට පටන් අරගෙන. මිනිසුන්ට රක්ෂාවල් නැහැ.'' එයිනො රහියා ලෙනින්ට කීවේය.

රට තුළද ඇත්තේ දුක්ඛිත තත්ත්වයකි. මුලදී ඉඳහිට හෝ පමාවී හෝ දුම්රිය ධාවනය කළද, දැන් සම්පූර්ණයෙන්ම දුම්රිය ප්‍රවාහණය ඇනහිට තිබේ. කම්හල්වලට වුවමනා බිම් අඟුරු නොලැබිණි. ගම්වලින් තිරිඟු හා ධාන්‍ය නගර වලට නොගෙනෙන ලදී.

''තවත් මොකටද බලාගෙන ඉන්නෙ ?'' රහියා ඇසුවේය.

''බලාගෙන ඉඳල බැහැ! කම්කරුවන්ගේ විප්ලවයක් බොල්ෂෙවික් වරුන් වහාම පටන්ගත යුතුයැ''යි ලෙනින් පැවසීය.

පෙබ්‍රවාරි විප්ලවයේ සිටම සෝවියට් සභා වල වැඩි නියෝජිත බලය බොල්ෂෙවික් පක්ෂය ලබාගත යුතුයැයි ලෙනින් තරයේ කියා සිටියේය. එවිට කම්කරු පංතියට සාමකාමී ලෙස පාලන බලය ලබාගත හැකි බව ඔහු පෙන්වා දුන්නේය. එහෙත් එම මතයට විරුඬවූ මෙන්ෂෙවික් වරු ලෙනින්ගේ නායකත්වයට බාධා කළහ.

දැන් තත්ත්වය වෙනස්විය. අවිගත් නැගිටීමක් මගින් කම්කරු පංතිය බලය අල්ලා ගැනීමට සුදුසු තත්ත්වයක් පැන නැගී ඇත. පමාවීම අවදානමය!

ඒ ඔක්තෝබර් සන්ධ්‍යාවේ රහසේ පවත්වනලද මධ්‍යම කාරක සභා වේ රැස්වීමට එහි සාමාජිකයෝ පැමිණියහ. බොහෝ කලක් තිස්සේ

ලෙනින් නොදුටු ඔවුහු, ඔහු එනතුරු බලා සිටියහ. වෙස් වළාගෙන පැමිණි පුද්ගලයා ඔවුන්ට එකවරම හඳුණාගන්ට බැරිවුණද, ඔහුගේ කට හඬද, තර්ක සහ දෙශපාලන දුරදර්ශී භාවයද අනුව ලෙනින් බව සැක රහිතව ඔවුහු දැන ගත්හ.

වහාම අවිගත් නැගිටීමකට සූදනම් විය යුතුය! යුධ හමුද කම්කරුවන් පැත්තට දිනාගත යුතුය. වැදගත් ප්‍රදෙශවලට හා නගරවලට දක්ෂතම බොල්ෂෙවික් නායකයින් යැවිය යුතුය. කම්හල් හා පැක්ටරිවල සංවිධාන කොට ඇති රතු ආරක්ෂක භට සේනාවලට වඩාත් වැඩියෙන් අවි සැපයිය යුතුය. දක්ෂ, නිර්භය හා බුඩිමත් කම්කරුවන් මේ සේනාංකවල නිලධාරීන් වශයෙන් පත්කළ යුතුය.

විප්ලවය පටන්ගන්නා විට රතුභට සේනාංක අල්ලාගත යුතු ස්ථාන හා ළහාවිය යුතු තැන් ආදිය ගැන කල් ඇතිව ස්ථිර ලෙසම දැනුම් දිය යුතුය.

අවිගත් නැගිටීම මෙහෙයැවීම සඳහා යුධ විප්ලවවාදී කමිටුවක් පත් කළ යුතුය.

ලෙනින් ඉදිරිපත් කළ මේ සැළැස්ම මධ්‍යම කාරක සභාව සාකච්ඡාකොට අනුමත කළාය.

මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෝ දෙදෙනෙක් පමණක් එයට විරුඩවූහ. මොවුන් බොල්ෂෙවික්වාදීන් වශයෙන් පෙනී සිටීමද මායාවකි. නිර්ධන පංතියේ අවිගත් නැගිටීමට හා ලෙනින්ගේ සහ පක්ෂයේ අදහස්වලට විරුඩවූ මේ දෙදෙනා නම් සිනොවියෙව් සහ කාමිනෙව්ය.

මේ දෙදෙන තර්කයෙහි හා විවාදයේ සූරයෝ වූහ. දක්ෂතම කතිකයින්වූ මොවුහු අවිගත් නැගිටීමකට බියවූවෝ, නිවටයින් බවට පත්වූහ.

''කම්කරු පංතියට රජයක් අල්ලාගෙන එය ගෙන යා හැකිද?'' සිනොවියෙව් හා කාමිනෙව්ගේ තර්කය වූයේ එයය.

දැන් තීරණාත්මක මොහොත එළඹිණි. අවිගත් නැගිටීමට දැඩිලෙස විරුඩවූ මේ දෙදෙන, බොල්ෂෙවික් පක්ෂයේ අවිගත් නැගිටීම පිළිබඳ තීරණය හා සූදනම් මෙන්ෂෙවික්වාදී පුවත්පතක පළ කළහ. අවිගත් නැගිටීම පටන්ගන්නේ කවදද, කොතැනින්ද, කොහොමද යන හැම දෙයක්ම ගැනම ඔවුහු එම පුවත්පත මගින් දන්වා, තමන් එම ක්‍රියාවට විරුඩ බවද පවසමින් පක්ෂය පාවා දුන්හ. මේ නිසා තාවකාලික ධනපති ආණ්ඩුවට කලින්ම ඒ ගැන දැනගන්නට ලැබිණ.

''ඔවුන් අපව ධනපතීන්ට පාවා දුන්නා. ඔවුන් අපේ සහෝදරවරුන් නොවේ!''

''මම ඔවුන් තවදුරට සහෝදරයින් හැටියට පිළි නොගන්නා බව

තරයේම කියා සිටිමි. අසීරු කාලයකි... බරපතල කාර්යයකි... බරපතල ලෙස පාවාදීමකි...'' ලෙනින් ඔවුන් හෙළාදකිමින් පැවසීය.

ලෙනින් ස්ථිර ලෙස සිටියේය. අවිගත් නැගිටීම නියතවශයෙන්ම ඇතිවේ. මධ්‍යම කාරක සභාව අවිගත් නැගිටීම සංවිධානය කිරීම දිගටම කරගෙන ගියේය.

## ස්මෝල්නි ආයතනයට පැමිණීම

නෙවා නදියේ ජල ප්‍රවාහයක් ලදෙෂ්ස්ක් වැව දක්වා යයි. මේ ගං ඉවුරේ පෙර කලෙක දුම්මල ලාටු උණුකරන තැනෙක් විය.

පසුකලෙක මෙතැන තාපසාරාමයක් සාදන ලදී. මෑත භාගයේදී රදළයින්ගේ දූවරුන් සඳහා අධ්‍යාපන ආයතනයක් ගොඩ නැගූහ. ස්මෝල්නි හෙවත් දුම්මල ලාටු යන අර්ථය ගෙනදෙන රුසියන් වචනය අනුව මේ අධ්‍යාපන ආයතනයට ස්මෝල්නි යන නම තැබිණි.

1917 පෙබ්‍රවාරි මාසයේදී සාර් රජු බලයෙන් නෙරපා දමා විප්ලවයක් ඇතිවූ විට, ස්මෝල්නි ආයතනයේ ඉගෙනගනිමින් සිටි තරුණියෝ ගෙවල් බලා ගියහ. හිස්වූ ආයතන ගොඩනැගිල්ල කම්කරුවන්ගේ හා සෙබළුන්ගේ සෝවියට් සභාවේ පෙට්‍රොග්‍රාඩ් කාර්‍යාලය ලෙස පාවිච්චි කිරීමට පටන් ගන්නා ලදී. යුධ විප්ලවවාදී කමිටුවේ ප්‍රධාන කාර්‍යාලයද ස්මෝල්නිහි පිහිටුවා ගත්හ.

යුධ විප්ලවවාදී කමිටුව පෙට්‍රොග්‍රාඩයේ හැම කම්හලක් සමගම සබඳකම් ඇති කරගෙන ඒවා තුළ රතු ආරක්ෂක භට සේනාංක සංවිධාන කළේය. පෙට්‍රොග්‍රාඩ් නගරයේ විසි දහසක් කම්කරුවන්ට අවි සපයා අණ ලැබෙන ඕනෑම මොහොතක ඔවුන් සටනට යෙදවීමට කටයුතු යෙදවීය. බෝල්ටික් නාවුක හමුදාවේ භටයින් ධනපති ආණ්ඩුවට හා එයට පක්ෂපාත නිලධාරීන්ට විරුධව උසි ගැන්වීම සඳහා පක්ෂය බොල්ෂෙවික් කොමසාරිස් වරුන් උද්ඝෝෂකයින් ලෙස පිටත් කළාය. නාවිකයෝ කම්කරුවන්ට පක්ෂව සටන් මග තෝරාගත්හ. භට සේනාංක විශාල ගණනක් විප්ලවයට පක්ෂව යුධ විප්ලවවාදී කමිටුවේ අණ පිළිපැදීමට එකඟවූහ.

තාවකාලික ධනපති ආණ්ඩුවට කුමක් වීද? තාවකාලික ආණ්ඩුව බොල්ෂෙවික් පක්ෂයට හා කම්කරුවන්ට බියවිය.

''කම්කරුවන්ට අවි ගැනීම තහනම්! යුධ විප්ලවවාදී කමිටුවේ සාමාජිකයින් සිර භාරයට ගනු! ලෙනින් සොයා ඔහු දහගෙට දමනු!'' මේ

ආදී නියමයන් හා ආඥවන් නිකුත් කළේ තාවකාලික ධනපති ආණ්ඩුව විසිනි.

දැත් බැඳගෙන නිකම් බලා නොසිටි ආණ්ඩුව කම්කරුවන්ට හා පක්ෂයට විරුධව යෙදවිය හැකි හැම බලයක්ම යෙදවීය. ආණ්ඩුවට පක්ෂපාත සියලු යුද්ධ හමුද ගෙනැවිත් පෙට්‍රොග්‍රාඩ් නගරය වට කළේය.

ලෙනින් මධ්‍යම කාරක සභාවට ලිපියක් ලියමින් අවිගත් නැගිටීම පමා නොකොට වහාම ඇරඹිය යුතුබව දන්වීය.

ඔක්තෝබර් විසිහතර වැනිද ලෙනින් පොපානවා මැතිනිය අත මධ්‍යම කාරක සභාවට තවත් ලිපියක් යැවීය. ලෙනින් දකින ඕනෑම යුධ නිලධාරියෙක් ඔහුට වෙඩි තබතියි යන බිය නිසා, ලෙනින්ට සැඟවී සිටි තැනින් එළියට ඒමට මධ්‍යම කාරක සභාව අවසර නොදුන්නේය.

ලෙනින්ගේ මග පෙන්වීම යටතේ මධ්‍යම කාරක සභාව අවසාන තීරණාත්මක සටන මෙහෙයැවීමට අවශ්‍ය සියලු විධි විධාන යෙදවීය. එහෙත් අවිගත් නැගිටීම පිළිබඳ දිනය තවම තීරණය කර නොමැත.

1917 ඔක්තෝබර් 25 ද ස්මෝල්නිහිදී සෝවියට් සභාවල දෙවැනි සම්මේලනවාරය පටන් ගැනීමට නියමව ඇත. රුසියාවේ හැම නගරයකින්ම සම්මේලනයට නියෝජිතයින් පැමිණීමට පටන්ගෙන තිබේ.

''අවිගත් නැගිටීම සෝවියට් සභාවල සම්මේලනය ඇරඹීමට පෙර පටන්ගත යුතුය. තාවකාලික ධනපති ආණ්ඩුව පෙරළා දමා පාලන බලය සෝවියට් සභාවලට පැවරිය යුතුය.'' ලෙනින් මෙසේ සිතීය.

ලෙනින් මෙසේ සිතන අතර කාලය ගෙවී ගියේය. මධ්‍යම කාරක සභාවට ඔහු තවත් ලිපියක් යැවීය. ලෙනින් කැළඹුණේය. ඔහු සැඟවී සිටි කාමරයේ තවත් සිටීම ඔහුට නොහැකි විය. එහි සක්මන් කිරීම පවා කළ නොහැක. පොපානොවාලාගේ ගෙදර යම්කිසිවකු ඉන්නා බව අසල්වැසියෝ සැක කරති.

හවස පොපානොවා තම වැඩවලින් පසුව ගෙදර ආවිට තවත් ලියුමක් මධ්‍යම කාරක සභාවට ගෙනයන ලෙස ඇගෙන් ලෙනින් ඉල්ලා සිටියේය

ඔහු ඉක්මනින්ම තවත් ලියුමක් මධ්‍යම කාරක සභාව වෙත ලියුවේය.

''සහෝදරවරුනි!

මා මේ ලියුම ලියන්නේ ඔක්තෝබර් 24 ද හවසය. තත්ත්වය කොතරම් අවදානම්දයත්, මීට වඩා එයට තවත් අවදානම් විය නොහැක. මීටත් වඩා අවිගත් නැගිටීම පමා කළහොත් එය මරණයට සමාන වනු ඇත.''

අදම සටන් අරඹා තාවකාලික ධනපති ආණ්ඩුව පෙරළා දැමිය යුතු බවද, බලය අල්ලා ගත යුතු බවද කියා සිටි ලෙනින්, අද අපි තීරණයක් නොගත්තොමු නම්, ඉතිහාසය අපට කිසිදිනෙක සමාව නොදෙන බවද

දන්වා සිටියේය. හෙට වන විට පමාවනු ඇත. අද තමා අන්තිම, අවසාන දවස.

''ඉක්මනට මේ ලියුම ගෙනයන්නැ!''යි ලෙනින් පොපානොවාට කීවේය.

ලෙනින් නැවත තනිවූවද ඔහු කැළඹී සිටී. වාඩිවී කිසිවකට සවන් දෙමින්, කිසිවක් බලාපොරොත්තු වෙමින් ඔහු සිටියේය.

ලෙනින්ගේ පණිවුඩ කරු එයිනො රහියා පැමිණ සීනුව හඬවා ගෙට ඇතුළු විය.

''නගරෙ හොඳටම කැළඹිලා'' රහියා ලෙනින්ට දැන්විය.

නගරයේ දැඩි සුළං සහිත අහිතකර කාල ගුණයකි. නෙවා ගඟේ සිට ඉඳ හිට කුණාටු හමයි. තෙතැති හිම පියලි වැටී. නගර මාර්ග නොපෙණෙන තරම් දැඩි මීදුමකි. හිම වැස්ස වරක් හීන් පොද වැස්සක් බවටද නැවත හිම වැස්සක් බවටද වෙනස් වෙයි. මිනිස්සු කාණ්ඩ ගැසී තැන් තැන්වල රැස්ව සිටිති. අවිගත් කම්කරුවන් හෝ යුද භටයින් හෝ පුරවා ගත් ලොරියක් වේගයෙන් ධාවනය වෙයි. ඉඳ හිට වෙඩි හඬක් ඇසේ. තව වරෙක මැෂින් තුවක්කුවක් හඬ නගයි. නැවත හැම දෙයක්ම නිහඬ වුණද නොසන්සුන්තාවය අඩු වී නැත.

පෙට්‍රොග්‍රෑඩ් නගරයේ යාන්ත්‍රික පාලම් සියල්ල දෙබෑ කරන ලෙස තාවකාලික ආණ්ඩුව අණ කළේය. අශ්වාරෝහක යුන්කර්වරු මිනිසුන් පන්නා දමා පාලම් දෙබෑ කිරීමට සූදනම් වූ නමුදු ඔවුන්ට එය නොකළ හැකි විය. අවිගත් කම්කරු සේනාංක විත් යුන්කරයින් පන්නා දමා පාලම් ආරක්ෂා කළහ. කෙසේවුවද, නිකොලායෙව්ස්ක් පාලම ඔවුහු දෙබෑ කළහ.

යුන්කර්වරු නගරයේ සියලු යාන්ත්‍රික පාලම් දෙබෑ කළෝ නම්, නාගරික පෙදෙස් වෙන්වනු ඇත. එවිට යුන්කර් හමුදවන්ට එක් එක් කම්කරු සේනාංක තනි කොට පහරදීමට පුළුවන් වනු ඇත.

එයිනො රහියා නගරයේ කැළඹීම ගැන ලෙනින්ට කළ විස්තරය එසේ විය.

ලෙනින් රහියාගේ කතාවට නිහඬව සවන් දී සිට වහාම පුටුවෙන් නැගිට සිටියේය. ඔහු ලාච්චු මේසය වෙත ගොස් පරණ බොරු කොණ්ඩය අතට ගත්තේය. ''කුමක් වේද?'' යන හැඟීමෙන් රහියා බලා සිටියේය. ලෙනින් රැකබලා ගැනීමේ කාර්‍යය පක්ෂය පවරා ඇත්තේ රහියාටය.

''ලෙනින් සහෝදරය යන්නේ කොහිද?''

''වහාම ස්මෝල්නියට යන්න ඕනැ!'' ලෙනින් කීවේ දැඩි අධිෂ්ඨානයකිනි.

''සහෝදරයව මරල දාවි. අපි යුන්කර් වරුන්ට මැදි වෙන්ට පුළුවනි!''

ලෙනින් රහියා සමග වාද නොකොට, කණ්ණාඩිය ඉදිරිපිටට ගොස් බොරු කොණ්ඩය පැළඳ ගත්තේය. පරණ කබායක් ඇඟ ලා ගෙන, ඊට උඩින් කබායක් ඇඳ ගත්තේය. ලෙනින් තවත් දුර රඳවා ගත නොහැකි බැව් රහියාට අවබෝධ වූයෙන් ඔහුද ගමනට සැරසුණේය.

ලෙනින් දත් කැක්කුමෙන් පෙළෙන සැටියක් ඇඟවීමට රහියා, ඔහුගේ එක කම්මුලක් වැසෙන සේ ලේන්සුවකින් බැන්දේය. දැන් ලෙනින් හඳුනාගැනීම වඩාත් අපහසුය.

දෙදෙනා ගෙදරින් පිටවූහ. ලෙනින් ස්මෝල්නි ආයතනය බලා ගියේය.

## පටන් ගැනීම

සෙර්දෙබෝල්ස්කි වීදියේ සිට ස්මෝල්නිය දක්වා යා යුතු දුර ප්‍රමාණය හැතැප්ම කීපයකි. ට්‍රැම්රථ දුවන බවක් නොපෙනේ. මිනිස්සු සැඟවුණහ. ඇහැට ඇන්නත් නොපෙනෙන තරම් දැඩි අඳුරකි. මාර්ග පුරා මඩය. ශීත සුළං මුහුණට වැදෙයි.

සුළං පහරට පපුව දෙමින් ලෙනින් හිස නමා ගෙන ඉදිරියට ගමන් කළේය.

"නවත්වාපන්! නවත්වාපන්!" යැයි ට්‍රැම් රථයක් දුටු රහියා කෑගැසීය.

ට්‍රැම් රථය නවත්වන ලදී. දෙදෙනම එයට නැගගත්හ. මගීන් නොසිටිය එම රථය ඩිපෝව බලා යමින් සිටියේය. යායුතු මගින් අඩදුරක් හෝ මෙසේ යාමට හැකිවීම සතුටකි.

ලෙනින් ශරත් සමයේ ඇඳිරි රාත්‍රිය දෙස මහත් ඕනෑකමින් බැලීය. සෙබළුන් පුරවාගත් ලොරියක් ට්‍රැම් රථය පසුකොට වේගයෙන් දිව ගියේය. තවත් ලොරියක් ට්‍රැම් රථය පසු කළේය.

"ධනපතීන් බොහොම අමාරු තත්ත්වයකට වැටිල!" කිසිවෙක් කීහ.

"අපි ඩිපෝවට යනව. තමුසෙල ට්‍රැම් රථයෙන් බහිනවා!" යැයි කොන්දොස්තර කාන්තාව කීවාය.

නැවත ලෙනින් හා රහියා පාළු වීදියක් ඔස්සේ ගමන් කළහ. යුන්කර් භටයින් හමු නූනොත් ඒ ඇති!

එවිටම වාගේ අසරුවන් දෙදෙනෙකු අසුන් පිට නැගී එන හඬ ඇසිණි.

එක් අසරුවෙක් තම අසුගේ පටිය තදින් අදිත්ම, ග්‍රීවය නවා උඟ නැවතුණේය.

"බලපත්‍රය පෙන්වාපන්!" මෙසේ යුන්කර් අසරුවා රහියා යන මග හරස් කරමින් අසු නැවැත්වීය.

රහියා ළඟින් ගමන් කළ මහල්ලා ගැන යුන්කර් අසරුවා ගණන්

නොගත්තේය. මහල්ලෙකුගෙන් මොන බලපත්‍ර ඉල්ලන්ටද? මහල්ලා මෙන් සැරයි සිටි ලෙනින් ලේන්සුවෙන් වෙළනලද කම්මුල අතගාමින් අසරු භටයින් ළඟින් ගියේය.

ලෙනින්ට ඇත යාමට ඉඩ දෙමින් රහියා අසරුවන් සමග වාද කරන්නට විය. ''මොන බලපත්‍රයක්ද?'' ඔහු ඇසීය. ''මම දන්නේ නැහැ, කොයින්ද ඔය බලපත්‍ර ලබාගන්ට ඕන කියල. බලපත්‍ර මොකටද? කම්කරුවන් බලපත්‍ර නැතුවට හඳුණාගන්ට බැරිද?''

අසරු යුන්කරයෙක් රහියාට බැණ වදිමින් ඔහුට පහරදීමට පිස්තෝලය අතට ගත්තේය.

''ඔන්න ඔය මිනිහව යන්ට අරිනව'' අනිකා තම සගයාට කීවේය.

අසරු යුන්කරයෝ පිටව ගියහ. රහියා වහා දුවගොස් ලෙනින්ට ළං විය.

''සහෝදරයට ස්තුතියි'' ලෙනින් රහියාට තම කෘතඥතාවය පළ කළේය.

ස්මෝල්නි ආයතනය ඉදිරියේ විශාල පිට්ටනියකි. මෙහි වූ කුඩා ගස් හා පඳුරු වටා විශාල ජනකායක් රැස්ව සිටියහ. ගිනි මැල ගසාගෙන සමහරු ගිනි තැපූහ. ගිනිපුපුරු අහස දෙසට විසිවිණි. වැල නොකැඩී ලොරි හා රථ එන්නට විය. ආයුධ ගත් නැවියෝ, යුද භටයෝ සහ කම්කරුවෝ ස්මෝල්නියට මේ රථ වලින් ආහ. ස්මෝල්නිය අවිගත්තවුන්ගෙන් පිරී ගියේය.

තිලධාරිහු අණ දුන්හ:

''සේනාංකය පෙළගැසෙනු!''

සෙනඟ හඬ නැගූහ. රැස්ව සිටි ජනකාය ජංගම ශීලි වූහ. ස්මෝල්නි ආයතනය අසල කාල තුවක්කු ද තිබිණි. දෙරටුසියල්ලම මුරකරනු ලැබීය. තෙමහල් ගොඩ නැගිල්ලක්වූ ස්මෝල්නියේ හැම කවුළුවකින්ම ආලෝකය විහිදිණි. ස්මෝල්නියේ පහන් එළියද, රැස්වසිටියවුන්ගේ නෙත් වල ඇති කාන්තිමත් බවද එක්තරා තේජාන්විත චිත්‍රයක් මවා පෑවේය.

ලෙනින්ගේ හදවත වේගයෙන් ගැහෙන්නට වණ. ඔහු බලාපොරොත්තුවූ දවස පැමිණ ඇත.

දෙදෙනාම ස්මෝල්නිය ඇතුළට ගියහ. තම බොරු කොණ්ඩය ගැන අමතක කළ ලෙනින් උඩු කබායේ බොත්තම් ගළවා දැත් සාක්කුවල ඔබාගෙන සුපුරුදු වේගවත් ගමනින් කොරිඩෝරය දිගේ ගමන් කළේය. එහි හැම කොරිඩෝරයකම පතරොම් තුවක්කු ආදී අවි ගොඩ ගසා තිබිණි.

ජනයා ඒ මේ අත යමින් සිටියහ. ඔහු තෙවැනි මාලයේ පිහිටි යුධ විප්ලවවාදී කමිටුවේ කාර්‍යාලයට ගියේය.

කමිටුවේ සාමාජිකයෝ රැස්ව සිටියහ. පැය දෙළහක් තිස්සේ රැස්වීම පැවැත්වේ. ලේකම් තැන වාර්තාව ලියයි. ඔහු අවිගත් නැගිටීම පිළිබඳ සැළැස්ම සාකච්ඡා කරමින් සිටියේය.

රතු භට සේනාංකවල හා හමුදවල පණිවිඩ කරුවෝ නිතර දුවමින් සිටියහ.

ලෙනින් යුධ විප්ලවවාදී කමිටුවේ කාර්‍යාලයට ඇතුළුව කබාය, හිස්වැස්ම හා බොරු කොණ්ඩය ගළවා දමා වැඩවල යෙදෙන්නට විය.

යුධ විප්ලවවාදී කමිටුවේ සභාපතිවර නිකොලායි පොද්වොයිස්කි දින කීපයක් තිස්සේ නිදි වර්ජිතව සිටීම නිසා රතැස් වලින් යුක්ත විය. ඔහුගේ දෙනෙත් ඉදිමීලාය. ඔහු කෙට්ටුවෙලාය. පොද්වොයිස්කි ලෙනින් දැක ඉමහත් ප්‍රීතියෙන් කතා කළේය:

''ලෙනින් සහෝදරයා!''

ලෙනින්ගේ පැමිණීම නිසා ඔහු අතිශයින්ම සතුටු විය. ලෙනින් ඔහුට නව ශක්තියක් හා ධෛර්‍යයක් ලබා දුන්නාක් මෙනි. ඔහු ලෙනින්ගේ උපදෙස් සෙවීය.

''පමාකිරීම මරණයට සමානය. වහාම විදුලි පණිවුඩ කාර්‍යාලය, තැපැල් කාර්‍යාලය, දුම්රිය ස්ථාන හා පාලම් සියල්ල අල්ලා ගත යුතුය. එය දැන්ම, පසුද එළිය වැටීමට පෙර කළ යුතුය.''

යුධ විප්ලවවාදී කමිටුවේ කාර්‍යාලයට පැමිණි පණිවුඩ කරුවෝ ලෙනින් පැමිණ සිටින සැටි දුටුවෝය.

''ලෙනින් ඇවිත්! ලෙනින්!'' මේ පුවත කටින් කට පැතිර ගියේය.

විදුලි පණිවුඩ කාර්‍යාලය, තැපැල් කාර්‍යාලය, දුම්රිය ස්ථාන, පාලම් හා ආණ්ඩුවේ කාර්‍යාල සියල්ල අල්ලා ගත යුතුය යන අණ රතු භට සේනාංක වලට හා යුධ සේනාංක වලට ලැබිණි.

''රතු භට සේනාංක පෙළ ගැසෙනු!'' නිලධාරීහු අණ දුන්හ. ස්මෝල්නිය ඉදිරිපිට දහසක් සේනාංක පෙළ ගැසුණහ.

තැනින් තැන ගිනි මැළ ගසමින් සමහරු ගිනි තපිති. අවිගත් කම්කරු භට සේනා පුරවාගත් ලොරි ඔක්තෝබරයේ අඳුරු රැයට වැදෙයි.

ඔක්තෝබර් 24 ද රාත්‍රියේ සහ 25 ද එළිවෙන යාමයේ රුසියාවේ අගනුවරවූ පෙට්‍රොග්‍රාඩයේ පාලන බලය විප්ලවවාදී නිර්ධන පංතියට හා විප්ලවවාදී යුද හමුද අතට පත්විය.

ශ්‍රේෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයගත්තේය.

## හිම මාලිගය අල්ලා ගැනීම

තාවකාලික ආණ්ඩුව තම ආරක්ෂක භට සේනා සමග හිම මාලිගයට රිංගා ගති. හිම මාලිගයේ එක් දොරටුවක් නෙවා ගඟට මුහුණ ලා සිටි අතර අනික් දොරටුව විශාල මාලිගා චතුරශ්‍රයට මුහුණ ලා ඇත. මාලිගය අලංකාර කෙරෙනුයේ කිරි ගරුඬ කුළුණු හා රූපවලිනි. දොරටු අසල විශාල රූප හා මල් බඳුන්ය. මාලිගාවේ මුදුනෙහි පියාපත් විදහාගත් රන් පැහැති රාජාලියෙකි. ඉස්සර මේ මාලිගයේ වාසය කළේ සාර් රජ වරුන්ය.

ලෙනින් යුධ විප්ලවවාදී කමිටුවේ සභාපතිවර පොද්වොයිස්කිට මෙසේ පැවසීය:

''මුළු මහත් පෙට්‍රොග්‍රාඩ් නගරයම අප අතේය. එහෙත් හිම මාලිගය අල්ලාගෙන නැත. වහාම හිම මාලිගය අල්ලාගෙන තාවකාලික ආණ්ඩුව සිරභාරයට ගත යුතුය.''

ඔක්තෝබර් 25 ද උදේ ඔක්තෝබර් විප්ලවයේ පළමුවන දවස උදෑසන ලෙනින් ''රුසියාවේ රට වැසියනට'' ප්‍රකාශනයක් නිකුත් කළේය.

'තාවකාලික ආණ්ඩුව බිඳ වැටී ඇත. රටේ පාලන බලය සෝවියට් සභා අතට පත්වී තිබේ. විප්ලවය ජයගත්තේය,' එහි සඳහන් විය.

ලෙනින්ගේ ප්‍රකාශනය සත්‍යයකි. තාවකාලික ආණ්ඩුවක් නොතිබිණි. එහෙත් එහි ඇමතිවරු හිම මාලිගයට රිංගාගෙන සිටියහ.

''දැන් මේ තත්ත්වය හින්ද සිදුවන්නේ මොනවාද?'' ඔහු පොද්වොයිස්කිගෙන් ඇසීය.

''අදම හිම මාලිගය අල්ලා ගන්නෙමු''යි යුධ විප්ලවවාදී කමිටුවේ සභාපති තැන පිළිතුරු දුන්නේය.

හිම මාලිගය වට කරන ලෙස රතු හමුදා භට කණ්ඩායම් වලට සහ හමුදා වලට අණ දෙන ලදී.

කම්කරු සේනාංක හා හමුදා හිම මාලිගය අවට සියලු පෙදෙස් හා මාවත් අල්ලා ගත්තෝ, හිම මාලිගය වටා කවාකාරව සිටගත්හ. කාල තුවක්කු ගෙනැවිත් හිම මාලිගයට එල්ල කොට තබන ලදී. නෙවා ගඟ දිගේ කුඩා නැව් සහ ලොකු නැව් පැමිණ හිම මාලිගයට ළංවී නැංගුරම් දමා ගත්හ.

දුම්බට තුනක් සහිත සුදු පැහැති ''අව්රෝරා'' යුධ නැව හිම මාලිගය ළඟට විත් තම කාලතුවක්කු එල්ල කළේය. හිම මාලිගය හැම අතින්ම වට වී ඇත. 1917 ඔක්තෝබර් 26 ද රෑ විය.

1905 මිනීමරු ඉරිද කම්කරුවන්ට හා ජනතාවට අමතකවී නැත. මේ හිම මාලිගයේ චතුරශ්‍රය ඉදිරිපිට සාර්ගේ අණපිට ඔහුගේ මාර සේනාව

අවි රහිතව පැමිණි සාමකාමී කම්කරු පෙළපාලියට වෙඩි තැබීය. පිටර්බුර්ග් නගරයේ කම්කරුවන් සාර්ට තම දුක කීමට පැමිණියේ කුරුස කොඩි, දේව රූප රැගෙනය. ''ජනතාවගේ පියාණන්වූ සාර් රජ තුමාණෙනි! අපගේ කුස ගින්න ඉවසා සිටීමට බැරිය. අපට උදව් කරන සේක්වා!''

1905 ජනවාරි 9 ඉරිද සාර් රජු කම්කරුවන් සිය ගණනක් මරා දමා දහස් ගණනක් තුවාල කළේ මේ චතුරශ්‍රයේදීය.

1917 ඔක්තෝබර් මාසය පැමිණියේය. දැන් මෙහි කම්කරුවන් පැමිණ සිටින්නේ කුරුස කොඩි රැගෙන නොවේ.

හිම මාලිගය බියවචි!

යුධ විප්ලවවාදී කමිටුවේ කොමසාරිස්වරු හා සාමාජිකයෝ රථවලට හා වේගයෙන් දුවන අසුන් පිට නැගී හිම මාලිගය වටකර ගෙන සිටින සේනාංක හා බළ මුළු පිරික්සා බැලූහ.

''සහෝදරවරුනි, තව පොඩ්ඩක් ඉවසන්න. ලෙනින් සහෝදරයා සේනා මෙහෙයැවීම භාර අරගෙන තියෙනවා.''

''ලෙනින්!'' කම්කරුවන් හා සෙබළුන් අතර විදුලිය වේගයක් මෙන් පැතිරිණි.

හිම මාලිගය වට කිරීම පිළිබඳ වාර්තා නිතර නිතර ස්මෝල්නි ආයතනයේ සිටි ලෙනින්ට යවන ලදී. හිම මාලිගය අවට පෙදෙසේ සිතියමක් පිරික්සා බලමින් රතු සේනාංක යැවිය යුතු ස්ථාන සළකුණු කරමින්, අමතර සේනා යැවිය යුතු තැන් පෙන්වා දෙමින් ලෙනින් සටන් මෙහෙයවන්නට විය. ක්‍රොන්ෂ්තාඩ්ට් සිට නාවික භටයෝ පැමිණියහ. ''අව්රෝරා'' යුධ නැව සටනට සූදනම්ය.

''සහෝදරවරුනි වෙලාව හරි, පටන් ගන්න!'' ලෙනින් අණ දුන්නේය.

නගරය හරහා දැඩි සීත සුළඟක් හැමීය. නගර වැසියෝ තම ගෙවල්වල දොරවල් වසා දැමූහ. කවුළු ඇදිරි ය. නගර මහා මාර්ගයේ තැන් තැන්වල ගිනි මැල ගසමින් භට හමුද ගිනි තැපූහ. දුම් මුසු වාතය පැතිරිණි.

විප්ලවීය භට කණ්ඩායම් කෙමෙන් හිම මාලිගයේ චතුරශ්‍රයට තව තවත් ළංවූහ.

හිම මාලිගය රකිමින් සිටි තාවකාලික ධනපති ආණ්ඩුවේ සේනාද රැකවල් තර කරමින් සටනට සූදනම් වූහ. යුන්කර්වරු සහ නිලධාරීහු දර සහ ලී කොට ගොඩගසා කපොලු සෑදූහ. මාලිගයේ හැම දොරටුවකම ආරක්ෂක කපොලු සාද ඒවා අතර මැෂින් තුවක්කු තැබූහ.

නපුරු නිහඬතාවයකි, හිම මාලිගය වටා පැතිර ගියේ.

ස්මෝල්නි ආයතනයේ සිට විශෙෂ පණිවුඩ කරුවෙක් පැමිණියේය. ඔහු ලෙනින් විසින් යුධ විප්ලවවාදී කමිටුවට එවන ලද පණිවුඩ කරුවෙකි.

''වහාම හිම මාලිගය අල්ලා ගෙන සටන ඉවරයක් කරන්න.''

රාත්‍රි අන්ධකාරය දසත පැතිරිණි. නේවා ගඟ මළ එකියක මෙන් නිහඬවූවාය. හිටි හැටියේම අන්ධකාරය හා නිහඬතාවය බිඳලමින් කාල තුවක්කු හඬ ඇසිණි.

''අව්රෝරා'' යුධ නෞකාව අන්තිම සටන ඇරඹීම පිණිස සංඥ වෙඩි තැබීය.

කුණාටුවකට අසුවුණු ජල ප්‍රවාහයක් නැඟී සිටින්නා සේ දහස් ගණනක් අවිගත් කම්කරු සේනාංක හා යුධ භටයෝ නැගී සිට හිම මාලිගය දෙසට දුව ගියහ. මාලිගය අසල කාල තුවක්කුද, මැෂින් තුවක්කුද ක්‍රියා කාරී විය. යුධ රථයක් හඬ නගමින් චතුරශ්‍රය හරහා දිවගොස් ලී ආරක්ෂ කපොලු හා කඩුලු වලට වෙඩි තබා විනාශ කරත්ම එහි සැඟවී සිටි යුන්කරයෝ තම අවිද පසෙක තබා මාලිගාව තුළට ගොස් සැඟවුණහ.

සතුරන් ලුහුබඳිමින් ඉදිරියට ගිය විප්ලවීය භට සේනා ජය හඬ නැගූහ:

''කම්කරු පංති විප්ලවයට ජයවේවා!''

අවි ගත් කම්කරු සේනාංක මාලිගය තුළට කඩා වැදුණහ. තමන් දුටු දේ නිසා ඔවුහු පුදුම වූහ...

හිම මාලිගයේ කාමර හා ශාලා සිය ගණනකි. බොහෝ වටිනා පළිඟු හා වීදුරුවලින් කරනලද පහන් හා විසිතුරු භාණ්ඩ බොහෝය. සේද හා වැල්වට් රෙදි, අගනා චිත්‍ර හා රූප, අනගිතම ලී වලින් කරන ලද කැටයම් සහිත ගෘහ භාණ්ඩ, කණ්ණාඩි ආදිය එහි විය.

රතු ආරක්ෂ භටයෙක් රන් පැහැති රාමුවක් සහිත කණ්ණාඩියකට බයිනෙත්තුවකින් ඇන්නේය. එය කැලි වලට බිඳී විසිරී ගියේය.

''නුඹට පිස්සුද? අද ඉඳල මේව සාර්ගෙ දේපොළ නොවේ. මහජනයගෙ පොදු වස්තුව'' ඔහු කළ ක්‍රියාව හෙළාදුටු තවත් භටයෙක් කීවේය.

''සහෝදරවරුනි! විප්ලවවාදී විනය ආරක්ෂා කරන්න.'' සේනාංකයේ නායකයා මේසයක් මත නැගී ආයාචනා කළේය.

විප්ලවීය භට සේනා කාමරයෙන් කාමරයටත්, ශාලාවෙන් ශාලාවටත් යමින් සටන් කළහ. යුධ විප්ලවවාදී කමිටුවේ නිර්භය නායකයෝ ඉදිරියෙන් යමින් සටන් මෙහෙයැවූහ: අන්තෝනොව්-ඔව්සේයෙන්කෝ, යෙර්මේයෙව්, පොද්වොයිස්කි... නිල්පාට කබා හැඳ සිටි මාලිගා සේවකයෝ බියෙන් වෙවුලමින් සැඟවුණහ. තාවකාලික ධනපති ආණ්ඩුවේ ඇමතිවරු එක් ශාලාවක් තුළට වී සිටියහ. ඔවුන්ගේ ආරක්ෂාවට යුන්කර් වරු සිටියහ.

''යුන්කර්වරුනි, නිලධාරියෙනි, අවි භාරදී යටත් වෙයව්. ඇමතිවරුනි නුඹලා සිරභාරයට ගෙන ඇත.''

මැදියම් රෑ පසුවුණද ස්මෝල්නියේ පහන් ආලෝකමත් ලෙස බැබලිණි. එහි තුළ වූ මිනිස්සු යුහුසුලු වූහ. හැම දෙනෙක්ම නොසන්සුන් තාවයකිනි. මාලිගා චතුරශ්‍රයේ තත්ත්වය කොහොමද? සටන් සිදුවන්නේ කෙසේද? ඔවුහු අලුත් ආරංචි බලාපොරොත්තුවෙමින් සිටියහ.

යුධ විප්ලවවාදී කමිටුවේ සභාපතිවර පොද්වොයිස්කි සපත්තු හඬ නංවමින් කාර්‍යාලයට ඇතුළු විය. ඔහුගේ මුහුණ ඔක්තෝබරයේ දැඩි සීත සුළං නිසා රත්පැහැගෙන තිබිණි.

''ලෙනින් සහෝදරය, හිම මාලිගය විප්ලවීය සේනා අල්ලාගත් බව වාර්තා කරමි'' පොද්වොයිස්කි පැවසීය.

ලෙනින් වහාම අඩියක් ඉදිරියට පැන පොද්වොයිස්කි බදාගෙන සිපගත්තේය.

## පළමුවැනි පණත

දෙවැනි දවසේදීත් යුධ විප්ලවවාදී කමිටුව නිදි වර්ජිතව, විවේක රහිතව වැඩකළේය. ස්වෙර්ඩ්ලොව්, ස්ටාලින්, ජෙර්සින්ස්කි, බුබ්නොව්, පොද්වොයිස්කි, අන්තෝනොව්-ඔව්සියෙන්කෝ සහ තව බොහෝ පක්ෂ නායකයෝ මෙහි සාමාජිකත්වය දැරූහ. ලෙනින් දෙවැනි රැයෙහිද ඇසි පිය නොහෙළා සියලු වැඩ මෙහෙයැවීමෙහි යෙදී සිටී. කෲප්ස්කයා ලෙනින් දෙස බැලුවාය. ඔහුගේ දෙනෙත් ප්‍රීතියෙනි. එහෙත් නිදි නැතිව එක හුස්මට වැඩ කිරීම නිසා ලෙනින් විඩාපත්ව සිටී.

''ලෙනින් සහෝදරයට විවේක ගන්න ඕන. අපට පදිංචියට ගෙයක් නැහැ. අපේ නෑයෝ ඉන්නෙ බොහොම දුර. එයාට විවේක ලබාදීමට කොහෙ ගෙනියන්නද කියල දන්නෙ නැහැ''යි බොන්ච්-බ්රුයේවිච්ට ඇය කීවේ සුසුම්ලමිනි.

ජිනීවාහි ලෙනින් නැවතී සිටි කාලයේ සිටම ඔහුගේ කිට්ටු සගයෙකි, බොන්ච්-බ්රුයේවිච්. ඔහු ලෙනින්ගේ ''ඉස්ක්‍රා'' පුවත්පතට ලිපි ලියුවේය. විප්ලවවාදී සාහිත්‍ය රුසියාවට ගෙනඒම සංවිධාන කළ ඔහු 1905 දී විප්ලවය සඳහා අවි ගෙනාවේය.

''මගේ ගෙදර විවේක ගන්න පුළුවනි''යි කී බොන්ච්-බ්රුයේවිච් ස්මෝල්නිය අසල නවතා තිබූ මොටෝ රියක ලෙනින් හා කෲප්ස්කයා නංවා ගෙන ගෙදර ගියේය.

පිටුපස ආසනයේ වාඩිවී සිටි ලෙනින්ට නින්ද ගියද, රිය නැවැත්වූ විගසම ඔහු නැවත අවදිවිය.

''දෙවියො එවා ඇති දේකින් රට මොනවා හරි කමු''යි බොන්ච්-බ්රුයේවිච් යෝජනා කළේය.

ගෙදර නිද සිටි අයට බාධා නොවනසේ කුස්සියට ගිය තිදෙනා පාන්, කේජු හා කිරි ආහාර වශයෙන් ගත්හ.

''බොහොම අගේ ඇති කෑම'' ලෙනින් පැවසීය.

ඔවුහු ආහාර ගනිමින් සිඟීන් ගැන කතා කරන්ට වූහ. කම්කරු සමාජවාදී විප්ලවය ජයගෙන ඇත. ශ්‍රෙෂ්ඨ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය නමින් මෙය ඉතිහාස ගත වනු ඇත.

අනාගත සමාජය ගැන කතා කරමින් ඔවුහු නැවතත් විවේක ගැනීම ගැන අමතක කළහ. බොන්ච්-බ්‍රුයේවිච් නැගිට සිටිමින් මෙසේ කීය:

''ලෙනින් සහෝදරය දැන් ඉතින් ටිකක් නිදගන්න. නැතිනම් ඔබෙට අසනීප වේවි.''

ඔහු ලෙනින් තම කාමරයට කැඳවාගෙන ගියේය. එහි නිදන ඇඳක්ද, ලියන මේසයක්ද තිබිණි. ලෙනින්ට නිතරම ලිවීමට අවශ්‍ය බැවින් ලියන මේසය හා ලිපි ද්‍රව්‍ය හා පෑනක් නැතිවම බැරිය. කෘෂ්ස්කයාට බොන්ච්-බ්‍රුයේවිච් මැතිනියගේ කාමරයේ නිදගැනීමට සලස්වන ලදී.

ලෙනින් විදුලිය පහන නිවා දමා නින්දට ගියද ඔහුට නිදගැනීමට බැරිවිය. හෙට සිට ලෝකයේ නව විධියක රජයක්, ලෝකයේ පළමුවැනි කම්කරු ගොවිකරු රජයක් ගොඩ නැගිය යුතුය යන අදහස සිතින් අමතක කිරීමට ලෙනින් අපොහොසත් විය.

ලෙනින් අවට නිහඬතාවයට කන් දුන්නේය. ගෙදර හැම කෙනෙක්ම නිදති. නිතර අවිවේකව සිටින බොන්ච්-බ්‍රුයේවිච් පවා විවේක සුවයෙන් නිදනවා විය යුතුය. ලෙනින් නැගිට ලියන මේසය අසල වාඩිවී පහන දල්වා, කවුළුවෙන් එපිට බැලීය. මැදියම් රැයද පසුවී ඇත. ලෙනින් හිස තරමක් පහත් කරගෙන කල්පනා කරන්නට විය. ඔහු තම හැඟීම්වලට සවන් දෙන්නාක් මෙනි. ඒ අන්ධකාර ගොළු රාත්‍රියේ ලෙනින් බරපතල ලෙස කල්පනා කරන්නට විය.

ඔහු පෑන අතට ගෙන ලියන්නට විය.

රදළයින්ට, පල්ලියට සහ පූජක තාපස සංවිධානවලට අයත් සියලු ඉඩම් නොමිලේ ඉඩම් නැති ගොවීන්ට ලබා දිය යුතුය. ඉඩම්වල ගොවිතැන් නොකරන්නන්ට ඉඩම් අයිති නැත. ඉඩම්වල ගොවිතැන් කරන අයට පමණක් ඉඩම් අයිතිය.

රුසියාවේ ගොවි ජනතාව සියවස් ගණනක් තිස්සේ සිහින දකිමින් සිටි දෙය ලෙනින් යථාර්ථයක් බවට පත් කළේය. සෝවියට් සමාජවාදී රජය පටන් ගන්නේ පසුකලෙක සත්‍යයක් වූ සිහිනයකිනි.

ලෙනින් ඉමහත් ප්‍රීතියෙන් ආශ්වාස ප්‍රශ්වාස කළේය. කැළඹීම්, සටන්, කාල තුවක්කු වෙඩි තැබීම් හා හිම මාලිගය අල්ලා ගැනීමෙන්

පසු පෙත්‍රොග්‍රාඩයේ ජනතාව නිදති. ඇඳිරි කවුළුවක් අසලට වී ඔහු වාඩිවී සිටී. ෂුෂෙන්ස්ක්කොයෙහිදිද එසේවිය. සයිබීරියාවේ ගම් නිදිගත්තා විට ලෙනින්ගේ කොළ පැහැති පහන පමණක් ආලෝක විය.

ලෙනින් තම අදහස් වචනයට නගා ලියා අවසාන වන විට එළිය වැටෙන්නට ළං විය.

පැයක්, දෙකක් නිදගන්ට පුළුවනියි සිතූ ලෙනින් ඇඳට වී කොට්ටයට හිස තැබුවා පමණකි. ඔහු සැපසේ නිදගත්තේය.

මේසය මත ලෙනින්ගේ අත් අකුරු සහිත ලිපිය ඇත.

කෙමෙන් එළිය වැටී අහස පැහැදිලි විය. ලෙනින් නිද සිටි කාමරය තුළට ඇඳිරි වළා බිඳගෙන හිරු රැස් වැටෙන්නට විය. ලෙනින්ගේ ලිපිය මතද හිරු රැස් වැටිණි. ඉඩම් නැති ගොවීන්ට ඉඩම් ලබා දෙන "ඉඩම් පිළිබඳ පණත" ළදරු සෝවියට් ජනරජයේ උදෑසන සූර්‍යාලෝකය මෙන් විය.

## කුළුණු සහිත ධවල මන්දිරය

පෙර මෙහි සිටුවරු හා ධනපතියෝ බාල් නැටුම් පැවැත්වූහ. සංගීතය වාදනය විය. බාල් නැටුම් සඳහා විශේෂ සපත්තු ඇඳි වැදගත් නෝනාවරු විශෙෂයෙන් ඔප දැමූ නැටුම් බිමේ නැටූහ.

දුප්පත් සෙබළාට හෝ ඔර්ලොව් කෝරළයේ සිට පැමිණි දුප්පත් සෙබළ ගැමියාට හෝ මෙවැනි ධවල මන්දිරයකට සිහිනෙන් පවා ඇතුළුවීමට බැරිවිය. ස්මෝල්නිය තුළට නොව ඒ අහලකටවත් ඔවුන්ට පැමිණීමට අවසර නොතිබිණි.

එහෙත් දැන්... සෝවියට් සභාවල දෙවැනි සම්මේලනවාරයට නියෝජිතයෙකු ලෙස සෙබළෙක් පැමිණ සිටී.

ස්මෝල්නිහි ධවල මන්දිරය නියෝජිතයින්ගෙන් පිරී ඇත. මෙතැනට රැස්වුණු ජනතාව අතර නියෝජිතයින් පමණක් නොවිය. පි-ජැකට් නැමති කබා සහ ඉරි සහිත මේස් බැනියම් ඇඳගත්, අත් බෝම්බ ඉණ පටිවල එල්ලා ගත් නැවියෝද, ඊයේ හිම මාලිගය අල්ලාගත්, තුවක්කු අතින් ගත් රතු භට කණ්ඩායමේ කම්කරු භටයෝද එහි වූහ. ඈත ගම්වල සෝවියට් සභාවලින් පැමිණි යටිරැවුළු සහිත ගොවියෝද, නගරයේ කම්හල් හා පැක්ටරි වලින් පැමිණි කම්කරුවෝද ධවල ධන්දිරයේ අසුන් ගත්හ.

ධවල මන්දිරයේ සියලු පුටු සහ බංකු මතද, ජනේල පඩි මතද, බිමද කම්කරුවෝ, යුද භටයෝ හා ගොවියෝ වාඩිවී සිටියහ. හැම එකෙකුගේම අතක රතු රෙදි පටියකි. දුම් බීම නිසා මන්දිරයේ හැම තැන දුම්කොළ සුවඳ වහනය වෙයි. සමහරු මහ හඬින් කතා කරති.

''අපේ අය බලය ඇල්ලුවා. ධනපති පංතිය හංගවේවා! පාලන බලය සෝවියට් සභාවලට පවරනු!''

ඔර්ලොව් කෝරළයේ සිට පැමිණි සෙබළා වට පිට බලමින් හැම දෙයක්ම මනැසෙහි ඇඳගනී. ධවල මන්දිරයේ සීලිම බොහෝ උසය. කුලුණු කිරි ගරුඬෙන් තනා ඇත. බිත්තියේ රනින් කළ රාමුවකි. එය මිනිසෙකුගේ උසට සමානය. එය තුළ තිබුණු සාර්ගේ ඡායාරූපය වීසි කර දමලාය.

මේ හැම දෙයක් ගැනම පුදුමව බලා සිටි සෙබළා ලෙනින් එන තුරු මහත් නොසන්සුන් තාවයකින් පසුවිය.

හිටි හැටියේම ජනතාව හඬ නැගූහ:

''ලෙනින්! ලෙනින්!''

බොහෝ දෙනෙක් නැගී සිටිමින් ලෙනින් දැක බලා ගැනීමට සැරසුණහ.

සභාපති මණ්ඩලයේ සාමාජිකයෝ ශාලාවට ඇතුළු වූහ. මේසය වටා වාඩිවූ අයගෙන් කෙනෙක් කළු පැහැති සම් කබායක් ඇඳ සීන් ලනුවකින් බඳින ලද උපැස් යුවළක් පැළඳ සිටිති. ඔහු යුද සෙනෙවියකු විය හැක, නැතිනම් නොවිය හැකිය.

ඒ ස්වෙර්ඩ්ලොව් බව ඔහුට කියා දෙන ලදී.

සිහින් උසැති සිරුරකින් හෙබි සටන්කාමී බොල්ෂෙවික් නායකයෙකුවූ පීලික්ස් ජේර්සින්ස්කි. යුධ විප්ලවවාදී කමිටුවේ සභාපතිවර නිකොලායි පොද්වොයිස්කි.

සභාපතිවරයා රැස්වීමේ වැඩ පටන්ගෙන ලෙනින්ට කතා කිරීමට අවසර දුන්නේය.

සෙබළා නැගිට සිට දෙපයේ ඇඟිලි තුඩුවලින් සිටගත්තේ ලෙනින් දැකගැනීමටය. ලෙනින් පළල් උර තළවලින් යුත් මිටි මිනිහෙකි. ඔහුගේ ඇස් බැමි ශංඛක දක්වා පැතිර ගොසිනි. ඔහුගේ දෙනෙත් කොතරම් තියුණුදයත්, කෙනෙකුගේ අභ්‍යන්තරය පවා බලන්නාක් මෙනි...

ලෙනින් කතා මණ්ඩපයට ඉක්මනින් නගිත්ම, රැස්වූවෝ නැගිට සිටියහ. නාවිකයින්ගේ හිස්වැසුම් උඩ වීසිවිය.

''ලෙනින්ට ජයවේවා!''

ලෙනින් කතා මණ්ඩපයේ සිට ශාලාව දෙස බැලීය. තමා ඉදිරියේ සිටින්නවුන්ගේ මුහුණු ප්‍රීතිමත්ය. සාමාන්‍ය, වාම් මිනිස්සු දුප්පත් ඇඳුමින් සැරසී සිටිති. ජෑක්කුවට හැඳ පැළඳ ධනපති රදළ හාම්පුත්තු හා නවීන පන්නයට ඇඳි ස්ත්‍රීහු මෙහි නොවූහ. කම්කරුවන්ගේත්, ගොවීන්ගේත්,

සෙබළුන්ගේත් නියෝජිතයෝ පමණක් මෙහි රැස්වූහ. වැඩකරන ජනතාවගේ සැපත සඳහා වැඩකිරීමේ වගකීම මේ නියෝජිත පිරිස ඉදිරියේදී ලෙනින්ට දැනිණි.

ඔහු අතක් ඔසවත්ම ශාලාව නිහඬවිය. එහෙත් මිනිස්සු සිටගෙන ලෙනින්ගේ කතාවට සවන් දුන්හ.

ලෙනින් සාමය ගැන කතා කළේය. කම්කරුවන්ට හා ගොවීන්ට යුධය අවශ්‍ය නැත. සෝවියට් ආණ්ඩුව යුධය ආශා නොකරයි. සාමාන්‍ය ජනයා යුධයක් නැතිව සාමයෙන් ජීවත්වීමට ආශා කරන බැවින් මේ යුධය නවත්වා දැමිය යුතුය. ලෙනින් "සාමය පිළිබඳ පණත" සභාවට කියැවීය. බොන්ච්-බ්රුයෙව්ච් නිවසේ සිට ස්මෝල්නියට පැමිණි පසු ඔහු එම පණත කෙටුම් පත් කළේය.

නියෝජිතයින් ලෙනින්ට සවන් දුන්නේ කොතරම් වුවමනාවකින්ද! පළමුවැනි ලෝක මහා යුධය — ජර්මනුන්ට විරුඬව කරන යුධය හතරවැනි වසරට පා තබා ඇත. මේ යුධය නිසා ජනතාව අපමණ දුක්පීඩාවලට භාජන වී සිටී.

"ඔන්න අපේ සෝවියට් ආණ්ඩුවේ හැටි. සාධාරණ, ජනතාවගේ උවමනා ගැන ක්‍රියා කරන ආණ්ඩුවක්!" ඔර්ලොව් කෝරළයේ සිට පැමිණි සෙබළා කල්පනා කළේය.

"ජයවේවා!" යන හඬින් ශාලාව දෙදරුම් කැවේය. කිරි ගරුඬ කුලුණු සහිත ධවල මන්දිරය එවැනි ජය ඝෝෂාවක් මින් පෙර කිසි දිනෙක අසා නැත! එවැනි බලගතු සහ බිහිසුණු ගීයක් අසා නැත.

පිබිදෙව් පෙළෙන්නො කුස ගින්නෙන්!
පිබිදෙව් ලොවේ වහල්ලු!

අනිත් අයද මහත් ආශාවකින් ගැයූහ.

රෝසේ හඬයි යුක්ති කෝ!
බිහිවෙයි ලොවක් අළුතෙන්!

පසුව ලෙනින් පෙර ද රැ ලියූ "ඉඩම් පිළිබඳ පණත" කියැවීය. විශේෂයෙන් ගොවීන් ප්‍රමුඛ නියෝජිතවරු ලෙනින්ගේ යෝජනාවට නැවත පක්ෂවූහ.

1917 ඔක්තෝබර් 25 ද සහ 26 ද ස්මෝල්නිහි ධවල මන්දිරයේ රැස්වූ සෝවියට් සභාවල සම්මේලනය ඉතිහාස ගත විය. මේ සම්මේලනයේදී රටේ පාලන බලය සෝවියට් සභා අතට] පත්වූ බැව් ලෙනින් දන්වා සිටියේය.

සාමය හා ඉඩම් පිළිබඳ පණත් ලෙනින් ඉදිරිපත් කළ අතර ඒවා සම්මේලනය ස්ථිර කළාය.

සම්මේලනය මහජන කොමසාරිස්වරුන්ගේ මණ්ඩලයක් පත් කළාය. මහජන කොමසාරිස් මණ්ඩලයේ සභාපති ධූරය හෙවත් ආණ්ඩුවේ අගමැති ධූරයට ව්ලදිමීර් ඉල්යීච් ලෙනින් තෝරා පත්කර ගන්නා ලදී.

පළමුවැනි සෝවියට් ආණ්ඩුව බිහිවූයේ මේ අයුරිනි.

මුළු රටේදී රාජ්‍ය පාලන ගැන සලකා බැලූ සම්මේලනය උදෑසන විසිර ගියාය.

"සහෝදරවරුනි, ඉක්මනින් තම තමන්ගේ නගර ගම් බලා යන්න. කම්කරු විප්ලවය ජයගත් බව හැම දෙනාටම දන්වන්න. දැන් අපරටේ පාලනය සෝවියට් සභා සතුවී ඇත. රුසියාව පුරාම සෝවියට් ආණ්ඩු බලය තහවුරු කරන්නැ"යි ලෙනින් නියෝජිතයින්ට කිය.

## ඔවුන් ජීවත්වූ හැටි

ස්මෝල්නි ගොඩනැගිල්ලේ පළල්, දිගැති කොරිඩෝරයක් දිගේ නදේෂ්ද කෘප්ස්කයා ගමන් කළාය. ගුරුවරයින් හා කම්කරුවන් සමග සාකච්ඡා පවත්වා ඇ ගෙදර එමින් සිටින්නීය. එදින ලෙහෙසි නොවීය. පාසල්, පුස්තකාල, ළමා මන්දිර හා කම්කරු සමාජ ශාලා සංවිධාන කළ යුතුය. වැඩකරන ජනතාවගේ වුවමනා අනුව අධ්‍යාපනය හැඩ ගැසිය යුතුය.

සවස් වී ඇ ගෙදර පැමිණියේ මහන්සියෙනි. එහෙත් ඇ සතුටිනි.

ලෙනින් හා කෘප්ස්කයා පදිංචි වී සිටියේ ස්මෝල්නිහි තනි කාමරයකින් යුත් ගෙයකය. උස සීලිමක් සහිත දිගැති එම කාමරයේ එක් කවුළුවක් ගෙවත්තට මුහුණ ලා ඇත. නිදන කොටස වෙන්කර තිබුණේ ඉස්කිරිමකිනි. දෙදෙනාට නිදගැනීම සඳහා යකඩ ඇඳන් දෙකකි. ඒවා මත සෙබළ ඇතිරිලි දෙකකි. නිදන තැන ගිනි තපින ලිපකි.

කෘප්ස්කයා කොරිඩෝරය දිගේ ඉක්මනින් ගමන් කළාය. ඇගේ කාමරයට ඇතුළු විය හැක්කේ මූණ සෝදන බේසම් සහිත වතුර පයිප්ප විස්සක් ඇති කාමරයක් තුළිනි. ඉස්සර ස්මෝල්නි ආයතනයේ උගත් කාන්තාවන් සඳහා වූවකි මේ කාමරය. "දැන් අපට මූණ සෝදන්ට වතුර පයිප්ප විස්සක්ම තියෙනවා" යැයි කෘප්ස්කයා විහිලු කළාය. "අපට ආණ්ඩුවෙන් ලැබුණු වතුර පයිප්ප විස්ස ඇරණු විට වෙන ධනයක් තිබුණෙ නැහැ. අපේ ගෙදර තිබුණෙ චාම් ගෘහ භාණ්ඩ. අල්මාරියක්. පිහන් බඩු සඳහා අල්මාරියක්. පුංචි ලියන මේසයක්."

කාමරයේ අනිත් මුල්ලක සැටියක් හා ඇඳි පුටු දෙකක්ද රවුම් මේසයක්ද විය. මේ මේසය වටේ වාඩිවී සමහර දවස්වලදී ලෙනින් සහ ක්‍රෑප්ස්කයා ආහාර ගත්හ. සමහර දවස්වලදී බරපතළ රාජ්‍ය ගැටළු පිළිබඳ සාකච්ඡා කළේත් මෙහිදීය.

නදේෂ්ද ක්‍රෑප්ස්කයා තම හිම කබාය ගළවා දමා ගිනි උදුනට ළංවූවා, ගිනි තපින්නට වූවාය. ලෙනින් තවම ගෙදර විත් නැත. බොහෝ වේලාවක් වැඩ කිරීමේ බලාපොරොත්තුවෙනි ඔහු ස්මොල්නිය තුළම කාමරයක් තම පදිංචියට තෝරාගත්තේ. සෝවියට් සමාජවාදී ආණ්ඩුවේ අගමැතිවරයාගේ කාමරය තුළ සමාජවාදය ගොඩනැගීම පිළිබඳ හැම ප්‍රශ්නයක්ම තීරණය විණි. රුසියාවේ මින් පසු වංශාධිපති සිටු තනතුරු, වෙළඳ කුවේර තනතුරු නැතිකර දමා තිබෙන බවත්, දුම්රිය මාර්ග, මුහුදු නැව් හා ගංගාවල තරණය කරන නැව්, බැංකු හැම දෙයක්ම රජය සතු බවත්, නිෂ්පාදනය පාලනය කිරීම කම්කරුවන් සතු බවත් දැන්වෙන පණත් සම්මත වූයේ ලෙනින්ගේ කාර්යාල කාමරයේදීය.

හැම දෙයක්ම අළුත්ය, අසමානය, ලෝකයේ පළමුවැනි වරට සෝවියට් රටේ අත්හද බලන දේය.

ලෙනින් හමුවීමට උදේ සිට කම්කරුවෝ, ගොවියෝ නාවිකයෝ සහ යුද සෙබළු පැමිණියහ. අළුත් කම්කරු ගොවිකරු ජීවිත ගොඩනගන සැටි අසා දැනගැනීමට ඔහු වෙත ආහ.

"ඊ කෑම කන්ට වත් විවේකයක් එයාට නැති හැඩයි" ලෙනින් ගැන සිතූ ක්‍රෑප්ස්කයා නිගමනය කළාය.

ඔහු එන හඬ ඇසිණි. ඉක්මන් සැහැල්ලු පියවර ඔහුගේය. බේසම් සහිත වතුර පයිප්ප තබා ඇති කාමරයේ දෙර හැරී ලෙනින් ඇතුළු විය.

"විවේක කාලයක් ලබාගන්ට තීරණය කළා." ප්‍රීතියෙන් යුතුව ලෙනින් තම බිරිඳට කියමින් කවුළුවෙන් පිටත බැලීය. "බලන්නකො සුදෝසුදු හිම වැටිල, නදේෂ්ද යමුද පොඩ්ඩක් ඇවිදින්න. ඔයා කොහොමද අදහස් කරන්නේ?"

"මම අදහස් කරන්නෙ මෙහෙමයි. ඊ නවය වෙනකන් වැඩ කරනවා. වහාම වැඩ සියල්ල හෙටට කල්දමල විවේක ගන්ට ඕන" යැයි තදින් ක්‍රෑප්ස්කයා පිළිතුරු දුන්නාය.

"අන්න හරි. අවවාදය අපේ ෂෙල්විෂොව් සහෝදරයට කෙලින්ම බලපානවා!" යැයි එවේලාවේ ලෙනින්ගේ කාමරයට පැමිණි සෙබළා පෙන්වමින් ඔහු කීය. ලෙනින් හා ක්‍රෑප්ස්කයාට ගෙදර වැඩවලදී උදව්වීමට පැමිණියෙකි ෂෙල්ටිෂොව්. "ෂෙල්ටිෂොව් සහෝදරයා වහාම ගිහිල්ල විවේක ගන්න. ගිහින් විවේක ගන්නැ"යි ලෙනින් තම බිරිඳ කී දේ නැවත කීය.

ෂෙල්ටිෂොව්ට විවේක ගැනීමට කොහෙත්ම ආශාවක් නැත. ඔහු කැමති ලෙනින්ට උදව් කරන්ටය. පොදු අවන් හලට ගොස් ලෙනින්ට කෑ කෝප්පයක් ගෙනැවිත් දීම, කඩේට ගොස් පුවත්පත් ගෙනඒම, ගිනි තපින ලිපට දර දැමීම ආදිය කිරීමට ඔහු කැමතිය.

අද ෂෙල්ටිෂොව් වේලාසනින් පැමිණියේ විශේෂ කාර්‍ය්‍යයක් සඳහාය.

නදේෂ්ද ක්‍රෲප්ස්කයා සතුටු කරවීමට ඔහු බලාපොරොත්තු වෙයි. ඔහු තම කබා සාක්කුවෙන් මුහුණ බලන කණ්ණාඩියක් එළියට ගත්තේය. එය කුඩාය, වටකුරුය.

''මෙතැන ඉස්සර ඉගෙන ගත් නෝනා කෙනෙකුට මතක නැති වෙලා දාලා යන්නට ඇති. මම ඇහිඳල ඔය සහෝදරීට දෙන්ට ගෙනාවා. වැඩ කරන ගමන් මූණ බලා හිස පීරන්ට එහෙම පුළුවනි. ඒ වගෙ දේ වලට හොඳා'' මෙසේ කී ෂෙල්ටිෂොව් කණ්ණාඩිය ක්‍රෲප්ස්කයාට දෙන ගමන් ලෙනින් එය අනුමත කරත්දැයි බැලීය.

ලෙනින් එය අනුමත කළා විය යුතුය. මන්දයත් ඔහු කොක් හඬලමින් සිනාසුණු බැවිනි. පසුව ලෙනින් මෙසේ පැවසීය:

''අනේ මට බැරිවුණා නෙව ඕක කලින් හිතා ගන්න. නදේෂ්ද මම ඔයාට කණ්ණාඩියක් මිළදී ගත යුතුව තිබුණා.''

''ඔයාට කොහෙද ඒව ගැන හිතන්න වේලාවක්!'' ක්‍රෲප්ස්කයා සිනාසෙමින් පැවසුවාය.

ෂෙල්ටිෂොව් සතුටින් ගෙදර යාමට සමුගත්තේය.

ලෙනින් හා ක්‍රෲප්ස්කයා රාත්‍රි අහාර වශයෙන් සූරිය මල් තෙල් මුසු මීලට කෑ ගත්හ. තමා සමග ඇවිදීමට එන ලෙස ලෙනින් ක්‍රෲප්ස්කයාට නැවත වරක් අඬ ගැසීය. හිම කාලය මුලදී වැටෙන නැවුම් හිම පෑගීමට හා අළුත් වාතය ආශ්වාස කිරීමට ඔහු බොහොසෙයින්ම කැමතිය.

නදෙෂ්ද ක්‍රෲප්ස්කයා ලොම් සහිත හිම තොප්පිය හිස ලාගෙන හිම කබාය ඇඳ ගෙන සෙබළාගෙන් ලැබුණු කණ්ණාඩියෙන් මූණ බලන්නී, විස්මය පළ කළාය:

''අනේ වලෝද්යා මම නාකිවෙලා!''

''පොඩ්ඩක් වත් නාකි වෙලා නැහැ'' ලෙනින් පැවසීය.

ඇගේ ලස්සණ හිසකේ පැසෙන්නට පටන් ගෙන ඇත. නළල මත සිහින් රැළි වැටී ඇත. ලෙනින් ඒ වෙනස නොදකින්නේ ඈ පෙර දුටු පරිදිම දුටුවේය. කොළපැහැති පහනකුත් රැගෙන ඈ ඔහු සොයා හැතැප්ම් දහස් ගණනක් මග ගෙවා සයිබීරියාවේ ෂුෂෙන්ස්කොයෙ ගමට ආ සැටි ඔහු ඇයට මතක කළේය. පහනේ වීදුරු කවර බිඳේ යන බියෙන් ඈ මුළු ගමනේදී පහන අතින් ගෙන ගියාය.

''ඔයා වැඩ හන්ද හොඳටම මහන්සි වෙලා නේද?'' හිටි හැටියේම ලෙනින් ඇගෙන් ඇසීය.

''වැඩි මහන්සියක් නැහැ'' ඇ පිළිතුරු දුන්නාය.

ඇ ලෙනින් සමග ඇවිදිමින් ගමන ඉක්මන් කළාය. ලෙනින් දවසේ වැඩ තාවකාලිකව නවත්වා පැමිණියා මිස වැඩ අවසන් නොකළ බව ඇ දන්නිය. සක්මනින් පසු ලෙනින් ස්මෝල්නි ගොඩනැගිල්ලේ තෙවැනි මාලයට නැග අගමැති කාර්‍යාල කාමරයට වී මැදියම් රැය පසුවන තුරු වැඩ කරනු ඇත. කළයුතු වැඩවලට අවසානයක් නැත. ලෝකයේ ප්‍රථමවැනි සමාජවාදී, ගොවීන්ගේ හා කම්කරුවන්ගේ ආණ්ඩුව ගොඩනගන්නේ කෙසේද යන්න සිතමින් ඔහු වැඩ කළේය.

## ඉගෙන ගනිමු

ස්මෝල්නියේ දොරටු සෙබළු මුරකරති.

''බලපත්‍රය පෙන්වනව!'' මුර සෙබළෙක් කීය.

ඉදිරියට ගිය කම්කරුවන් තිදෙනාගේ ගමනට බාධා කරමින් මුර සෙබළා තුවක්කුව හරස් කළේය. ඔවුන් තිදෙනාගෙන් දෙදෙනෙක් යටි රැවුළ සහිත මහල්ලෝ වූහ. තෙවැන්නා තරුණයෙකි. ඔහුගේ නම රොමාන්ය.

සන්සුන් ලෙස තුවක්කුව පසෙකට තල්ලු කළ මහලු කම්කරුවෙක් ''බලපත්‍ර දෙන්නෙ කොතැනද?'' යි ඇසීය.

''ඒයි, ඒයි... සෙල්ලම් කරන්ට එපා! බලපත්‍ර දෙන්නෙ කාරියාලෙ, මෙහෙ නෙමෙයි'' සෙබළා කෑගැසීය.

මේ වේලාවේදී ස්මෝල්නියේ බලපත්‍ර නිකුත්කරන නිලධාරි මල්කොව් පැමිණියේය. හිටපු නාවිකයකුවූ ඔහු බොත්තම් නොපියවන ලද පී ජැකට් හෙවත් කබායක් ඇඳ සිටියේය. ඔහුගේ නාවික බැනියම පිටතට පෙනිණි.

''තමුසෙලට මොනවද ඕන?''

''ලෙනින් හමුවෙන්ට ඕන. බොහොම වැදගත් කාරණයක්'' රොමාන් කීවේය.

''වහාම හමුවෙන්න ඕන'' අනෙකා කීය.

''ඔහෝ, හදිසියක්'' මෙසේ කී මල්කොව් කම්කරුවන් තිදෙනා දෙස ඕනෑකමින් බලමින් සෘජුව සිටගත්තේය: '':ඔක්තෝබර් විප්ලව කාලෙදි තමුසෙල කොහෙද හිටියෙ?''

''හිම මාලිගය අල්ලන්ට ගියා මිසක් වෙන කොහිද? ''

විනාඩි පහළොවකින් කම්කරුවෝ තිදෙන අගමැති හමුවීම සඳහා පිළිගැනීමේ කාර්යාලයට පැමිණියහ. එය විශාල කාමරයකි. එහෙත් අවශ්‍ය පුටු මේසාදිය නැත. සැටි දෙකක් තබා පිළිගැනීමේ කාර්යාලය දෙකට බෙදා වෙන් කරලාය. මේස දෙකක් පුටු කීපයක් හැර ඒ විශාල කාමරයේ වෙනත් දේ නොතිබිණි.

කම්කරුවෝ වටපිට බලා කාමරය තමන්ට නොරිසි නොවන බව දැනගත්හ.

කාන්තාවක් අගමැති කාර්යාලයේ දොර ඇරගෙන එළියට ආවාය:

''සහෝදරවරු එන්න. ලෙනින් සහෝදරයා බලා ගෙන ඉන්නවා.''

කම්කරුවෝ අගමැති කාර්යාලයට ඇතුළු වත්ම, ලෙනින් නැගිට ඉදිරියට විත් ඔවුන් පිළිගත්තේය. ඔහු මිටිය, ක්‍රියාශීලිය. ඔහුගේ දෙනෙත් ජීවයෙන් පිරිලාය.

''ආයුබෝවන් සහෝදරවරුනි. එන්න, වාඩිවෙන්න!''

ඔවුන් වාඩි කරවූ ලෙනින්ද ඔවුන් ඉදිරියෙන් නොව අසලින් වාඩිවිය. ඔහු අත පැන්සලයකි. ඔහු ඔවුන්ගෙන් ප්‍රශ්න පිට ප්‍රශ්න අසයි:

''කොයි කම්හලේ ඉඳලද? රස්සාව? කම්හලේ වැඩ කොහොමද? ඔහෙලගෙ ප්‍රශ්නෙ මොකක්ද? එළිපිට කියන්න. යාළුවො වගෙ කතා කරමු.''

ලෙනින් මඳ සිනා පෑවේය. කම්කරුවෝ සතුටු වූහ.

ලෙනින්ගේ දයාන්විත මඳ සිනාව නිසා, ධෛර්යමත්වූ රොමාන් තමන් අගමැතිවරයා හමුවීමට පැමිණි වැදගත් හේතුව ගැන කීවේය. ඔහුට සහ සගයිනට තම කම්හල ගැන කීමට සිත්වුණු නමුදු දැන් ඔවුහු එහි වැඩ නොකරන බැවින් ඒ ගැන නොකීහ. මේ කම්කරුවන් තිදෙනා කම්හලේ සිට ඇමති කාර්යාලයට සේවය සඳහා යවා ඇත. සාර් කාලයේ සිටි නිලධාරීහු සෝවියට් පාලනය යටතේ වැඩ කිරීමට අකමැති වූ බැවින් ඉවත්ව ගියහ. මේ අඩුව පිරවීම සඳහා කම්කරුවන් ඇමති කාර්යාල සේවය සඳහා සෝවියට් ආණ්ඩුව තෝරා ගත්තේය.

''ඔහෙලව වැඩට යැව්වේ සෝවියට් ආණ්ඩුවට උදව් කරන්නට නොවේද?''

''එහෙම තමා.''

''එහෙනම් මොකද අමාරුව?''

ලෙනින් රොමාන් දෙස බලාගත්වනම සිටියේය. තරමක් නොසන්සුන්වූ රොමාන් තම රත් පැහැති හිස කේ අතගාන්නට විය.

''අපට ඔය වැඩ තේරෙන්නෙ නැහැ සහෝදරය. කම්හලේ වැඩ නම් අපට හොඳට කරන්න හැකි. ඇමති කාර්යාලෙ වැඩ දැපි දන්නෙ නැහැ. කම්කරු පාලනය තිබිය යුතුද? පොට්ටයො වගෙ අතපත ගානව'' රොමාන් කීය.

"සහෝදරවරු හිතන්නෙ මට රටක් ආණ්ඩු කරන්න ලෙහෙසියි කියලද" පිළිතුරක් වෙනුවට ලෙනින් ප්‍රති ප්‍රශ්නයක් ඇසීය "ඔහෙල හිතනවද මට පුරුද්දක් තියෙනව කියල? මම කිසිමදක අගමැතිකම් කරලා නැහැ. අපේ ඇමති මණ්ඩලේ එකම සහෝදරයෙක්වත් මීට ඉස්සෙල්ලා ඇමති ධුර දරූ අය නොවේ" යැයි ලෙනින් පැවසීය.

එක් කම්කරුවෙක් සැක සිතින් හිස වැනීය:

"සහෝදරය, වැඩ අළුත් දේ."

"අපි එකතු වෙලා පරණ දේ කඩා බිඳ දැම්මා! දැන් ඉතින් කව්ද අළුත් දේ ගොඩනගන්නේ?" ලෙනින් ප්‍රශ්න කළේය.

ඔහු වඩාත් සතුටුව කම්කරුවන්ට වඩාත් ළංවී කරුණු පැහැදිලි කර දුන්නේය. දැනීම නැතිව ඇමති කාර්‍යාලයක වැඩ කිරීම අපහසුය. එහෙත් කම්කරුවන්ට නිර්ධන පංතික ඉවක් ඇත. අපේ පක්ෂයේ, සෝවියට් ප්‍රතිපත්තිය ඇමති කාර්‍යාලවල ක්‍රියාවේ යෙදවිය යුතුය. කම්කරුවන් හැරුණු විට එය ක්‍රියාවේ යොදවන්නේ කවුද? හැම තැනම කම්කරු ඇසකින් පරීක්ෂා කළ යුතුය. කම්කරු පාලනය තිබිය යුතුය.

"ලෙනින් සහෝදරය අපට වැරදුණොත්?"

"වැරදුණොත්, වැරදි හරි ගස්වා ගනිමු. දන්නෙ නැතිනම් ඉගෙන ගනිමු. සහෝදරවරුනි! පක්ෂය තමුසෙලාට එම වැඩේ භාරදී තිබෙනවා. යුතුකම ඉටුකරන්න." නැගිටිමින් ස්ථිර ලෙස පැවසූ ලෙනින් උනන්දුකරවන දයාන්විත මඳ සිනාවකින් ඔවුන්ට සංග්‍රහ කොට යළි මෙසේද පැවසීය: "දන්නේ නැතිනම් ඉගෙන ගනිමු".

මේ සාකච්ඡාවෙන් පසු කම්කරුවන් තුළ තිබූ බිය සැක දුරුවිය. ඇමති කාර්‍යාලයේ වැඩ කෙරෙන හැටි සම්පූර්ණයෙන්ම අවබෝධ කරගන්නා තුරු රෑ දහවල් නොතකා වැඩ කිරීමට ඔවුහු ඉටා ගත්හ.

"හොඳයි ලෙනින් සහෝදරය, අපේ වගකීම ඉටු කරන බවට ප්‍රොරොන්දු වෙනවා" ඔවුහු කීහ.

ලෙනින් නිවැරදි ලෙස කරුණු පැහැදිලි කළහයි කම්කරුවෝ පිටවී යන ගමන් සාකච්ඡා කළහ. කම්කරු ගොවිකරු ආණ්ඩුව අපේය, අප එයට වගකිව යුතුය.

## බර පතළ පාඩමක්

යුද්ධය නිසා රුසියාව විනාශයට පත්විය. පෙට්‍රොග්‍රාඩයේ දුර්භික්ෂය වඩාත් තර්ජනාත්මක ස්වරූපයක් ගත්තේය. සලාක පොත් අනුව දිනකට පාන් රාත්තල් කාලක් බැගින් දෙන ලදී. උදය ආහාරය සඳහා එය

ප්‍රමාණවත් නොවීය. දහවල් කෑම සඳහා ලූණු දැමූ හෙරිං නැමැති මාළු වලින් සුප් සෑදීම සිරිතක් බවට පත්විය. කම්කරු පවුලද, ඇමති වරුද, අගමැති ලෙනින්ද දවසකට පාන් රාත්තල් කාල බැගින් ආහාර වශයෙන් ගත්හ.

ලෙනින් දිනපතා ඇමති මණ්ඩලයේ රැස්වීම් කැඳවීය. වැඩ අධිකවූ අතර හැම දෙයක්ම හදිසි ඒවා විය. ප්‍රධානතම කරුණ දුර්භික්ෂයෙන් රට මුදවාගන්නේ කෙසේද යන ප්‍රශ්නයයි. ආහාර හිඟයට මූණ පෑවේ පෙට්‍රොග්‍රාඩය පමණක් නොවේ, රුසියාවේ හැම නගරයකම තත්ත්වය එසේ විය. රුසියාවේ ගම්වලද, සයිබීරියාවේද, වොල්ගා නදී පෙදෙසේද ආහාර ඕනෑ තරම් තිබිණි. ගම්වල ඇති ධාන්‍ය එකතු කොට නගරවලට ගෙනඒම වහාම කළ යුතුය. බැලූ බැල්මට ප්‍රශ්නය ලෙහෙසිය. එහෙත් එය කොහෙත්ම ලෙහෙසි නොවීය. දුම්රිය මාර්ග කැඩී බිඳී ගොසිනි. පළමුවෙන්ම කළ යුත්තේ දුම්රිය මාර්ග අළුත් වැඩියා කොට යථා තත්ත්වයට පැමිණවීමය. ශීත කාලයේදී නගරවලට තාපන ද්‍රව්‍ය වුවමනා කෙරේ. දර හා බිම් අඟුරු නගරවලට ගෙන ආ යුතුය. වහාම කළ යුත්තේ දුම්රිය මාර්ග ඇතුළු ප්‍රවාහණ මාර්ග යථා තත්ත්වයට පත් කිරීමය. එය අතිශයින්ම අසීරු කාර්‍යයකි! හැම තැනම කඩා කප්පල් කාරීන් හා කළු කඩකාරයින්ය. කළුකඩකාරයෝ දරිද්‍රතාවයෙන් පීඩිත ජනතාවගේ කරපිටින් පොහොසතුන් වීමට යත්න දැරූහ. කඩාකප්පල්කාරීහු විප්ලවය බිඳදැමීමට කටයුතු කළහ. ඔවුන්ට හැම අතින්ම ධනපති පංතිය ආධාර දුන්නේය. ධනපති පංතිය හා සාර්ගේ බලවේගයන්ද සෝවියට් ආණ්ඩුව කෙසේ හෝ පෙරළා දැමීම සඳහා තමන් සතු හැම බලයක්ම යෙදවූහ. ධනපතීහු, සාර්ගේ නිලධාරීහු, කළු කඩ ජාවාරම් කාරයෝ, කඩාකප්පල් කාරීහු හැම තැනම විනාශ කාරී වැඩ කරන්නට වූහ. ජර්මන් යුධ සේනා සෝවියට් රුසියාව පරාජය කර දමන තුරු බලා සිටි රුසියානු ධනපති පංතිය ජර්මනියේ ජය ග්‍රහණයෙන් පසු නැවත බලය ලබා ගැනීමේ සිහිනය දිටීය.

මේ හැම දෙයක් ගැනම කල්පනා කර බැලීමට ලෙනින්ට සිදුවිය.

ජර්මන් යුධ හමුදව ශක්තිමත්ව තිබියදී සාර්ගේ හමුදව දිරාපත් වූ විට, රාජාණ්ඩුවාදී යුධ නිලධාරීහු යුද පෙරමුණෙන් පැන ගියහ. යුද භටයෝද තම නිවෙස් කරා ගියෝය. රට මහත් විනාශයකට ගොදුරුවීමේ අවදානමක් ඇතිවිය.

''කළ යුත්තේ කුමක්ද?'' මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ලෙනින් පක්ෂයේ මධ්‍යම කාරක සභාවද, ඇමති මණ්ඩලයද කැඳවා සාකච්ඡා කළේය.

"අපි සාමය පිළිබඳ පණතට අත්සන් තැබුවෙමු. වහාම ජර්මනුන් සමග කරන යුද්ධය නවත්වා දැමිය යුතුයැ"යි ලෙනින් කියා සිටියේය.

සෝවියට් ඇමති මණ්ඩලය ජර්මන් යුධ සෙන්පතියාට සාම යෝජනා ඉදිරිපත් කළ අතර ඔහු ඒවා පිළිගත්තේය. ජර්මනුන් ඉදිරිපත් කළ කොන්දේසිවලට සෝවියට් ආණ්ඩුව එකඟ විය. මෙතෙක් ජර්මන් හමුදා අල්ලාගෙන ඇති පෙදෙස් ජර්මනියට අයත් වේ.

"අපට වෙනත් මගක් නැති නිසා ඔවුන්ගේ කොන්දේසි පිළිගැනීමට සිදුවී තිබෙනවා" ලෙනින් පැවසීය.

සැබැවින්ම වෙනත් මගක් නොමැතිය. යුද්ධය නිසා ජනතාව ඉමහත් දුකට වැටී ඇත. රට විනාශයට මුහුණ පා ඇත. ජනතාවට ශක්තිය ගොනු කර ගැනීමට සාමය වුවමනාය.

මධ්‍යම කාරක සභාව කීප වරක්ම ජර්මනිය සමග සාමය ඇතිකර ගැනීමේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළාය. වහාම ජර්මනිය සමග සාමයක් ඇති කර ගත යුතු බව ලෙනින් ඔප්පු කොට පෙන්වීය. අප වෙත ඉදිරිපත් කර තිබෙන කොන්දේසි කොතරම් බරපතළ වුවද ඒවා පිළිගත යුතුය. සෝවියට් සමාජවාදී ජනරජය ආරක්ෂාකර ගැනීම සඳහා හැම පරිත්‍යාගයක්ම කළ යුතුය. සෝවියට් ආණ්ඩුව ශක්තිමත් කොට, අළුත් කම්කරු ගොවිකරු යුධ හමුදාවක් සාදා, රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත්කළ යුතුය.

ලෙනින්ගේ මතයට පක්ෂපාත වී නම් කොතරම් අගනේද! මධ්‍යම කාරක සභාව තුළ තියුණු මතභේද පැන නැගිණි. ළාමක, අස්ථිර අදහස් ඇති අය ලෙනින්ට විරුද්ධව තර්ක කළෝය. "මංකොල්ලකාරී සාම ගිවිසුමක්. අප සූදානම් නැහැ එවැනි සාම ගිවිසුමකට අත්සන් තැබීමට." සාම ගිවිසුමට අත්සන් නොතබති නම් සෝවියට් රුසියාවට මූණ පෑමට සිදුවන භයානක විපාක ගැන ඔවුහු නොදත්හ.

විරුද්ධවාදීන්ගේ මත නිසා ඇතිවිය හැකි විපාක ගැන කලින් දත් ලෙනින් දුක් විය.

"සහෝදරවරුනි! අපේ රට විනාශයට හා දුර්භික්ෂයට මූණ පාලා. සෝවියට් ජනරජය බේරාගැනීමට නම් අපට සාමය ඕනෑ."

ලෙනින් තම සගයිනට කරුණු පහදා දෙමින් පැවසීය. ඔවුහු ලෙනින්ට පක්ෂවූහ.

සෝවියට් ආණ්ඩුව නැවත ජර්මන් සෙනවිවරුන් වෙත සාම නියෝජිත මණ්ඩලයක් යැවීය. එහි නායකවූයේ ට්‍රොට්ස්කිය.

ඔහු ලෙනින්ගේ නියමයන් උල්ලංඝණය කළේය. සෝවියට් ආණ්ඩුව හා පක්ෂයේ මධ්‍යම කාරක සභාව ජර්මන් යුධ හමුදා සමග ඕනෑම බරපතළ තත්ත්වයක් යටතේ සාම ගිවිසුමක් අත්සන් කරන ලෙස නියෝජිත මණ්ඩලයට දැන්වීය.

එහෙත් ට්‍රොට්ස්කි සාම ගිවිසුමට අත්සන් නොතැබීය. සෝවියට් රුසියාව යුඩ නොකරන බව පැවසීය. යුද භටයෝ යුද පෙරමුණ අත හැර දමා ගෙවල් බලා ගියහ. යුද පෙරමුණ අතුරුදහන් විය.

ජර්මන් සෙනවිවරු කිසිදු අවහිරයක් නොමැතිව තම යුද හමුද මෙහෙයවා රුසියාවේ නගර ගම් අල්ලා ගනිමින් ඉදිරියට ගමන් කළහ. රුසියාව තුළටම කා වැදුණු ජර්මන් හමුද අගනුවරට ළං විය. පෙට්‍රොග්‍රාඩ් නගරය තර්ජනයට මුණ පැවේය. ජර්මන් හමුද රුසියාවේ අගනුවර අල්ලා ගනීවිද? රුසියානු විප්ලවයේ අවසානය ළංවීද?

ධනපතියෝ, කළු කඩකාරයෝ සහ වෙළෙන්දෝ තම වාරය එනතුරු බලා සිටියහ. සෝවියට් ආණ්ඩුව කඩා වැටුණු විගස මරා දැමිය යුතු බොල්ෂෙවික්වරුන්ගේ හා කම්කරුවන්ගේ නාම ලේඛණ සකස් කළහ.

ට්‍රොට්ස්කිගේ ක්‍රියාකලාපය අධිරාජ්‍යවාදීන් හා ධනපතීන් නැමැති පණිත රිළවුන්ට ඉණිමං බැඳීමක් වැන්න.

ට්‍රොට්ස්කි මීට පෙරද සටන්කාමී කොමියුනිස්ට් පක්ෂයක් සෑදීමට විරුඬව ක්‍රියා කළේය. ලෙනින්ට හා ලෙනින් වාදීන්ට විරුඬව ඔහු නොයෙකුත් කණ්ඩායම් සමගි කළේය.

නැවත පක්ෂයේ මධ්‍යම කාරක සභාව හා සෝවියට් ඇමති මණ්ඩලය රැස්වී සාකච්ඡා කළහ. ස්මෝල්නි මන්දිරය තුළ ගිනි තැපිමට පවා දර නැත. මධ්‍යම කාරක සභිකයෝ හා ඇමතිවරු හිම කබා පොරවා ගෙන, ලොම් සහිත කබා කර උස්සාගෙන ශීතලට විරුඬව සටන් කරමින් සාකච්ඡා කළහ. පෙබ්‍රවාරි මාසයේ චණ්ඩ හිම කුණාටු හමන්නට විය.

''කටුක දුක්ඛරිත පාඩමකි'' යි ලෙනින් පැවසීය.

''සමාජවාදී පිතෘභූමිය අවදනමට මුණ පා ඇතැ!''යි ඇමති මණ්ඩලයේ ආයාචනයේ සඳහන් විය.

''කම්කරුවෙනි, ගොවියනි, සහෝදරවරුනි! පිතෘභූමිය-බේරාගැනීමට නැගිට සිටින්න!''

නගරවල, ගම්වල හා කම්කරු ජනපදවල දස දහස් ගණන් ස්වේඡා සේවකයෝ අගමැති ලෙනින්ගේ හා ඇමති මණ්ඩලයේ ආයාචනයට සවන්දී රට බේරා ගැනීමට ඉදිරියට ආහ. අළුත් යුඬ හමුදවක් සෑදීමට පුළුවන් වූයේ මේ නිසාය.

රතු හමුදව හෙවත් සෝවියට් හමුදව ජර්මන් ආක්‍රමණිකයාට එදිරිව සටන් අරඹා ඔහුගේ ඉදිරි ගමන නැවැත්විය.

මෙය සිදුවූයේ 1918 පෙබ්‍රවාරි මාසයේදීය. එද සිට පෙබ්‍රවාරි 23 ද සෝවියට් රතු හමුද දිනය හැටියට සෝවියට් ජනතාව උත්සව පවත්වති. එද සිට සෝවියට් රතු හමුදව සතුරන්ගෙන් තම මවුබිම කීපවරක්ම රැක ගත්තේය. ඉදිරියටද එසේම රැක ගනු ඇත.

රතු හමුදාව පෙරමුණගෙන තමන්ට පහර දෙන විට ජර්මන් සෙනවිවරු සාමයට කැමති වූහ. එහෙත් දුන් එය වඩාත් දැඩි කොල්ලකාරී ස්වරූපයක් දැරිය. වඩාත් වැඩි පෙදෙසක් ජර්මනුන් අතට පත්විය. එපමණක් නොව වන්දි ගෙවීමටද සිදුවිය.

ගත හැකි අන් මගක් සෝවියට් ආණ්ඩුව ඉදිරියේ නොවීය.

හත්වැනි සම්මේලනවාරය සෝවියට් අගමැති වී. අයි. ලෙනින්ගේ යුධය හා සාමය පිළිබඳ වාතීාව නිවැරදි දේශපාලන ප්‍රතිපත්තිය ලෙස සම්මත කළාය.

මාස කීපයකට පසු ජර්මනියේ විප්ලවයක් ඇතිවූයෙන් කොල්ලකාරී ගිවිසුම අහෝසි විණි.

''ලෙනින් සහෝදරයා බොහොම දුර දිග බලා ක්‍රියා කළා!'' කම්කරුවෝ ඔහුගේ ප්‍රතිපත්තියට පක්ෂව කීහ.

## මොස්කව්

මාර්තු මාසයේ රැයෙක පීටර්බුර්ගය අසල නිකොලායෙව්ස්ක් දුම්රිය පොළේ, මල් චතුරශ්‍රය නමින් හැඳින්වෙන වේදිකාව අසල ඇඳිරි කවුළු සහිත දුම්රියක් විය. වේදිකාව මුරභටයෝ ආරක්ෂා කළහ. දුම්රිය දිගටම ලැට්වියානු භටයෝ තුවක්කු රැගෙන පෙළගැසී සිටියහ. දුම්රිය යන්ත්‍රය ඇති වහළ මත මැෂින් තුවක්කුවකි.

හම් කබායකින් සහ උපැස් යුවළකින් සැරසී සිටි එතරම් නොඋස් පුද්ගලයෙක් දිගැති යුද කබායක් හැඳ සිටි මිනිහකු සමග පහත් හඬින් කතා කළේය.

''ප්‍රතිවිප්ලවවාදීන් දුන් පිටවයාමට නියමිත මේ දුම්රිය ගැන දන්නේ නැති බව සහෝදරයට සහතිකද?'' ස්වෙර්ඩ්ලොව් ජෙර්සින්ස්කිගෙන් ඇසීය.

''සමහර විට දන්නව ඇති. නමුත් කොතැනින්ද කියන එක දන්නෙ නැහැ.''

''බොහොම හොඳ උපායක්. ප්‍රධාන දුම්රිය පොළෙන් නොවෙයි. අප්‍රසිඩ කුඩා දුම්රිය පොළකින්'' ස්වෙර්ඩ්ලොව් පැවසීය.

''ප්‍රතිවිප්ලවවාදීන් පිපිරවීම ඇතිකරනව. හැමදම උන්ගෙ කඩා කප්පල්කාරී ක්‍රියා අපි සොයා ගන්නවා'' යැයි ජෙර්සින්ස්කි පිළිතුරු දුන්නේය.

ස්වෙර්ඩ්ලොව් මෙන්ම ජෙර්සින්ස්කිද සාර් රජුගේ ආණ්ඩුව විසින් කීප වරක්ම සිරගෙට හා පිටුවහලට නියම කරන ලදී.

1917 ඔක්තෝබර් විප්ලවයට නායකත්වය දීමේදී ලෙනින් සහ මධ්‍යම කාරක සභාව මෙන්ම එහි සාමාජිකයෙකුවූ ජෙර්සින්ස්කිද ප්‍රධාන කාර්‍යයක් ඉටු කළේය. ප්‍රතිවිප්ලවවාදීන්ට විරුඬව සටන් කිරීමේ විශේෂ කමිටුවේ සභාපති ධූරයට ජෙර්සින්ස්කි තෝරාගනු ලැබුවේ ලෙනින්ගේ යෝජනාවක් අනුවය.

ඉක්මනට උණුවන හදවතකින් හෙබි ජෙර්ෂින්ස්කි හතුරන් කෙරෙහි දක්වූයේ දැඩි වෛරයකි. ඔහු ළමයිනට තදින්ම ඇලුම් කළේය. සෝවියට් ආණ්ඩුව ජනතාවට සමෘධිමත් හා වාසනාවත් අනාගතයක් ලබා දෙතියි ඔහු තදින්ම විශ්වාස කළේය. ජෙර්සින්ස්කි දිවා රෑ නොතකා, විවේක නොගෙන වැඩ කළේය.

විප්ලවය, පක්ෂය හා ජනතාව සඳහා ඔහු වෙහෙසුණේය.

මේ අතර ඇඳිරි දුම්රිය වෙත මිනිසුන් කණ්ඩායමක් ළං විය. ලෙනින් ඉක්මන් ගමනින් ඉදිරියෙන් ගිය අතර ඔහු පිටුපසින් කෲප්ස්කයා ගමන් කළාය. ඈ වුලන් සළුවක් පොරවාගෙන සිටියාය.

හැම දෙනෙක්ම දුම්රියට නැංගාහ. නළා හඬ ඇසෙත්ම ලැට්වියානු මුර හටයෝ දුම්රිය පාපුවරුවල එල්ලී ගත්හ.

දුම්රිය පහන් නොදල්වා දුම්රිය පොළෙන් පිටවිය.

ලෙනින් කවුළුව ළඟ මේසයක් අසල වාඩිවී තම බෑගයෙන් කඩදසි ගෙන ලියන්නට සූදනම් විය.

''දෙවියන්ගෙ නාමෙට ගමන් කරන විට හරි විවේක ගන්නැ!''යි ලෙනින් දුටු ස්වෙර්ඩ්ලොව් පැවසීය.

''අපි දෙවියන්ට බය වෙලා කටයුතු කළා නම් රුසියාවෙ කිසි දිනක විප්ලවයක් ඇති වෙන්නේ නැහැ.'' ලෙනින් පිළිතුරු දුන්නේ සිනාසෙමිනි.

තමා විසින් ලියන ලද ලිපිය නැවත කියවා එහි වැරදි තැන් කපා හැරීමට ලෙනින් පටන් ගත්තේය. අපේ සමාජවාදී විප්ලවය ශක්තිමත් කොට රුසියාව බලගතු රටක් බවට පත්කිරීම සඳහා පක්ෂයත් ජනතාවත් කටයුතු කළ යුතු සැටි ඔහු විස්තර කළේය.

සතුරෝ සෝවියට් රුසියාව වට කළහ. ප්‍රති විප්ලවය රජය පෙරළා දැමීමේ කුමන්ත්‍රණ කළේය. අපේ සමාජවාදී මවුබිම සමෘධිමත්, ශ්‍රේෂ්ඨ රටක් කළ හැකි බවත්, විප්ලවය වර්ධනයවී ජය ගන්නා බවත් ලෙනින් දැඩි ලෙසම විශ්වාස කළේය.

දුම්රියේ ගමන් කළ මගීහු නිදගත්හ. යන්ත්‍රය එළවන්නා පමණක් ප්‍රවේසමින් දුම්රිය පැදවීය. රාත්‍රි අන්ධකාරය හැම තැනම පැතිර පවතී. ලැට්විනියානු ආරක්ෂක මුර හටයෝ පමණක් තමන්ට නියමිත කාල වේලාව

අනුව දුම්රිය මැදිරි මුර කළහ. ලෙනින් කණමැදිරි ආලෝකයේ ආධාරයෙන් ප්‍රව්ද පුවත්පතට ලිපියක් ලියුවේය.

කම්මුලට අතක් තබාගත් නදේෂ්ද ක්‍රෘප්ස්කයා නිහඬව නිදගත්තාය. ලෙනින් ඇය ප්‍රවේසමින් කොටු සහිත වූලන් සළුවෙන් ආවරණය කළේය. ලෙනින්ගේ මව සහ නංගී මරියා ස්ටොක්හෝම් නුවරට පැමිණි කාලයේදී, නදේෂ්ද ක්‍රෘප්ස්කයාට තම නැන්දගෙන් ලැබුණු තිළිණයකි, ඒ වූලන් සළුව. ලෙනින්ට තම මව සිහිවිය...

1918 මාර්තු 11 ද සවස සෝවියට් ආණ්ඩුවේ ඇමතිවරුන් රැගත් විශේෂ දුම්රිය නිරුපද්‍රිතව මොස්කව් නුවරට ළඟාවිය. ප්‍රතිවිප්ලවවාදීන්ට එය විනාශකිරීමට බැරිවිය. අගමැති ලෙනින්ද, සමස්ත සෝවියට් මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවද, සෝවියට් ආණ්ඩුවේ ඇමති මණ්ඩලද පෙට්‍රොග්‍රාඩයේ සිට මොස්කව් නුවරට ආවේය. එද සිට සෝවියට් සමාජවාදී ජනරජයේ අගනුවර වූයේ මොස්කව් නගරයය.

ලෙනින්ගේත්, නදේෂ්ද ක්‍රෘප්ස්කයාගේත්, මරියා උල්යානොවාගේත් පදිංචි ස්ථානය වූයේ ක්‍රෙම්ලිනය ඉදිරිපස පිහිටි ''නට්සියොනාල්' හෝටලයය. ඉක්මනින්ම ලෙනින්ගේ අගමැති කාර්‍යාලය ක්‍රෙම්ලිනයට ගෙනයාමට තීරණය විය. පසුදින ලෙනින්ද, ක්‍රෘප්ස්කයාද, ඔවුන්ගේ මිත්‍ර බොන්ච්-බ්රුයේවිච්ද — සෝවියට් ඇමති මණ්ඩලයේ පරිපාලන කටයුතු භාරව සිටියේ මොහුය — ක්‍රෙම්ලිනය බැලීමට ගියහ.

ඔක්තෝබර් විප්ලවයේදී ක්‍රෙම්ලිනය අල්ලාගෙන සිටි ප්‍රතිවිප්ලවවාදී යුන්කරයෝ කපොලු සාදගෙන කම්කරු හමුදවට පහර දෙමින් කාල තුවක්කු වෙඩි තැබූහ. බිහිසුණු සටනකින් පසු විප්ලවීය හමුදවන්ට යුන්කරයින් සහ සාර්ගේ නිලධාරීන් පන්නා දමා පැරණි ක්‍රෙම්ලිනය අල්ලා ගැනීමට හැකිවිය.

1918 දී ක්‍රෙම්ලිනය යුඩය නිසා විනාශවී තිබිණි. සමහර ශාලා කැඩී බිඳී කළු පැහැගෙන තිබිණි. හැම තැනම ගඩොල් කැට හා සුන්බුන් විය. කුණු ගොඩවල් පිරී තිබුණේය.

ලෙනින් හා ක්‍රෘප්ස්කයා චතුරශ්‍රය හරහා ගමන් කළහ. කඳු ගැටයක් වැනි යෝධමය සන්ධාරය. උසින් අඩි තිහක් පමණවූ මේ යෝධ සීනුව තඹ ලෝහයෙන් අතින් වාත්තුකොට තැනීමට තරම් ඉස්සර කාලේ රුසියානු ශිල්පියෝ සමත් වූහ. එවැනිම විශාල කාලතුවක්කුවක්ද ඔවුහු සෑදූහ. පැරණි ක්‍රෙම්ලිනයේ තාප්ප දැති සහිත විය. ක්‍රෙම්ලිනයේ කුලුණු සුන්දරය. හැම කුලුණක්ම අතීත පුරාවෘත්තයක් සිහියට නගයි. ක්‍රෙම්ලිනයේ හැම දෙයක්ම රුසියානු ඉතිහාසය සිහි ගන්වයි.

ලෙනින් කල්පනාකාරි ලෙස අවට නැරඹීය. ක්‍රෙම්ලින් කඳුවැටියේ සිට බලන විට මොස්කව් නගරය හැම අතින්ම පෙනේ.

ලෙනින් සතුටු සිනා පාමින් මොස්කව් නගරයට සුබ පැතීය:

''සැරද මොස්කව් නගරය!''

## කොමියුනිස්ට් පක්ෂය

බොල්ෂෙවික් පක්ෂයේ හත්වැනි සම්මේලනයේදී ජර්මනිය සමග සාමය පිළිබඳ තීරණය සම්මත කර ගත්තාය. එම සම්මේලනය ඉදිරියේ යෝජනාවක් කළ ලෙනින් බොල්ෂෙවික් පක්ෂය කොමියුනිස්ට් පක්ෂය වශයෙන් නම් කළ යුතු යැයි කියා සිටියේය.

අපේ පරමාර්ථය කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩ නැගීමය. එසේ නම් අප පක්ෂයේ නමද පරමාර්ථයට එකඟ වනසේ කොමියුනිස්ට් පක්ෂය විය යුතුය.

ලෙනින් තම ක්‍රෙම්ලින් කාර්යාලයට පැමිණි කම්කරුවන් සමග සාකච්ඡා කරමින් නව සමාජය ගොඩ නගන සැටි කල්පනා කළේය. මුලින් ගන්නා පියවර අන් හැම දේටම වඩා අමාරුය. මුලින්ම ගන්නා පියවර අතිශයින්ම වැදගත්ය. ලෙනින් මේ ගැන දිවා රෑ දෙක්හි ාල්පනා කොට ඇමතිවරුන් සමග සාකච්ඡා කළේය.

ලෙනින් නිතර යාකොව් මිහයිලොවිච් ස්වෙර්ඩ්ලොව් සමග සාකච්ඡා කළේය. සමස්ත සෝවියට් මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිවර ස්වෙර්ඩ්ලොව් සහ ලෙනින් මිතුරු ලීලාවෙන් වැදගත් රාජ්‍ය ප්‍රශ්න විසඳූහ.

යුද්ධය නිසා විඩා පත්වී ජනතාවට විවේක ලබා දෙනු පිණිස ජනතාවගේ නව ජීවිතය ශක්තිමත් කිරීමට ලෙනින් ක්‍රියා කළේය.

ඔහු තම ප්‍රධාන ආධාර කරු වශයෙන් තෝරා ගත්තේ කම්කරු පංතියය. ''අපට නිර්ධන පංතියේ අයෝමය හමුදවක් අවශ්‍යයැ''යි ''සෝවියට් ආණ්ඩුවේ මීළඟ කාර්යභාරය'' නැමති ලිපියෙන් පෙන්වා දුන්නේය. පක්ෂයේ මධ්‍යම කාරක සභාව ලෙනින් සැලැස්ම හා අදහස් පිළිගත්තාය. ''ප්‍රව්දා'' සහ ''ඉස්වෙස්ටියා'' යන පුවත්පත්වල ලෙනින්ගේ ලිපිය පළවිය. උසස්තම පරමාර්ථයන් සඳහා ජනතාව පුබුදුවන ලදී. කොමියුනිස්ට්වාදීහු, කම්කරුවෝ සහ ගොවියෝ ලෙනින් කෙරෙහි විශ්වාසය තබා ඔහු සමග ඉදිරියට ගියහ.

ලෙනින්ගේ කාර්යාලයේ ලියන මේසය අසල වේවැලින් වියනලද ඇඳි සහිත පුටුවක් විය. ඔහු මේ පුටුවේ වාඩිවීමට ආශා කළේය. තම ළමාවියේදී උලියානොව්ලාගේ සිම්බීර්ස්ක් ගෙදර මෙවැනි වේවැල් පුටු

තිබුණු නිසා විය හැකිය. හිම කාලයේදී අම්මා වටා එක්රැස්වන ළමයින් ඇගේ කතාවලට සවන්දෙන සැටි ඔහුට මතක් විය. ලස්සන පොත්! ප්‍රීතිමත් ළමාවිය!

සෝවියට් රුසියාවේ හැම ළමයකුටම ප්‍රීතිමත් ළමා වියක් ලබාදිය යුතුයැයි ලෙනින් සිතාගත්තේය.

සාර්ගේ පාලන සමයේදී කම්කරු හා ගොවි ළමයින්ට ඉගෙනගැනීමට ඉඩකඩ මඳවිය. මැද පාසල අවසන් කළේ කලාතුරකින් එක් ළමයෙක් පමණකි. උසස් විද්‍යාලයකට ඇතුළුවීම විරල සිඩියක් විය. සෝවියට් පාලනයේ ආරම්භයත් සමගම රුසියාවේ සියලු පාසල්, විද්‍යාල හා විශ්ව විද්‍යාල කම්කරු ගොවිකරු ළමයින් සඳහා විවෘත විය. පුස්තකාලද ඔවුන් සතුවිය. කළයුත්තේ ඉගෙනීම පමණකි.

යුඩය නිසා රුසියාව විනාශයට, දුර්භික්ෂයට හා ශීතලට මුහුණ පෑවද, ලබාගත හැකි ඉතාම හොඳ හා පෝෂ්‍යදයක ආහාර ළමයින්ට බෙදා දෙන ලදී. ලෝකයේ කිසිම ධනපති රටක් මෙතරම් හොඳින් තම දරුවනට නොසලකයි. හැම දෙයක්ම වැඩකරන ජනතාවගේ දූ දරුවන් සඳහා වෙන් කැරිණි.

සාර් කාලයේදී කම්කරුවෝ දවසකට පැය 12 ක් හෝ සමහර විට පැය 15 ක් හෝ වැඩකළහ. සෝවියට් ආණ්ඩුව ලෙනින්ගේ යෝජනාවක් අනුව වැඩකරන කාලය දවසකට පැය අටකට සීමා කළේය.

ඉස්සර කුලාකයින්ට (පොහොසත් ගොවීන්ට) හා රදළයින්ට අයත්ව තිබූ ඉඩම් ගොවීන්ට බෙදා දෙන ලදී. රටේ සියලුම කම්හල්, ෆැක්ටරි, දුම්රිය මාර්ග, පතල්, ආකර, ඛණිජ තෙල් සම්පත්, බැංකු හැමදෙයක්ම රජය සතු කරන ලදී. හැම වස්තුවක්ම ජනතාවට, සෝවියට් සභාවලට හා රජයට අයත් විය. රදළයින් හා ධනපතීන් රටේ ආර්ථික ක්ෂේත්‍රයෙන් වෙන්කර දමන ලදී. ඕනෑම පුරවැසියකුට වැඩ කිරීමට අයිතියක් ඇත. වැඩකරන්නෝ කවරෙක්ද හේ අනුභව කරයි.

සෝවියට් රටේ ඇතිවූ ආර්ථික හා සමාජයීය පෙරළිය එය විය. විප්ලවය ජය ලබමින් ඉදිරියට ගමන් කළේය. ඒ හැම ජයග්‍රහණයකම නිර්මාණකයා හා පිතෘවරයා වූයේ කොමියුනිස්ට් පක්ෂය හා එහි නායක ව්ලදිමීර් ඉල්යිච් ලෙනින්ය.

## ගම්වලට යාම

විප්ලවයට බොහෝ කලකට පෙර ලෙනින් තම සගයින් සමග ජිනීවා නගරයෙහි වාසය කරන කාලයේදී රුසියාවේ සිට ඔහු හමුවීමට තරුණ

විප්ලවවාදී කතක් පැමිණියාය. ඇගේ නම ලිඩියා අලෙක්සාන්ද්‍රවනා පෝට්යෙවාය. ඇ මුල සිට ලෙනින්ගේ දෙශපාලන මතවලට ගරු කරන්නියක් වූවාය. ඇ තම ජීවිතය විප්ලවවාදී ව්‍යාපාරය සඳහා කැප කළාය. විප්ලවවාදී කටයුතු හැරුණු විට ඇ සංගීතයට ඇලුම් කළාය. ජිනීවාහි වාසය කළ බොල්ෂෙවික්වරු සමහර දවස් වලදී ලෙපෙෂින්ස්කිගේ අවන් හලේ රැස්වූහ. එවැනි අවස්ථාවලදී පෝට්යෙවා පියානෝව වාදනය කළාය. ලෙනින් පැමිණ සිටිත් නම් ඇ බීතෝවන්ගේ ස්වර මාලා රචනයක් වාදනය කරයි. ලෙනින් අන්හැමටම වඩා බීතෝවන්ගේ සොනාටා ස්වරමාලා රචනයට ආශා කළේය. එය මුදු මෙන්ම ගැඹුරු අදහස් කියා පාන උසස්තම ස්වර මාලා රචනයක් විය.

විප්ලවයෙන් පසු ලිඩියා පෝට්යෙවා අගමැති කායර්‍යාලයේ ලේකම්වරිය ලෙස වැඩ කරන්නී, ක්‍රෙම්ලින් මන්දිරය තුළම පදිංචිව සිටියාය. මේ නිසා ඇට වැඩවල යෙදීමට පහසු විය.

ඇ ලෙනින්ගේ දිනචරියාව ඉතා හොඳින් දැන සිටියාය. ඔහුට අවශ්‍ය හැම දෙයක්ම ඇ සැපයුවාය.

සෝවියට් ආණ්ඩුවේ ඇමති මණ්ඩලයේ සභාපති හෙවත් අගමැතිවරයා හමුවීමට නිතර කම්කරුවෝ හා ගොවියෝද, වෙනත් නියෝජිතයෝද පැමිණියහ.

''ලෙනින් සහෝදරයා හදකී (ගම්වල සිටම පයින් ගමන් කරමින් පැමිණි) ගොවි නියෝජිතයො ඇවිත් ඉන්නවා'' පෝට්යෙවා කීවාය.

''අඬ ගහන්න! අඬ ගහන්න!'' ලෙනින් පැවසීය.

වැස්සට තෙමී, අව්වට වේලුණු, හිම කුණාටුවලට මූණ දුන් යටි රැවුළු සහිත ගොවීහු අගමැති කායර්‍යාලයේ කොළපාට මේසය වටා වාඩිවුණහ. පළමුව ඔවුන් කුලෑටි ගතියකින් පසුවන සැටි පෙනිණ. එහෙත් ලෙනින් ගේ වාම් ගතිය දුටු ගොවියෝ ධෛර්‍යමත් වූහ.

ලෙනින්ගේ වාම් ගතිය හා දයාන්විත බව දුටු ගොවියෝ සැක හැර තම අදහස් කියන්නට වූහ. ලෙනින්ට අවශ්‍යවූයේත් ගොවීන්ගේ අදහස් හරිහැටි දැනගැනීමටය.

''ලෙනින් සහෝදරයා ඔහෙ තමා අපේ නායකයා. ඔහෙට වැඩ ගොඩක් තියෙන බව අපි දන්නවා...''

''ඒක එහෙම වෙන්ට පුළුවනි. නමුත් ගම් ගැන අපේ දැනීම අඩුයි'' ඔවුන් දිරි ගන්වමින් ලෙනින් පැවසීය.

''ගම් ගැන අපි ඔහෙට සම්පූර්ණ ඇත්ත කියා දෙන්නම්.''

''අන්න හොඳා. කියන්න!''

''සෝවියට් ආණ්ඩුව රදළයින්ව පන්නා දමල ගොවීන්ට ඉඩම් බෙදල

දීපු හන්ද ගොවියො ආණ්ඩුවට පණ වගෙ ආදරෙයි.'' මෙසේ කීයේ පපුව වැසෙන තෙක් දිගැති යටි රැවුළක් සහිත වැඩිමහලු ගොවියාය.

''හොඳා. තව දුරටත් ගම්වල හැටි විස්තර කරන්න.''

''දැන් අපි කියන්නෙ කුලාකයින් ගැන. අපේ අළුත් ජීවිත කුලාකයො පාගා දැමීමට හදනවා. ලෙනින් සහෝදරයා දුප්පත් ගොවීන් ගැන විශ්වාසය තබන්න. කුලාකයා සෝවියට් ආණ්ඩුවෙ මිතුරෙක් නෙවි, හතුරෙක්...''

ලෙනින් මේ කරුණු හොඳහැටි දැන සිටියද ගොවීන්ගේ කතාවට සවන් දුන්නේය. මේ අනුව ගොවීන්ගේ අදහස් සියල්ල කැටි කොට මනාසේ ගළපා වැදගත් නිගමනයක් කළේය. ඉන්පසු නව පණතක් ඉදිරිපත්කොට, නීතිගත කළේය.

ගම්බද දුප්පත් ගොවීන් පිළිබඳ පණතකට 1918 ගිම්හානයේදී ලෙනින් අත්සන් තැබීය. එය කොම්බෙද් නමින් හැඳින්විණි. එය ඉඩම් හිමි පොහොසත් ගොවීන් වන කුලාකයින්ට එදිරිව සටන් කිරීමේ ප්‍රධාන බලවේගය විය.

කුලාක්වරු කවරහුද? අද සෝවියට් සංගමයේ කුලාක් නමින් හැඳින්වෙන කොටසක් නැත. ඔවුන් සමාජයෙන් අතුරුදන් වී බොහෝ කල්ය.

සමෘධිමත් ගොවීන් වූ කුලාකයින් අතර බොහොසෙයින්ම පොහොසත් ගොවීහුද වූහ. ඉස්සර ගම්බද පැවැති සමාජ රටාව අනුව අවංකලෙස වැඩ කිරීමෙන් පොහොසත් විය නොහැකි විය. ඔවුහු අනුන්ගේ ශ්‍රමය සූරාකෑමෙන් කූට ප්‍රයෝග යොදමින් පොහොසත් වූහ. මෙසේ පොහොසත් වූ පසු ඉඩම් මිළදී ගත්හ. දුප්පත් ගොවීන් තමන්ගේ කුඹුරුවල වැඩට යොදවා අඩු කුලී ගෙවූහ. ඔවුන්ට ගිනි පොලියට මුදල් හා ධාන්‍ය දුන්හ. දුප්පත් ගොවියාට බේරීමට මඟෙක් නොවීය. ඔහු නැවත නැවතත් කුලාකයාගේ බිල්ල බවට පත්විය. කුසගින්නෙන් පෙලුණු දුප්පත් ගොවියා පුහු ගොයම් කරලක් සුළඟට වැනෙන්නාක් මෙන් වැනෙන්නට විය. කුලාකයාගේ ආහාර ගබඩාව තිරිඟු, මිලට්, බාර්ලි ආදි ධාන්‍ය වලින් පිරිලාය. ඔහු එයට අගුළු ලා ආරක්ෂා කරයි. කුලාකයා තම ආහාර තොගය වැඩි කර ගැනීමටද අනුන්ගේ ඉඩම් සොරා ගැනීමටද, ලාභ ලබාගැනීම සඳහා ඕනෑම ගොවියෙකුගේ ගෙල මිරිකා දැමීමටද නිතර සූදානමින් සිටියේය.

විප්ලවයෙන් පසු නගරවල දුර්භික්ෂය වැඩි වෙන්නට විය. කළ යුත්තේ කුමක්ද? කම්කරුවන්ට, සේවකයින්ට, ළමා ළපැටියන්ට හා රතු හමුදවට ආහාර සපයන්නේ කෙසේද? ආහාර සොයාගන්නේ කෙසේද?

ගම්වල ආහාර තිබේ. කුලාක්වරු ආහාර දීමට අකමැති වූහ, ආහාර සැඟවූහ, පොළොව හාරා වළවල් කපා ආහාර වළ දැමූහ.

අසාධාරණයකි! නගරවල කම්කරු ජනතාව කුසගින්නේ මියයාමට ඉඩ තැබිය යුතුද? ගම්බද කුලාකයින්ගේ ආහාර ගබඩා ධාන්‍යවලින් පිරී පවතී. කුලාකයින් ආහාර වගා කළේ කුලී ගොවීන්ගේ ශ්‍රමය සූරාකෑමෙනි. එම ආහාර කුලාකයින්ට නොව ජනතාවට අයිතිය.

ලෙනින් මෙසේ නිගමනය කොට කම්කරුවන්ට ආයාචනා කළේය.

''කම්කරු සහෝදරවරුනි! හැම කම්හලකම සහ පැක්ටරියකම ආහාර එකතු කිරීමේ සේනාංක සංවිධාන කරන්න. ගම්වලට ගොස් අමතර ධාන්‍ය රැස්කරගෙන සිටින අයගෙන් ධාන්‍ය ලබාගන්න. ගම්වල දුප්පත් ගොවියෝ සංවිධානාත්මක ලෙස අපට පක්ෂපාත වී සිටිත්. මැද පන්තියේ ගොවියෝ අපේ පැත්ත ගැනීමට පටන්ගෙන සිටිති. ගම්වල සෝවියට් බලය තහවුරු කරන සැටි ඔබ ඔවුන්ට කියා දෙන්න. කුලාකයින් ආහාර සඟවාගෙන තිබෙන තැන් ඔවුන් ඔබට පෙන්නා දෙනු ඇත. කුසගින්න හා දුර්භික්ෂය පැරදවීමට අමතර ධාන්‍ය එකතු කරන්න.''

අමතර ධාන්‍ය ගම්වල දුප්පත් ගොවීන්ට සහ කම්කරුවන්ට පවරාදෙන පණතක් ලෙනින් කෙටුම්පත් කළේය.

සෝවියට් ඇමති මණ්ඩලය එම පණත සම්මත කළාය. සෝවියට් ආණ්ඩු බලය පිහිටවූ පළමුවැනි අවුරුදු වලදී ලෙනින් හා ආණ්ඩුව කම්කරු ජනතාව දුර්භික්ෂයෙන් බේරා ගත්තේ ඒ විධියටය.

## ආක්‍රමණය

සමාජවාදී විප්ලවයට තුන් වසරකට පෙර ධ්‍රැව කක්ෂයට එහා පිහිටි බාරෙන්ට්සෙව් මුහුදු වෙරළේ මූර්මන්ස්ක් නමින් අළුත් නගරයක් පැන නැගිණි. නගරය විශාල නොවූවද, උතුරු දිග රුසියාවේ වැදගත් වරායකි, මූර්මන්ස්ක්.

1918 වසන්ත සමයේදී දවසක හිමිදිරි පාන්දර මීදුමෙන් වැසී තිබෙද්දී නිහඬව ඉදිරියට එන කළු පැහැති යුධ නෞකාවක සේයාවක් පෙනිණි. කාල තුවක්කු එල්ල කරන ලදී. මූර්මන්ස්ක් වරායට ඉංග්‍රීසි ක්‍රෑසර් නැවක් පැමිණියේය.

සැනෙකින් තවත් යුධ නැවක් පැමිණ නැංගුරම් ලෑවේය. එය ප්‍රංශයට අයත්ය. ඊළඟට පැමිණියේ ඇමෙරිකන් යුධ නැවකි.

සෝවියට් රුසියාව ආක්‍රමණය කරමින් විදේශීය රටවල යුද හමුද ගොඩ බැස්සාහ.

එය ඉංග්‍රීසි, ප්‍රංශ හා ඇමෙරිකා එක්සත් ජනපද යුද හවුල හෙවත් අක්ෂ පක්ෂය විසින් ළදරු සෝවියට් රජයට විරුඩව කරන ලද ආක්‍රමණයකි. මේ යුද හවුල ලෝක ඒකාධිකාරි අධිරාජ්‍යවාදීන්ගේ සංවිධානයකි.

රුසියාවේ සමාජවාදී සෝවියට් රජය පෙරළා දැමීමට ලෝක අධිරාජ්‍යවාදී හවුල ඉදිරිපත් වූයේ, ලෝකයේ අනිකුත් රටවල කම්කරුවන්ද සෝවියට් රුසියාවේ කම්කරුවන් අනුගමනය කරමින්, විප්ලව ඇතිකොට රාජ්‍ය බලය අල්ලා ගනිතියි යන බිය නිසාය.

1918 වසන්තය හා ගිම්හානයද අසීරු විය!

ගිම්හානයේදී අධිරාජ්‍යවාදී යුද හවුලේ තවත් යුධ නෞකා කීපයක් සුදු මුහුදට පැමිණියේය.

උතුරු ද්විනා නදිය ප්‍රචණ්ඩ ලෙස සුදු මුහුදට ගලා බසින්නට විය.

ද්විනා නදියේ මෝය කට අසල වූ නදී තීරය ඔරු පාරු වලින් හා කුඩා නැව්වලින් පිරිලාය. වෙරළ බදනගරය පටුය. පදික වේදිකා, නැව් තටාක ලීවලින් සාද ඇත. එහි ලී ඉරන කම්හල් හා ගබඩාය. නගරයේ එක් කෙළවරකින් ඉමක් නැති තුන්ද්‍රා මහා වනයය. මේ නගරය රුසියාවේ යුධමය හා වාණිජමය වරාය වන අර්හාන්ගිල්ස්ක්ය.

අධිරාජ්‍යවාදී යුද හවුලේ සේනා අර්හාන්ගිල්ස්ක් අල්ලා ගත්හ. රුසියානු ධනපති පංතිය හා ප්‍රති විප්ලවවාදියෝ අර්හාන්ගිල්ස්ක් නගරයේ වැටීම ප්‍රීතියෙන් පිළිගත්හ. ඔවුන්ගේ එකම බලාපොරොත්තුව වූයේ සෝවියට් රජය විනාශ කිරීමය. ප්‍රති විප්ලවවාදීහු නගරය තුළ කැරැල්ලක් ඇති කොට දගස් ගණන් කම්කරුවන්, විප්ලවවාදීන්, රතු හමුද භටයින් හා නාවිකයින් මරා දැමූහ.

මෙතෙක් සැඟවී සිටි වෙළෙන්දෝ සහ ධනපතියෝ එළිපිට තම රාජ්‍ය විරෝධී ක්‍රියා කළ අතර සාර් යුද හමුදවේ නිලධාරීහු නැවත තම නිල පටි පැළඳගත්හ. පල්ලිවල සීනු ගසමින්, දේව මෙහෙයන් පවත්වමින් පූජකවරු මිනීමරු ප්‍රතිවිප්ලවවාදීන්ට ආශීර්වාද කළහ.

අධිරාජ්‍යවාදීන්ගේ ආධාර ලැබූ ප්‍රතිවිප්ලවය උතුරේ ආක්‍රමණය ඇරඹීය.

ඈත පෙරදිග, සයිබීරියාවේ, උරාලයේ සහ වොල්ගා නදිය අසල පෙදෙසේ ප්‍රතිවිප්ලවය කැරලි ගසමින් සටන් පටන් ගත්තේය. අධිරාජ්‍යවාදී රටවලට අයත් කෲසර් නෞකා ව්ලදිවස්තෝක් නගරයද ආක්‍රමණය කළේය.

සයිබීරියාවේ ගම්වල කුලාකයෝ කැරලි ගැසූහ. දුප්පත් ගොවීන්ට වදහිංසා කොට ඔවුන්ගේ සංවිධාන විසුරුවා හැර කොමියුනිස්ට්වාදීන් එල්ලා මැරූහ.

ඩොන් හා කුබාන් පෙදෙසේ නගර ගම්වල දහස් ගණන් කොමියුනිස්ට්වාදීන්, කම්කරුවන් හා ගොවීන් මරා දමන ලදී. උක්රයිනය ජර්මන් යුද සේනාවලට අත් විය.

ළදරු සෝවියට් රජය වටා සතුරු බල සේනා කවාකාරව සිටගෙන, එය තොණ්ඩුවක් මෙන් හිර කළේය.

හිමිදිරි පාන්දර හිරු පායන්නටත් කලින් අරුණෝදයේ ආලෝකය යම්තම් පෙනන විට, සෝවියට් අගමැති ලෙනින් තම ක්‍රෙම්ලින් නිවසින් පිටතට ආවේය.

ලෙනින්ගේ ගෙදරත් අගමැති කාර්‍යාලය අතරත් ඇත්තේ අඩි කීපයක දුරකි. එය ස්මෝල්නි ගොඩනැගිල්ලේ ඔහුගේ නිවෙස හා කාර්‍යාලය අතර තිබුණු දුරටත් වඩා අඩු දුර ප්‍රමාණයකි.

අගමැති කාර්‍යාලයේ දොරටුව මුරකරමින් සිටි රතු හටයාට ලෙනින් ආචාර කළේය:

"සුබ උදෑසනක් වේවා! සහෝදරය."

පිළිගත් රීති අනුව අගමැති තම මුර සෙබළුන්ට ආචාර නොකරයි. එහෙත් ලෙනින් හැමදම මුර හටයින්ට ආචාර කළේය. ලෙනින් දුටු මුර හටයා වඩාත් සීරුවෙන් සිටගත්තේ විස්මය පත්වෙමිනි. "ලෙනින් සහෝදරය රෑට නිදාගන්නේ නැතිද?" ඔහු කල්පනා කළේය.

ලෙනින් අගමැති කාමරයෙන් පිටව ගියේද දූනට පැය තුනකට පමණ පෙරය. හිරු පෙරදිගින් උදාවන්නටත් පෙර නැවත ලෙනින් තම කාර්‍යාලය දෙසට ගියේය.

අගමැති කාර්‍යාලයේ කවුළු දෙක අතර බිත්තියේ විශාල සිතියමක් එල්ලා ඇත. ලෙනින් සිතියම ඉදිරියේ සිටගෙන බොහෝ වේලාවක් යුද පෙරමුණු සලකුනු කොට ඇති ස්ථාන දෙස බැලීය. දූන් යුඩය ඇවිල පවතින නගර හා ස්ථාන ගැන ඔහු මනාලෙස දනී. රතු හට සේනා මෙහෙයවන සෙනවිවරුන් හා කොමසාරිස් වරුන් ගැනද ඔහු දනී. ඔවුන්ගේ ගතිගුණද, දක්ෂතාවයන් ගැනද ඔහු දූනගැනීමට උත්සාහ කළේය.

සෝවියට් රුසියාවට සතුරන් පහර දෙද්දී සාමාන්‍ය ජනතාව අතරින් දක්ෂ සෙන්පතිවරු බිහිවූහ.

වසීලි ඉවානවිච් චපායෙව් මෙවැනි ජනතා වීරයෙක් වූ අතර ඔහු පෑ යුද දස්කම් ගැන ජනතාව අතර අද්භූත කතා පැතිර යන්නට විය. ක්ලෙමෙන්ති වොරෝෂිලොව්ද ජනප්‍රිය සෙනවියෙක් විය.

මිහයීල් ෆ්‍රුන්සේ ගැන ලෙනින් සිහිකළේ මහත් ගෞරවයෙනි. ඔහු ෆ්‍රුන්සේ කෙරෙහි විශ්වාසය තැබීය. 1905 පළමුවැනි විප්ලවය ඇතිවූ කාලයේදී ඉවානොවො-වොස්නෙසෙන්ස්ක් පෙදෙසින් කම්කරු සේනාංකයක් සාද මොස්කව්හි ප්‍රෙස්නයා පෙදෙසේ ඇතිවූ සටන්වලට සහභාගිවූ මිහයීල් ෆ්‍රුන්සෙ දූන් රතු හමුදාවක් භාරව සටන් මෙහෙයවන්නේ බිහිසුණු පෙරමුණකය.

ලෙනින් රතු හට සේනා මෙහෙයවන පෙරමුණු දෙස බැලීය:

වොරෝෂිලොව්, බුඩ්ඔනි, ලසෝ, කොතොව්ස්කි, ෂෝර්ස්, තුහාචෙව්ස්කි, බ්ලයුහෙර්...

උතුරු, දකුණු සහ නැගෙනහිර පෙරමුණු තුනකි.

නැගෙනහිර පෙරමුණට සයිබීරියාව, උරාලය හා වොල්ගාව අයත්ය. රුසියාවේ ධාන්‍යාගාරයද මෙහිය.

අධිරාජ්‍යවාදී යුද හවුලේ ආධාරයෙන් ප්‍රති විප්ලවවාදී ධනපති යුධ හමුද නැගෙනහිර ආහාර ගබඩා නමින් හැඳින්වෙන සරු පෙදෙස අල්ලාගෙන කම්කරු ගොවිකරු රජය දුර්භික්ෂයකට භාජන කොට විනාශ කිරීමට වැර දැරූහ.

''රතු හමුදවේ ප්‍රධාන බලය යෙදවිය යුත්තේ නැගෙනහිර පෙරමුණටය. වොල්ගා පෙදෙසින් හා සයිබීරියාවෙන් ප්‍රතිවිප්ලවවාදීන් පන්නා දම කුලාක් ආධිපත්‍යය බිඳිය යුතුයැ''යි ලෙනින් කල්පනා කළේය.

යුද පෙරමුණු වලින් ඊයේ ලැබුණු වාර්තා ඔහු නැවත මහත් සැලකිල්ලෙන් කියවා බැලීය. ජෙර්සින්ස්කි, ස්වෙර්ඩ්ලොව්, චිචේරින් ඇතුළු අනිකුත් නායකයින් සමග යුද පෙරමුණුවල තත්ත්වය ගැන සාකච්ඡා කළේය. ඔවුහුද ලෙනින්ගේ මතයට පක්ෂපාත වූහ. තීරණය ගන්නා ලදී. ඒ අනුව රතු හමුද මෙහෙයවන සෙනවිවරුන්ට නියමයන් දන්වා යැවිය යුතුය ලෙනින් නැවත ලියන්නට විය. ඉර පායාගෙන එනවාත් සමගම අගමැතිගේ ලේකම්වරිය පෝටියෙවා අමුත්තන් පැමිණ සිටින බව ලෙනින්ට දැන්විය. ඔහු තම ඔර්ලෝසුව දෙස බැලීය. කලින් නියම කළ වේලාවට අමුත්තෝ පැමිණ සිටිති.

''යුධ නිලධාරීන් බව ජේනවා'' ලෙනින් සිතීය.

ලියවිලි හා කඩදසි පයිල් කවරයට දමා පෝටියෙවාට දුන්නේය.

''ඔය ලියවිලි ඉක්මනට ඕන!''

තම මුහුණේ ඇති රැළි සහ නොසන්සුන්තාවය නැතිකර දැමීමට මෙන් ඔහු මුහුණ අතගෑවේය. ඔහු කොතරම් කැළඹීගෙනද, නොසන්සුන්තාවයෙන්ද යනු අන් උදවිය නොදැනගත යුතුය.

සෙනෙවිවරු කාර්‍යාලයට ඇතුළු වූහ. ලෙනින් ඉතා හොඳින් දන්නා රතු හමුද භාර සෙනවිවරුද, සාර් යුධ හමුදවේ හිටපු සෙන්පතියෙක්ද එහි වූහ.

''අපේ ප්‍රහාරක සැලැස්ම ගැන වාර්තා කරන්නැ'' යි ලෙනින් සාර් හමුදවේ හිටපු සෙන්පතියාට කීවේය.

ලෙනින් සාර් හමුදවේ සෙන්පතියෙකු සමග සාකච්ඡා කිරීම ඔහුගෙන් උපදෙස් ගැනීම පුදුමයට හේතුවක් නොවේද? රතු හමුදවේ සේවය කිරීම ගෞරවයට හේතුවකි, එම ගෞරවයට හිමි කම් ඇත්තෝ දුප්පත්තුය,

කම්කරුවෝය, වැඩ කරන ජනතාව හා ඔවුන්ගේ පුත්තුය. රදළ, ධනපතීන්ගේ හා කුලාකයින්ගේ පුතුන් රතු හමුදවට නොගත යුතුය. රතු හමුදව මෙහෙයැවීම කොමියුනිස්ට්වරුන්ට පමණක් භාර කළ යුතුය යන පණතකට ලෙනින් අත්සන් තබා ඇත.

එහෙත් හිටි හැටියේම සාර්ගේ යුධ සේනාවේ සෙන්පතියෙක්! එසේ විය හැකිද? එහෙත් මේ සෙන්පතියා ලෙනින්ගේ පරමාර්ථ කෙරෙහි විශ්වාසය තැබුවෙකි. මෙවැනි අවංක යුධ විශෙෂඥයින්ගේ ආධාරය රතු හමුදවට ලබාදීමට ලෙනින් උනන්දුවිය.

සෙන්පතියා දිග චේවැලක් ගෙන සිතියම පෙන්වමින් වාතීා කළේය.

''ඔව්, ඔව්'' යැයි ලෙනින් හිස වනමින් අනුමත කළේය. ඔහු සෙන්පතියාගේ වාතීාව අනුමත කළේ ඊයේද, පෙරේදද ඔහු අනිකුත් සහෝදරවරුන් සමග සාකච්ඡාකොට දුන් සෙන්පතියා ඉදිරිපත් කරන සැළැස්මට සමාන දෙයක් කල්පනා කළ බැවිනි. දුන් ඔහු තම සැළැස්ම සෙන්පතියාගේ වාතීාව සමග සසඳා බැලීය.

''බොහොම ලස්සන ප්‍රහාරයකට ඉඩ ලැබේවි'' යැයි සෙන්පතියා තම වාතීාව අවසානයේදී කියා සිටියේය.

''ලස්සන ගැන කොහොම වුණත් වැදගත් දෙය ජය ගැනීමයි... සහෝදරවරුන්ගේ අදහස් කොහොමද?..'' ලෙනින් අනිකුත් රතු හමුද නායකයින්ගෙන් ඇසීය.

සැළැස්ම පිළිබඳ බොහෝ වේලාවක් සාකච්ඡා කළ ඔවුහු හැම අංශයක් ගැනම සලකා බැලූහ.

තීරණය පොදුය, දුඩිය.

''අපේ තත්ත්වය භයානකය. නමුත් රතු හමුදව ජය ගත යුතුයැ''යි ලෙනින් කීවේය.

## වෙඩි නැතීම

ලෙනින්, කෲප්ස්කයා සහ මරියා උල්යානොවා කුස්සියේ වාඩිවී උදේ ආහාරය ගනිමින් සිටියහ. ලෙනින්ට ක්‍රෙම්ලිනය තුළ වෙන්කර තිබූ නිවසේ කුස්සියක්ද, ආහාර ගැනීමට කාමරයක්ද තිබුණේය. ඉඳහිට එකට වාඩිවී තේ බීමට මේ තිදෙනා පුරුදුවී සිටියහ. එවැනි අවස්ථාවලදී දෙශපාලනය ගැන කතා කිරීමද පුරුද්දකි. පිට උදවිය නැති අවස්ථාවලදී මේ තිදෙන කුස්සියට වී ආහාර ගත්හ.

එදින සිකුරාද දවසකි. සතියේ සැම සිකුරාදවකම පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෝද, මහජන කොමසාරිස් වරුන් වන

ඇමතිවරුද මොස්කව් නගරයේ කම්හල් හා පැක්ටරිවල කම්කරුවන් ඉදිරියේ කතා පැවැත්වීම සිරිතක්ව පැවතිණි. මොස්කව්හි පක්ෂ කමිටුව එදින ලෙනින්ටද කම්හලකට යන ලෙස දන්වා තිබුණේය.

හිටිහැටියේම පෙට්‍රොග්‍රාඩයේ සිට විදුලිය පණිවුඩයකි. අගමැති කාර්යාල අසල කොරිඩෝරයේ තිබුණු විදුලිය පණිවුඩ යන්ත්‍රය පැය විසි හතරේම නොකඩවා ක්‍රියා කරන බැවින් ලෙනින්ට වහාම එම පණිවුඩය ලැබිණ.

පෙට්‍රොග්‍රාඩයේ ප්‍රතිවිප්ලවවාදීන්ට එදිරිව ක්‍රියා කරන විශේෂ කමිටුවේ සභාපති උරිට්ස්කි මරා දමා ඇති බව විදුලිය පණිවුඩයෙන් කියැවිණි. විනාඩි කීපයකින් මොස්කව් කමිටුවෙන් ටෙලිපෝන් පණිවුඩයකි.

''ලෙනින් සහෝදරය, මොස්කව් කමිටුව ඉල්ලා හිටිනව අද රැස්වීමට යන්ට එපයි කියල. ප්‍රතිවිප්ලවය මිනී මරන්ට පටන් අරගෙන. අද යාම අවදානම්.''

''සහෝදරයා,යකුන්ට බය නම් සොහොනෙ ගෙවල් හදනවද?'' මෙසේ ප්‍රශ්න කළ ලෙනින් තම කාර්යාලයට ගියේය.

උරිට්ස්කි මරා දමන ලදී. ඊට පෙර බොල්ෂෙවික් නායකයෙකුවූ වොලොදර්ස්කිද මැරුම් කැවේය. කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින්ද, සෝවියට් ආණ්ඩුවේ ඇමතිවරුන්ද තනිකොට මරා දැමීමට ප්‍රති විප්ලවවාදී මිනීමරුවෝ තීරණය කළහ.

කම්කරු රැස්වීමට නොගිහින් සිටීමට ලෙනින්ට පුළුවන්ද? ඔහු කම්කරුවන්ට පොරොන්දු වී ඇත.

හැමද මෙන්ම එදිනද ලෙනින් ගෙනයාමට රියකරු ස්තෙපාන් ගිල් මොටෝරිය සමග පැමිණියේය. අද ලෙනින් රැස්වීම් දෙකක කතා කළ යුතුය. හවස ඇමති මණ්ඩලයේ රැස්වීමකි.

''ඉස්සෙල්ලා කම්කරු රැස්වීමට යනවා. පස්සෙ ඇමති මණ්ඩලයේ රැස්වීමට'' ලෙනින් කීවේය.

ගිල් හිස වැනීය:

''ලෙනින් සහෝදරය, කොහොමද විවේක නැතුව ඔහොම වැඩ කරන්නෙ?''

ගිල් ලෙනින් රියේ නංවාගෙන සෙර්පුහොව්ස්කි වීදියේ පිහිටි මිහෙල්සොන් කම්හලට ගියේය. ඔහු මීට පෙරද මේ කම්හලේ කම්කරුවන් අමතා කතා පවත්වා ඇත.

කම්කරුවෝ අත් බෝම්බ හදන විශාල වැඩ ශාලාවේ රැස්වූහ. එය මේ නොබෝද ලියෙට් ෟනන ලදී. කම්කරුවෝ ලියවන පට්ටල් අසලද, දෙරටුව අසලද රැස්වූහ. ඔවුන්ගේ මුහුණු දැඩිය, දෙනෙත් තියුණුය.

ලෙනින් කම්කරුවන් ඉදිරියේ කතා කරමින් සිවිල් යුධය ගැනද ප්‍රතිවිප්ලවවාදීන්ට එදිරිව කරන සටන ගැනද විස්තර කළේය.

කම්කරුවෝ ප්‍රතිවිප්ලවවාදීන්ට එදිරිව සටන්වලදී අත් බෝම්බ සාද පෙරමුණට යැවූහ. අවශ්‍යවුවොත් යුද පෙරමුණට යාමට වුවද කම්කරුවෝ සූදනම් වූහ.

කම්කරුවෝ තම කම්හල් හා පැක්ටරි නැවත ධනපතීන්ට භාර දීමට සූදනම් නැතිබව ලෙනින්ට දැණිනි.

ලෙනින්ට විවේක නොගෙන වැඩකිරීමට මෙතරම් ශක්තියක් ලැබෙන්නේ කොයින්දැයි ගිල් පුදුමවිය. කම්කරු පංතිය සඳ ශක්තිය ලබාදෙන යන්ත්‍රයක් මෙනි.

රැස්වීම අවසානයේදී කම්කරුවන් සමග ලෙනින් කම්හලින් පිටවිය. ගිල් මෝටෝ රියේ යන්ත්‍රය ක්‍රියා කොට ගමනට සූදනම් වූයේ ඔහු සූපරීක්ෂකාරී වූ බැවිනි. තත්ත්වය නොසන්සුන්ය. උරිට්ස්කිගේ මරණය ගැන රියැදුරු ගිල් දැන සිටියේය. ලෙනින් දූන් දූන් මොටෝරියේ වාඩි වෙතියි ගිල් නොඉවසිල්ලෙන් බලා සිටියේය... එහෙත් කම්කරුවෝ වටකරගෙන ප්‍රශ්න අසන්නට වූහ. ලෙනින් නැවත තරුණ දිවියක් ලැබූවාක් මෙන් ඔවුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්ට විය. හිටි හැටියේම වෙඩි හඬකි, ශබ්දයකි. ඒ කුමක්ද? වෙඩි තැබීමක්ද? ලෙනින්ට වහාම තේරුම් ගැනීමට බැරිවිය. වම් අත ගැස්සිණි. ඔහු බිම වැටෙන්නට විය. එවිටම වාගේ තවත් වෙඩි හඬක් ඇසිණි. බෙල්ලේ දැඩි වේදනාවක් ඇතිවිය. ලෙනින් පැත්තකට හැරෙත්ම තෙවැනි වෙඩි පහර ඔහුගේ පිටට වැදුණේය.

ලෙනින් බිම වැටී වැතිරිණි.

"ලෙනින්ව මරා දැම්මා!" යැයි පිරිස කෑගසන්නට වූහ.

කෙට්ටු ගැහැනියක් තම අත තිබූ බ්‍රව්නිග් පිස්තෝලය බිම දමා වත්තෙන් පිටවූවාය. මිනිස්සු ඒ මිනීමරු ස්ත්‍රිය අල්ලා ගැනීමට ඇ පසුපස දිවවෝය.

"ලෙනින් සහෝදරය! සහෝදරය!" ගිල් ශෝකයෙන් කෑගැසීය.

"ගෙදර!" වෙඩි පහර කෑ ලෙනින් පහත් හඬින් කී විගස කම්කරුවෝ ඔහු ඔසවා ගෙනැවිත් මොටෝ රියේ වාඩි කරවූහ. හැම දෙනම නිහඬවූහ. ලෙනින් අමාරුවෙන් ආශ්වාස ප්‍රශ්වාස කරන හඬ ඇසිණි.

ගිල් හැකිතරම් වේගයෙන් රිය පදවමින් ක්‍රෙම්ලිනයට ගියේය.

"ලෙනින් සහෝදරය, අපි සහෝදරයව උස්සාගෙන යන්නම්" යැයි ගිල් ලෙනින්ට කීය.

එහෙත් ලෙනින් ගිල්ගේ උරහිස අල්ලාගෙන අනිත් කම්කරුවන්ගේත් ආධාරය ඇතිව තමා පදිංචි තුන්වැනි තට්ටුව දක්වා පියගැට පෙළ දිගේ නගින්නට විය... ඔහුගේ කමිසය ලෙයින් තෙත්වී තිබිණි.

ලෙනින්ගේ නැගණිය මරියා උල්යානොවා ඉදිරියට දිවගොස් බියවී කෑගැසුවාය:

''වලදිමිර්! වලදිමිර්!''

''තරමක් තුවාල වෙලා... සනීප වේවි. සන්සුන් වෙන්න, මරියා! නදේෂ්දව බය කරන්න එපා!'' යැයි මාරක ලෙස තුවාල ලැබ සිටි ලෙනින් මහත් අමාරුවෙන් පැවසීය.

ලෙනින්ගේ බිරිඳ නදේෂ්ද ක්‍රෘප්ස්කයා තමාට අයත් රාජ්‍ය කාර්‍යයන් සඳහා පිට ගොස් සිටියාය.

ඇමති මණ්ඩලයේ සියලු සාමාජිකයෝ අගමැති කාර්‍යාලයේ රැස්වී සිටියහ. ලෙනින් නියම වේලාවට රැස්වීම ගැන විශාල වුවමනාවක් දැක්වූ බැවින් එදින රෑ නවයට, කලින් දන්වා තිබූ පරිදි ඔවුහු රැස්වූහ. පළමුවැනි වරට අගමැතිවරයා පමාවිය...

කොට්‍ටු සහිත සළුවකින් වසා තිබුණු ඇඳ මත ලෙනින්, සතප්පවූහ. ක්‍රෘප්ස්කයා එම සළුව ආරක්ෂා කළාය. ඔහු ක්‍රමයෙන් දුර්වල වත්ම ඔහුගේ කය සුදුමැලි විය.

කාමරයේ දොර පළු හැර තිබුණු අතර බියවූ සහ කැළඹුණු සහෝදරවරු කාණ්ඩ ගැසී ලෙනින් බැලීමට ආහ. මේ වනවිට දෙස්තරවරුද පැමිණියහ.

''ලෙනින් සහෝදරයා මරණාසන්න ලෙස තුවාල ලබා සිටිනවද?'' සහෝදරවරුන් ඇසුවේ බලාපොරොත්තු සහගතවය.

''තුවාල බොහොම බරපතළයි. මොහොම භයානකයි'' දෙස්තරවරු පිළිතුරු දුන්හ.

කාලය සෙමින් ගෙවිණි. ක්‍රෘප්ස්කයා තම කටයුතු වලින් පසුව ගෙදර ආවාය. මොකද අද දොරවල් ඇරලා? මොකද මෙතරම් පිරිසක් රැස්වෙලා ඉන්නේ?

කිසිවෙක් ඇගේ උරහිසට අතක් තබමින් ඇ සැනසූහ. ඇට කාරණය අවබෝධ විය.

''පණ තියෙනවද?'' ඇ ඇසුවාය.

කාමරය තුළින් ලෙනින්ගේ කෙඳිරි ගෑම ඇසිණි. ඇ සෘජුව, කඳුළු රහිත වියලි නෙත් වලින් ඔහු දෙසට ගමන් කළාය. ලෙනින් ඇ දෙස බලා මහත් ආයාසයකින් මඳ සිනා පාමින් මෙසේ පැවසීය:

''නදේෂ්ද, කමක් නැහැ. විප්ලවවාදීන්ට ඔහොම දේවලට මූණ පෑමට සිදුවීම සාමාන්‍ය දෙයක්. බොහොම සුළු තුවාලයක්, සනීප වේවි...''

ඔහුගේ දෙනෙත් වැසිණි. රුධිර පීඩනය පහත වැටෙන්නට විය. ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය වඩ වඩාත් අයහපත් වෙන්නට පටන් ගති.

ඇත්තටම ලෙනින් මිය යත්ද?

## අසීරු කාලය

අගමැති කාර්යාලයේ කොරිඩෝරයේ තබා ඇති විදුලිය පණිවුඩ යන්ත්‍රය ක්‍රියා කාරී විය. ටක්, ටක්, ටක්, ටක්, ටක්, ටක්. පණිවුඩ භාර ගනිති, පණිවුඩ යවති... සෙබළ ඇඳුමකින් සැරසී සිටි විදුලිය පණිවුඩ යන්ත්‍රය ක්‍රියා කරන්නා යන්ත්‍රයෙන් පිටවන ටේප් පටිය කියවන්නට විය. ඔහු එම සංඥ ඉක්මනින් පරිවර්තනය කොට කොරිඩෝරයේ අග ඇති ලෙනින්ගේ නිවෙසට දිව ගියේය.

කෘෂ්ප්ස්කයා දොර හැරියාය.

''ඉක්මනින් ලෙනින් සහෝදරයට බාර දෙන්න.'' ඈ කීවාය.

පණිවුඩ කරුවා තමාට ලැබුණු පණිවුඩය නිසා කැළඹී සිටියේ කුඩා කාමරයට ඇතුළු විය.

එහි කොටු සහිත සළුවකින් වසන ලද පටු යකඩ ඇඳක් විය. ඒ අසල ලියන මේසයකි. මේසය ළඟ වාඩිවී සිටි ලෙනින් පුවත්පතක් කියවමින් සිටියේය. ඔහුගේ වමත වෙළුම් පටියකින් බැඳ තිබිණි. ලෙනින් තරමක් කෙට්ටු වී, දුර්වල වී සිටියද වෙනත් වෙනසක් නොපෙනේ. ඔහුගේ දෙනෙත් තියුණුය, ගමන කඩිසරය.

එම විදුලිය පුවත යවන ලද්දේ රතු හමුදව විසිනි.

''ආදරනීය ලෙනින් සහෝදරය! ඔබ ලැබූ එක් වෙඩි පහරකට පිළිතුරු වශයෙන් ඔබ උපන් නගරය මුද ගතිමු. දෙවැනි වෙඩි පහර වෙනුවට සමාරාව මුදගන්නෙමු!''

''හරිම හපන්නු!'' ප්‍රීතියෙන් කෑ ගැසූ ලෙනින් නැවත දයාන්විත ලෙස මෙසේ පැවසීය: ''බොහොම ස්තුතියි! බොහොම ස්තුතියි!'' ඔහු නැවත හඩනගා විදුලිය පණිවුඩය කියවන්නට විය: ''ඔබ උපන් නගරය මුද ගත්තෙමු...'' ''අපේ හමුදව සිම්බීර්ස්ක් නගරය මුදගෙන ඇහුණද විදුලි පණිවුඩභාර සහෝදරය? නදේද්, උසස්තම ජයක් අපි ලබා ගත්තා නොවේද?''

ලෙනින් රතු හමුදවට පිළිතුරු ලිපියක් වහාම යැවීය. රතු හමුදවට තම කෘතඥතාවය පිරිනැමූ හෙතෙම සිම්බීර්ස්ක් මුදගැනීම තම තුවාල වලට මෙතෙක් ලැබුණු ඉතාම හොඳ බෙහෙත් බවද දන්වීය.

''මීට වඩා හොඳ බේතක් තවත් නැත! දැන් ඉතින් ඉක්මනට සුවය ලැබේවි.''

එය සැබෑවිය. ඊට දවස් කීපයකට පසු ලෙනින්ගේ සෞඛ්‍ය තත්ත්වය සතුටුදායක වී තිබෙන බව ''ප්‍රව්දා'' පුවත්පතේ පළවූ වෛද්‍ය නිවේදනයේ සඳහන් විය.

තම කාර්‍යාලයට ගොස් වැඩ කිරීමට ලෙනින්ට දොස්තරවරුන්ගෙන් අවසර ලැබිණි.

තත්ත්වය වඩාත් අසීරුවිය, අමාරුවිය. රතු හමුදාව සමග සටන් කොට ලෙහෙසියෙන් ජය ගත නොහැකි බව අධිරාජ්‍යවාදී යුද හවුලට අවබෝධ වූයෙන්, ඔවුහු තවත් යුද සේනා රුසියාවට එවූහ. මේ අනුව ආණ්ඩු දහ හතරක් හමුදා එවා සෝවියට් රුසියාව ආක්‍රමණය කළෝය. රුසියාව වටකරනු ලැබූ බලකොටුවකට සමාන විය.

''වට කරනු ලැබූ බලකොටුව තුළ හැම දෙයක්ම යුධමය විය යුතුයැ''යි ලෙනින් පැවසීය.

විශේෂ ශ්‍රමදාන ක්‍රමයක් අරඹන ලදී. හැම රට වැසියෙක්ම කම්හල්වල, ෆැක්ටරිවල, ආයතනවල, ගොවි පොළවල, දුම්රිය මාර්ග වල වැඩ කළ යුතුය. සෝවියට් ජනතාව රතු හමුදාවට ආධාර කළ යුතුය!

රතු හමුදාවට අවි වුවමනාය! කම්කරු සෝයුරනි අවි තනන්න! විශාල වශයෙන් අවි සාදන්න!

රතු හමුදාවට ඇඳුම් හා සපත්තු වුවමනාය. කම්කරු සෝයුරනි ඇඳුම් මසන්න! සපත්තු සාදන්න!

හමුදාවට අවශ්‍ය කමිස, කලිසම්, යට කබා, උඩ කබා ආදිය මැසීම ෆැක්ටරිවලට නොපුළුවන. මන්දයත්, අවශ්‍ය රෙදි පිළි ආදිය නැති බැවිනි. සපත්තු නිපදවීමට අවශ්‍ය හම් නැත. මේ ප්‍රශ්නය විසඳන්නේ කොහොමද? රතු හමුදාවට අවශ්‍ය ඇඳුම් ලබා දෙන්නේ කෙසේද?

ආණ්ඩුව හා පක්ෂය මහජනතාවගෙන් හිම කාලයට ඔබින ඇඳුම් පරිත්‍යාග කරන ලෙස ඉල්ලා සිටියෝය. ජනතාව තමන් සතු හිම කබා ලොම් සහිත හමෙන් කළ තොප්පි, අත් කෙටි කබා, වූලන් මේස් ආදිය පරිත්‍යාග කළහ.

ධනපති පංතිය තමන් සතු වූලන් රෙදි ලොම් කබා ආදී දේ පරිත්‍යාග නොකළේය.

''ධනපතීන් සතු අමතර හිම කබා ආදී දේ පැහැර ගත යුතුය. එක ධනපතියකුට එක හිම කබායක් බැගින් තිබුණාම හොඳටම ඇතැ''යි ලෙනින් ජෙර්සින්ස්කිට දැන්වීය. ''කම්කරුවන් තමා සතු එකම කබාය පවා පරිත්‍යාග කරනවා. ධනපතියන් ඔවුන් සතු අමතර ඇඳුම් දුන්නාවේ.''

ප්‍රතිවිප්ලවවාදීන්ට විරුඬව සටන් කරන සමස්ත රුසියානු විශේෂ කමිටුවේ සභාපති වරයා පීලික්ස් ජෙර්සින්ස්කිය. මේ කමිටුව චෙ. කා. නමින් රුසියාවේ ප්‍රසිඬ විය. මේ කමිටුවේ සාමාජිකයින් හා සේවක පිරිස හඳුන්වන ලද්දේ චෙකිස්ට් යන නමිනි. චෙකිස්ටවරු ධනපති බංගලාවලට ගොස් ධනපතීන් සතු අමතර ඇඳුම් සියල්ල රජය සතු කළහ. රතු හමුදවට අවශ්‍ය රෙදි හා ඇඳුම් යවා, වැරහැලි ඇඳ ගෙන සිටි කම්කරුවන්ට හා ඔවුන්ගේ දූ දරුවනට නොමිලේ ඇඳුම් බෙදා දුන්හ.

සෝවියට් රුසියාවේ බියජනක සතුරා වූයේ දුර්භික්ෂයයි. නගරවල ආහාර බෙදීම සලාක ක්‍රමයට කරන ලදී. දුර්භික්ෂයේ තර්ජනය එයින් නොනැවතිණි.

රට දුර්භික්ෂයෙන් බේරා ගැනීම සඳහා සෝවියට් ආණ්ඩුව දැඩි නීති පැනවීය. මේ විශේෂ නීතිය අනුව ගොවීන් සතුව තිබූ අමතර ධාන්‍ය සියල්ල රජයට භාරදෙන ලෙස දන්වන ලදී. ගොවීන්ට අයත් අමතර මස්, ධාන්‍ය, පිටි, බටර් හා තෙල් වර්ග, අර්තාපල් ආදිය රතු හමුදවට හා කම්කරු පංතියට දෙනු ලැබීය. ගොවීන්ගේ තත්ත්වය අතිශයින්ම අයහපත් වූ නමුදු කළ හැකි අන් දෙයක් නොවීය.

විදේශීය අධිරාජ්‍යවාදී රටවල් දහහතරක් සෝවියට් රුසියාවට පහර දුන්හ. ධනපතීන් හා සාර්වාදී නිලධාරීන් ප්‍රති විප්ලවවාදී හමුද සංවිධාන කොට සෝවියට් ආණ්ඩුව විනාශ කිරීමට සටන් කළහ. කුලාකයෝ හා ධනපතියෝ සෝවියට් රුසියාව තුළ ආණ්ඩු විරෝධී කැරළි ඇති කළහ. ආහාර සැඟවූහ. ආහාර ගබඩාවලට ගිනි තැබූහ. කොමියුනිස්ට්වාදීන් මරා දැමූහ. මෙවැනි බිහිසුණු බරපතළ තත්ත්වයක් යටතේ සෝවියට් ආණ්ඩුව විශේෂ හදිසි නීති පණවා රතු හමුදවේ ජය සහතික කිරීම සඳහා වැඩ කළේය. ගොවීන් සතු අමතර ආහාර පැහැර ගෙන රතු හමුදවට හා කම්කරුවන්ට බෙදා දුන්නේය. ධනපතීන්ගේ අමතර ඇඳුම් පැහැරගෙන බලපත්‍ර අනුව ඒවා කම්කරු ජනතාවට නොමිලේ බෙදා දුන්නේය. රට තුළ තිබුණේ ලොරි, බස්, හා මොටෝ රිය සීමාසහිත ගණනකි. ඒවාද පරණ වූ, අබලන්වූ යන්ත්‍ර සහිත විය. දුම්රිය හා දුම්රිය මාර්ගවල තත්ත්වයද එසේවිය. මේ හැම ප්‍රවාහණයක්ම යුඬ පෙරමුණට අවශ්‍ය අවි හා ආහාර සැපයීමටද, සේනා සැපයීමටද යොදවන ලදින්, ප්‍රවාහණ පාවිච්චි කිරීමටද බලපත්‍ර නිකුත් කරන ලදී. මේ වකවානුවේදී සෝවියට් ආණ්ඩුව අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තිය යුඬමය කොමියුනිස්ට්වාදය ලෙස ලෙනින් විසින් හඳුන්වන ලදී. එය අසීරු කාලයක් විය.

වාසනාවෙකි, ඒ අසීරු අමාරු කාලයේදී සෝවියට් ආණ්ඩුවේ නායකයාවූයේ ලෙනින්ය.

## සොකොල්නිකි සිද්ධිය

ලෙනින් වෙඩි පහරවලට ගොදුරුව, මරණාසන්න ලෙස තුවාල ලැබ සිටි කාලයේදී කෲප්ස්කයා තම බිය හා කාන්සිය සඟවාගෙන හැසිරෙන්නී, දුටුවන් මවිතයට පත් කළාය.

ලෙනින් සුවය ලැබූ විගස ඈ බරපතළ ලෙස රෝගාතුර වූවාය. පිරිසුදු වාතය ඇයට වැඩියෙන් ලබා දිය යුතු බව වෙද්දු කීහ.

ඒ කාලයේදී අද මෙන් සෞඛ්‍යාගාර නොතිබිණි. මොස්කව්හි දුර්වල ළමයින් උදෙසා සොකොල්නිකි උද්‍යානයේ පාසලක් විවෘත කළේද මේ දවස්වලදීමය. එහි අවට වාතය පිරිසුදුය.

තම රෝගයට ප්‍රතිකාර ලබාගැනීමක් වශයෙන් කෲප්ස්කයා මේ පාසලේ නැවැත්වීමට කැමති කරවා ගන්නා ලදී.

ලෙනින් නැවත දිවා රෑ නොතකා වෙහෙසී වැඩ කරන්නට පටන් ගත්තේය. අතිශයින්ම වැදගත් තීරණ ගැනීම ඔහුට භාරවිය. සමාජවාදී රජය මුල සිටම හැම දෙයක්ම ගොඩ නගන්නට වූ අතර, එහි ප්‍රධානියාවූ ලෙනින් මත පැවරුණු වගකීම විශාල විය.

හවස පැයක පමණ විවේකයක් ලැබුණු විගස ඔහු තම රියදුරු ගිල්ට මෙසේ පැවසීය:

"අපි යමු නදේෂ්ද සහෝදරිය බලන්ට, හොඳද?"

ශීත සමය වූ බැවින් මොස්කව් නගරය පුරා හිම ගොඩගැසී තිබිණි. මොස්කව්හි වීදිවල මෙසේ ගොඩ ගැසුණු හිම ගොඩවල් උසින් දෙමහල් මන්දිරයකට සම විය.

1919 ජනවාරි මාසයේ දවසක සොකොල්නිකි උද්‍යාන පාසලේ නත්තල් ගහ සහිත උත්සවය සූදනම් කර තිබිණි. මෙම උත්සවයට සහභාගි වීමට ලෙනින් පොරොන්දු විය. මරියා උල්යානොවාද කෲප්ස්කයා බැලීමට යාමට සූදනම් වූවා, ඈට කිරි බඳුනක්ද ගෙන ගියාය.

මෝටෝ රිය ගිල් පැදවූ අතර ආරක්ෂක දෙපාර්තමේන්තුවේ චෙබානොව්ද ලෙනින් කැටුව ගියේය.

එදින ඉරිදා වූයෙන් බොහෝ දෙනෙක් මහාමාර්ග වල ගමන් කළහ. හිම වැසි නිසා පළල් මාර්ග පටු අඩිපාරවල් තරම් පටු විය. හැමතැනම හිම ගොඩැලිය. ඉදිරියෙන් කිසිවක් නොපෙනේ. දක්ෂතම රියකරුවකුවූ ගිල් මිනිසුන් හා හිම ගොඩැලි අතරින් රිය පදවන්නට විය.

සොකොල්නිකි උද්‍යානයට ඇතුළුවන තැන, දුම්රිය මාර්ගය සහිත පාලම අසල මිනිසුන් තිදෙනෙක් පෙනී සිට පාර හරස් කරමින් කෑගැසූහ:

"නවත්වාපන් නැතිනම් වෙඩි තියනව!"

ගිල් ඔවුනතරින් රිය පදවාගෙන යාමට සූදනම් වුවද ලෙනින් ඔහු නැවැත්විය. ඔහු, ඔවුන් මහජන මිලිෂියා භටයින් වෙතියි සිතීය. යුධ කාලය නිසා මොටෝ රියකින් නගරයෙන් පිටවී යන්නන් පරීක්ෂාකිරීම අවශ්‍ය දෙයකි. ඔවුන් නිල ඇඳුමින් සැරසී නොසිටීම වැදගත් දෙයක් නොවූයේ, එවකට මිලිෂියා භටයිනට විශෙෂ ඇඳුම් නොතිබුණු බැවිනි.

රිය නවත්වත්ම, හැඩි දැඩි මිනිසුන් තිදෙනෙක් පිස්තෝල එල්ල කර රියේ දෙර විවර කළහ:

''එළියට බැහැපල්ලා!''

''මම ලෙනින්'' යැයි ලෙනින් කීවේය.

ඔවුන් මහජන මිලිෂියා භටයින් විය යුතු බව තවමත් ලෙනින්ගේ විශ්වාසය විය. දෙදෙනෙක් දෙපැත්තෙන් පිස්තෝල දෙකක් ලෙනින්ගේ ශංඛක වලට එල්ල කළහ. දූන් ඔහුට එම පිස්තෝලවල ලෝහ බට දූනේ. තුන්වැන්නා උද්දච්ච ලෙස ලෙනින්ගේ සාක්කු අතගා බලන්නට විය. ක්‍රෙම්ලිනයට ඇතුළු වන බලපත්‍රයත්, බ්‍රවුනිංග් වර්ගයට අයත් කුඩා පිස්තෝලයකුත්, සටහන් පොතකුත් ඔහු උදුරාගත්තේය.

ඉන්පසු පල්හොරු තිදෙන මොටෝ රියට පැන එය පදවාගෙන ගියහ. මෙය කොතරම් ඉක්මනින් සිදුවීදයත්, සිදුවන්නේ කුමක්ද යන්න වටහා ගැනීමටත් පෙර ඔවුහු අතුරුදන් වූහ.

කෝපයට පත් ලෙනින් මොහොතක් නිහඬව සිට පසුව පසුතැවිලි වූයේ මෙසේ පැවසීය:

''ලජ්ජාවකි! අපි කීපදෙනෙක් ඉඳලත්, මොටෝ රිය කොල්ලකාගෙන යාමට ඔවුන්ට ඉඩ දුන්නා.''

''ලෙනින් සහෝදරයා! මම වෙඩි නොතැබුවෙ උන් සහෝදරයට වෙඩි තියයි කියල හිතපු හන්ද'' ගිල් කීවේය.

''ඔව්. ඒක ඇත්ත. අපි සටන් නොකිරීම හරි. උන්ට අපට වඩා බලයක් තිබුණා.'' ලෙනින් ගිල් සමග එකඟ විය.

ලෙනින්ගේ ආරක්ෂාවට පැමිණි වෙබානොව් දෙස බලා ඔවුහු හඬ නගමින් සිනාසුණහ. ලෙනින් සිනාසෙන්නේ අවට අයටද තම සිනාව බෝ කරමිනි. මරියා උල්යානොවා සහ ගිල්ද ලෙනින් අනුව සිනහසුණහ. වෙබානොව් පමණක් කිරි බඳුන රැගත්වනම ගල් රුවක් මෙන් සිටියේය...

''හොරුන්ගෙන් අපට බේරාගැනීමට පුළුවන්වූ එකම වස්තුව!'' යැයි කී ලෙනින් වෙබානොව් අත වූ කිරි බඳුන පෙනවමින් සිනාසුණේය.

වෙබානොව් එක් සාක්කුවක වූ පිස්තෝලය අල්ලා ගෙන, අනිත් අතින් කිරි බඳුන රැගෙන, අනිත් යගේ විහිළුවලට භාජන වෙමින් ගමන් කළේය. ඔවුහු ප්‍රාදේශීය සෝවියට් සභා කාර්යාලයට ගියහ. එහිදී වෙනත්

මොටෝ රියකින් ලෙනින් හා මරියා උල්යානොවා පාසලට ගෙනගියහ. සිදුවූ දේ ගැන වහාම ජේර්සින්ස්කිට දන්වනලදින්, මොටෝ රිය කොල්ල කරුවන් වහාම සොයන ලෙස ඔහු අණ කළේය. ඉක්මනින්ම ඔවුන් අල්ලා ගැනීමට චෙකිස්ටවරු සමත්වූහ.

ලෙනින්ගේ පමාවීම නිසා නොසන්සුන් වූ කෲප්ස්කයා පාසලේ ඇවිදින්නට වූවාය. ඈ නිතර නිතර කවුළුවෙන් පිටත බැලුවාය.

කෙමෙන් එම නොසන්සුන්තාවය පාසලේ සිසුන්ටද පැතිර ගියේය. විනාඩි පැයවලට හැරිණි.

හිටිහැටියේම කිසිවෙක් කෑගැසූහ:

"ඇවිල්ලා!"

ලෙනින් පාසල් වත්තේ සිට පාසලට දිව ආවේය. ඔහුගේ හිම කබායේ බොත්තම් නොපියවා තිබිණි. ලෙනින්ගේ යටි රැවුළ හා ඇස් බැම් සුදෝසුදු හිමෙන් වැසිලාය. දෙකොපුල් රත් පැහැගෙන ඇත.

"හිම සීයා!" යැයි ලෙනින් දුටු ළමයි කෑ ගැසූහ.

ළමයින් සමග ගමන් කළ ලෙනින් නදේෂ්ද කෲප්ස්කයා වෙත ළං විය. පල්හොරුන්ගේ කොල්ලකෑම ගැන ඔහු ඇට නොකීමට සිතුවද, ඈ නොසන්සුන්තාවයෙන් ඔහු දෙස බලත්ම, ඔහු ඇට ඇත්ත හෙළි කළේය.

"ඔව සුළු දේවල් නදේෂ්ද, වැදගැම්මකට ඇති දේ නොවේ."

ඈ පල්හොරුන්ගේ ක්‍රියා ගැන ඇසූ විට සුදුමැලි වූවා, නිහඬව සිට පසුව පහත් හඬින් මෙසේ පැවසුවාය:

"ඔයා පණපිටින් පැමිණීම ගැන ස්තුතියි."

උත්සවය ආරම්භ විය. නත්තල් ගහ අලංකාර ලෙස සරසා තිබිණි. කොඩි, තරු, කුඩා බෝනික්කෝ ආදී දේ ළමයින් විසින් සාද නත්තල් ගසේ එල්ලා සරසන ලදී. නත්තල් ගස සීලිමට වැදෙන තරමටම උසය. නැවුම් සුවඳ හැම තැනම පැතිර ඇත. ලෙනින්ද ළමයින් සමග එකතුව සමූහ ගී ගායනය කළේය. බළලා සහ මීයා, හැංගි මුත්තන් කෙළිය ආදී ක්‍රීඩා වලට ලෙනින්ද සහභාගි විය. ළමයි සිනාසී, උඩ පනිමින්, ප්‍රීති ඝෝෂා කරමින් සතුටු වූහ. එය හැම අතින්ම නියම උත්සවයක් විය!

මීට දෙපැයකට පෙර ලෙනින් පල්හොරුන් දෙදෙනෙකුගේ කුවක්කුවලට මැදිවී මාරයාට ළංවී සිටි බැව් කල්පනා කළ කෲප්ස්කයා ඔහු දෙස බලමින් ආදරයෙන් හා උඩඟුවෙන් තොල මතුළාය. "ඔබ අභීත මිනිසෙකි. එනිසාම ඔබ ප්‍රීති වන්නෙහිය."

## මරණ බිය සහ වසංගත රෝග

1919 මාර්තු මාසයේ රැයක පෙට්‍රොග්‍රාඩ් සිට මොස්කව් බලා යන දුම්රියක ලෙනින් හා ඔහුගේ වැඩිමහල් සොහොයුරිය ආන්නා උල්යානොවාද වූහ. භූමිතෙල් පහන කණාමැදිරි ආලෝකයට සමාන විය. දුම්රිය මැදිරි සෙලවුණ අතර රෝද වල භ්‍රමණය කාන්සිය වැඩි කළේය.

ආන්නා උල්යානොවා දුම්රිය මැදිරියේ මුල්ලකට වී දුකින් තැවෙයි. ඔවුන් මොස්කව් බලා යමින් සිටියේ ආන්නා උල්යානොවාගේ සැමියාවූ මාක් එලිසාරොව්ගේ අවමඟුලට සහභාගී වීමටය.

සෝවියට් රුසියාවට එදිරිව තවත් බිහිසුණු සතුරෙක් නැගී සිටියේය. හැම නගරයකම හා ගමකත්, දුම්රිය පොළකමත් උණ සන්නිපාත රෝග බෝකරන විෂබීජ සහිත උකුණන් හා මැක්කන් බෝ විය. බොහෝ දෙනෙක් උණ සන්නිපාතයෙන් මිය ගියහ. රෝහල්, වෛද්‍යන් හා බෙහෙත් හිඟය නිසා මෙය තවත් දරුණු විය.

මාක් එලිසාරොව් රාජ්‍ය කටයුත්තක් සඳහා පෙට්‍රොග්‍රාඩයට පැමිණි විට ඔහු උණ සන්නිපාතයට ගොදුරුව මිය ගියේය. වොල්කොව් සුසාන භූමියේ සුදු පැහැති බිරියෝස්සා ගස් යට ඇති පවුලේ මිනී වළවල් දෙකට තවත් එකක් එකතු විය.

...මාක් එලිසාරොව්ගේ ජීවිතය දුක හා ප්‍රීතිය මුසු එකක් විය ලෙනින්ගේ වැඩිමහල් සොහොයුරාවූ අලෙක්සාන්දර්ගේ සගයෙකුවූ මාක්, සාර් රජු විසින් අලෙක්සාන්දර් මරා දමනු ලැබූ පසු උල්යානොව් පවුලට ළං විය. බුද්ධිමත්, දයාන්විත මාක් උල්යානොව් පවුලේ හැම දෙනෙකුටම අවශ්‍ය කිට්ටු මිතුරෙක් විය.

ඇඳිරි රැය තුළින් දුම්රිය දිව ගියේය. මාර්තු මාසයේ අඳුර අවට කැලය වසාගත්තාක් මෙනි. පිදුරු ගොඩවල් සහිත ගම් ඔස්සේ දුම්රිය දුවයි. කම්හල්වල හා පැක්ටරිවල දුම් බට ගොළුවන්සේය. එහි වැඩ කරන කම්කරු සංඛ්‍යාව එන්ට එන්ටම අඩුවෙයි. අමු ද්‍රව්‍ය හිඟයකි. තාපන බලයද නැත. කම්හල් අක්‍රියාකාරී වෙලාය. රට විනාශයට මුහුණ පා ඇත.

මොස්කව් නගරයේ තවත් විපතකි. සමස්ත රුසියානු මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපතිවර යාකොව් ස්වෙර්ඩ්ලොව් ඉස්පාන්කා (බෝවෙන ප්‍රතිශ්‍යා උණය ඒකාලයේ හැඳින්වූයේ මේ නමිනි) නමින් හැඳින්වුණු දරුණු බෝවෙන රෝගයකට ගොදුරු විය. ස්පාඤ්ඤයෙන් පැතිර ගිය මෙම වසංගත රෝගය සෝවියට් රටේද පැතිර ගියේ කුණාටුවක් මෙනි. දහස් ගණන් මරුවාට බිලිවූහ. උණ සන්නිපාතය

නිසාද දහස් ගණනින් මියගියහ. සාගතය, සිවිල් යුද්ධය. රට විනාශයෙන් විනාශයට වැටිණි. විදේශීය රටවල ධනවාදී පුවත්පත් ප්‍රීතියෙන් කෑගැසූහ: ''සෝවියට් රුසියාව විනාශයි!''

ලෙනින් දෑතින් හිස බදගත්තේය. රට මූණ පා ඇති ප්‍රශ්න බරපතළය.

ස්වෙර්ඩ්ලොව් මරණයෙන් බේරුණොත් එය වාසනාවකි. ඔහු ලෙනින් සමග වැදගත් රාජ්‍ය කටයුතු වල යෙදුණු නායකයෙකි.

''මේ වැඩේ කළ යුතුයි ස්වෙර්ඩ්ලොව් සහෝදරයා'' ලෙනින් කියයි.

එවිට, ස්වෙර්ඩ්ලොව් සන්සුන්ව පිළිතුරු දෙයි:

''දැනටමත් කරල ඉවරයි.''

''කොහොමද සහෝදරය එය ඉටු කළේ. අපි ඒ ගැන යම්තමින් කතා කළා විතරයි නොවැ'' ලෙනින් විස්මයෙන් යුතුව ප්‍රශ්න කරයි.

''යම්තමින්...'' ස්වෙර්ඩ්ලොව් මඳ සිනා පායි.

ලෙනින් හිතන දේ වටහා ගැනීමේ පුදුම ශක්තියක් ඔහුට තිබිණ. යාකොව් ස්වෙර්ඩ්ලොව් විප්ලවවාදියෙකි, බුද්ධිමත් රාජ්‍ය නායකයෙකි.

ලෙනින්ට රෝගී ස්වෙර්ඩ්ලොව් බැලීමට දොස්තරවරු ඉඩ නොදුන්හ. ඉස්පාන්කා රෝගය වසංගත රෝගයක් බැවිනි.

දොස්තර නියමය පිළිනොගත් ලෙනින් තම සගයා බැලීමට පැමිණියේය.

මේ ස්වෙර්ඩ්ලොව්ද? සුදු පැහැති ඇඳ මත වැතිරි සිටි මිනිසා ඇට සැකිල්ලකට සමානය. ඇස් හා දෙකොපුල් වෙනුවට වළ ගැසුණු, රැළි ගැසුණු ලපය. නාසය පමණකි පෙනෙන්ට තිබෙන්නේ. මුහුණ නාඳුණන මහල්ලෙකුගේ මෙනි.

ලෙනින් ඇඳ අසල වාඩිවී යටි සිතින් අයදින්නට විය: ''අවංක, දක්ෂ සහෝදරයා, නුඹ අපෙන් වෙන්වී යන්ට එපා!''

ලෙනින්ගේ මනැස ඉදිරියේ ශරීර සතිපයෙන් යුත් තිස්තුන් හැවිරිදි තරුණ ස්වෙර්ඩ්ලොව්ය. ඔහු කඩිසරය, ශක්තිමත්ය, ප්‍රිය මනාපය. අතිශයින්ම අවදානම් අවස්ථාවලදී පවා නොසැලී සටන් කළ ස්වෙර්ඩ්ලොව් යම්තමින් හෝ සැක සිතූ සැටියක් ලෙනින්ට සිහිකිරීමට පවා බැරිය. ජනතාව අමතා කතා කිරීමට ඔවුන් තුළ විප්ලවීය ආස්වාදයක් ඇති කිරීමට සමත් උපන්ගෙයි හපනෙකි, ස්වෙර්ඩ්ලොව්.

රෝගියා තරමක් තිගැස්සී දෙනෙත් හැර බැලීය. ඔහු අඩ සිහියෙනි. ලෙනින්ව හැඳිනගත් ඔහු වේදනා සහගත මඳ සිනාවක් පෑවේය. දෙතොල් යම්තමින් විවර විය. ලෙනින් වියලි දර කෝටුවක් වැනි ස්වෙර්ඩ්ලොව්ගේ අතක් අල්ලා ගත්තේය. ලෙනින් කොතරම් දුක්විඳයත්, ඔහුගේ දෑසින් කඳුලු කැට කඩා නොවැටුනා පමණකි.

ලෙනින් ස්වෙර්ඩ්ලොව් වෙතින් ඈත්වූයේ හිස පාත් කරගෙනය.

විනාඩි කීපයක් ගතවිය. යාකොව් මිහලොවිච් ස්වෙර්ඩ්ලොව් සදහටම දෙනෙත් පියා ගත්තේය.

සෝවියට් රජය ගොඩනැගීම සඳහා අභීත සටනක් කළ මුල් කාලයේදී තමාට හැම අතින්ම ආධාර උපකාර කළ ස්වෙර්ඩ්ලොව් ලෙනින් කිසිදිනක අමතක නොකළේය.

...දවස් ගෙවිණි. සෝවියට් රජය ආරක්ෂා කළ යුතු විය, ශක්තිමත් කළ යුතු විය.

සමස්ත රුසියානු මධ්‍යම කෘත්‍යාධිකාරී කමිටුවේ සභාපති ධූරයට ලෙනින් මිහයිල් ඉවානවිච් කලිනින්ගේ නම යෝජනා කළේය.

කලිනින් ත්වෙර්ස්ක් ගුබෙර්නියාවේ ගොවියෙකුගේ පුතෙකි, පිටර්බුර්ගයේ කම්හල් කීපයක වැඩකළ කම්කරුවෙකි. යෝජනා කළ යුත්තා ගැන ලෙනින් දැන සිටියේය. හොඳ කොමියුනිස්ට්වාදියෙකුවූ කලිනින් උසස් ගුණයෙන් හෙබී කෙනෙකි. බුද්ධිමතෙකි. මිනිස්සු ඔහුට ඇලුම් කළහ.

## "වැඩකරන ජනතාවගේ පුත්‍රයා..."

නවීනතම අවි වලින් සැරසුණු අධිරාජ්‍යවාදී හා දේශීය ප්‍රතිවිප්ලවවාදී හටසේනා දසලක්ෂයක් සෝවියට් රුසියාවේ අගනුවර දෙසට පැති හයකින් ළංවූහ. අයෝමය වළල්ලක්මෙන් කවාකාරව මොස්කව් දෙසට ළංවූ සතුරු හමුද පෙර නොවූ විරූ ලෙස නගරයට තර්ජනය කළහ.

මැයි මාසයේ එක් දවසක මොස්කව් නගරයේ ජනතාව මහත්සේ යුහුසුලු විය. අරුණෝදයේ සිටම කම්හල් හා පැක්ටරි අසල රැස්වූ කාන්තාවෝ එක්තරා බියකින් පසුවූවෝ, යම්කිසිවක් බලාපොරොත්තුවෙන් පසුවූහ. දූ දරුවෝ තම මව්වරුන්ගේ අතේ හෝ රෙදි පොටේ හෝ එල්ලී සිටියහ. මොස්කව්හි කම්කරු දරු පැටවුන් බෙලහීනය, ඔවුන්ගේ මුහුණු කෙට්ටුය, කඩදසියක් මෙන් සුදු පැහැතිය, හෘමතේ සිටි ඔවුන්ගේ නෙත් දිලිසිණි.

කම්හල්වල දොරවල් හරිනලදී. සෙබළ කබා හෝ පුළුන් පුරවා මසන ලද කබා හෝ ඇඳගත්, ගමන් මලු හා තුවක්කු රැගත් කම්කරුවෝ කම්හල් වලින් පිටවූහ.

"පෙළ ගැසෙන්!" හමුද නායකයෝ අණ දුන්හ.

රතු හටයෝ පෙළ ගැසුණහ. මොවුන් යුධාභ්‍යාසවල යෙදීමට පටන් ගත්තේ මේ නොබෝදය. පෙළ ගැසීම් වැනි දේ එතරම් හොඳින් නොකළද ඉලක්කය බලා වෙඩි තැබීමට හොඳින් උගත්හ.

"රතු චතුරශ්‍රයට ගමන් කරව්!"

මොස්කව් නගරයේ හැම දෙසකින්ම සේනාංක රතු චතුරශ්‍රය බලා ගමන් කළහ.

රතු හා සුදු ලේන්සු බැඳගත් ගැහැනු ගමන් මලු රැගෙන රතු භටයින් ළඟින් ගමන් කළහ. ඔවුහු තමන්ගේ සැමියන්, පුතුන් සොය සොයා ආහාර මලු ඔවුන්ට දුන්හ.

මව්වරු අඩමින් කෑගැසූහ:

"වාස්යා, මගේ පුතේ! ධනපති වෙඩි වලින් නුඹව දෙවියෝ ආරක්ෂා කරත්වා!.."

ලජ්ජාවට පත්වුණු රතු භටයෙක් වට පිට බැලීය:

"අම්මා මාව මහජනය ඉදිරිපිට ලජ්ජාවට පත් කළා.. දෙවියන්ගෙ පිහිට ඉල්ලනවා. නිර්ධන පංති හැඟීම අමතක කළා!"

කම්කරු කවියෙක් ගෙතූ ගීයක් තරුණ කොමියුනිස්ට් කම්කරු භටයෝ ගයමින් එඩි පෑහ.

රාජාණ්ඩු භංගවේවා!
පූජකයින් භංගවේවා!
දෙව්ලොව අපි අල්ල ගනිමු.
හොර දෙවියන් පන්නා දමමු.

රතු සේනාංක අතරට වැදුණු කොල්ලෝ විහිළු තහළු කරමින් වහසි බස් දොඩමින් ගමන් කළහ:

"අපේ තාත්තා ළඟ තුවක්කුවක් තියෙනව. ඕ ඒකෙ තරම..."

"අපි නොදකපු තුවක්කු, අපේ තාත්තා ළඟ තියෙනව මැෂින් තුවක්කු පතොරම් පටියක්. ධනපතින්ට බැට වදින්නෙ ඒකෙන් තමා!"

"අර බලපන් අපේ තාත්තගෙ පටිය වටේ අත් බෝම්බ. දනපතින්ට දේව් බැටේ!"

"වැඩකරන ජනතාවගේ පුත්‍රයකුවූද, සෝවියට් ජනරජයේ පුරවැසියකුවූද, මම කම්කරුවන්ගේ හා ගොවීන්ගේ හමුදාවේ සෙබළෙක් වෙමි..."

එම දිවුරුම ප්‍රෞඪය, උසස්ය! එය කියවන විට හදවත ගැස්සේ. ලෙනින්ගේ හදවතද එලෙසම උණුසුම් ලෙස ගැසෙන්නට වූයේ, මීට වසරකට පෙර සෝවියට් සමාජවාදී ජනරජයේ අගමැතිවරයා ලෙස දිවුරුම් දුන් අවස්ථාවේදීය. මේ වර ලෙනින්ද මිහෙල්සොන් කම්හලේ කම්කරු සෙබළුන් සමග එක්වී රතු හමුද සෙබළ දිවුරුම දුන්නේය. "කම්කරුවන්ගේ

හා ගොවීන්ගේ ආණ්ඩුව අණකළ විගසම මම සෝවියට් ජනරජය රැකීමට ඉදිරිපත්වන බවට දිවුරා පොරොන්දු වෙමි.''

ලෙනින් පක්ෂ නායකයින් සමග කල්පනාකාරී ලෙස රතු චතුරශ්‍රයට ගමන් කළේය.

රතු චතුරශ්‍රය ජනයාගෙන් පිරී තිබිණි. ඉඳ හිට කැකෝ ගැසීමද ඇසිණි. දස දහස් ගණනක් බයිනේත්තු ඔසවමින් කැගසන සෙබළුන් ලෙනින් දුටුවේය. වානේමය බයිනේත්තු හිරු රැස් නිසා ළෙලදිණි. ගැහැණු තම සැමියන්, පුතුන් හා සොහොයුරන් කෙරෙන් ඈත් නොවූහ. බොහෝ රතු හමුද භටයෝ තම බිරියන් සිප වැළඳගෙන, දූ දරුවන් සනසමින් සමුගන්නා සැටි ලෙනින් දුටුවේය.

රතු හමුදවට අයත් සේනාංකද, යුධාභ්‍යාස වලට සහභාගීවූ කම්කරු සේනාංකද මෙහි රැස්ව උන්හ.

පසුගිය අවුරුද්දේදී ලෙනින් විසින් අත්සන් තබන ලද සෝවියට් ආණ්ඩුවේ පණතක් අනුව, සෑම කම්කරුවෙක්ම යුධාභ්‍යාසවලට සහභාගි වී, ඉලක්කයට වෙඩි තැබීමට ඉගෙන ගෙන, සෝවියට් ජනරජය රැකීමට ඉදිරිපත් විය යුතුය. රට එතරම්ම අවදනමකට මූණ පා ඇත.

එවකට කතා මණ්ඩප නොතිබිණි. පරණ ලොරියක් වටේ රතු රෙදි ඔතා, ලෑල්ලක සටන් පාඨ ලියන ලදී. ''දුෂ්ට රදළ ධනපති හොර මුල පරාජය කරමු!''

ලෙනින් සෙන්පති සමග බල සේනා පිරික්සා බලා ලී ඉණිමග ඔස්සේ ලොරියට නැංගේය.

ඔහු ඉදිරියේ මහා බල කායකි. දස දහස් ගණනක් කම්කරුවෝ තුවක්කු රැගෙන සිටිති.

හැම එකකුම දෙම්නසින් හා සොම්නසිනි, බලාපොරොත්තුවෙනි, ආලයෙනි. මේ හැම කම්කරුවෙක්ම සහ භටයෙක්මත් සෝවියට් ආණ්ඩුවේ පළමුවැනි ආයාචනයට කන් දී සිවිල් යුධයට සහභාගි වූහ.

ලෙනින් කතා කළේය.

ජනතාව නිහඬ විය.

ඉස්සර යුද සෙබළා සාර් රජුව සහ ධනපතීන්ව ආරක්ෂා කිරීම සඳහා සටන් කළ නමුදු දැන්, රතු සෙබළා තමාත්, තමන්ගේ අඹු දරුවනුත්, දෙමාපියනුත්, තම රජයත් රදළ ධනපති හතුරන්ගෙන් ආරක්ෂා කරන බව ලෙනින් පැහැදිලි කළේය. ඔහුගේ කතා විලාසය චාම්ය. සිත් ඇදගන්නා සුලුය. රතු චතුරශ්‍රයට රැස්වූ හැම රතු සෙබළෙක්ම කල්පනා කළ දේ ගැන ඔහු කීවේය. ඔවුන්ගේ බිරියන් සිතූ දේ ඔහු කීවේය. ගැහැණු

නොහැඩු නමුදු තම ගෙල දැතින් බද ගත්හ. ඔවුන්ගේ මුහුණු සුදුමැලි වෙලාය.

රැස්වීමෙන් පසු රතු සේනා කෙළින්ම දුම්රිය පොළවලට ගොස් යුද පෙරමුණු බලා පිටත්ව ගියහ.

## මහජන දේපොළ

අගමැති කාර්‍යාලයේ සේවක පිරිස සංඛ්‍යාවෙන් සුළුවිය. හැම කෙනෙකුටම වැඩ බොහෝ විය. එහෙත් හැම දෙනෙක්ම තම වැඩට ඇලුම් කළ අතර ආශාවෙන් එය ඉටු කළහ. ලෙනින් තම සේවක පිරිසට ගරු කළේය.

''පුංචි මාළුවෙක් ලොකු කැරපොත්තෙකුට වඩා වටිනවා'' යැයි ලෙනින් කියමින් විහිළු කළේය.

''අපි පුංචි මාළු'' අගමැති කාර්‍යාලයේ සේවක පිරිස ඔහුට කීහ.

''පුංචි වුණත් බොහොම වටිනා මාළු,'' ලෙනින් පිළිතුරු දුන්නේය.

ඇමති මණ්ඩලයේ රැස්වීමට නියමිත වේලාවට විනාඩි පහකට කලින් ලෙනින් තම කාර්‍යාලයට පැමිණියේය. ඔහු හැමදම වේලාසනින් පැමිණීමට පුරුදුව සිටියේය. ඔහු තම අසුනේ වාඩිවී නොයෙකුත් ලියවිලි හා විදුලි පණිවුඩ කියවා බලන්නට විය. ඇමතිවරු පැමිණ දිගැති කොළ පාට මේසය වටා වාඩිවෙන තුරු අගමැතිවරයා අවශ්‍ය දේ කියවා බැලීය. සමහර ලියවිලිවලට අත්සන් තැබීය. තවත් සමහර ලියවිලි කියවීම කල් තැබීය. අත්සන් තැබූ ලියවිලි ලේකම් තැනට භාර දුන්නේය. රැස්වීම අරඹන බව පවසන ලදී.

හැම ඇමතිවරයෙක්ම නියමිත වේලාවට රැස්වීමට පැමිණියහ. කිසිවකු පමාවීමට අකැමැතිවූයේ ඔහු විනය කඩකිරීමට අසුවෙති යන බියෙනි. නැතිනම් ඔහුට විරුද්ධ චෝදනාවක් සම්මත කරනු ඇත. අගමැතිවරයා පමාවන අයට කරුණාව නොපෙන්වීය.

''පටන් ගනිමු''යි ලෙනින් පැවසීය.

ආහාර ඇමැති කාර්‍යාලයේ වගකිව යුතු නිලධාරියෙක් ආහාර තත්ත්වය ගැන වාර්තා කළේය. රජය සතු හැම ආහාර ද්‍රව්‍යයක්ම නිවැරදි ලෙස අන්තිම රාත්තල් බාගය දක්වා මැන බලා, ගැන බලා තිබෙන බව කී ඔහු වැඩ කරන ජනතාවට දිය හැකි පාන්, ලුණු හා තෙල් වල ප්‍රමාණය මේ යැයි පැවසීය.

බොහොම අඩුයි. ළමයින්ට තරමක් වැඩියෙන් දුන්නත් බොහොම අඩුයි.

''තනිවී ඉන්න මහලු අයව අමතක කරන්න එපා!'' ලෙනින් පැවසීය.

අගමැතිගේ ඉල්ලීම ගැන පවා ආහාර අමාත්‍යාංශයේ වාර්තාකරු නිහඬ වී නම් ආහාර තත්ත්වයේ හැටි අවබෝධ කරගත හැකිය.

''තනිවී ඉන්න මහලු උදවිය අමතක කරන්න එපා!'' ලෙනින් නැවත වරක් කීවේය. ''ඒ අය ගැන අපි, සෝවියට් ආණ්ඩුව සලකන්නේ නැතිනම් කවුද සලකන්නේ? ඔව්. ඔව්! අපි දුප්පත් තමා. නමුත් කොහොම හරි මගක් සොයාගන්න ඕන'' ඔහු වැඩි දුරටත් කීවේය.

ආහාර ඇමති අලෙක්සාන්දර් ට්සුරුපා තමාගේ අදහස ගැන කුමක් කියත්දැයි සිතූ ලෙනින් ඔහු දෙස බැලීය. ලෙනින් ට්සුරුපා හඳුනන්නේ සයිබීරියාවේ පිටුවහලේ සිට පැමිණි කාලයේ සිටය. ඔහු උපුල්වන් නෙත් ඇති, රන්වන් කෙස් කැරළි සහිත ප්‍රීතිමත් පුද්ගලයෙකි. ලෙනින් ඔහු සමග මිතුරුවූයේ බොහෝ කලක සිටය.

අලෙක්සාන්දර් ට්සුරුපාගේ බාහිර පෙනුම නොව ඔහුගේ විප්ලවවාදී පන්නරය නිසා ඔහු නායකයෙක් විය. ඔහු ඉතා දක්ෂ ඇමතිවරයෙක් විය ට්සුරුපා වැනි දක්ෂ ඇමතිවරයෙකු සමග කටයුතු කිරීම ලෙනින්ට පහසුවූයේද මේ නිසාය.

ලෙනින් ට්සුරුපා දෙස මහත් ඕනෑ කමකින් බැලීය. ඔහුට කුමක්වීද? ඔහු කොතරම් කෙට්ටුවීද? ඔහුගේ මුහුණේ ලේ බිඳක්වත් නැත. එතරමටම ඔහු සුදුමැලිය.

''කොතරම් විශාල සාගතයක්ද! ආහාර ඇමති ට්සුරුපා පවා කෙට්ටු වෙලා, හාමතේ'' ලෙනින් සිතීය.

ලෙනින් වාර්තාවට සවන්දෙන අතර කඩදාසියක් ගෙන ට්සුරුපා වෙත සටහනක් ලියුවේය. මහජන දේපොළ ගැන වඩාත් සැලකිලිමත්ව, එය ආරක්ෂා කළ යුතුයැයි ලෙනින් ඔහුට දැන්වීය.

ට්සුරුපා එය කියවා මද සිනා පෑවේය. රජය වෙනුවෙන් බොහෝ වෙහෙස දරා වැඩ කරන අය ලෙනින් හැඳින්වූයේ මහජනයා සතු දේපොළ හෙවත් රජය සතු දේපොළ හැටියටය. හැම දෙනෙක්ම මේ දිනවල කුසපුරා ආහාර නොගන්නා බවත්, හාමතින් සිටින්නේ තමා පමණක් නොවන බවත්, තත්ත්වය යහපත් වනතුරු ඉවසා සිට, පසුව කුසපුරා ආහාර ගත හැකි බවත් ලෙනින්ට දැන්වීමට ට්සුරුපාට සිත්විය.

ආහාර අමාත්‍යාංශයේ නිලධාරි තැන තම වාර්තාව කියවා අවසාන වූ බැවින්, ලෙනින්ට පිළිතුරු සටහනක් නොලිව් ට්සුරුපා ආහාර ප්‍රශ්නය ගැන උපදෙස් දීමට හා තම අදහස් කීමට අවසර දෙන ලෙස ඉල්ලමින් නැගිට සිටියේය. එහෙත් එවිටම වාගේ ඔහු සිහිසන් නැතිව බිම ඇද වැටුණි. ලෙනින් වහා නැගිට ඔහු වෙත දිව ගියේය:

''ට්සුරුපා සහෝදරයා, ඔබට මක්වුණාද?''

ආහාර ඇමති වසුරුපා උඩුබැලි අතට වැටී දැත් දෙපැත්තට විදහාගෙන සිටියේය. ළඟ සිටි ඇමතිවරයෙක් වහාම දෙස්තරට ටෙලිපෝන් කළේය. තව ඇමතිවරයෙක් වීදුරුවකට වතුරගෙන ඔහුගේ මුහුණට ඉස්සේය. ඔහු අත් පා සොළවා ගැඹුරු ලෙස ආශ්වාස කළේය. ඔහුට සිහිය ලැබුණු විට, ඔහු පුටුවක වාඩි කරවන ලදී. ඔහු ලජ්ජාවට පත්වී, ලේන්සුවක් ගෙන මුහුණ පිසදගෙන වරදක් කළ එකකු මෙන් මෙසේ පැවසීය:

"මදැ මා කළ වැඩක හැටි. රැස්වීම කඩාකප්පල් කළා!"

"ආහාර ඇමති හාමතින් සිහි නැතිව වැටෙනවා. අපේ තත්ත්වය එතරම් භයානකයි. කොහොම වුණත් මහජනයා සතු දේපොළ රකින්ට ඕන. අද හාමත්වී ඇදවැටුණු මහජන දේපොළ සම්පූර්ණයෙන්ම ප්‍රකෘතිමත් කිරීම සඳහා යැවිය යුතු යැයි මා යෝජනා කරනවා," ලෙනින් පැවසීය.

## මැයි දින උත්සවය

උදැසනින් අවදිවූ ලෙනින්, තම බිරිඳට හා නැගණියට බාධා නොවන සේ සාලය මැදින් ගමන් කොට කුස්සියට ගියේය. අද ඔහු ඇඳ සිටියේ පරණ කබායක් හා කලිසමකි. ටයිපටියද පැළඳ නැත.

කුස්සියේ කේතලය වාෂ්ප පිටකරමින් හඬ නැගීය. එය අසල තවත් භට්ටියකින් අල තැම්බෙන සුවඳ වහනය විය. ලෙනින්ගේ ක්‍රෙම්ලින් නිවසේ වැඩ වලට උදවුවූයේ, 1906 සාර් රජු විසින් එල්ලා මරාදමන ලද කම්කරු නායකයෙකු වූ ඉවාන් බාබුෂ්කින්ගේ ඥාති සොහොයුරියක්වූ සාන්යාය.

"ලෙනින් සහෝදරය, අද වැඩට යන්න ලෑස්ති වෙලාද"යි ඇසූ සාන්යා පුදුම වූවාය.

"ආ මේ මොනවාද?" ලෙනින් ඇසුවේ කපටි මඳ සිනාවක් ආරූඪ කර ගනිමිනි. ඔහු නටන වතුර සහිත කේතලය හා තැම්බෙන අල බඳුන පෙන්වමින් "මේ මොනවද? ඇයි මට අද උදෙන්ම තේ ලෑස්ති කළේ? කොහොම වුණත් සාන්යාට ස්තුතියි. මා සමග වාඩිවී තේ බොන්නැ"යි ඇට ඔහු ආරාධනා කළේය.

ලෙනින් රුචියකින් ආහාර ගත්තේය. සාන්යා ලෙනින්ගේ කෝප්පයට උණු තේ වත්කරමින් තවමත් විස්මය පත්වූවාය:

"ලෙනින් සහෝදරයා, ඔහෙට අයිති වැඩක් නොවේ, ශ්‍රමදානය. ඔහෙ බුද්ධියෙන් වැඩ කරන කෙනෙක්."

"දවසක් කය වෙහෙසා වැඩ කිරීම සෝවියට් රජයට අවශ්‍ය වෙලා තිබෙනවා නම්" ලෙනින් ප්‍රශ්න කළේය.

ඔහු ඉක්මනින් ආහාර ගෙන ක්‍රෙම්ලින් වත්තට ගියේය. උදෑසන ප්‍රණීතය, පිරිසුදුය. දළු ලියලා එන අත්තකට සුළං පහරක් වැදුනෙන්, ළපටි කොළ ලෙලදෙන්නට විය. නිල්වන් අහසේ සුදු පැහැති වළාකුළු පාවී ගියේය.

ක්‍රෙම්ලින් කොටුව තුළ වෙනදට වඩා ජනයා පිරිලාය. විශාල උද්යෝගයකි. ක්‍රෙම්ලිනයේ යුධාභ්‍යාස වල යෙදී සිටියහු චතුරශ්‍රයට රැස්වූහ. සමස්ත රුසියානු කෘත්‍යාධිකාරී කමිටුවේ සේවකයෝද මෙහි පැමිණියහ.

එදින මැයි මස පළමුවැනිදය.

මැයි දින උත්සවය හා පෙළපාලි වෙනුවට ශ්‍රමදාන දිනයක් ඇති කළ යුතුයැයි පක්ෂය ආයාචනා කළේය.

මීට අවුරුද්දකට පෙර මොස්කව්-කසාන් දුම්රිය පොළේ කම්කරුවෝ සෙනසුරාද වැඩ හමාර කිරීමෙන් පසුව ගෙවල් බලා නොගොස්, තම වැඩ පොළවලම නැවතී දුම්රිය යන්ත්‍ර හතරක් හා දුම්රිය මැදිරි දහසයක් නොමිලේ අළුත් වැඩියා කළෝය. මේ ගැන ලියූ ලෙනින් එය "ශ්‍රේෂ්ඨ උනන්දුව" වශයෙන් හැඳින්විය. කොමියුනිස්ට්වාදී ශ්‍රමය යනු නොමිලේ සිය කැමැත්තෙන්ම ඉටු කරන ශ්‍රමය බව ඔහු පෙන්වා දුන්නේය.

1920 මැයි දින උත්සවය වෙනුවට සමස්ත රුසියානු ශ්‍රමදානයක් සංවිධාන කරන ලදී. රුසියාවේ හැම නගරයක, ගමක හා නියම්ගමක මිනිස්සු සිය කැමැත්තෙන්ම ඉදිරියට විත්, නොමිලේ වැඩ කළහ. පොදු ජන ප්‍රයෝජනයට අවශ්‍ය වැඩ ඔවුන් විසින් කරන ලදී.

ක්‍රෙම්ලිනයේ යුධාභ්‍යාස ලබන සිසුවෝ යෝධ පැරණි කාලතුවක්කුව අසල රැස්වූහ. ලෝහමය යෝධ කාලතුවක්කුව යකඩ මැස්සක් උඩ තබා ඇත. ඒ ළඟ යෝධ වෙඩි උණ්ඩය. මේ කාලතුවක්කුවෙන් කිසි කලෙක වෙඩි තබා නැතද, පැරණි අවි ශිල්පීන්ගේ විස්මයජනක නිර්මාණය සතුරන් බිය ගැන්වීය. එය කෞතුක වස්තුවක් ලෙස ක්‍රෙම්ලින්හි තබන ලදී.

පෙළ ගැසී සිටින යුධාභ්‍යාස සිසුනට කතාකළ නායකයා කළ යුතු වැඩ ගැන විස්තර කළේය. ක්‍රෙම්ලින් චතුරශ්‍රයේ දමා ඇති ලී කඳන්, කුණු රොඩු, ගොඩගැසී ඇති සුන් බුන් සියල්ල ඉවත්කොට, චතුරශ්‍රය මනාලෙස පිරිසුදු කළ යුතුය.

මේ අතර ලෙනින් පැමිණියේ තමාට සුපුරුදු ඉක්මන් ගමනිනි. පරණ කලිසමක් හා කබායක් ඇඳ සිටි සෝවියට් අගමැතිවරයා කම්කරු කැප් තොප්පියක් පැළඳ සිටියේය. ඔහුගේ පෙණුම වෙනද මෙන්ම ගැඹුරු වුවද, දෙනෙත් ප්‍රීතියෙන් දිලිසිණි.

සෙබළෙකු සේ ඍජුව සිටගත් ලෙනින් නායකයාට වාර්තා කළේය:

''ඔබගේ අණ පිළිපැදීමට මම සූදනම්. ශ්‍රමදාන ව්‍යාපාරයට මා බඳවා ගන්න.''

''දකුණු කෙළවරේ සිටගන්නැ''යි නායකයා අණ කළේය.

වේලාව දන්වමින් ක්‍රෙම්ලින් ඔර්ලෝසුවේ රිදීවත් හඬ පැතිරිණි. ගීත වාදකයෝ වාදනය ඇරඹූහ.

මිනිස්සු සතුටු සිතින් වැඩ පටන් ගත්හ. ගීත වාදනයද, හිරු රැස්ද ඔවුන් පුබුදුවා ලීය. යුධාභ්‍යාස සිසුන් වඩාත් ප්‍රීතිවූයේ ලෙනින් ඔවුන් සමග එකතුව වැඩ කරන බැවිනි.

බරැති ලී කඳන් හයදෙනා බැගින් එකතුව ගෙනයන්නට වූහ. ලී කඳන්වල මහත කොටස උස්සාගෙන යාමට නිතරම ලෙනින් ඉදිරිපත් වන සැටි දුටු සිසුහු ඔහුට මෙසේ කීහ:

''ලෙනින් සහෝදරයා, ඔය තරම් බර වැඩ කරන්ට සහෝදරයට ඉඩ දෙන්ට බැහැ.''

''තමුසෙලට බර උස්සන්ට පුළුවන් නම්, මට බැරි ඇයි?'' ලෙනින් ප්‍රශ්න කළේය.

''ලෙනින් සහෝදරය ගෙදර යන්න. අපි ඉතිරි වැඩ කරන්නම්'' ඔවුහු ඔහු කැමති කරවා ගැනීමට වැර දැරූහ.

''ඒව හරියන්නෙ නැහැ. තමුසෙල කිව්වට මම වැඩකිරිම නවත්වන්නේ නැහැ.''

''සහෝදරයට වයස අවුරුදු පනහක් නොවැ'' එකෙක් කීවේය.

ලෙනින් මෙසේ වැඩකිරීම ගැන එක් සිසුවෙක් අමනාප විය. අනිත් සිසුන් ලෙනින් සමග කතා කරන්නේ ඔහු සෝවියට් රජයේ අගමැති බව අමතක කරමින්, සොහොයුරෙකු හෝ කම්කරුවෙකු හැටියට සලකමිනි.

ලෙනින් ඔවුන් දෙස බලා දබරැඟිල්ල දිගු කොට සිනාසී මෙසේ පැවසීය:

''මා තමුසෙලට වැඩිමල් නම් මා සමග වාද කරන්න එපා.''

තමා සහ තම බිරිඳ සයිබීරියාවේ ෂුෂෙන්ස්කොයෙ ගමේදී පැවැත්වූ මැයිදින උත්සවය ගැන ලෙනින්ට මතක් විය. අනිකුත් දේශපාලන සිරකරුවන් සමග පාළු පිටියක රැස්වූ ඔවුහු රතු කොඩියක් සිටුවා මැයි දින ගීත ගැයූහ.

මැයි දිනයට ජයවේවා!
ජනතා දුක නැතිවේවා!
සාදුක හඳුණන හැමදෙන පිබිදෙව්!
ධනපති යදමින් රට දූය මුදවව්!

එද සයිබීරියාවේදී ලෙනින් අනාගතය ගැන සිතුවේය...

ඒ අනාගතය දැන් උදවී ඇත. ජනතාව නිදහස්ය, ඔවුහු තමන් සඳහාම

වැඩ කරති. රතු හමුදව හැම පෙරමුණකම සතුරාට පහර දීමට පටන් ගෙන ඇත. ඉක්මනින්ම විදේශීය සතුරු හමුද හා දේශීය ප්‍රති විප්ලවවාදී හමුද රටින් පන්නා දමනු ඇත.

දවසේ ශ්‍රම දනය අවසන් කොට ලෙනින් ගෙදර පැමිණියේ දහඩියෙන් තෙත්වුණු කමිසයක් සහ කැඩුණු සපත්තුවක් සහිතවය.

''ඔයා සපත්තුවක් කඩාගෙන'' කෘෘප්ස්කයා පැවසුවාය.

ඇ ලෙනින්ට පිරිසුදු ඇඳුම් ගෙනෙන්නට ගිය විට, ඔහු කුස්සියේ වතුර පයිප්පයට හිස අල්ලාගෙන, හිසත්, බෙල්ලත්, පිටත්, පපුවත් සෝදන්නට වූයේ වතුර බිංදු දසත විහිදුවමිනි.

පසුව ලෙනින්ගේ කබායට රතු පටියක් අල්ලා මැසූ කෘෘප්ස්කයා ඔහුට ඇඳුමක් පිළියෙළ කොට දුන්නාය. ලෙනින් අළුත් ඇඳුම් කට්ටලයකින් සැරසී කාල් මාක්ස්ට සිහිවටණක් තැනීමට මුල්ගල තැබීමේ උත්සවයට සහභාගිවීම පිණිස රතුහල් චතුරශ්‍රයට ගියේය. මුල්ගල තැබූ සෝවියට් අගමැති වරයා රැස්ව සිටියවුන් අමතා කතාවක් කොට, ''විමුක්තිකාමී ශ්‍රමය'' සිහිකිරීමේ සිහිවටණයක් සඳහා මුල් ගල තැබීමේ උත්සවයකටද සහභාගි විය. එහිදීද ඔහු කතාවක් කළේය.

හවස තවත් රැස්වීම් තුනක කතා කළ ලෙනින් කම්කරු මාලිගයට පැමිණියේය. 1920 මැයි 1 ද මොස්කව්හි කම්කරු මාලිගයක් විවෘත කරන ලදී.

එදින පැවැත්වුණු ශ්‍රමදන ව්‍යාපාරය සාර්ථක වීම නිසා ලෙනින් ප්‍රීතිවිය. නව සිහිවටණ හා නව සංස්කෘතිය නිසා ඔහු මහත්සේ සතුටු විය.

ලෙනින් කායික වශයෙන් වෙහෙසට පත්ව සිටියද, මානසික වශයෙන් මහත් සේ ප්‍රීතියට පත්විය.

## කොමියුනිස්ට් තරුණ සංවිධානය

කොමියුනිස්ට් තරුණ සංවිධානයේ සාමාජිකයෝ නිර්භය, පුරෝගාමී තරුණයින් බව හැම දෙනම දනිති. ජනතාවගේ සුබ සිද්ධිය සඳහා වැඩකරන පක්ෂය අතිශයින්ම අවදනම් සහිත පෙරමුණුවලට යැව්වේ පුරෝගාමී කොටස්ය. හැමදම කොමියුනිස්ට් තරුණ සංවිධානය ඉදිරියෙන් ගමන් කළේය.

මූකලන් කැලෑ මැදින් නවමාර්ග සෑදිය යුතු විය. පෙරමුණ ගෙන ක්‍රියා කළේ කවුද? කොමියුනිස්ට් තරුණ සංවිධානයයි. යුධය පැමිණි විට නොසැලී, අභීත ලෙස සටන් කළේද තරුණ කොමියුනිස්ට් වරුන්ය.

සිවිල් යුධ කාලයේදී දස දහස් ගණන් වික්‍රමවලට මුල්වූවෝද ඔවුහුය.

සයිබීරියාවේ, උක්‍රයිනයේ, ක්‍රිමියාවේ, වොල්ගා අසල පෙදෙසේ, කුර්ස්ක් හා පෙට්‍රොග්‍රාඩ් අසල මහ සටන්වලදී දස දහස් ගණන් තරුණ කොමියුනිස්ට් භටයෝ වීරෝදාර ලෙස සටන් කොට අභීත ලෙස දිවි පිදූහ...

ලෙනින් පැන්සලය පසෙක තැබීය. ඔහුගේ අත් අකුරු සිහින්ය, උසය. කොමියුනිස්ට් තරුණ සම්මේලනය ඉදිරියේ කතාවක් කිරීමට ඔහුට ආරාධනා කර ඇති බැවින් ඔහු කතාවේ සැලැස්මක් පිළියෙල කළේය.

සමස්ත රුසියානු කොමියුනිස්ට් තරුණ සම්මේලනය පිහිටුවා අදට අවුරුදු තුනකි. එහි තෙවැනි සම්මේලනවාරය අද පැවැත්වෙන අතර එහි ප්‍රධාන කතිකයා සෝවියට් අගමැති වී. අයි. ලෙනින්ය. ඔහු තරුණ කොමියුනිස්ට්වරුන් ගැන මහත් සතුටින් කල්පනා කළේය. ඔවුන් ප්‍රෞඪය, දූඪය. කම්කරුවන්ගේ හා දුප්පත් ගොවීන්ගේ දූ පුතුන්ය. අපි විප්ලවය කළෙමු. නිසිලෙස කොමියුනිස්ට්වාදී සමාජයක් ගොඩනැගීමට අපට ආයු මදිය. එම උදාර කාර්යය අපේ තරුණ පරපුර සපුරාලනු ඇතැයි ලෙනින් නිගමනය කළේය. එම කාර්යයේදී පෙරමුණ ගන්නේ කොමියුනිස්ට් තරුණ සංවිධානයය.

ශ්‍රම දානයෙන් පසු තරුණ නියෝජිතවරු සම්මේලනයට සහභාගි වීමට සූදානම් වූහ. කොමියුනිස්ට් තරුණයෝ මොස්කව් නගරයේ දුම්රිය ස්ථාන, බඩු පටවන දුම්රිය වේදිකා, ගබඩා ආදී තැන්වල වැඩ කරමින් ශ්‍රමදාන ව්‍යාපාරයට එක්වූහ. මොස්කව් නගරයේ මාවත් පිරිසුදු කොට අලංකාර කළහ.

1920 ඔක්තෝබර් 2 ද අහස ඇඳිරි විය. එහෙත් හිටි හැටියේම ශරත් සමයේ කහ පැහැති කොළ සොළවමින් සුළඟක් හැමීය. හීන් පොද වැස්සක් පටන් ගති.

ශරත් සමයේ කාල ගුණයටද, උදෑසන ප්‍රණීත බවටද, ගස්වල කොළවල හඬටද සවන් දුන් තරුණ නියෝජිතවරු පොදුවේ ශ්‍රමදාන ව්‍යාපාරයට සහභාගිවීම නිසා සතුටුවූහ. එහෙත් ඔවුන් වඩාත් සතුටු වූයේ ලෙනින් කොමියුනිස්ට් තරුණ සම්මේලනය ඉදිරියේ කතාවක් කිරීමට නියමිත බැවිනි!

මාලයා දිමිත්‍රොව්කා වීදියේ අංක හය දරණ නිවෙසට නියෝජිතයෝ කල් ඇතිවම රැස්වූහ. දැන් එතැන ලෙනින්ස්කි කොම්සොමොල් රඟුම් හලකි. (කොමියුනිස්ට් තරුණ සම්මේලනයේ රඟුම් හල මෙනමින් හැඳින් වේ.) එද මෙතැන රඟුම් හලක් තබා වේදිකාවක් පවා නොතිබිණි. ලී පටිවලින් සෑදූ දිගැති මේසයක් මත රතු රෙද්දක් එළා ශාලාව වටා උද්‍යොග පාඨ ලියා සම්මේලන හල පිළියෙල කරන ලදී.

චිත්‍ර ශිල්පියෙකු නිම කළ එක් චිත්‍රයක් මෙසේවිය. රතු හමුදාවේ තරුණ

සෙබළෙක් අතක් දිගු කොට ප්‍රශ්නයක් අසයි: ''නුඹ සිය කැමැත්තෙන්ම රතු හමුදවට බැඳුණෙහිද?''

බොහෝ නියෝජිතවරු සම්මේලනයට පැමිණියේ යුද පෙරමුණු වලිනි. ඔවුන් විවිධ නගර, ගම්වලට අයත් වූ අතර පාසල් සිසුන් නොවීය. සමහරු අකුරු කියැවූහ. අන් සමහරු අකුරු නොදත්හ. තවත් අය ජීවිතයේ කිසි දිනක පොතක් අතට නොගත්හ. එසේවුවද ඔවුහු අධිරාජ්‍ය හමුදවන්ට හා ප්‍රතිවිප්ලවවාදීන්ට බැටදී ඔවුන් විනාශ කළහ. කුලාකයින් සඟවාගෙන සිටි ආහාර නිර්භය ලෙස උදුරා ගත්හ. සෝවියට් ආණ්ඩුව රැකීම සඳහා දිවි නොතකා අභීත ලෙස සටන් කළහ.

ලෙනින් දූත් දූත් කතා කරතියි සිතූ නියෝජිතයින්ගේ හදවත් ගැහෙන්නට විය. ලෙනින්ගේ කතාව අසමු!

ඔවුහු තම ආදරණීය නායකයාගේ කතාව ඇසීමට සූදනම් වෙමින් උරෙනුර ගැටී බංකුවල වාඩිවූහ. සමහරු සෙබළ කබාද තවත් සමහරු කළු පැහැති සමින් කළ කෙටි කබාද ඇඳ සිටියහ. එක්දස් නවසිය විසි ගණන්වලදී ස්වේර්ඩ්ලොව් මෙන් බොහෝ දෙනෙක් සම් කබාය ඇඳීමට ආශා කළහ. දහඩියෙන් හා වෙඩි බෙහෙත් සුවඳින් මුසුවූ සෙබළ කබායද එවකට නරක ඇඳුමක් නොවීය. බොහෝ දෙනෙක් රතු තරුව සහිත සෙබළ හිස්වැසුම් ඇන්දහ.

''ලෙනින් කුමක් කියාවිද?'' නියෝජිතයෝ බලාපොරොත්තුවෙන් සිටියහ. ඔහු යුධය ගැන හෝ වීර වික්‍රමාන්විත ක්‍රියා කරන ලෙස ආයාචනයක් හෝ කරතියි ඔවුහු සිතූහ. රතු හමුදව ප්‍රති විප්ලවවාදී හමුද පරාජය කළ නමුදු සිවිල් යුධය නිමාවට පත්වී නැත.

අභීත ලෙස සටන් කරමු!

යන ගීතය සම්මේලන ශාලාවේ එක් මුල්ලකින් ඇසිණි.

සෝවියට් බලය රැකගමු.
නොබියව දිවි පුදමු.
අභීත ලෙස සටන් කරමු!

නිහඬතාවයකි. පළමුව සභාපති මඩුල්ලට සාමාජිකයින් තෝරන ලදී. සභාපති මේසය රතු රෙද්දකින් වසා තිබිණි. සභාපති මඩුල්ලේ සාමාජිකයෝ අසුන් ගත්හ. බිත්තියේ එල්ලා තිබුණු මාක්ස්ගේ හා එංගල්ස්ගේ පින්තූර සම්මේලන නියෝජිතයින් දෙස බලන්නාක් මෙනි.

ප්‍රීතිමත් හඬක් පැතිරිණි:

''ලෙනින්''

නියෝජිතවරු නැගිට සිට අත්පොලසන් දුන්හ. කොමියුනිස්ට් තරුණයෝ ලෙනින්ට මහත්සේ ඇලුම් කළහ.

ලෙනින් තම කළු පැහැති හිම කබාය නමා මේසය මත තබා සභාපති මඬුල්ලේ වාඩිවී සිටි තරුණයන්ට අත දී ආචාර කළේය. ඔහුගේ හැම ඉරියව්වක්මත්, සිනාවක්මත් ඔවුහු මහත්සේ අගය කළහ. ලෙනින් ඔවුහු කොතරම් අගය කළෝදයත්, ඔහු දුටු පමණින්, මාරාන්තික සටන් කළ වීර තරුණයෝ පවා නැගිට අත්පොළසන් දෙමින් සතුටු කඳුළු වැගුරවූහ. ලෙනින් දැකීම විරල භාග්‍යයක් ලෙසය, ඔවුන් සැලකුවේ.

නොනවතින අත්පොළසන් මැද සභාපති මඬුල්ලේ මේසය ළඟ සිටගත් ලෙනින්, තම සාක්කුවේ තිබුණු සිහින් දම්වැල් පොට සහිත කුඩා ඔර්ලෝසුව පෙන්වමින්, අත් පොළසන් හා ප්‍රීති ඝෝෂා නවත්වන ලෙස ඉල්ලා සිටියේය.

ලෙනින්ගේ මේ ක්‍රියාවද තරුණයින්ගේ සිත් ගති.

''සහෝදරවරුනි! හැම දෙනම වහාම යුද පෙරමුණට යා යුතුයැ''යි ඉල්ලා සිටියේ නම්, හැම දෙනම එකා මෙන් නැගිට ඔහුගේ ඉල්ලීම ඉටු කරනු ඇත.

එහෙත් එද කතා කළේ වෙනත් දෙයක් ගැනය. නියෝජිතවරු අන්දමන්ද වූහ. මුලදී ඔවුහු අසතුටට පවා පත්වී, විස්මය පත් වූහ. ඔහුගේ කතාව මුලදී ඔවුන්ට අවබෝධ කර ගැනීමට පවා බැරිවිය.

ලෙනින් වේදිකාවේ ඒ මේ අත ඇවිදිමින් තම කතාව කළේය. වැඩිමහල් කොමියුනිස්ට්වරු සභාපති මඬුල්ලේ අසුන් ගත් විට, පුටුවල ගණන අඩුවූ නිසා අනිකුත් තරුණ නායකයෝ වැඩිදුර කල්පනා නොකොට, වේදිකාවේ පඩිය මත වාඩිවූහ. ලෙනින් ඔවුන්ට බාධා නොවන සේ ඔවුනතරින් ගමන් කරමින් කතා කළේය.

ඔහු කතා කළේ කුමක් ගැනද? කොමියුනිස්ට් තරුණ සම්මේලනයේ කාර්‍යභාරය ගැන, එනම් උගත යුතුය යන්න ගැන ඔහු කතා කළේය.

නියෝජිතවරුන් විස්මය පත්වී ඇති බැව් ලෙනින් දුටුවේය. ඔවුන් නොසන්සුන් ලෙස තමා දෙස බලමින් තමාගේ කතාව තේරුම් ගැනීමට වෑයම් කරමින් සිටින සැටි ලෙනින් දුටුවෙන්, තම අදහස් හැකි තරම් වාම් ලෙස ප්‍රකාශ කළේය. අපි ඉක්මනින්ම සිවිල් යුධය අවසන් කරන්නෙමු. සතුරන්ට බැටදී ඔවුන් පන්නා දමන්නෙමු. ඉන් පසු කුමක් කරමුද? රට ගොඩ නැගීම පටන් ගත යුතුය. කම්හල්,පැක්ටරි සාද, ට්‍රැක්ටර්, අහස්යානා, යන්ත්‍ර සූත්‍රාදිය නිෂ්පාදනය කළ යුතුය. රට පුරාම විදුලි බල ස්ථාන සාද සෝවියට් රුසියාව විද්‍යුතන කළ යුතුය. විදුලිබලය යනු කුමක්ද? තරුණ කොමියුනිස්ට්වරු ඒ ගැන දනිත්ද?

බොහෝ දේ උගත යුතුය. දැනගත යුතුය!

දැනීම හා බුද්ධිය නැතිව කොමියුනිස්ටවාදී උත්තරීතර සමාජය ගොඩනැගිය නොහැකි බව නියෝජිතවරුන්ට ලෙනින් පැවසීය.

උගත යුතුය, වැඩ කළ යුතුය. ''ගොවීන් හා කම්කරුවන් සමග එකතුව ශ්‍රමය වැය කිරීමෙන් පමණකි නියම කොමිනිස්ටවාදියෙකු විය හැක්කේ.'' පැරණි සමාජයට එදිරිව නිර්ධන පංතිය ගෙනයන සටන සමග තම ජීවිතය එක් කිරීමෙන් සහ නව කොමියුනිස්ටවාදී සමාජය ගොඩනැගීමෙන්, කොමියුනිස්ටවාදය ගැන ඉගෙන ගත යුතුබව සෝවියට අගමැති ලෙනින් පැවසීය.

## ජය අපටය

ලෙනින් හමුවීමට පැමිණි සුප්‍රසිද්ධ ඉංග්‍රීසි ගත්කරු හර්බට් වෙල්ස් අගමැති කාර්යාලයේ වාඩිවී සිටියේය. වෙල්ස්ගේ ''දෙලොවක් අතර යුද්ධය,'' ''කාල යන්ත්‍රය'', ''අදිසි මිනිසා'' යන පොත් ලොව බොහෝ දෙනා දනිති. ඔහුගේ පොත්වල විස්මයජනක මනස් සෘෂ්ටිය නිසා ඔහු ජගත් කීර්තියක් දිනාගත්තේය.

වෙල්ස් ධනපති සමාජයේ අඩුපාඩු විවේචනය කළ අතර විද්‍යාව හා කාර්මික ශිල්පය ගැන විශාල උනන්දුවක් දැක්විය. ලෙනින් ඔහු හාමුවී කතා කිරීමට කැමතිවූයේ මේ නිසාය. උසැති, පළල් උරතල සහිත ඉංග්‍රීසි ගත්කරුවා දෙස බැලූ ලෙනින් මඳ සිනාවක් පෑවේය. හිසකෙස් හරි මැදින් දෙකට බෙදා පීරා සිටි වෙල්ස්ගේ උඩු රැවුළ කෙටිවිය. ඔහු ඇඳ සිටියේ බොහෝ වටිනා කලිසමක් හා කමිසයකි. කමිස කර තදට වසා තිබුණු අතර කමිසය සුදු පාටින් බැබලිණි. අගහිඟකම කුමක්දැයි මේ සුප්‍රසිද්ධ ගත්කරුවා නොදන්නා බව පෙනෙන්නට තිබේ.

සෝවියට් ජනතාව ශීතලෙන් හා කුසගින්නෙන් පෙළෙමින් ජීවත් වූහ. කමිසයක් මිළදී ගැනීමට පවා නොහැක. කඩ සාප්පු හිස්වෙලාය.

හර්බට් වෙල්ස් තමා දුටු දේ ලෙනින්ට විස්තර කළේය. ඔහු මීට සති දෙකකට පෙර එංගලන්තයේ සිට පැමිණි බැවින් වැඩි මහන්සියක් නැතිව පීටර්බුර්ගයේ වීදිවල ඇවිද්දේය. කම්හල් බැලීමට ගියේය. අගනුවර හා අනිකුත් නගරවල කම්හල්වලින් අඩකටත් වැඩි ගණනක් හිස්ව තිබිණ. ලියවන පට්ටල් ගල් ගැසිලාය. වෙල්ස් පාසල් බැලීමට ගියේය. ළමයින්ට උදේ ආහාර සඳහා බෙදා දුන්නේ පාන් කෑල්ලක් පමණකි. පාසල් පොත් හිඟය උග්‍රවිය. එක පොතක් තුන් හතර දෙනෙක් භාවිතා කළහ.

වෙල්ස් නිරීක්ෂණය කළේය, මිනිසුන්ගෙන් ප්‍රශ්න ඇසීය, ඔවුන්ගේ අදහස්වලට සවන් දුන්නේය. සෝවියට් රටතුළ තත්ත්වය නොවූ විරූ තරම

අසීරුය, අමාරුය! විනාශය හා දුර්භික්ෂය. තාපන ද්‍රව්‍ය කිසිවක් නැත විදුලි බලය නැත. රුසියාව ගණ අඳුරට වැටිලාය.

මේ සියලු අසීරුකම් මැඩ රුසියාවට නැගී සිටීමට බැරිබව වෙල්ස් පැවසීය.

ලෙනින්ගේ මඳ සිනාව අතුරුදන් විය. ඔහු වෙල්ස්ගේ නිගමනය නිසා අසතුටු වුණා නොවේ. ලෙනින් හැංගි හොරා නැතිව කතා කිරීමට ආශා කළ කෙනෙකි. හිතන දේ කෙළින්ම කීමට ඔහු කැමතිය. වෙල්ස් කීවේ සත්‍යයකි: රුසියාව විනාශයට මූණ පා ඇත. ඔහුගේ නිගමනය තර්කානුකූලය, සාධාරණය: රුසියාව විනාශ කළේ බොල්ෂෙවිකයින් නොවේ. සාර් ආණ්ඩුවත්, දේශීය හා විදේශීය ධනපති පංතියත්ය. රුසියාව විනාශ කිරීමට යුධ පටන්ගත්තේ ඔවුන්ය. එහෙත් රුසියාව පුනරුත්ථාපනයට පත් කිරීමට බොල්ෂෙවික්වරුන් සමත්වෙතියි, ඔවුන් යුධයට ගොදුරුවුණු, දුගී බවට ඇදවැටුණු රුසියාව දියුණු කරති යි වෙල්ස් කිසි දිනෙක විශ්වාස නොකළේය.

"රුසියාව පුනරුත්ථාපනය කිරීම සඳහා බොල්ෂෙවික්වරු ඉදිරිපත් කරන සැලැස්ම ගැන ඔබ දන්නවද? දැනගන්ට කැමතිද?" වෙල්ස් දෙසට නැඹුරුවූ ලෙනින් උපහාසාත්මක සිනහවකින් ඔහු දෙස බලා ප්‍රශ්න කළේය.

වෙල්ස් අද්භුත කතා කාරයෙකි, විද්‍යාඥයෙකි. එම නිසා ලෙනින් තම සැළැස්ම ගැන ඔහු සමග සාකච්ඡා කිරීමට සිතීය. විශාල, දැවැන්තමය සැලැස්මකි!

ලෙනින් තරුණ කාලයේ සිටම කොමියුනිස්ට් වාදියකු හා දක්ෂතම ඉංජිනේරුවකුවූ ග්ලෙබ් ක්‍රිෂිෂානොව්ස්කිගේ මිතුරෙක් විය. මේ ඉංජිනේරුවා කවියෙක්ද විය. සාර් ආණ්ඩු කාලයේදී ඔහු පෝලන්ත විප්ලවීය ගී රුසියන් බසට පෙරලීය. ඉස්සර ඒවා රහසේ ගායනා කළ අතර දැන් මුළු රටම ඒවා ප්‍රසිඩියේ ගැයීය.

ජය අපටය
කම්කරුවන් උදෙසා
සටන්කාමී ධජය රැගෙන
නිර්භය ලෙස ඉදිරියට...

රුසියාවේ විදුලි බල ස්ථාන සෑදීම සඳහා ක්‍රිෂිෂානොව්ස්කි ඉදිරිපත් කළ සැළැස්ම ගැන ලෙනින් කීප වරක්ම ඔහු සමග සාකච්ඡා කළේය. මේ මහා සැළැස්මේ සියලු අංග සම්පූර්ණ කර ලීමට ලෙනින් සෝවියට් රටේ දක්ෂතම හා දීර්ඝ පළපුරුද්දක් ඇති විද්‍යාඥයින් දෙසිය දෙනෙකු කැඳවීය.

සෝවියට් රටේ විදුලිබල ස්ථාන සෑදීමේ එම සැළැස්ම ගැන වෙල්ස් සමග ලෙනින් සාකච්ඡා කළේය. වෙල්ස් රුසියන් බස නොදත්තද, ලෙනින් ඉතා හොඳින් ඉංග්‍රීසි කතා කළේය. ලෙනින්ගේ පොහොසත් ඉංග්‍රීසි කතාව ඇසූ වෙල්ස් විස්මයෙන් ප්‍රීතිවිය. ඔහුගේ අදහස් විදුලි කෙටීම මෙන් කාන්තිමත්ය! අද්භූත කතාවක් වුවද පරදවන සුලුය. ලෙනින්ගේ සැළැස්ම ගැන ඇසූ වෙල්ස් තුෂ්ණිම්භූත විය. රුසියාව විද්‍යුතන කිරීම! ඉමක් නැති සමතලා බිමකින් හා කැලෑ වලින් පිරි, ලුවිනා නම්වූ දර කෝටු පහන් වෙනුවට පාවිච්චි කරන ගම් සහිත, විනාශවුණු නගර හා අක්‍රියා කාරී කම්හල් සහිත, වෙළඳාම විනාශ වී ගිය, දුම්රිය මාර්ග කැඩී බිඳී ගිය රුසියාවේ විදුලි බල ස්ථාන සෑදීම...

''විනාශයේ පතුලටම වැටී ඇති ඔය රටේ ඔය තරම් විශාල විදුලි බල ස්ථාන සහිත සැලැස්මක් ක්‍රියාවේ යෙදවීමට ඔබ සිතන්නෙහිද?''

''ඔව්. අපි විදුලි බල ස්ථාන හදනවා. අපේ කම්හල්වලට අවශ්‍ය බලය ලබා දෙනවා. විදුලි යන්ත්‍ර සහිත දුම්රිය ක්‍රියා කරවනවා'' ලෙනින් පිළිතුරු දුන්නේය.

සෝවියට් අගමැතිගේ කතාවට සවන්දෙන වෙල්ස් ''ලෙනින් පුදුම මිනිසෙකැයිද'', ''ඔහු ක්‍රෙම්ලිනයේ ඉඳගෙන සිහින දකින්නේ'' යැයිද සිතීය. අද්භූත කතා ලිවීම නිසා ලෝක ප්‍රසිඩියක් දිනාගත් වෙල්ස්ට ලෙනින්ගේ සැළැස්මය ක්‍රියාවේ යෙදවිය නොහැකි අද්භූත කථාවක් මෙන් විය.

ලෙනින් වෙල්ස් හමුවී දෙමසකට පසු, එනම් 1920 දෙසැම්බර් මස සමස්ත රුසියානු සෝවියට් සභාවල අටවැනි සම්මේලනය බොල්ෂොයි රඟහලේදී පවත්වන ලදී.

රතු විලූද සහිත ඇඳි පුටුවල, වාඩිවී සිටියේ සෙබළ කබාද, කසොවොරෝට්කා නමින් හැඳින් වෙන රුසියානු කබාද, ඉරිගිය කබාද හැඳගත් මිනිසුන්ය. ඔවුන්ගෙන් සමහරු වාලෙන්කා නමින් ප්‍රකට හිම සපත්තු පැළඳ සිටියහ. ඔවුන්ගේ මුහුණු වල බැරෑරුම් විලාසයකි. ඔවුහු සෝවියට් රටේ පාලකයෝය. රටේ ආර්ථිකය හා අනාගතය පිළිබඳව අළුත් පණත් හා සැළැස්ම සම්මත කර ගැනීමට ඔවුහු රැස්වුණහ.

සෝවියට් රට විද්‍යුතන කිරීමේ විශාල සැළැස්මක් සහිත සිතියමක් වේදිකාවේ සවිකොට තිබිණි. මේ සිතියම ගැන ලෙනින් මහත් උනන්දුවක් දක්විය. ඔහු නිතර ක්‍රිෂිෂානොව්ස්කිට ටෙලිපෝන් කළේය. චිත්‍ර ශිල්පියාට, කාර්මික ශිල්පීන්ට එම සිතියම ගැන මතක් කරමින් නියමිත වේලාවට එය සම්පූර්ණ කළ යුතු බැව් කීවේය. සෝවියට් සභාවල

නියෝජිතවරුන් එම සිතියම සියැසින් දැකිය යුතුය! රුසියාව විද්‍යුතන කිරීමේ සැළැස්ම එයය. අපි මේ සැළැස්ම ක්‍රියාවට යොදවා රුසියාව යළි ගොඩනගන්නෙමු. තව දස අවුරුද්දකින් රුසියාවට නැවත පැමිණියොත් වෙල්ස්ට එය බලා ගත හැකි වනු ඇත...

කළු පැහැති නෙත් සහිත ක්‍රිෂිෂානොව්ස්කි වේදිකාවේ අසුන් ගෙන සිටියේය. හුරු බුහුටි, ක්‍රියාශීලී පුද්ගලයෙකුවූ ඔහු දැන් නිසලව වාඩිවී සිටී. ඔහු නොසන්සුන්ය.

ඊයේ රුස්වීම අමතා කතා කළ ලෙනින් මෙසේ පැවසීය: "සෝවියට් පාලන බලය සහ රට විද්‍යුතන කිරීම කොමියුනිස්ට් වාදයයි" විද්‍යුතන කිරීමේ සැළැස්ම පිළිබඳ විස්තර කිරීම අද ඉංජිනේරු ශිල්පී ක්‍රිෂිෂානොව්ස්කිට භාරව ඇත. ඔහු කැළඹී සිටී. ඔහු තම දේශනය අරඹත්ම, ශාලාවේ පහන් නිවිණි. ඔහු වේවැලෙන් සිතියම පෙන්වීය. එහි එක් තැනෙක ආලෝකයකි. තවතැනක් පෙන්වත්ම, එතැනද ආලෝකයක් ඇතිවිය. විදුලි බලස්ථාන සෑදීමට අදහස් කරන හැම තැනකම ආලෝක ඇති විය. විදුලි බල ස්ථාන සාදත්ම, අපේ කර්මාන්ත දියුණු වනු ඇත. අපේ ගොවි පොළවල් නව පණක් ලබනු ඇත. සිතියම පුරාම විදුලි බුබුළු ආලෝකවූයේ රට පුරාම පැන නගින විදුලි බලස්ථාන පෙන්වමිනි. ක්‍රිෂිෂානොව්ස්කි බැරෑඩි, උස් හඩකින් කතා කළේය.

තම මිතුරා නව ආශ්වාදයක් ලැබ සිටින සැටිද, සෝවියට් සභා සම්මේලනයේ නියෝජිතවරුන් මහත් උනන්දුවකින් ඔහුගේ කතාවට සවන් දෙන සැටිද, ලෙනින් දිටීය. සිතියමේ ආලෝකය, අනාගතයේ ආලෝකමත් අරුණෝදයට සමාන විය. තමා විශ්වාසය තැබූ එම සැළැස්ම ක්‍රියාවට නගනු වස් සෝවියට් මන්ත්‍රීවරු වෙහෙස නොබලා ක්‍රියා කරතියි ඔහු දැන සිටියේය. ජනතා සුබසිඩිය සඳහා ඔහු සිහින දිටීය. ඔහු තනිවම නොවේ. ඔහු සමග සෝවියට් ජනතාව හා කොමියුනිස්ට්වරු එක්වූහ.

## දුර්භික්ෂය

1920 දෙසැම්බර් මාසයේදී යුධ විප්ලවවාදී කමිටුව ප්‍රව්ද පුවත්පත් මගින් නිවේදනයක් පළ කළේය: "යුධ පෙරමුණුවල නිහඬතාවයකි." රතු හමුදව විදේශීය ආක්‍රමණිකයින් පන්නා දමා ඇත. ප්‍රතිවිප්ලවවාදීන් පරාජය කොට ජයගෙන ඇත. සෝවියට් බලය ඇත පෙරදිග දක්වා තවම නොපැමිණියද ඉක්මනින්ම එහි යනු ඇත.

රට තුළ පැවැති යුධය සම්පූර්ණයෙන්ම පාහේ අවසන් වෙමින් පවතී. යුධ කොමියුනිස්ට්වාදී පාලන ක්‍රමය නවත්වා දමන ලදී. සාම කාලයට සුදුසු අළුත් ප්‍රතිපත්තියක් ලෙනින් පිළියෙල කළේය.

එහෙත් සෝවියට් රට තවත් බියජනක විපතකට මූණ පෑවේය.

එම වසරේ ශීත කාලය හිම රහිත විය. පොළොව දැඩි ශීත නිසා යකඩ මෙන් තදවී, ඉඩොරයට අසුවුණු කලෙක මෙන් ඉරි තැලිණි. හැම පැළයක්ම වැහි පොදක් හෝ ලබා ගැනීමේ ආශාවෙන් සිටියේය. එහෙත් ඉන් පලක් නොවීය. වසන්තය හා ගිම්හානයද වැහි රහිත වූ අතර නැගෙනහිරින් උණුසුම් සුළං හැමීය. අහස වළා රහිත විය. ඉර මහ පොළොව ගිනිරත් කළේය. වොල්ගාව අවට පෙදෙසේ සරු කෙත් වතු පාලු විය. ක්‍රිමියාව සහ දකුණු උරාලයද වියලී ගියේය.

දස ලක්ෂ සංඛ්‍යාත ජනකායක් ඉදිරියේ මාරයා දුර්භික්ෂයේ වෙස් ගෙන පෙනී සිටියේය.

ලෙනින් අගමැති කාර්යාලයේ රැස්වීම නියමිත වෙලාවට කැඳවීය. න්‍යාය පත්‍රයේ එකම දෙය වූයේ දුර්භික්ෂයට මූණ පා සිටි ජනතාවට උදවු දීම ගැන සාකච්ඡා කිරීමය. යුද්ධ කාලයේදී මෙන් හදිසි, ස්ථිර පියවරයන් තීරණාත්මක ලෙස ගතයුතු බව ලෙනින් දන්වා සිටියේය.

සෝවියට් ආණ්ඩුව නැවත ජනතාවට ආයාචනා කළේය. නගර, ගම් හා පෙදෙස්වලට විදුලි පණිවුඩ යවන ලදී: ''සහෝදරවරුනි! දිය හැකි හැම දෙයක්ම දෙන්න!''

විශෙෂ කමිටුවේ සභාපතිවර ජෙර්සින්ස්කි ආහාර එකතු කිරීම පිණිස සැ...රියාවට ගියේය. ඒවා වොල්ගාව අවට දුර්භික්ෂයට මූණ පෑ මිනිසුන්ට බෙදා දීම පිණිසය.

එම වසරේ යුක්රයිනයේ ඉතා හොඳ අස්වැන්නකි. ලෙනින් යුක්රයිනයේ ජනතාවට ආයාචනයක් කළේය.

''වහාම, විශාල වශයෙන් ආධාර දෙන්නැ''යි ලෙනින් දැන්වීය.

පිටරටවල කම්කරුවන්ගෙන් ආධාර ඉල්ලා යැවීය.

දුර්භික්ෂයට අසුවුණු අයට ආධාරදීමේ කමිටුවක් සෝවියට් ආණ්ඩුව සංවිධාන කළේය. මේ කමිටුවේ සභාපතිවූ කලීනින් කෙරෙහි ලෙනින් තැබුවේ ඉමහත් විශ්වාසයකි. උපතින් ගොවියෙකුවූ සෝවියට් රජයේ ජනාධිපති මිහයිල් කලීනින් වෘත්තියෙන් කම්කරුවෙක් විය.

''ඔක්තෝබර් විප්ලවය'' නැමැති විශේෂ දුම්රියකින් මිහයිල් කලීනින් වොල්ගාව අවට පෙදෙසට ගියේය.

''ළමයින් ගැන සලකා බලන්න. විශේෂයෙන්ම ළමයින් ගැන සලකා බලන්නැ''යි කී ලෙනින් ''කරුණාකරලා!'' යැයි ඉල්ලා සිටියේය.

ලෙනින් ළමයින් කෙරෙහි දැක්වූ ඉමහත් දයාව නිසා කලීනින් පවා පුදුම විය. තම හැඟීම යටපත් කරගැනීමට මෙන් කැස්සේ, යටි රැවුළද අත ගාන්නට විය:

''කළ හැකි හැම දෙයක්ම කරන්නම්'' කලිනින් පැවසීය.

''එයටත් වඩා වැඩියෙන්!'' ලෙනින් ඉල්ලා සිටියේය.

ය ඩෝ විය. සෝවියට් අගමැති කායඝාලයේ විදුලි බුබුල කණාමැදිරි එළියක් පිටකරයි. ලෙනින් අත්සන් තැබූ ලිපි හා වෙනත් ලියවිලි පැත්තකින් තැබීය.

ඉවසිය නොහැකි කරමට හිස කකියන්නට විය. ලෙනින් අසනීපයෙනි. මෙය අසනීප විය යුතු අවස්ථාවක් නොවේ. ඔහු අසනීපයෙන් පසුවන බව කිසිවෙක් නොදිටීය. නළල අත්ල මත තබා ගෙන සිටියද දුර්භික්ෂය පිළිබඳ සිතුවිලි ඔහුට ඉවත් කිරීමට නොහැකි විය.

''කළ හැකි හැම දෙයමත්, එයටත් වඩා වැඩියෙනුත්!'' ලෙනින් නැවත සිතීය.

සෝවියට් ආණ්ඩුවට කළ හැකි හැම දෙයක්මත්, එයටත් වඩා වැඩියෙනුත් කර ඇත. සෝවියට් රටේ බැංකුවල තිබුණේ රත්රන් සුළු ප්‍රමාණයකි. රන් රූබල් එක් කෝටි විසි ලක්ෂයක් පිටරට යවා ඉඩෝරයට හසුවී අළුවී ගිය කුඹුරුවල ගොවිතැනට අවශ්‍ය ඉස්තරම් වර්ගයේ තිරිඟු, බිත්තර වී ආදී ධාන්‍ය ගෙන්වීය. මේ පණතට සෝවියට් අගමැති ලෙනින් අත්සන් තැබීය.

කම්කරුවෝ සෝවියට් අගමැති වරයාට මෙසේ දැන්වූහ:

''ලෙනින් සහෝදරය! අපේ රුසියාවේ දේවස්ථාන දස දහසකි. රත්රන් කුරුස හා රූප විශාල ගණනක් මෙහි ඇත. මේවා පිටරට යවා කුසගින්නේ සිටින මිනිසුන්ට අවශ්‍ය ආහාර ලබා ගන්න.''

කම්කරුවෝ හරිම නුවණක්කාරයෝ! මෙසේ කී ලෙනින් ඔවුන්ගේ අදහස පිළිගෙන වහාම ක්‍රියා කළේය.

ටෙලිපෝනය නාදවිය. වොල්ගා පෙදෙසට ගිය මිහයිල් කලිනින් ලෙනින්ට කතා කළේය.

''කොහොමද සහෝදරය ඔහේ තත්ත්වය?''

''ලෙනින් සහෝදරයා, තත්ත්වය නරකයි'' කලිනින් පිළිතුරු දුන්නේය.

කෙත්වතු පාළුවූ සොහොන් පිටිවලට සමානය. ගම් හා නියම්ගම් මිරිඟුවකින් වැසිලාය. එළදෙනුන්ගේ හඬ නොඇසේ. සත්තු දුව පැන නොඇවිදිති. හතු හෝ පලු වර්ග මේ ගිම්හානයේ වැවිලා නැත. එතරම් දුෂ්ට ගිම්හානයකි. මිනිස්සු නොමැරී ජීවත්වීම සඳහා ගස්වල කොළවලින් හා තණ පඳුරුවලින් කැඳ පිසූහ. බොහෝ දෙන හාමතින් බිම ඇද වැටුණහ. වසූරිය බෝවුණු කලෙක සමහර ගොවි පවුල් පිටින් මරුට බිලිවූහ.

ටෙලිපෝන් සාකච්ඡාවෙන් පසු පුටුවක වාඩිවූ ලෙනින් නොසැලී එලෙසම සිටියේය. මෙය ලෙනින්ට පුරුදු ඉරියව්වක් නොවේ.

දුර්භික්ෂයට විරුඬව සටන් කිරීම පිණිස සංවිධාන කරන ලද කමිටුව ළමයින් වෙනත් පෙදෙස් වලට ගෙනයාමෙන් කළේ දුරදර්ශී ක්‍රියාවකි. හාමතින් පෙළුණු ළමයින් රැගත් දුම්රිය මැදිරි තුළ නිහඬතාවය පුදුම එළවන සුලුවිය. ළමයි නිහඬව උන්හ...

දුර්භික්ෂයට අසුවුණු පෙදෙස්වල සිට දුම්රිය නොයෙක් පෙදෙස්වලට ගමන් කළහ. චුවාෂ් රටේ ළමයින් මොස්කව් නගරයට යවන ලදී. පැරණි සිටු මාලිගා සහ ධනපති බංගලා ළමාගාර සඳහා පිළියෙල කැරිණි.

රෑ බෝ වුණු පසු අගමැති කාර්යාලයෙන් පිටවූ ලෙනින් තම නිවෙසට පැමිණියේ අන් අයට බාධා නොවන පරිදිය. හැම දෙනම නිද සිටි නමුදු, ලෙනින්ගේ නැගණිය මරියා පමණක් අවදිව සිටියාය. ඈ තම අයියණ්ඩිය කුස්සියට කැඳවූවාය.

''ව්ලදිමීර් ඔහොම මහන්සි වෙලා වැඩ කරන්න එපා. උණු තේ එකක් හරි බොන්න. නදේෂ්ද කාර්යාලයේ ඉඳල ආවෙ හොඳටම මහන්සි වෙලා. නිද ගත්තා.''

කුස්සියේ මේසය උඩ රෙදි උරයක් සහිත පාර්සලයකි. එය තම්බෝවේ ගොවීන් විසින් ලෙනින් වෙත එවන ලද තිළිණයකි. ''අපේ ගමේ සාදන ලද බේකන් කා ශක්තිය ලබා ගන්නැ''යි ගොවියෝ තම ආදරණීය නායකයාට ලියා එවූහ.

''ව්ලදිමීර් කිසිදක තෑගි බාර ගන්නේ නැති හන්ද මාත් නදේෂ්දත් තීරණය කළා, ඔය තෑග්ගත් බාර නොගන්න. ඒ වුණත් අයියාගේ පෙණුම ලෙඩ පාටයි...'' මරියා උල්යානොවා තම වැඩිමල් සොහොයුරුට පැවසුවාය.

ලෙනින් තම සුන්දර නැගණියට බෙහෙවින්ම ආදරය කළේය. 1887 දී ලෙනින්ගේ අයියා — අලෙක්සාන්දර් එල්ලා මරා දමන විට, ඈ සිඟිති දූරියක්ව සිටියාය. එවිට මුළු නගරයම උල්යානොව් පවුල වර්ජනය කළ අතර චුවාෂ් ජාතික ඉවාන් යාකොව්ලෙව් ඔවුන්ට පිටු නොපෑවේය. ඔහු ලෙනින්ගේ පියාගේ මිතුරෙක් විය. චුවාෂ් ජාතික ඔහොට්නිකොව්ද ඔවුන්ට උදව් කළේය.

''අපි තෑග්ගට හොඳ වැඩක් කරමු. නංගී දන්නවද මොස්කව් නගරෙට චුවාෂ් රටෙ ඉඳල ළමයින්ව ගෙනැවිත් තියෙනව. ඒ ගොල්ලන් ඉන්න ළමා නිවාසයකට මේ තෑග්ග යවමු. මරියා නංගී කැමතිද?''යි ලෙනින් ඇසුවේ ගොවීන් එවූ තිළිණයට නිය පිටින් පහරක් ගසමිනි.

මරියා උල්යානොවා වෙහෙසට පත්වී සිටින තම සොහොයුරු දෙස බලන්නී, ශෝකයට පත්වූවාය. ඇගේ හදවත වේදනාවෙන් හැකිළිණි.

''හොඳටම දුර්වල ළමයින්ට මෙය දෙන්න කියල අපි ළමා නිවසින් ඉල්ලා හිටිමු'' ලෙනින් කීවේය.

මරියා උල්යානොවා එකහඬින් පළකරමින් හිස වැනුවාය.

ලෙනින්ගේ හිසේ ඇම්ම නොනැවතිණි. එහෙත් ඔහු සතුටිනි. තම්බෝව්හි ගොවීන්ගේ තිළිණය කාන්තාරයකට වැටුණු දිය බිඳක් මෙනි. එහෙත් හෙට අතිශයින්ම දුර්වල ළමයින් කීපදෙනෙකුට අතිශයින්ම පෝෂ්‍යදයක ආහාරයක් එක වේලකට හෝ ලැබෙනු ඇත.

## නව ආර්ථික ප්‍රතිපත්තිය

තමන් ජීවත්වන හා වැඩකරන සැටි කීමට කම්කරුවෝ ලෙනින් වෙත පැමිණියහ. රතු හමුදාවේ සෙනවිවරු ලෙනින් හමුව යුද පෙරමුණ හා යුධාභ්‍යාස ගැන තොරතුරු කීහ. හැම කෙනෙකුටම මහත් සැලකිල්ලකින් සවන් දෙන ලෙනින්, ඔවුනට අවශ්‍ය උපදෙස්ද දුන්නේය.

ජනතාවගේ හැඟීම් අනුව සෝවියට් ආණ්ඩුව තම ප්‍රතිපත්ති සකස් කළේය. රටට ගැළපෙන හා අවශ්‍ය තීරණ හා පණත් සම්මත කර ගත්තේය.

ලෙනින් හමුවීමට ගොවියෝද ආවෝය. සෝවියට් ආණ්ඩුව පිහිටවූ මුල් කාලයේදී රදළ ඉඩම් හිමියන්ගේ හා කුලාකයින්ගේ ඉඩම් බෙද ගැනීම පිළිබඳ ප්‍රශ්න විසඳාගැනීමට ඔවුහු ආහ. ඉඩම් නැති දුප්පත් ගොවීන් හා මධ්‍යම ගොවීන් අතර ඉඩම් බෙද ගන්නේ කෙසේද? ඒවා නිසි පරිදි වගා කරන්නේ කෙසේද?

ඉන් පසු සිවිල් යුධය ආරම්භ විය.

යුධය ආරම්භ වීමත් සමගම ගොවීන්ගේ අමතර ආහාර ලබා ගැනීම පිණිස විශේෂ සංවිධානයක් සෝවියට් ආණ්ඩුව විසින් ඇති කරන ලදී. අස්වැන්න කපාගත් පසු තමන්ගේ ආහාර පිණිස කොටසක්ද, ඊළඟ ගොවිතැන සඳහා කොටසක්ද තබාගෙන ඉතිරි හරිය රජයට ගන්නා ලදී. එසේ නැතිනම් රතු හමුදාවටද, නගරවල වැඩකරන කම්කරුවන්ටද ආහාර නැතිව යනු ඇත.

ඒ කාලය ගොවීන්ටද, සෝවියට් රටේ හැම කෙනෙකුටමද අමාරු කාලයක් විය.

යුධය අවසාන විය. ඈත ගම්වල සිට මොස්කව් දක්වාම පයින්ම ගමන් කරන හදකී නමින් හැඳින්වෙන ගොවි නියෝජිතවරු වැළ නොකැඩී

ලෙනින් හමුවීමට පැමිණියහ. දිගැති යටි රැවුළු සහිත මේ ගොවීහු දිඝී ජීවිත අත්දැකීම් අනුව මුනිවරයින්ට සමාන වූහ. බොහොසෙයින් සතුටුවූ ලෙනින් අනාගතය ගැන ඔවුන්ගේ අදහස් විමසා බැලිය.

අමතර ආහාර බලෙන් ලබා ගැනීමේ ක්‍රමය නැවැත්විය යුතුයැයි කී ගොවීහු ඒ වෙනුවට අයබදු ගෙවීමේ ක්‍රමයක් ඇති කරන ලෙස ඉල්ලා සිටියහ.

යම්තම් කුසගින්න පිරිමසා ගැනීමට පමණක් ආහාර තබා ගෙන ඉතිරි ආහාර සියල්ල රජයට දීම වෙනුවට, වැඩියෙන් වගාකොට, වැඩි අස්වැන්නක් ලබා ගන්නාට, වැඩි ආහාර තොගයක් තමාළඟ තබා ගැනීමට පුළුවන් වන ලෙස අයබදු ගෙවීමේ ක්‍රමයක් ඇති කිරීමය. මෙයින් ගොවියා තුළ උනන්දුවක් ඇතිවෙයි. වැඩියෙන් ආහාර වගා කිරීමටත් ගැඹුරුලෙස සීසෑමටත් පෙළඹෙයි. රජයේ නියම අනුව අයබදු ගෙව්වද, තමාට අමතර ආහාර තොගයක් ලබා ගැනීමට මේ නිසා ගොවියාට හැකි වෙයි. මේ අමතර ආහාර තොගය නගරයට ගෙන ගොස් විකුණා තමාට අවශ්‍ය භාණ්ඩ වන සබන්, භූමිතෙල්, රෙදිපිළි, දැකැති, උදළු, පිහි ආදී දේ මිළදී ගැනීමට හැකිවනු ඇත. නගුල් හා අස්වැන්න කපා ගන්නා යන්ත්‍ර ගස් මෙන් පැළ කළ නොහැක. ඒවා සෑදීමට නම් නගරවල කම්හල් ක්‍රියා කරවිය යුතුය. හැම දෙයක්ම නිපැදවිය යුතුය.

දුප්පත්කම නැතිකර දැමීමට වැඩ කරන ජනතාව අසමත් වෙතිද? ධනපතීන් පරාජය කොට, විදේශීය අධිරාජ්‍යවාදී යුධ හමුද සහ දේශීය ප්‍රතිවිප්ලවවාදී හමුද පන්නා දැමූ කම්කරුවන්ට හා ගොවීන්ට රට සුඛිත මුදිත කළ හැක.

ගොවීන්, කම්කරුවන් හා සෝවියට් සභාවල නියෝජිතයින් සමගද, පාක්ෂිකයින් සමගද සාකච්ඡා කරමින් මේ ගැන නිතර කල්පනා කළ ලෙනින් අළුත් සැලැස්මක් ගැන සිතීය. මේ අළුත් සැලැස්ම නව ආර්ථික ප්‍රතිපත්තිය (නෝවයා එකොනොමීචෙස්කයා පොලිටිකා) හෙවත් නෙප් යන නමින් හඳුන්වනු ලැබීය.

දිගැති නම් කෙටියෙන් හැඳින්වීම විප්ලවයෙන් පසු නවීන පන්නයක් බවට පත්විය. ඒ අනුව නෝවයා එකොනොමීචෙස්කයා පොලිටිකා යන රුසියන් වචන තුනේ මුල් අකුරු තුන ගෙන "නෙප්" යන නම සෑදිණි.

පෞද්ගලික වෙළඳාම නැවත පටන් ගැනීමට ඉඩ දෙන ලද නමුදු එය සීමාසහිත විය. කම්කරු ගොවිකරු ආණ්ඩුවට තර්ජනයක් නොවන සේ එය පාලනය විණි. ප්‍රධාන ආර්ථික අංශ වන කර්මාන්තය, දුම්රිය මාර්ග පාලනය හා ප්‍රවාහනය, ගංගා හා මුහුදු වල බඩු ගෙනයාම ආදී හැමදෙයක්ම රජය සතු පොදු දේපොළ බවට පත්කොට ඒවා පාලනය කිරීම හා ශක්තිමත් කිරීමද, වර්ධනය කිරීමද නොකඩවා කැරිණි.

ලෙනින් හැම දෙයක්ම කළේ වැඩකරන ජනතාවගේ යහපත හා සුබසිද්ධිය පිණිසය. යුඩය අවසන් වූ පසු ලෙනින් රටේ ආර්ථිකය, වෙළඳාම, කර්මාන්තය, විදුලි බල ස්ථාන සෑදීම, යන්ත්‍ර සූත්‍ර සෑදීම හා නගර හා ගම් අතර මිතුරු සබඳකම් වැඩි දියුණු කිරීම සඳහා වෙහෙස විය.

මේ කාර්‍යය ඉටුකිරීම සඳහා ''නෙප්'' ප්‍රතිපත්තිය ලෙනින් ඉදිරිපත් කළ විට, පක්ෂයේ දසවැනි සම්මේලනය එය සම්මත කළාය.

නව සමාජය ගොඩනැගීම සඳහා ලෙනින් ඉදිරිපත් කළ යෝජනා වලට බාධා කළ අයද, ඒවාට විරුඩ වූවෝද වූහ. ට්‍රොට්ස්කි ලෙනින්ගේ මතයට විරුඩ වෙමින් තම අදහස් ඉදිරිපත් කළේය. ඔහු නිතර ලෙනින්ට විරුඩව තර්ක කළේය. ඔහුගේ සමහර මත නිසා ජනතාවට විශාල අලාභ හානි සිදුවිය. බ්‍රෙස්ට් සාමයෝජනා වලට ට්‍රොට්ස්කි විරුඩ විය. එයින් සෝවියට් රටට සිදුවූ පාඩුව ඉමහත් විය.

ට්‍රොට්ස්කි නැවත වරක් ලෙනින්ට විරුඩව තර්ක කළේය. පක්ෂයේ ප්‍රතිපත්තිවලට පටහැණි මත ඉදිරිපත් කළ ඔහු වෙනත් මත ඉදිරිපත් කළේය. ලෙනින්ගේ ප්‍රතිපත්තිවලට එකඟ නොවී පක්ෂය තුළ සිටි අස්ථිර, වැනෙන සුලු කොටස් තමන්ට නතු කර ගත් ට්‍රොට්ස්කි පක්ෂ විරෝධී කණ්ඩායම් ඇති කළේය. තවත් විවිධ පුද්ගලයෝ ලෙනින්ට විරුඩ වූහ.

හැම දෙනකු සමගම එකතුව නව සමාජය තුළ සාමකාමී දිවියක් ගොඩ නැගිය යුතුයැයි ලෙනින් සිතීය. පක්ෂය තුළ හැම ප්‍රශ්නයක් ගැනම එකඟත්වයක් තිබිය යුතුය.

එහෙත් සමහරු නව ජීවිතය ගොඩනැගීමට බාධා කළහ.

ලෙනින් ඔවුන්ට විරුඩව දැඩි සටනක් කළේය.

කොමියුනිස්ට්වාදීන්ගෙන් වැඩි දෙනෙක් ලෙනින් සමග වූහ. ඔවුහු රට සමාජවාදී හා කොමියුනිස්ට්වාදී මග ඔස්සේ ගෙන යාමට තීරණය කළහ.

ප්‍රදීපය

පිබිදෙව් පෙළෙන්නො කුස ගින්නෙ
පිබිදෙව් ලොව් වහල්ලු!
රෝසේ හඬයි යුක්ති කෝ
බිහිවෙයි ලොවක් අළුතෙන්.

ක්‍රෙම්ලින් මාලිගයේ මහ ශාලාව තුළින් නික්මුණු එම ගීතයේ හඬ රැව් පිළිරැව් දුණි.

බිහිවෙයි ලොවක් අළුතෙන්
නැගිටිව් බැඳුම් ඉවරයි.

සිය ගණනක් නියෝජිතයින් රැස්වී, විවිධ භාෂා පනහකින් පමණ ජාත්‍යන්තර ගීය ගායනා කළහ. ප්‍රංශ, ජර්මන්, ඉතාලි, තුර්කි, ජපන්, ඉංග්‍රීසි, නෝර්වේ, පින්ලන්ත, එස්තෝනියා, ලැට්වියා හා රුසියන් භාෂා වලින් එකවර ගයන ලදී...

ලෙනින් ජාත්‍යන්තර ගීය ගයන විට, හැමදා මෙන්ම එදිනද කැළඹුණේය. රටවල් කීපයකින් කොමියුනිස්ට්වාදීහු සිය ගණනක් කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ හතරවැනි සම්මේලනයට සහභාගි වීම සඳහා සෝවියට් රුසියාවට පැමිණියහ. ඔවුහු සාර් රජුගේ මාලිගයට රැස්වී නිදහස්ලෙස හා ස්වාධීන ලෙස ජාත්‍යන්තර ගීය ගායනා කළහ. ලෙනින්ගේ අධ්‍යාත්මය දූත් සතුටින් පිරිලාය.

මේ අන්තිම සටනයි
හැම තම හිමි තැන් ගනිමු.
මේ හැම ලොවේ දෙනා.

ලෙනින් බොහෝ පිටරටවල වාසය කරන කාලයේදී විදේශීය කොමියුනිස්ට්වාදීන් දැන හැඳින ගත්තේය. ප්‍රංශයේ සුප්‍රසිඩ විප්ලවවාදී පුවත්පතක්වූ ''හුමානිතේ'' පත ආරම්භ කළ ජාන් ජොරේස් ඔහු හැඳින සිටියේය.

ජර්මන් කොමියුනිස්ට්වාදීන් වන ක්ලාරා සෙට්කින්, රෝසා ලුක්සම්බුර්ග්, කාල් ලිබ්ක්නෙක්ට් ද ඔහුගේ මිතුරෝ වූහ. සාර්ගේ පොලිස් ඔත්තු කරුවන්ගෙන් ලෙනින් බේරාගැනීම සඳහා ක්‍රියාකළ පින්ලන්තයේ හෙල්සින්පෝර්ස්හි පොලිස්පති ධූරය දැරූ රෝවියෝ වැනි විප්ලවවාදීන්

බොහෝ දෙනෙකු ලෙනින් දැන සිටියේය. රුසියාවේ විප්ලවය ආරම්භවූ විගස ලෙනින්ට තම මවුබිමට යාමට උදවු කළ ස්විට්සර්ලන්ත ජාතික විප්ලවවාදියෙකු වූ ප්‍රිට්ස් ප්ලැටන්ද, තවත් බොහෝ රටවල විප්ලවවාදීන්ද, කම්කරුවන් හා බුද්ධිමතුන්ද සෝවියට් රටේ අගමැති දැන සිටියේය.

රුසියාවේ ඔක්තෝබර් සමාජවාදී විප්ලවය ජයගත් පසු, නොයෙක් රටවල මාක්ස්වාදී විප්ලවවාදීහු කොමියුනිස්ට් පක්ෂ සංවිධාන කළහ.

''ලෝකයේ සියලු කොමියුනිස්ට්වාදීන් එක්සත් විය යුතුයැ''යි ලෙනින් කීවේය.

කොමියුනිස්ට් පක්ෂ මෙසේ එක්සත් කොට සාදන ලද සංවිධාන කොමියුනිස්ට් ජාත්‍යන්තරය හෙවත් කොමින්ටර්නය යන නමින් හඳුන්වන ලදී.

ලෙනින් කතා මණ්ඩපයට නගිත්ම, දහසක් දෙනා ඔහු දෙස බලන්නට වූහ. ලෝකයේ විවිධ රටවල කොමියුනිස්ට්වරුන් අමතා කතා කළ යුත්තේ මොනවා ගැනද?

සෝවියට් රටේ ගොඩනැගීමට පටන්ගෙන ඇති නව සමාජය ගැනය.

සෝවියට් දේශය පස් වසරක් තුළදී ආර්ථිකය ගොඩනැගීම සඳහා කළ වැඩ, ලැබූ ජය හා පරාජය, විදේශීය ආක්‍රමණය, දේශීය ප්‍රති විප්ලවවාදී පහරදීම් පරාජය කර දැමීම, දුර්භික්ෂය මැඩ ජයගැනීම, රටේ ඇතිවූ විනාශය නැති කර ඉදිරියට යාම ආදී දේ ගැන ඔහු විස්තර කළේය. මේ කාලය තුළදී ඇතිවූ යුධ හා දුර්භික්ෂය නොතකා කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ජීවන තත්ත්වය යහපත් විය. වෙළඳාම් කිරීමට සෝවියට් ආණ්ඩුව ඉගෙන ගනිමින් සිටී. දැනට අප යන්ත්‍ර සූත්‍ර සෑදූවද ඒවා සංඛ්‍යාවෙන් අඩුය, ගුණයෙන් පහත්ය. යන්ත්‍ර සූත්‍ර හා මහා කම්හල් දස දහස් ගණනින් ගොඩනැගිය යුතුය. නවීනතම ආර්ථික, කර්මාන්ත හා විද්‍යාත්මක පදනමකින් තොරව කොමියුනිස්ට්වාදී සමාජය ගොඩනැගිය නොහැක. සෝවියට් දේශය ඉදිරියේ ඇති අරමුණ කොමියුනිස්ට්වාදය ගොඩනැගීමය. විදේශීය කොමියුනිස්ට් පක්ෂ ඉදිරියේ ඇති අරමුණ විප්ලවය ය.

ලෙනින්ගේ කතාවේ හරය එය විය. එද ඔහු කතාකළේ ජර්මන් බසිනි, මන්දයත්, රුසියන් බස විදේශීය කොමියුනිස්ට්වාදීන් නොදැන සිටි අතර ජර්මන් බස වැඩි දෙනෙක් දැන සිටි බැවිනි.

''ලෙනින් ජර්මන් බසින් බොහොම හොඳට කතා කරනවා'' යැයි ජර්මන් කොමියුනිස්ට්වාදීහු කීහ.

කතාව අවසාන විය.

විවිධ රටවලින් පැමිණි කොමියුනිස්ට්වරු නැගී සිට අත්පොළසන් දුන්හ.

''ලෙනින්! ලෙනින්ට ජයවේවා!''

රැස්වීම් ශාලාව කුණාටුවකට හසුවූ කලෙක මෙන් කැළඹුණේය.

තමා වෙත දක්වන ලද සහෝදරාත්මක, දයාබර හැඟීම් ලෙනින් අවබෝධකර ගත්තද, අත්පොළසන් හා ප්‍රීති ඝෝෂා ඔහුට රිසි නොවීය. ඔහු හැකිතරම් ඉක්මනින් ශාලාවෙන් පිටවීමට තැත් කළද, ඔහු වටා කවාකාරව සිටගත් සහෝදරවරු ඔහුට ඉවත්වීමට ඉඩ නොදුන්හ. කෙනෙක් ලෙනින්ගෙන් යමක් ඇසූ අතර, තව කෙනෙක් ඔහුගෙන් උපදෙස් සෙවීය. වෙනත් කෙනෙක් ඔහුට සුබ පැතීය.

කැරළි හිසකේ සහිත මිනිසෙක් ලෙනින්ට ළංවී ''ආයුබෝවන්, ලෙනින් සහෝදරය!'' යැයි ප්‍රංශ බසින් පැවසීය. ඔහුගේ දෙනෙත් කළු පැහැතිය. ඒවා ප්‍රීතියෙන් බැබලේ. ඔහු නැවත නැවත ප්‍රංශ බසින්, ''ආයුබෝවන්, ලෙනින් සහෝදරය! කම්රාඩ්, කම්රාඩ්...'' ඔහු පසුව රුසියන් බසින් මෙසේ පැවසීය: ''ලේ-නින්, නායකයා.''

ලෙනින් ප්‍රංශ බසින් ප්‍රශ්න කරමින් මඳ සිනා පෑවේය:

''ඔය සහෝදරයා, ප්‍රංශෙ කොයි පළාතින්ද?''

''මම ඉතාලි ජාතිකයෙක්. ලෙනින් සහෝදරය අපේ බස නොදන්න හන්ද...''

''මම තරමක් දන්නවා'' යැයි ලෙනින් ඉතාලි බසින් පැවසීය.

''ඔහෝ! ලෙනින් සහෝදරය බොහොම හොඳට ඉතාලි දන්නවා!'' යැයි ඔහු කීය.

ලෙනින් ඉතාලි, ප්‍රංශ, ඉංග්‍රීසි හා ජර්මන් භාෂාවලින් නියෝජිතයින් සමග කතා කරන්නට විය.

''ලෙනින් අපේ මිතුරා!'' ''ලෙනින් කොමියුනිස්ට් පක්ෂයේ නායකයාය.'' ''ලෙනින් අපේ ගුරුවරයාය'' යන හඬ හැම තැනින්ම ඇසිණි.

සම්මේලනයට පැමිණ සිටි විදේශීය ආකර කම්කරුවෙක් දැත් බටයක් සේ වටකුරු කොට මුව වටේ තබා ගත්තේය. ඔහුගේ මුහුණ බිම් අඟුරු නිසා කළු ලප වලින් ගහණ විය. ඔහුගේ කබා කර පටිය හිම මෙන් සුදු පැහැතිය. ඔහු උස් හඬින් කෑගැසීය:

''සෝවියට් දේශය අපේ ප්‍රදීපයයි! අපි සෝවියට් මග ඔස්සේ යමු!''

## නව වසර

ව්ලදිමීර් ඉල්යිච් ලෙනින් බලවත් සේ රෝගාතුර වූයෙන් ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය අතිශයින්ම අවදානම් විය.

ඔහු හිටිහැටියේම රෝගාතුර වූහයි සමහරු සිතූහ. එහෙත් ඔහු සෑහෙන කලක් තිස්සේ රෝගයට භාජනවෙමින් සිටියේය. ඔහුට නිදාගැනීමට

නොහැකිවූ අතර හිසේ රදය නොනැවතිණි. ඔහු රාත්‍රිය ගතකළේ ඉවසිය නොහැකි වේදනාවකිනි. කෙමෙන් ලෙනින් රෝගයට ගොදුරුවූයෙන් ඔහු ඇඳට සීමාවිය.

ක්‍රෙම්ලින් මාලිගයේ කුඩා කාමරයක ඔහු වැතිර සිටියේය.

"ලෙනින් සහෝදරයා බොහොම වෙහෙස මහන්සි වෙලා වැඩ කරල තියෙනව. මිනිහකුට ඔයතරම් මහන්සි වෙන්ට බැහැ." ඔහු පිරික්සා බැලූ වෙද්දු පැවසූහ.

එහෙත් ලෙඩ ඇඳේ වැතිර සිටි ලෙනින්ට වැඩ නොකර සිටිය නොහැකි විය! තමාට වැළඳී ඇති රෝගය භයානක බැව් දැනගත් ලෙනින් තම අදහස් අනිකුත් පාක්ෂික නායකයින්ට දැන්වීමට යුහුසුලු විය.

ලෙනින් ඇඳේ උඩුබැලි අතට වැතිර සිටි අතර ඔහුගේ දෑත් අප්‍රාණික විය. ඔහුගේ හිස වටා වෙළුම් පටිය.

හවස ඇඳිර පැතිර යත්ම, ලෙනින්ගේ කාමරයේ අඩ ඇඳිර සහිත විදුලි බුබුලක් ආලෝක කරන ලදී. ආහාර ගැනීමෙන් පසු ලෙනින්ට විවේක ගැනීමට දෙස්තරවරුන් නියම කළද, ඔහු හැකි තරමින් රාජ්‍ය කටයුතු වල යෙදෙන්නට පටන් ගත්තේය.

1922 දෙසැම්බර් 30 ද සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ පළමුවැනි සම්මේලනවාරය මොස්කව්හි ආරම්භ කරන ලදී. සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු කීපයක් අනුබඩ කොට සංගමයක් සෑදීමේ ගිවිසුම සම්මේලනය අනුමත කළාය.

සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය බිහිකිරීමේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ, සෝවියට් සමාජවාදයේ නිර්මාණකයාවූ ලෙනින්ය.

සෝවියට් සංගමයක් බිහිකිරීමේ අවශ්‍යතාවය හැමදෙනාටම එකවර අවබෝධ නොවීය. ලෙනින් මහත් වුවමනාවෙකින් හා දැඩි අධිෂ්ඨානයකින් යුතුව මෙම සංගමය බිහිකිරීමට වෑයම් කළේ මන්දයි ඔවුහු නොදත්හ.

සාර් රුසියාවට වඩා හාත්පසින්ම වෙනස් නව පන්නයක රාජ්‍ය පද්ධතියක් සෝවියට් සංගමය පිළිබිඹු කළ යුතු බව ලෙනින් පෙන්වා දුන්නේය. සාර් පාලනය උක්රයිනය, බෙලොරුසියාව වෙන්ව පිළි නොගත් අතර ආමේනියාව, අසර්බයිජානය හා ගෘසියාව (ඉංග්‍රීසිහු මේ රට ජෝජියාව හැටියට හඳුන්වත්) රුසියාවේ කොටස් හැටියට සලකන ලදී. සාර් රජු ජනතාවට නිදහස හා සෙවරි පාලනයක් නොදුන්නේය. මවු බස් පාසල්වල උගැන්වීම තහනම් කරන ලදී. කුඩා ජන කොටස් වලට කතා කරන බසක් මිස ලිඛිත බසක් හෝ හෝඩියක් හෝ නොතිබිණි. සුළු ජාතීන් වනසාලීමේ ප්‍රතිපත්තියක් සාර් රජු අනුගමනය කළේය. ඔවුන් නින්දවට භාජන කරන ලදී. ජනතාව අතර අසමතාවය ලෙනින් හෙළා දුටුවේය.

ලෙනින් ඇඳේ වැතිර ගැඹුරු කල්පනාවක යෙදී සිටින සැටි දුටු කෲප්ස්කයා දොර ළඟ මොහොතක් සිට ගෙන පහත් හඬින් මෙසේ ඇසීය: ''නිදිද?''

''නිදි නැහැ, නදේෂ්ද. වැඩ කිරීමට ලැහැස්ති වෙනවා.''

ඈ ඇඳිරි පහන නිවා මේසය මත තිබුණු පහන ආලෝක කළාය. කාමරය ආලෝක වෙත්ම, රෝගී ලෙනින්ගේ සුදුමැලි මුහුණද එය පසුතලය කොට ඇති සුදුපැහැති ඇඳ රෙද්ද ද ආලෝකවිය.

බිත්ති ඔර්ලෝසුවේ බට්ටා ඒ මේ අත පැද්දෙමින් හය වරක් හඬ නැගීය. එවිටම වාගේ ලෙනින්ගේ කාමරයට ලසුලේඛිකාව — මරියා වොලොදීචෙවා ඇතුළු වූවාය. තිස් හැවිරිදි ඈ සිහින්ය, බුද්ධිමත්ය, සැලකිලිමත්ය. ඇඳ ළඟ වූ පුටුවක වාඩිවූ ඈ පැන්සලය හා සටහන් පොතද සූදනම් කර ගත්තාය.

''පටන් ගනිමු!'' ලෙනින් ඈ දෙස බලා පැවසීය.

''දොස්තරලා අද මට විනාඩි හතළිහක් වැඩ කිරීමට අවසර දීලා තියෙනවා. හරි ගොඩක් වේලාව ලැබී තියෙනවා! මම අදහස් කළ ලිපිය හිතින් මම දැනටමත් සූදනම් කරල ඉවරයි.''

ඊයේ ලෙනින් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ සම්මේලනයට සහභාගි වී නම්, ඔහු විසින් කළ යුතුව තිබුණු කතාව, දැන් ඔහු ලසු ලේඛිකාවට කියවන්නට විය. එය පක්ෂයේ නායකත්වයට දෙන උපදෙසකි. ඔහුගේ උපදෙස් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය ශක්තිමත් කිරීමට අත්‍යාවශ්‍ය විය. පක්ෂය ලෙනින්ගේ කතාව අසා ඔහුගේ උපදෙස් අනුව ක්‍රියා කරනු ඇත. සුළු ජාතීන්ට මොන අන්දමකින් හෝ අඩම් තේට්ටම් නොකළ යුතුය. ජනතාවට කොහෙත්ම පීඩා නොකළ යුතුය! සංගමයට ඇතුළුවන හැම සෝවියට් සමූහාණ්ඩුවකටම සමාන අයිතියක් තිබිය යුතුය. සෝවියට් සංගමය බලගතු හා සාධාරණ රජයක් වන්නේ එවිටය. අධිරාජ්‍යවාදී පීඩනයට ගොදුරුවී සිටින ජනතාව එවිට සෝවියට් සංගමය දෙස බලාපොරොත්තුවකින් යුතුව බලනු ඇත...

යාබද කාමරයේ සිටි නදේෂ්ද කෲප්ස්කයා තම ආදරණීය සැමියාගේ කට හඬට සවන් දී සිටියාය. අත්ල මත නිකට තබාගෙන සිටි ඇගේ මුහුණ නොසන්සුන්තාවයක් දැක්වූවද, සිත ආදරයෙන් පිරිලාය.

ලිපිය කියවා අවසාන වූ විගස ලසු ලේඛිකාව ඉවත ගිය විට, කෲප්ස්කයා ඔහුගේ ඇඳ ඇතිරිලි ඉවත්කොට පිරිසුදු ඇතිරිලි එලුවාය. ඇගේ මඳ සිතාවෙහි කැළඹුණු ස්වභාවයක් හෝ අමුත්තක් හෝ පෙනෙන්නට නොතිබිණි. ඇගේ සන්සුන් ගතිය දුටු ඔහුද සන්සුන් විය.

''නදේෂ්ද මට මතක්වුණා'' යැයි කල්පනා කාරී ලෙස ලෙනින් තම බිරිඳ ඇමතීය. ''මට මතකයි සිම්බීර්ස්ක් ගුබෙනියාවේ, චුවාෂ්, මොර්දෙවින්, තතාර් ජාතික ළමයින්ට පාසල් ලබා දීමට අපේ තාත්තා කළ සටන. තාත්තාට ඉස්සෙල්ලා කිසිවෙක් ඒ වගේ දෙයක් සිම්බීර්ස්ක්වල කළේ නැහැ''යි ලෙනින් පැවසීය.

''ඔයාගෙ තාත්තා උසස් ගතිගුණ ඇති කෙනෙක්. එයා පොඩි දේවලින් පටන් ගත්තා. දැන් රට සම්පූර්ණයෙන්ම වෙනස් කළ විප්ලවය ජය ගත්තා'' යැයි ක්‍රෘප්ස්කයා කීවාය.

අද ලෙනින්ට ප්‍රයෝජනවත් වැඩක් කිරීමට ලැබීම නිසා ඔහු සතුටුව සිටින බවත්, ඔහුගේ දෙනෙත්වල පෙර මෙන්ම ප්‍රීතිය මුසු කාන්තියක් ඇති බවත් ඈ දුටුවාය. හිස වටා බැඳ තිබුණු වෙළුම් පටි ගළවා දමා ඇත. සමහර විට ඔහු ඉක්මනින්ම සම්පූර්ණ සුවය ලබනු ඇත.

''සමහර විට? ඇයි මා එහෙම හිතන්නේ? සමහර විට නොවේ, නැබැවටම ස්ථිරවම සුවය ලබාවි. මීට හයමසකට ඉස්සෙල්ලා ඔය විදියටම අසනීප වෙලා සනීප වුණා. දැනුත් සනීපවේවි'' බිය මුසු හැඟීම්වලින්යුතුව ක්‍රෘප්ස්කයා සිතුවාය.

ඈ ඔහු පොරවාගෙන සිටි ඇඳ රෙද්ද සහිත බ්ලැන්කෙට්ටුව හරි ගැස්සුවාය.

''වලෝද්යා ඔයා දන්නවද අද අළුත් අවුරුද්ද. අද ඔයා සතුටු වෙන්නෝ ඒ හන්ද වෙන්ට ඕන'' මෙසේ පැවසූ ලෙනින්ගේ බිරිඳ පහත් වී ඔහුගේ මුහුණ සිප ගත්තාය. ''සුබ අළුත් අවුරුද්දක්, වලෝද්යා!''

## හැම්දාම සටන් පෙරමුණේ

රාජ්‍ය කටයුතු පිළිබඳ ලිපි ලසු ලේඛිකාවේ ඉදිරියේ කියවීමට ලෙනින්ට ඉඩ දීම නිසා ඔහුගේ සෞඛ්‍යයට බාධා වෙතියි දෙස්තර වරු සිතූහ. ලෙනින් මොළයට වෙහෙස වීමට ඉඩ නොතැබිය යුතුය. රාජ්‍ය කටයුතු ගැන ඔහු නොවෙහෙසිය යුතුය. එම ලිපි ලිවීම නැවැත්විය යුතුය.

ලෙනින් තදින්ම විරුද්ධ විය!

එහෙත් දෙස්තරවරුන් සමග තර්ක කිරීම ලෙහෙසි නැත. ලෙනින් මෙහිදී උපක්‍රමීය පිළිවෙතක් අනුගමනය කළේය.

''රාජ්‍ය කටයුතු ගැන නොලියා දෛනික සටහන් ගැන පමණක් ලියන්නම්'' ලෙනින් පැවසීය.

දෙස්තරවරු ඔහුගේ උපායට හසුවූහ. ඔවුන් ඉඩදුන්නද, ලෙනින් දෛනික සටහන් යටතේ කාලගුණය ගැන නොකියතියි ඔවුහු දැන සිටියහ.

ලෙනින් විසින් ගොඩගන ලද රජය ගැන සැලකිලිමත් වීමට ඔහුට ඉඩ නොදිය යුතුද? ඔහුට ලිපි කියවීමට අවසර නොදුන් දවස්වලදී ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය වඩාත් අයහපත් විය. ඔහුට නින්ද නොගියේය. දොස්තරවරු පසුව ඔහුගේ ඉල්ලීමට එකඟ වුවද, දවසකට විනාඩි තිහකට හෝ හතළිහකට හෝ සීමා කළහ.

නියමිත වේලාවට ලඝු ලේඛිකාව වොලොදීචෙවා පැමිණියාය. දවසකට පිටුවක් සමහර දවස්වලදී පිටු දෙකක් හෝ තුනක් සටහන් කර ගත්තාය. සෝවියට් සමාජය අනාගතයේදී ගොඩ නැගිය යුතු ආකාරය ගැන සැළැස්ම සහිත ලිපි කිපයක්ම එහි අන්තර්ගත විය. අඩුපාඩුකම් ගැන ඔහු තදින් විවේචනය කළේය. රාජ්‍ය යන්ත්‍රය ක්‍රියා කරවිය යුතු ආකාරය ගැන ඔහු උපදෙස් දුන්නේය. කොමියුනිස්ට් පක්ෂය තුළ සමගිය හා මිත්‍රත්වය රැකගැනීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති ඔහු පෙන්වා දුන්නේය. පක්ෂය තුළ අසමගිය ඇතිවේතියි ඔහු බියවිය.

තම ලෙඩ ඇඳේ වැතිර සිටි ලෙනින් හැම වචනයක් ගැනම බොහෝ වේලා කල්පනා කළේය. හැම අදහසක්ම ඔහු නැවත පිරික්සා බැලීය.

ලෙනින්ගේ ලිපි ''ප්‍රව්ද'' පුවත්පතේ පළකරන ලදී. වැඩකරන ජනතාව ඔහුගේ ලිපි කියවා ඒවා ගැන සාකච්ඡා කළහ.

''ලෙනින් සහෝදරයා අපේ ජීවිතය ගැන හොඳින් සොයා බල , එහි ගැඹුරටම වැදිලා පිරික්සා බලා තියෙනවා. අපි නොදකින දේ එයා දැක තිබෙනවා'' කම්කරුවෝ පැවසූහ.

''ලෙනින් සහෝදරයා සනීපය ලබමින් සිටිනවා''යි කී ඔවුහු ප්‍රීති වූහ.

හිටි හැටියේම... මාර්තු මාසයේ දවසක වසන්ත සූර්යයා සිනාසෙන්නාට විය. කුරුල්ලෝ ප්‍රීති නාද දෙමින් නගරයේ හැම තැනම පියාඹා ගියෝය. හිම දියවී ජලය බවට පත්වී සුදු පැහැති පෙණ දමමින් ගලා බැස්සේය. හැම තැනම අළුත් දිවියක ලකුණු පෙනිණි. එහෙත් පුවත්පත් අතට ගත් මිනිස්සු දෙම්නසින් පසුවූහ. සමහරු ඉක්මන් ගමනින් ගොස් පුවත්පත් මිළදී ගත්හ. බිත්තිවල හා කණුවල දැන්වීම් පත් අලවා තිබිණි. ''ආණ්ඩුවේ නිවේදනයකි.''

ආණ්ඩුව නිවේදන නිකුත්කරන්නේ යම්කිසි අවදානම් තත්ත්වයකදීය. කිසියම් අවදානමක් ඇතිවීද?

''ව්ලදීමීර් ඉල්යිච් ලෙනින්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ නිවේදනයකි.

පසුගිය දවස් කිපය තුළදී වි. අයි. ලෙනින්ගේ සෞඛ්‍ය තත්ත්වය වඩ වඩාත් අසතුටුදයක වී ඇත...''

කනගාටුදයක සිඩිය කළ ඉ ගුරු කියා පැවෙය... ''වඩාත් අසතුටුදයක වී ඇත...'' මිනිස්සු බියගතියකින් ක්යවා හිස් පහත් කරගත්හ.

එදවස කම්හල්වල වැඩ කළ කම්කරුවෝ දුකින් පසුවූහ.

''අනේ අපේ ලෙනින්!'' මහලු කම්කරුවෝ සුසුම් ලෑහ.

බියජනක ඉරණමකට මූණ පාතියි තරුණ කම්කරුවෝ නොසිතූහ.

''ආණ්ඩු ආවාට ගියාට නිවේදන නිකුත් කරන්නේ නැහැ''යි මහල්ලෝ කියා සිටියහ.

ලෙනින්ගේ රෝගය අසාධ්‍ය තත්ත්වයට හැරිණි. ඔහු ගොළු කරවමින් රෝගය දරුණු ලෙස නැගී සිටියේය. ලෙනින්ට කතා කළ නොහැක. එයටත් වඩා සංවේගජනක පුවතක් තවත් තිබේද! ලෝකයේ පළමුවැනි සමාජවාදී රජය බිහිකළ චතුර කතිකයා ගොළුවිය.

ලෙනින්ගේ ඇඳ ළඟ දක්ෂතම දෙස්තර වරු සේවයේ යෙදුණහ. වෛද්‍ය විද්‍යාව, කුසලතාවය හා ක්‍රියාකාරීත්වය ශ්‍රෙෂ්ඨතම ජීවිතයක් බේරා ගැනීම සඳහා සටනක යෙදෙන්නට විය. මුළු රටම ඉමහත් බලාපොරොත්තුවකින් පසුවිය. උදෑසන පුවත්පත් මිළදී ගන්නා මිනිස්සු ලෙනින්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ නිවේදනය කියවීමට උනන්දු වූහ.

වසන්තයේ මඳ සුළඟට හසුවන අගමැති කාර්‍යාලයේ රතු කොඩිය ලෙලදෙයි. ලෙනින් පදිංචි ක්‍රෙම්ලින් කාමරයේ සිදුවන්නේ කුමක්ද?

දවසේ වැඩ හමාර කළ කම්කරුවෝ තම ගෙවල් බලා යති. දහ දහස් ගණන් මිනිස්සු ලෙනින්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැන සිතමින් දුක්වූහ. ලෙනින්ගේ කාමරයේ සිදුවන්නේ කුමක්ද?

ලෙනින්ගේ කාමරයේ හැම දෙයක්ම නිහඬය. කොතරම් ගැඹුරු නිහඬතාවයක්දයත්, ඔර්ලෝසු බටටා පැදෙන හඬ ආහාර ගන්නා කාමරයට පවා ඇසේ. ලෙනින්ට සාත්තු කරන හෙදියද, ඔහු ගේ ඇඳ අසල නදේෂ්ද ක්‍රෘප්ස්කයාද වූහ.

ලෙනින් ඇසිපිය ඇර බලයි: ''නාද්‍යා ඔයා මෙතනද?''

ඔහුගේ අදහස් හා ඔහුට කීමට වුවමනා දේ ගැන ඇ දන්නීය. ඔහුගෙන් පිළිතුරු ලැබුණාක් මෙන් ක්‍රෘප්ස්කයා කතා කළාය.

''අද ඔයාට සනීපයි'' ඇ ස්ථිර ලෙසම කීවාය.

සැබැවින්ම තමාට ගුණ ලැබී තිබෙන බව ලෙනින්ට දැනිණි. ඔහු නැවත ඇ දෙස බැලුවේ ''ඔව'' යන පිළිතුරක් දෙන්නාක් මෙනි.

''ඔයා සනීපවෙන්න වලෝද්‍යා. ලෙඩෙන් සුවය ලබන්නට අධිෂ්ඨාන ශක්තිය වුවමනා බව දෙස්තරවරු කියනවා. දැඩි අධිෂ්ඨාන ශක්තිය යොදවන්න'' ඇ ඔහුට කීවාය.

''උත්සාහ ගන්නම්'' ඔහු ඇස් වලින් පිළිතුරු දුන්නේය.

''ඔයා මුළු ජීවිතයම යොදලා ජනතාවගෙ සැපත සඳහා සටන් කළා. දැන් ඔයාගෙ රෝගය සුව කරගන්න සටන් කරන්න. ජනතාව හා විප්ලවය සඳහා. හැම ශක්තියක්ම යොද සනීප වෙන්න'' ක්‍රෘප්ස්කයා නැවත තම සැමියාට කීවාය.

නැවත වරක් ලෙනින් තම බිරිඳ දෙස බලමින් පිළිතුරු දුන්නේය: "ඔව."

ඇගේ හදවත නැවත දුක්බරින් වැළපිණි. උගුර හිරවෙන්නාක් මෙනි. තම හැඟීම් රෝගී සැමියාට නොපෙන්වීම සඳහා ඇ දැඩි සටනක් කොට ජයගත්තී, උගුර පාදගෙන දයාන්විත ලෙස මෙසේ පැවසුවාය:

"ඔයා දැන් ටිකක් නිද ගන්න. එතකොට හොඳ සනීපයක් දැනේවි. ලෙඩේ සුවඅතට හැරේවි. නිදගන්න. මම යන්නේ නැහැ. ඇඳ ළඟම වාඩිවී ඉන්නම්."

## ශරත් සමය

1923 අප්‍රේල් මාසයේදී රුසියානු කොමියුනිස්ට් පක්ෂයේ හත්වැනි සම්මේලනය ආරම්භ විය. සම්මේලනය වි. අයි. ලෙනින්ට සුබ පැතුම් යැවීය:

"නිර්ධන පංතියේ හා සියලු වැඩකරන ජනතාවගේ පක්ෂය තම නායකයාවූද, නිර්ධන පංති චින්තනයේ අසහාය නිර්මාණකයාවූද, විප්ලවයේ නායකයාවූද වි. අයි. ලෙනින්ට උණුසුම් සුබ පැතුම් පිරි නමයි. ලෙනින් වෙත ඇති භක්තිය හා ආදරය ප්‍රකාශ කර සිටී...

මින් පෙර නොවූ විරු පරිදි පක්ෂය නිර්ධන පංතිය හා ඉතිහාසය ඉදිරියේ ඇති තම වගකීම වටහා ගනී. මින් පෙර නොවූ විරු පරිදි පක්ෂය තම ධජයට හා නායකයාට සරිලන සේ කටයුතු කිරීමට ඉටාගෙන ඇත..."

නදේෂ්ද ක්‍රෘප්ස්කයා සම්මේලනය එවූ පණිවුඩය ලෙනින්ට ඇසෙන සේ කියවූවාය. ගැඹුරු බැල්මකින් හා හැඟීමකින් යුතුව ඔහු පිළිතුරු දුන්නේය.

ලෙනින් රෝගය මැඩ ජය ගත්තේය. මැයි මස මැද හරියේදී ක්‍රෙම්ලිනයේ සිට ලෙනින්ව ගෝකිහි පිහිටි බංගලාවට ගෙනයන ලදී. ඒ විශාල බංගලාවේ කුඩාතම කාමරයක් සෝවියට් ආණ්ඩුවේ අගමැතිවර වි. අයි. ලෙනින් තමාට තෝරා ගත්තේය. එක් කොණක පිහිටා ඇති ජනේල උසය, ගෙවත්ත දෙසට ඒවා පිහිටා ඇත. ගෙවත්තේ නොයෙක් වර්ගවල තුරු, ලතාද, මල්ද ඇත. පක්ෂීහු මිහිරි ගී ගැයුහ.

හවස ඇඳිරි වැටෙන විට කෝකිලයෝ ගීත ගයන්නට පටන්ගත්හ. අහස තරු සහිත විය.

ලෙනින් ප්‍රණීත වාතය ආශ්වාස කළේය. ඔහු තරමක් සුවය ලැබීය. ගෝකිහි කාලගුණය නිසා ඔහුට නිදගැනීම පවා පහසුවිය. ආහාර රුචියක් ඇති විය. කෙමෙන් ඔහුට ශාරීරික ශක්තිය ලැබිණි.

වමතින් සැරයටියක් ගත් ලෙනින් සෙමින් සෙමින් ඇවිදීමට පටන් ගත්තේය. වමතින් ලිවීමට ඔහු උගත්තේය. නැවත කතා කිරීම සඳහා අභ්‍යාසවල යෙදෙන්නට විය.

ඔහුගේ ගුරුවරිය වූයේ, ඔහුගේ බිරිඳ නදේෂ්ද ක්‍රෘප්ස්කයාය. අභ්‍යාස පාඩම්වල යෙදෙන විට ඈ කාමර දෙර වසා පිටත කිසිවකුට නෑසෙන පරිදි උගැන්වූවාය.

ගෙදර හැම දෙනෙක්ම තරමක් සතුටු වූහ. ලෙනින් හඬනගා සිනාසෙන විට ගෙදර හැම දෙන තුළම ඇතිවූයේ ඉමහත් ප්‍රීතියකි. ඔහු සිනාසීමට හා විහිළු කිරීමට සතුටු කෙනෙකි. සනීපය ලබමින් සිටින ලෙනින් හැම විහිළුවක්, බුඩිමත් කියමනක්, අළුත් පොතක් නිසාත්, ශරත් සමය නිසා රත් පැහැගෙන ඇති කොළ නිසාත් සතුටු විය. මොස්කව් නගරයේ සිට තමා බැලීමට මිතුරකු පැමිණි විට ඔහුගේ ප්‍රීතිය වැඩිවේ. 1923 ශරත් සමය පැමිණියේය.

ඔක්තෝබරයේ දවසක ලෙනින් සැරයටියේ ආධාරයෙන් ගරාජයට පැමිණ තමාට මොස්කව් යාමට අවශ්‍ය වී ඇති බැව් දන්වා සිටියේය. න්දේෂ්ද ක්‍රෘප්ස්කයා සහ මරියා උල්‍යානොවා හොඳටම කැළඹුණහ.

"ඔහොමත් යන්ට හොඳද? අවදානම් වැඩක් වෙන්නට පුළුවනි!"

දොස්තරවරුද ඔහුගේ ගමනට විරුඩ වූහ.

ලෙනින් සිතූ දේ කරන මිනිහකු වූ බැවින්, ඔහුගේ තීරණය වෙනස් කළ නොහැකි විය.

කළු පැහැති රෝල්ස් රොයිස් මොටෝරිය, කහ පැහැති කොළ වලින් වැසීගත් මග ඔස්සේ මොස්කව් වෙත පදවන ලදී. වලවල්වල නොවැටෙන සේ රිය පැදවීමට රියැදුරු තැන වගබලා ගත්තේය. මොස්කව් නගරයේ රන් පැහැති කොත් කැරලි, සුදුපැහැති තාප්පද, දුම් පිටකරන කම්හල් බටද දුටු ලෙනින් ඉමහත් ලෙස ප්‍රීතිවූයේ, හිස් වැස්ම අතට ගෙන වනමින්, ඉක්මනට මොස්කව් යමු! ක්‍රෙම්ලිනයට යමු! කීවේය.

ලෙනින් අගමැති කාර්‍යාලයට ඇතුළු වත්ම, ඔහුගේ හදවත ගැහෙන්නට විය. මෙහි ඇති හැම දෙයක්ම ලෙනින්ට වටනේය. කොළ පැහැති රෙද්දකින් වසා ඇති දිග මේසය. වේවැල් පුටුව. ඔහු මේ කාර්‍යාල තුළ ගත කළ හැම පැයක්ම ඔහුට වටනේ විය!

ලෙනින් සීත සමයේදී ගිනි තපින උදුනදෙස බලා සිනාසුණේය. දුම් බොන අය මේ ලිපට මුවාවී දුම් බී එහි බටයට දුම් පිට කළෝය. ඇමති මණ්ඩලයේ රැස්වීම්වලදී දුම්බීම ඔහු විසින් තහනම් කැරිණි. වෙනත් අගමැති කෙනෙකු පත්වූ විට, ඔහු මේසයට තට්ටු කොට ඇමතිවරුන් කැඳවන තුරුම, ඔවුන් ලිපට මුවාවී දුම් බොනු ඇත.

ලෙනින්ගේ සිත යම්කිසි මුදු දයාන්විත බවකින් පිරිණි. ඔහු තම සගයින්ට මහත්සේ ආදරය කළේය.

ලෙනින් අගමැති කාර්යාලය තුළ පිහිටි තම කාර්යාල කාමරයට ඇතුළු විය. භූමි සිතියම්, කාල් මාක්ස්ගේ ඡායා රූපය, ටෙලිපෝන්, පොත් රාක්කය ආදිය දුටු ඔහු නැවත කල්පනා සයුරක ගිලෙන්නට විය.

ලෙනින් තම කාර්යාල කාමරයෙන් සමු නොගත්තේ එහි නැවත විත් තම කටයුතුවල යෙදීමේ අදහසිනි.

වටපිට බැලූ හෙතෙම කවුළුව අසල තිබුණු පාම් ගසට ළං විය. සම් කලාපික රටවල මිනිස්සු භාවිතා කරන කුඩවලට සමාන කොළ මේ පාම් ගසේ ඇත. ලෙනින් එම පාම් ගස ආරක්ෂා කරන ලෙස සහෝදරවරුන්ගෙන් ඉල්ලා සිටි අතර ඔවුහු එම ඉල්ලීම ඉටු කළහ.

තම ළමා වියේදී, සිම්බීර්ස්කිහි ගෙදරදීද මෙවැනිම පාම් ගස් තිබුණු බව ලෙනින්ට මතක් විය. ඒවායේද කොළ ජපන් කුඩවලට සමාන විය. අවුරුද්ද මුළුල්ලේම නොඉදෙන කොළ හරිත වර්ණයෙන් බැබළිණි.

පසුව මොටෝ රියට නැගුනු ලෙනින් කෘෂිකාර්මික හා හස්ත කර්මාන්ත ප්‍රදර්ශනයට ගියේය.

සෝවියට් ආණ්ඩුවේ පළමුවැනි ප්‍රදර්ශනය බැලීමට නොවරදවා යාමට ලෙනින් ඉටාගත්තේය.

මොස්කව් නදිය අසලවූ නෙස්කුච්නි උද්‍යානයේ මේ ප්‍රදර්ශනය පැවැත්විණි. ඉස්සර මෙතැන ගොඩගැසී තිබුණු කුනු කන්දල් සියල්ල ඉවත් කොට සුඩ පවිත්‍ර කරන ලදින්, මල් වවා අලංකාර කොට, ප්‍රදර්ශන ශාලා සාදන ලදී. සුරඟනා කතාවක එන නගරයකට සමාන නගරයක් ලීයෙන් සාදන ලදී.

යුධය, දුර්භික්ෂය හා සීත මොනවාද යන්න අත්දුටු මිනිසුන්ට එය අමතක නොවිණි.

එ නිසාම ප්‍රදර්ශන නගරය ඔවුන්ට අපූරු කතාවක එන පුරයක් සිහි කළේය.

ප්‍රදර්ශන ශාලාවල තුබූ ප්‍රදර්ශන භාණ්ඩද ඔවුන් විස්මය පත් කරවීය. රන් පැහැති තිරිඟු හා බාර්ලි, විශාල ගෝවා ගෙඩි ගොඩවල්, ලාරත් පැහැති ලොකු අර්තාපල්, පැණි කොමඩු සහ කැකිරි ආදිය එහි විය.

ගම්වල කෘෂිකර්මය දියුණුවීමට පටන් ගත්තාක් මෙනි.

කම්හල් හා වැඩපොළවල් තම කාර්මික භාණ්ඩ ප්‍රදර්ශනයට එවීය. නගරය දුප්පත්කම හා විනාශ මැඩ හිස ඔසවන බව එයින් පෙනිණි.

ලෙනින් කායික වශයෙන් විඩාපත්වී ගෙදර පැමිණියද, මානසික වශයෙන් ප්‍රීතියෙන් පසුවිය.

1922 නොවැම්බර් 20 ද ලෙනින් බොල්ෂොයි රඟහලේදී කළ කතාව නදේෂ්ද ක්‍රෲප්ස්කයාට සදහටම අමතක නොවිණි. රෝගයට ගොදුරුවීමට පෙර ලෙනින් කළ අවසාන කතාව එය විය.

''...නව ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කළ රුසියාව තුළින් සමාජවාදී රුසියාවක් බිහිවනු ඇතැ''යි එද ලෙනින් පැවසීය.

## ජීව ප්‍රේමය

හිම යානය ඇදගෙන දුවන අසුන්ගේ කුර වලින් හිම කැට් විසිවිය. හිම යානයෙන් පිටවූයේ 'කිස්' යන හඬකි. හවස හිරු බැසයත්ම ඉක්මනින් ඇඳිර පැතිරිණ. යම්තම් නිල් පැහැති හිම කැට් සහිත කැලෑව අඳුරුවිය. අහසේ තරු එබී බලන්නට පටන්ගති.

ලෙනින් දඩයමෙන් පසු ගෙදර ආවේය. ඔහුට තවම වෙඩි තැබීමට තරම් ශක්තියක් නැති වුවද, ඔහුගේ මිතුරෝ දඩයම් කරන සැටි බලා ඔහු සතුටු විය. සතුන් දඩයම් කිරීම හා දඩයම් කිරීම සමග සම්බන්ධ හැම දෙයක්ම ඔහුගේ ඉමහත් සතුටට හේතුවිය. කැලෑවේ ඇවිදීම, වන සිරිය නැරඹීම, සතුන් සොයා යාම, වෙඩි තැබීම ආදී හැම දෙයකටම ඔහු ආශා කළේය.

වෙනත් දඩයම්කරුවෙක් නිසැකවම වෙඩි තබන අවස්ථාවලදී ලෙනින් වෙඩි නොතබන අවස්ථාද විය. මීට පෙර වතාවක, ශීත සමයක දඩයම්කරුවෝ රතු කොඩි වලින් හිවලකු වට කොට පිටවීයාමට එක් මගක් තබා එතැනටවී සිට සතුන් දඩයම් කළහ. රතු කොඩි දැක බියවන හිවලුන් ගැළවී යාමට පැමිණියේ දඩයම් කරුවන් සිටින තැනටමය.

අනිත් අවස්ථාවලදී ඝෝෂා කරමින් දඩයම්කරුවෝ හිවලුන් තමන්ට වුවමනා තැනටම ගෙන්වා ගත්හ.

මෙවැනි දඩයම් වාරයක ලෙනින් තම තුවක්කුවත් රැගෙන හිවලා පිටවිය යුතු කපොල්ල අසලට වී සිටිමින් සිතන්නට විය: ''ආවොත් නොවරදින්ට වෙඩි තියන්ට පුළුවනි.'' භාස්කමෙකි. නත්තල් ගහකට මුවාවී සිටි හිවල් පැටියෙක් ලෙනින්ගේ තුවක්කු කටටම ගමන් කරන්ට විය. හිවල් පැටියා කොතරම් ලස්සනද යත් ලෙනින් ගල් ගැසුණාක් මෙන් ඌ දෙස බලා සිටියේය. සුදෝසුදු හිම පසුතලය කොට ඇති තැනකින් පිටවූ ඌ රතු පැහැතිය. උගේ හොම්බ උල්ය, වලිගය ලොමින් ගහණය. ඌ වඩාත් ලෙනින්ට ළං විය. ලෙනින් වෙඩි නොතැබීය. ඌ එතරම්ම ලස්සන හිවල් පැටියෙකි! එදවසද අද මෙන් දිලිසෙන හිම කැට් වලින් වනය පිරී තිබිණ.

තමා හිවලාට වෙඩි නොතැබූ සිඩිය මතක් කළ ලෙනින් මඳ සිනා පෑවේය.!

හිම යානයේ කුඩා සීනු හඬ නගයි! ඇඳිර කෙමෙන් පැතිර යයි. හිරු බැස ගියද වනයට ඉහළින් පැහැදිලි අහසේ අඩ සඳ බබලන්නට විය.

නදේෂ්ද ක්‍රෘප්ස්කයාද කවුළුවෙන් අඩ සඳ දකින්නී මරියා උල්යානොවා අමතා මෙසේ කීවාය:

"අද හරියට උත්සවයක් වගෙ. බලන්නකො හඳ හරිම දීප්තිමත්"

"වලදිමීර්ට සනීපය ලැබීම නිසා අපේ හිතට හරි සතුටකි. බලන්නකො අද අයියා දඩයම් කිරීමට පවා ගියා. හරිම අපූරුයි!" මරියා උල්යානොවා පිළිතුරු දුන්නාය.

"මතකද එයා නත්තල් උත්සව දවසේදී හිනාවුණු හැටි! ඉස්සර වගේම නේද?"

නත්තල් උත්සව කාලයේදී ගෝර්කි ගමේ රජයේ ගොවිපොළේ ගොවි ළමයින් වෙනුවෙන් නත්තල් ගහ සහිත උත්සවයක් ලෙනින් නැවතී සිටි මහගෙදර පවත්වන ලදී. ලෙනින්ද ළමයින් සමග එකතුව සිනාසෙමින් ඔවුන් සමග ක්‍රීඩා කළේය. මරියා උල්යානොවා පියානෝව වාදනය කළ විට ඔහු මහත් ඕනෑකමින් එයට සවන් දුන්නේය.

ප්‍රීතිදයක සිඩීන් ගැන පමණක් ලෙනින්ගේ බිරිඳ සහ නැගණිය කතා කළහ.

ලෙනින් දඩයමින් පසු ගෙදර පැමිණියේ රෝස පැහැති දෙකොපුල් ඇතිවය. ඔහු ප්‍රීතියෙනි. දෙනෙත් දිලිසිණි. සීත සුළං හා දඩයම් කිරීම, හිම යානයෙන් ගමන් කිරීම මේ නිසා ඔහු නව පණක් ලැබුවාක් මෙනි. වහාම ඔහුට පැයක් විවේක ගන්නා ලෙස දෙස්තරවරු නියම කළහ. ලෙනින් කෙටි නින්දකට වැටිණි.

නදේෂ්ද ක්‍රෘප්ස්කයා සහ මරියා උල්යානොවා ඔහු විවේක ගන්නා කාලය තුළදී වචනයකුදු කතා නොකොට, දෙතොල් මත ඇඟිල්ලක් තබා නිහඬව සිටින ලෙස දන්වමින් තම කටයුතු වල යෙදුණහ.

ඔවුන් සතුටු වුණද එය ස්ථිර නොවීය. ඔවුන්ගේ සතුට නිර්භය රහිත නිහඬතාවයකි. දෙස්තරවරු ඔහු ඉක්මනින් සුවය ලබන බව කීහ. වසන්තයේදී ලෙනින් සුවය ලබන බව එක් දෙස්තරවරයෙක් පැවසීය.

හවස ක්‍රෘප්ස්කයා ඔහුට පුවත්පත් කියවන්නට වූවාය. ලෙනින් සුවය ලබත්ම, ඈ ඔහුට ඇසෙනසේ "ප්‍රව්ද" පුවත්පත කියවූවාය. එදවස ඔහුට ඇසෙන සේ ඈ ජැක් ලන්ඩන්ගේ නව කතාවක් කියවූවාය.

ලෙනින් ඇඳි පුටුවක වාඩිවී, දෙනෙත් හකුළුවාගෙන කල්පනා ලෝකයකට පිවිසෙමින් කවුළුව දෙස බැලීය. ඇත, කවුළුවට එහා පැරණි

උද්‍යානයය. දැඩි සීත නිසා ජනේල වීදුරු වල හිම තට්ටු බැඳිලාය. ඒනිසා පිටත කිසිවක් ගෙතුළට නොපෙනේ. යම්කිසි ගුප්ත බලයකින් ගස්වල කොළ සහිත චිත්‍ර ජනේල වීදුරුවසා ඇති හිම තට්ටු මත ඇඳී ඇත. ළමා කාලයේදී දුටු හිම මල් මෙනි…

ඈ ඔහුට ඇසෙන සේ කියැවූ නව කතාව ජීව ප්‍රෙමයය. මිනිහෙක් හිම කාන්තාරයක් මැදින් ගමන් කරයි, ඔහු රෝගියෙකි, දුබලයෙකි. ඔහු අසලින් දුබල වෘකයෙක්ද ගමන් කරයි. මිනිසාත් වෘකයාත් අතර ද්වන්ද්ව සටනකි. ජයගන්නේ කවුද? වෘකයාට ජය ලැබේද? අවසානයේ මිනිහා ජය ගනී. ජීවත්වීමට ඇති ඉමහත් ආශාව විසින් ඔහුට ජයලබා දිණි. මිනිසාට පරමාර්ථයක් ඇත. හිම කතර කෙළවර මුහුදේ යන නැවක් ඔහු දකී. නැවට නැඟීමට හැකිවූවොත් යළි ජීවත්විය හැක. ඔහු බඩ ගෑවේය, නොනවත්වා බඩ ගාමින් වෙරළට ළඟා විය.

ලෙනින් එම කතාව අසා සතුටුවිය. ඔහුගේ හැඟීම් ඇවිස්සී ඇති බව ක෴ප්ස්කයාට දැනිණි. නිර්භීතකම, ස්ථිරබව, ජීවත්වීමට ඇති ආශාව, සතුරු බලවේගයට යටත් නොවීම ආදී ගුණයන් මිනිසා සතුය.

ලෙනින්ද රෝගය මැඩ ජය ගැනීම සඳහා දැඩි සටනක් කළේය. අද ඇසූ කතාව නිසා ඔහුගේ හැඟීම් ඇවිස්සී උග්‍රවූයේ එබැවිනි. නැවත ප්‍රකෘති ජීවිතයක් ගතකිරීමට වැඩ කිරීමට ඔහු තුළ ඇති ආශාව ඉමහත් විය.

ලෙනින් තව දවස් කීපයකින් මියයති යි කෙසේ නම් ඈ දන්නීද?

රෝගය දුෂ්ට ලෙස නැවත හිස එසවීය. එවර ලෙනින් පැරදුණේය.

1924 ජනවාරි 21 ද හවස හය පසුවී විනාඩි පනහට ව්ලදිමීර් ඉල්යිච් උල්‍යානොව් ලෙනින් — සෝවියට් දේශයේ අසාහාය නායකයාණෝ සදහටම දෙනෙත් පියාගත්හ.

## නායකයාට ගරු කරමු!

බොහෝ රතු හමුද භටයෝ සහ දෙශප්‍රෙමී ගොරිල්ලා භටයෝ ''උ-127'' දුම්රිය යන්ත්‍රය ගැන දන සිටියහ. යුධ කාලයේදී එම දුම්රිය යන්ත්‍රය පෙරමුණට යුද සේනා හා යුධායුධ ගෙන ගියේය. යුද පෙරමුණේ සිට පිටුපසට තුවාල කරුවන් ගෙනගියේය. වෙහෙස නොබලා මෙසේ සේවය කළ දුම්රියට ප්‍රතිවිප්ලවවාදී සතුරෝ නිතර පහර දුන්හ. යුධය අවසන් වෙත්ම, දුම්රිය යන්ත්‍රයද අබලන්වූයෙන් එය ක්‍රියා විරහිත විය.

රටේ ආර්ථිකය ගොඩනැගීමට පටන්ගත්විට ජනතාවට ''උ-127'' මතක් විය. කම්කරුවෝ එය දුම්රිය යන්ත්‍ර ගබඩාවෙන් එළියට ගෙන නැවත අළුත් වැඩියා කළහ.

නැවත මේ දුම්රිය යන්ත්‍රය නව පණක් ලැබූවාක් සේ ක්‍රියාකාරී විය. දුම්රිය කම්කරුවන් මේ යන්ත්‍රය අළුත්වැඩියා කළේ නොමිලේය. මේ ශ්‍රමදානයට කොමියුනිස්ට් පාක්ෂිකයින් සහ පක්ෂයේ නොවන අයද සහභාගි වූ අතර ඔවුහු තම ශ්‍රමය කොමියුනිස්ට් පක්ෂයට පරිත්‍යාග කළහ. සෝවියට් අගමැති වි. අයි. ලෙනින් දුම්රිය යන්ත්‍රය පදවන රියකරු කණ්ඩායමේ ගරු සාමාජිකයකු ලෙස ඇතුළු කරවා ගන්නා ලදී.

ලෙනින් මියගිය පසු, ගෝර්කි සිට මොස්කව් දක්වා එම මෘත දේහය ගෙනඒම "උ-127" දුම්රිය යන්ත්‍රයට භාර කරන ලදී.

ලෙනින් මියගිය දින රාත්‍රියේදීද, පසුදින උදේ සිට මධ්‍යම රාත්‍රිය දක්වාද ගෝර්කි හා අවට ගම්වල දස දහස් ගණන් ජනතාව ලෙනින්ට අවසාන ගෞරවය දැක්වීම පිණිස වැළ නොකැඩී ආවෝය.

ජනවාරියේ දැඩි සීත තවත් දරුණු වූ අතර හිම කුණාටු හමන්නට විය. ගෝර්කිහි උද්‍යානවල ගස් වසා සිටි හිම අයිස් බවට පත්වෙලාය. සුළංපහරට හසුවන අතු වැනෙන විට වීදුරු බිඳෙන හඬක් ඇතිවූයේ මේ නිසාය. ගෝර්කිහි ලෙනින් පදිංචිව සිටි ගෙදර රතු හා කළු කොඩිවලින් සරසා තිබිණි. මග දෙපස නත්තල් ගස් අතු හා රිකිලිවලින් සරසලාය. හිමෙන් පිරි අවට බිම මලින් වැසිලාය.

ගෝර්කි සිට දුම්රිය පොළ දක්වා ඇති දුරප්‍රමාණය හැතැප්ම හතරක් පමණය. ලෙනින්ගේ මෘත දෙහය සහිත පෙට්ටිය කම්කරුවන්, ගොවීන්, කොමියුනිස්ට්වාදීන්, කැබිනට් ඇමැතිවරුන් විසින් දුම්රිය පොළ දක්වා ඔසවාගෙන යන ලදී. "උ-127" දුම්රිය ලෙනින්ගේ මෘත දෙහය මොස්කව් නගරයට ගෙන ගියේය.

දුම්රිය කරු මත්වෙයි ලූවින් අවුරුදු විසි එකක් තිස්සේ දුම්රිය පදවා ඇත. දැන් ඔහු ගෝර්කි සිට මොස්කව් දක්වා "උ-127" යන්ත්‍රය පදවයි. නියමිත වේලාවට ලෙනින්ගේ මෘත දේහය මොස්කව් නගරයට ගෙන යා යුතුය.

දුම්රිය මග දෙපස ගොවීහුසිටගෙන තම ආදරණීය නායකයාට අවසාන ගෞරවය දැක්වූහ. විශාල සංඛ්‍යාවක් දුම්රිය පාර හරහා සිටගෙන උරෙනුර ගැටී හිස් පහත් කරගෙන සිටියහ.

දුම්රිය අනතුරු හඟවන නළාව හඬවමින් ඉදිරියට ගමන් කළද, මිනිස්සු දුම්රිය මගින් ඉවත් නොවූහ. දුම්රිය නැවැත්වූ රියකරු මත්වෙයි ලූවින් පඩිපෙළට නැග පිරිස ඇමතීය:

"සහෝදරවරුනි! මේ දුම්රිය පදවන රියකරු කණ්ඩායමේ ගරු සාමාජිකයෙක් හැටියට අපේ ලෙනින් සහෝදරයාව ඇතුළු කර ගත්තේ මීට කලකට ඉස්සෙල්ලා. අපේ ආදරණීය නායකයා ජීවත්ව සිටි කාලයේදී

පමා නොවන බවට මම ඔහුට පොරොන්දුවක් දී තිබෙනවා. දැන් ඔහු නියමිත වේලාවට මොස්කව් නගරයට ගෙන යා යුතුය. මට මගේ කාර්‍යය ඉටු කරගැනීමට තමුන්නාන්සේලා උදව් කරන්න. ලෙනින්ට දුන් පොරොන්දුව ඉටු කරන්න ඕන...''

මෙසේ කී ලූවින් හඩා වැළපෙන්නට වූ විට මිනිස්සුද කඳුළු පිසදමා ගනිමින් දුම්රිය මගින් ඇත්ව ඉඩ දුන්හ.

මොස්කව් නගරයේදී නැවත ලෙනින් සමග වැඩකළ පක්ෂ නායකයෝ ඔහුගේ මෘත දෙහය කරෙන් ගෙන ගොස් කුළුණු මාලිගයේ තැබුවෝය. මග දෙපස රැස්වූ ජනකාය විසි ලක්ෂයකටත් අධික විය.

සිය ගණන් අහස් යානා පහළින් පියාඹමින් පත්‍රිකා වීසි කළහ. රැස්ව සිටි ජනකාය පත්‍රිකා අහුලාගෙන කියවීය. ලෙනින්ගේ ඉමහත් සේවය ගැන සංක්ෂේප විස්තරයක් එහි විය.

නගරයේ මං සන්ධිවල ලෙනින්ගේ ජීවන චරිතය පිළිබඳ විස්තර පත්‍රිකා සහිත පුවරු සිටවා තිබිණි. ලෙනින් ජීවත්ව සිටි කාලයේදී ඔහු පිළිබඳ ලිවීමට කිසිවකුට ඉඩ නොදුන්නේය.

දැන් ඔහු ජීවතුන් අතර නැත. මිනිස්සු කාණ්ඩ වශයෙන් රැස්වී ලෙනින් චරිතය කියවූහ. සාමාන්‍ය ජනතාව ලෙනින්ගේ ශ්‍රෙෂ්ඨ ජීවිතය ගැන දැනගත්තේ මේ ආකාරයෙනි.

සීත තවත් දැඩිවිය. මොස්කව්හි මහ මාර්ගවල ගිනි ගොඩවල් ගසා මිනිස්සු ගිනි තපින්නට වූහ. ලෝක නිර්ධන පංති ජනතාවගේ සඳදරණීය නායකයාගෙන් සමු ගැනීම පිණිස වැළ නොකැඩී ආ ජනතාවගේ සංඛ්‍යාව නොනැවතිණි. සමහරු ගිනි මැළය අසලට වී ගිනි තපා පෙළට එක්වූහ. අන් සමහරු දෙපා හිරිවැටීම වළක්වනු පිණිස උඩ පැන්නාහ. මෙසේ හැතැප්ම ගණනක් දිගැති පෙළ කුළුණු මාළිගයට ළං විය.

මොස්කව් පුර වැසියන් පමණක් නොව, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ විවිධ සමූහාණ්ඩුවලට අයත් විවිධ ජාතිකයෝද මෙහි ආවෝය. රුසියානුන්, උක්රයින්වරුන්, අර්මේනියානුන් හා කසාක්ජාතිකයින්, ජෝර්ජියානුන්... අන් රටවලින් පැමිණි කොමියුනිස්ට්වරුන් සහ කම්කරුවන්ද මෙහි විය.

කුණුළු මාලිගයට ගෙනෙන ලද මල්වඩම් දස දහසකටත් වැඩිවිය. ශෝචනීය සංගීත වාදනයක් ඇසිණි. මිනිස්සු නිහඬව ඔහුගේ මෘත දේහය ඉදිරියේ මොහොතක් නැවතී, ආචාර කොට හිස පහත් කරගෙන පිටවූහ.

වී. අයි. ලෙනින්ගේ අවමගුල් උත්සවය 1924 ජනවාරි 27 ද මොස්කව් වේලාවෙන් සවස හතරට සිදු කරන ලදී.

රතු චතුරශ්‍රයේ ලෙනින්ගේ මෘත දේහය තැබීම පිණිස සොහොන් කොතක් සාදන ලදී. දැඩි ශීත නිසා වානේ මෙන් තද්දුනු පොළොව හාරා පුපුරවා දවස් තුනක් ඇතුලතදී ලීයෙන් සොහොන් කොතක් සෑදූහ. පසු කලෙක ලී සොහොන් කොත වෙනුවට කළු ගලින් හා කිරි ගරුඬෙන් ලස්සන කුඩා මන්දිරයක් බඳු සොහොන් කොතක් සෑදුවෝය.

ජනවාරි 27 ද මොස්කව් නගරයේ හා සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයේ හැම පෙදෙසෙකින්ම නියෝජිත මණ්ඩලද, ලෝකයේ නොයෙක් රටවලින් කොමියුනිස්ට් පක්ෂවල නියෝජිතවරුද රතු චතුරශ්‍රයට පැමිණියහ. ලෙනින්ගේ මෘත දෙහය සහිත පෙට්ටිය රතු චතුරශ්‍රයේ උසැති මණ්ඩපයක් මත තබා රතු ධජවලින් සරසන ලදී. ජනවාරි මාසයේ දැඩි ශීත ඉවසිය නොහැකි තරම් උග්‍රවිය.

මෘත දේහය අසල සිටගනිමින් ආචාර කිරීම ආරම්භ විය. ලෝක සමාජවාදී විප්ලවයේ අග්‍ර සේනාධිනායක වී. අයි. ලෙනින්ට ගරු කරමින් සෝවියට් අසරු හමුදාව ගමන් ගත්තේය. ලෙනින්ට අවසාන ආචාරය කරමින් රතු හමුදාවේ අසරු කාලතුවක්කු හමුද කණ්ඩායමක් රතු චතුරශ්‍රය හරහා ගමන් කළේය.

කම්කරු නියෝජිත කණ්ඩායම් කීපයක් ලෙනින්ගේ මෘත දෙහය තබා ඇති මණ්ඩපය වෙත ඇවිත් තම රතු ධජ පහත් කොට ආචාර කළෝය.

හවස හතරට සමස්ත සෝවියට් ගුවන් විදුලිය ජනතාවට ආයාචනා කළේය.

''සහෝදරවරුනි නැගිට සිට නායකයාට ආචාර කරන්න. වී. අයි. ලෙනින්ගේ මෘත දෙහය තැන්පත් කරයි!''

රට පුරාම කම්හල් නිහඬවිය. යන්ත්‍ර සූත්‍ර ක්‍රියා විරහිත විය. කෝටි සංඛ්‍යාත ජනකායක් නැගිට සිට නායකයාට ගරු කළෝය. විදේශීය රටවල කම්කරුවෝ වැඩ නවත්වමින් ජාත්‍යන්තර නිර්ධන පංති නායකයාට ආචාර කළහ. විනාඩි පහක නිහඬතාවයක් විය. කම්හල් වල නළා, දුම්රිය නළා හඬ නගමින් තම සංවේගය පළ කළේය. සාගරවල හා මුහුදු වල යාත්‍රා කරමින් සිටි සෝවියට් නැවිද නාවිකයෝද අවසාන ආචාරයට එක්වූහ. සෝවියට් දේශයේ හැම නගරයකමත් ගමකත් ජනතාව එකා මෙන් නැගී සිටි අවසාන ආචාරයට එක්විය.

කෝප්වූ කලෙක මෙන් හිම කුණාටුවක් රතු චතුරශ්‍රය හරහා හමන්නට විය. රතු කොඩි ලෙලදුන්නේය. ලක්ෂ සංඛ්‍යාත ජනකායකගේ නෙත් කඳුළුවලින් තෙත්විණි.

අවසාන ආචාර වෙඩි මුර පවත්වන ලදී.

හවස් වෙත්ම ඇඳිර පැතිරිණ. මිනිස්සු වැළ නොකැඩී, නොනැවතී රතු චතුරශ්‍රය දෙසට ආහ....

සෝවියට් සාහිත්‍යයේ මෙවැනි කෘතියක් මින් පෙර නොවිය.
වි. අයි. ලෙනින්ගේ ජීවන චරිතය රසබරව ලිවීමට
මාරියා ප්‍රිලෙෂයෙවා ඉදිරිපත් වූවාය.
මෙමඟින් ලෙනින් චරිතය සුපැහැදිලි ලෙස සහ දීප්තිමත් ලෙස
ඇය විසින් ඉදිරිපත් කරන ලදැයි
සෝවියට් පුවත්පත් සඳහන් කරයි.
මේ සඳහා සෝවියට් සම්මාන තිළිණයක් ද හිමිවී ඇත.



00027366 - 1
LENIN CHARITHAYA
Rs 250.00

මුද්‍රණය හා බෙදාහැරීම
සුරේන්ද්‍ර ප්‍රකාශන
ගණේමුල්ල.
දුරකතනය - 0602838510

ISBN - 955 - 9412 - 23 - x

මිල රු. 250/-